# බස්නාහිර පළාතේ පළාත් සභාව

மேல் மாகாண மாகாண சபை

**WESTERN PROVINCE PROVINCIAL COUNCIL**

**2017 අප්‍රේල් 04 වන අඟහරුවාදා**

2017 சித்திரை 04 செவ்வாய்க் கிழமை

Tuesday 04th April 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல 204 .இல ,மாவத்தை கொப்பேகடுவ டென்சில் ,ஜயவர்த்தனபுர ஸ்ரீ ,இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.38 ට පළාත් සභාව රැස් විය.**

மு.ப. 09.38 க்கு சபை கூடியது

*The Provincial Council met at 09.38 a.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.**

*திரு. **பிரதித்** தவிசாளர் [**யசபால கோரலகே** அவர்கள்] ] தலைமை வகித்தார்.*

*Mr. Deputy Chairman [ Yasapala Koralage ] in the Chair*

## නියෝජ්‍ය සභාපතිවරයාගේ නිවේදන

ANNOUNCEMENTS OF DEPUTY CHAIRMAN

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

Mr. Deputy Chairman

*i*

*"2017.04.16 වන දින පෙ.ව. 09.30 ට ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පැවැත්වීමට නියමිතව තිබූ තොරතුරු දැන ගැනීම පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුවට සම්පත්දායකත්වය ලබා දෙන මහතාට සහභාගිවීමට නොහැකිවීම හේතුවෙන් එදිනට එම වැඩමුළුව නොපැවැත්වෙන බව ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙනවා. ඉදිරි වෙනත් දිනයකදී එම වැඩමුළුව පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා.*

*ii*

*"සභා රැස්වීම් පැවැත්වීමට මින් පෙර තීරණය කරන ලද 2017.04.18 හා 2017.05.09 වන දිනවල සභා රැස්වීම් නොපැවත්වීමටත්, 2017.04.25 වන දින සභා රැස්වීම පැවැත්වීමටත් සුදුසු බව පසුගිය සභා කටයුතු කාරක සභාවේදී එකඟතාවයකට පැමිණි බවත්, ඒ අනුව සභා රැස්වීම සම්බන්ධයෙන් යෝජනා දෙකක් අද දින න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙනවා. න්‍යාය පත්‍රයේ එම විෂයයට පැමිණි විට ඒ පිළිබඳව නිශ්චිත තීරණයක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීවරුන් වෙත මෙලෙස පූර්ව දැනුම් දීමක් කරනවා.*

## කාරක සභා වාර්තා

COMMITTEE REPORTS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

Mr. Deputy Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2017.02.24 වන දින පැවැති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව සහ,

ii. 2017.03.22 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Deputy Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

## පෙත්සම්

PETITIONS

**ගරු සහන් ප්‍රදීප් විතාන**

Hon. Sahan Pradeep Vithana

ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ සිටින නිසා එතුමාගේ පෙත්සමක් තිබෙනවා. එම නිසා කළුතර, කටුකුරුන්ද, වැව පාර, අංක 05, ප්‍රිස්කා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ ප්‍රැන්සිස් ජෝශප් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

** [කල් ගන්නා ලද ප්‍රශ්නය ]*
*[Adjourned Question]*

**01.**

**නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/22)**

අ. i. කළුතර අධ්‍යාපන කොට්ඨාශයේ මොරොන්තුඩුව ධම්මානන්ද විද්‍යාලය ද්විතියික පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කර ඇති බව දන්නේද?

ii. ඒ කුමන වර්ෂයේ සිටද?

iii. ඒ කුමන වැඩසටහන යටතේද?

iv. ඒ සඳහා අවසර ලබා දුන්නේ කවුරුන් විසින්ද?

ආ. i. එම ද්විතීයික පාසලට යෝජනා කරනා ලද පෝෂක පාසල් කවරේද?

ii මෙම පාසල් පෝෂක පාසල් ලෙස ක්‍රියාත්මක වන්නේද?

iii. නොඑසේ නම් මන්ද?

ඇ. i. පෝෂක පාසල්වලින් ධම්මානන්ද ද්විතීයික පාසලේ 6 ශ්‍රේණියට පැමිණි දරුවන් සංඛ්‍යාව වසරින් වසර කොපමණද?

ii. එය සභාගත කරන්නේද?

ඈ. ධම්මානන්ද විද්‍යාලයේ 2017 වර්ෂයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාවත්, ද්විතීයික පාසැල් ව්‍යාපෘතිය ආරම්භක මොහොතේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාවත් කවරේද ?

ඉ. ධම්මානන්ද ද්විතීයික පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව ඉතා ශීඝ්‍රයෙන් අඩු වී ඇති බව පිළිගන්නේද ?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. i. ඔව්.

ii. 2012 වර්ෂයේ සිට.

iii ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ.

iv. කලාප ව්‍යුහ කමිටුව විසින් නිර්දේශ කර අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබා දී ඇත.

ආ. i. ගෝනදූව කණිෂ්ට විද්‍යාලය/කලපුගම කණිෂ්ට විද්‍යාලය/මාවල කණිෂ්ට විද්‍යාලය.

ii ඔව්.

iii. අදාළ නොවේ.

ඇ. i.

**6 ශ්‍රේණිය සඳහා පෝෂිත පාසල්වලින් පැමිණි දරුවන් සංඛ්‍යාව**

| වර්ෂය | ගෝනදූව කණිෂ්ට විද්‍යාලය | කලපුගම කණිෂ්ට විද්‍යාලය | මාවල කණිෂ්ට විද්‍යාලය |
|---|---|---|---|
| 2012 | නැත | නැත | නැත |
| 2013 | 09 | 18 | 28 |
| 2014 | 15 | 30 | 15 |
| 2015 | 10 | 23 | 03 |
| 2016 | 09 | 18 | නැත |
| 2017 | 05 | නැත | නැත |

ii ඔව්.

ඈ.

| වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 2012 | 1184 |
| 2017 | 852 |

ඉ. ද්විතීයික පාසල් ව්‍යාපෘතිය යටතේ ප්‍රාථමික පන්ති එකින් එක අඩුවීම නිසා ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වී ඇති නමුත් එය පාසලට ඇතුළත් වන සිසුන්ගේ අඩු වීමක් නොවේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළා, ධම්මානන්ද විද්‍යාලයේ ද්විතීයික පාසල් ආරම්භ කරන මොහොතේ හිටපු ළමයින් සංඛ්‍යාව. නමුත් ඔබතුමා නැවත කිව්වා, මේ මොහොතේ සිටින දරුවන් සංඛ්‍යාව 852 යි කියලා. ඔබතුමාගේ උත්තරය සඳහන් කළේ, ක්‍රමයෙන් ප්‍රාථමික පන්ති නොමැතිවීම නිසා තමයි මේ දරුවන් අඩු වෙන්නේ කියලා. ඒක නොවෙයි ගරු ඇමතිතුමා ඇත්ත තත්ත්වය. මේ වටේ තිබෙන පෝෂක පාසල්වලටත් දෙමව්පියන් දරුවන් ඇතුළත් කරන්නේ නැහැ. දැන් උදාහරණයක් තමයි, ඔබතුමන්ලා මේ වැඩ සටහන හරියට ක්‍රියාත්මක කරනවා නම් - ධම්මානන්දයට මේ පාර ගෝනදූවෙන් එන්න තිබුණා, ළමයින් 18 දෙනෙක්. නමුත් ළමයින් 04 දෙනයි ධම්මානන්දයට එවන්නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මේ සභාවේදී ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේදී මන්ත්‍රීවරුයෙකුට තිබෙන වරප්‍රසාදය සහ පැහැදිලි කිරීම්වලට තිබෙන වරප්‍රසාදයද පිළිබඳව අවධානය යොමු කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පැහැදිලි කිරීම් කරන්නේ නැතිව අතුරු ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම ඔබතුමාගෙන් නොවෙයි ඇහුවේ. මම ඇහුවේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමාගෙන්. සභාපතිතුමාගෙන් අහන ප්‍රශ්නවලට මන්ත්‍රීවරු උත්තර දෙන්න ඕනෑ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ අහපු ප්‍රශ්නයට අතුරු ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් පොඩ්ඩක් විග්‍රහ කරලා - නැත්නම් ඒක පැහැදිලි වෙන්නේ නැහැ. ඔබතුමාට අවශ්‍ය ප්‍රශ්න කෙටියෙන් අහන්න. වැල්වටාරම් නැතිව අහන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමා ද්විතීයික පාසල් සංකල්පය යටතේ පෝෂක පාසල්වලින් ධම්මානන්දයට දරුවන් එන්නේ නැහැ. උදාහරණයක් හැටියට කලපුගමෙන් ආවේ නැහැ. ගෝනදූවේ ළමයින් 18 දෙනෙක් ඉන්න කොට ළමයින් 04 දෙනයි ධම්මානන්දයට එවන්නේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා පියවර අරගෙන තිබෙනවාද? දැන් මාවලින් ගත්තොත් එහෙම ඔබතුමා පෝෂක පාසලක් ලෙස නම් කරනවා. අවුරුදු තුනක සිට ළමයින් එක්කෙනෙක්වත් එන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා කියන ප්‍රකාශයේ සත්‍යයතාවයක් තිබෙනවා. ප්‍රාථමික ගණයට වැටෙන පාසල්වලින් ද්විතීයික ගණයට වැටෙන පාසල්වලට දරුවන් පහෙන් පසු 06 වැනි ශ්‍රේණියට එවිය යුතුයි. මගේ ළඟ තිබෙන වාර්තාව අනුව ඒ පාසල් කිහිපයකින් දරුවන් එවන්නේ නැහැ. දරුවන් එවන්න කියලා අපි නියෝග කරලා තිබෙනවා. ඒ නිසා යළි ස්ථිර වශයෙන්ම ඉතා දැඩි නියෝගයක් මේ සභාවේ නිකුත් කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු ඇමැතිතුමනි, මම කියන්නේ ඔබතුමා කළ යුත්තේ මේ දැඩි නියෝග නිකුත් කරන එක නොවෙයි. මේ පෝෂක පාසල්වලින් ද්විතීයික පාසල් වෙත දරුවන් එවීම පිළිබඳව තිබෙන ගැටලු සම්බන්ධයෙන් ඔබතුමා සොයා බැලීමක් කරලා වාර්තාවක් දෙන්න පුළුවන්ද? උදාහරණයක් මම කියන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව එක ප්‍රශ්නයයි අහන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ, කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම කෙටියෙන් අහන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මම අහන්නේ, කලපුගම විදුහල්පතිතුමිය කියනවා. කලපුගමුවේ සිට ධම්මානන්දයට එන්න බැරිව ළමයින් 21 දෙනෙක් ගෙදර සිටියා කියලා. එතකොට ඒ ළමයින් 21 දෙනා ගැන කවුරුත් සොයා බැලීමක් කරන්නේ නැහැ. ඔබතුමා දැඩි නියෝග නිකුත් කරයි. හැබැයි, මේ දරුවන්ට වෙන අසාධාරණය, දුර ප්‍රමාණය සොයා බැලීමක් කරන්නේ කවුද? ඒ සාධාරණ ඉල්ලීමක් තිබෙනවා. ඒ පෝෂක පාසල්වලින් මතු කරන තත්ත්වය. ඒ පිළිබඳව සොයා බලා වාර්තාවක් දෙන්න පුළුවන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගෙදර සිටියා කියලා විදුහල්පතිතුමිය කොහොමද කියන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට සමාවෙන්න. අමතර ප්‍රශ්න මට අහන්න වෙනවා. විදුහල්පතිතුමිය කොහොමද දරුවන් 21 ක් ගෙදර සිටියා කියලා කියන්නේ?

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

එතුමිය කියනවා. එතුමිය ඔබතුමාගේ අමාත්‍යාංශයට ගෙනැල්ලා සාකච්ඡාවක් තියලා, විජේතුංග මහත්මයාත් සිටියා. මමත් සිටියා. ඒ අවස්ථාවේ තමයි එතුමිය කියන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා නේ. එකක් තමයි විදුහල්පතිවරයාගේ හෝ වරියගේ තිබෙන හිතුවක්කාර ගුණය. හිතුවක්කාරකම හින්දා ඒ අය නියමිත ක්‍රමවේදයට ළමයින් එවන්නේ නැහැ. මේක පාසල් දහසක් වැඩ සටහනේ ගොනු කරපු - මේ වාගේ ප්‍රශ්න මම ඇමැතිවරයා හැටියට පිළිගන්නවා. මේ වාගේ ප්‍රශ්න ටිකක් පාසල් ව්‍යුහයක තිබෙනවා. මේක විසඳගන්න මටත් ඕනෑකම තිබෙනවා. පිතට දුන්නාම සෙමට හොඳ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මෙහෙම කරන්න. උපදේශක කාරක සභාවට මෙතුමාව ගෙන්නලා ඒ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හරි. මම පිළිගන්නවා. සෙමට දුන්නාම පිතට හොඳ නැහැ. පිතට දුන්නාම සෙමට හොඳ නැහැ. මේ පාසල් දහසක් වැඩ සටහන යටතේ තිබෙන ගැටලුවක් මේක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, එහෙම කරන්න. මේක දිගට සංවාදයක් ලෙස ගෙනි යන්න දෙන්න බැහැ. ඔබතුමා පොඩ්ඩක් පෞද්ගලිකව උපදේශක කාරක සභාවේදී මේ ප්‍රශ්නය විසඳන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වාර්තාවක් බලාපොරොත්තු වෙනවා. එතුමාට සාධාරණ උත්තරයක් දීමටත් බලාපොරොත්තු වෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මගේ තුන් වැනි ප්‍රශ්නය?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෙටියෙන් අහන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මම එතුමා වෙනුවෙන් අහන්නේ. ගරු ඇමැතිතුමා, මේක මේ ප්‍රශ්නයට සම්බන්ධ නැහැ. නමුත් ඔබතුමාට පොදුවේ උත්තරයක් දෙන්න පුළුවන්. දැන් බස්නාහිර පළාත් සභා පාසල්වල පෝෂක පාසල් කියලා පාසල් ටිකක් නම් කරලා තිබෙනවා. ජාතික පාසලක් වෙන්න පුළුවන්. පාසලක් නම් කරනවා. ඒ පෝෂක පාසල්වලින් අර පාසල්වලට ගන්නවා කියලා. නමුත් ශිෂ්‍යත්ව විභාගයෙන් පසුව අර පාසල්වල ළමයින් ටික අනාථයි. වගකිව යුත්තෙක් නැහැ. මොකද

අර ජාතික පාසලට ගන්නෙත් නැහැ. මම උදාහරණයක් හැටියට කියන්නේ. පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි, මාම්පේ කණිෂ්ට, ඒ වාගේම පිළියන්දල කණිෂ්ට විද්‍යාලය. මේ ළමයින් ටික දැන් අනාථ වෙලා ඉන්නවා. පිළියන්දල මධ්‍ය මහ විද්‍යාලට මේ ළමයින් ටික ගන්නේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

බලෙන් ගිහිල්ලා ඉන්දවන්න තමයි වෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ සම්බන්ධව ඔබතුමා ගන්නා වූ ක්‍රියා මාර්ගය මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ අදහස මම භාර ගන්නවා. අධ්‍යාපනය මේ වාගේ ගැටලු තිබෙන අමාත්‍යාංශයක්. කොහොමත් එම ගැටලු නිරාකරණය කිරීම ඇමැතිවරයාගේ සහ අමාත්‍යාංශයේ වගකීම. මම වගකීම භාරගෙන මගේ පැත්තෙන් උපරිම සාධාරණය ඉෂ්ට කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි. ප්‍රශ්න අංක දෙක, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

** [කල් ගන්නා ලද ප්‍රශ්නය ]*
*[Adjourned Question]*

**02.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/27)**

අ. පසුගිය වසර තුළ පළාත් අයවැයෙන් වෙන් කරන ලද මුදලින් ඔබ අමාත්‍යාංශය මගින් ගම්පහ, කළුතර සහ කොළඹ දිස්ත්‍රික්කයන් සඳහා සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් මොනවාද ?

ආ. ඉහත පරිදි ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කර ඔබ අමාත්‍යාංශය මගින් කලින් වසරට වඩා ප්‍රගතියක් අත්කර ගෙන ඇති ක්ෂේත්‍ර/ අංශ මොනවාද ?

ඇ. සංවර්ධනය සඳහා දිගින් දිගටම මුදල් වැය කළත් කලින් වසරට සාපේක්ෂව ප්‍රගතියක් අත්කර ගෙන නොමැති ක්ෂේත්‍ර/අංශ මොනවාද ?

ඈ. එවැනි කලින් වසරට වඩා ප්‍රගතිය අත්කර ගෙන නොමැති ක්ෂේත්‍ර / අංශ වඩා ඵලදායි බවට පත්කර ගැනීමට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද ?

ඉ. එකී ව්‍යාපෘතීන්ට අමතරව මෙම නව වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් නව රැකියා උත්පාදනය කළ හැකි නව ව්‍යාපෘති පවතින්නේද?

ඊ. එසේනම් ඒ මොනවා දැයි ඉදිරිපත් කරන්නේද?

උ. නො එසේනම් ඒ මන්ද?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.) [On Behalf of Chief Minister]

අ. කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක සඳහා අමාත්‍යාංශය යටතේ පළාත් පාලන, අපද්‍රව්‍ය කළමනාකරණය, සංචාරක, පරිසර, විදුලිය හා

ජලය යන විෂයයන්වලින් ව්‍යාපෘති අනුමත කර ඇත.

ඇමුණුම I [1]

ඇමුණුම II [2]

ඇමුණුම III [3]

ආ.

| **විෂය ක්ෂේත්‍රය** | **මූල්‍ය ප්‍රගතිය %** | |
|---|---|---|
| | 2015 | 2016 |
| පළාත් පාලන | 88 | 97 |
| අපද්‍රව්‍ය කළමනාකරණය | 86 | 99 |
| ජලය | 73 | 96 |
| විදුලිය | 91 | 100 |

ඇ.

| **විෂය ක්ෂේත්‍රය** | **මූල්‍ය ප්‍රගතිය %** | |
|---|---|---|
| | 2015 | 2016 |
| පරිසර | 98 | 95 |
| සංචාරක | 100 | 93 |

ඈ. අමාත්‍යාංශය මගින් ව්‍යාපෘති අනුමත කිරීමට කටයුතු කිරීම හා 2017.06.31 ට ප්‍රථම සියලු ව්‍යාපෘති අනුමත කිරීමට සැලසුම් කර ඇත.

අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අමාත්‍යාංශය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම. මාසිකව ප්‍රගතිය සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා නිරන්තරයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීම.

ඉ. ඔව්.

ඊ. මේ සඳහා පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ අදාළ පළාත් පාලන ආයතන මගින්ද පළාතම ආවරණය වන පරිදි ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයෙන් හා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ඇමුණුම iv හි සඳහන් සියලුම වැඩ සටහන් නියාමනය කරනු ලැබේ.

එම සියලු ව්‍යාපෘති පිළිබඳ විස්තර ඇමුණුම iv [4] මගින් දැක්වේ.

උ. අදාළ නොවේ.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.
[2] - එම -
[3] - එම -
[4] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කාලය නාස්ති කරන්නේ නැහැ. මේ ඇමුණුම් ගොඩාක් තිබෙනවා. කියවලා අතුරු ප්‍රශ්න අහන්න තිබෙන අයිතිය රඳවා ගන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට තුන්වැනි ප්‍රශ්නය. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් මාර්ග, ප්‍රවාහන, සමුපකාර, නිවාස පිළිබඳ ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේ අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හතරවැනි ප්‍රශ්නය රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගෙන්මයි. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේ අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම ප්‍රශ්නය සඳහා සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා, නිදහස් තැපැල් සම්බන්ධව. මේ චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඇති වුණු -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ තැපැල් කන්තෝරුව මගේ තැපැල් ගන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙයින් පසුව අවස්ථාව දෙන්නම්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ චක්‍රලේඛයේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ ප්‍රශ්න ටික ඉවර වුණාට පස්සේ, අවස්ථාව ලබා දෙන්නම්. ඊළඟට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභාවේ නැහැ. පිළිතුරු ඇත්නම් සභාගත කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***05.***

***ඕ.ඩබ්.ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/31)***

*ප්‍රශ්නය :*

*අ. i. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් බේරුවල ප්‍රාදේශීය සභාවට 2013.01.01 දිනට අනුමත කර ඇති සෞඛ්‍ය පරිපාලන තනතුරු සංඛ්‍යාව කීයද ?*

*ii. 2016, 2017 ප්‍රාදේශීය සභාවේ අයවැය ලේඛනයට අනුව එම තනතුරු සංඛ්‍යාව කීයද?*

*iv. තනතුරු සංඛ්‍යාව වැඩි වී තිබේද ?*

*iv. එසේ නම් එම තනතුරට බඳවා ගනු ලැබුවේ කෙසේද ?*

*v. බඳවා ගැනීමේ පටිපාටියට පරිබාහිරව පත්වීම් ලබා දිය හැකිද ?*

*vi. එවැනි ගත්වීම් සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද ?*

*පිළිතුර :*

*අ. i. දෙකකි.*

*ii. තනතුරු සංඛ්‍යාව තුනකි.*

*iii. ඔව්.*

*iv. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 25/2014 (i) චක්‍රලේඛන විධිවිධාන අනුව, දින 180 කට වඩා වැඩි සේවා කාලය පදනම් කර ගනිමින්.*

*v. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 චක්‍රලේඛනයෙහි විධිවිධානයන්ට අනුකූලව අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් පී. සුරාජ් තරංග මයා සපුරා ඇති තත්ත්වය යටතේ, 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය පරිපාලක තනතුරට ඔහු පත් කර ඇත.*

*vi. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ට අනුකූලව සිදු කරන ලද පත්වීමක් බැවින්, ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.*

*ප්‍රශ්නය :*

ආ i. බේරුවල ප්‍රාදේශීය සභාවේ 2016, 2017 අයවැය ලේඛන අනුව රියදුරු තනතුරු සංඛ්‍යාව කොපමණද?

ii. අනුමත කළේ කුමන වර්ෂවලද ?

iii. 25/2014 චක්‍රලේඛය අනුව ස්ථිර කළ සංඛ්‍යාව කීයද ?

iv. චක්‍රලේඛයට පරිබාහිරව රියදුරු පත්වීම් ලබාදී තිබේද ?

v. එම සංඛ්‍යාව කීයද ?

පිළිතුර :

ආ. i. 2016 වර්ෂය සඳහා 15,2017 වර්ෂය සඳහා 15

ii. 2013.01.01 කාර්ය මණ්ඩල වාර්තාවට අනුව.

iii. පස් දෙනෙක් පමණි.

iv. ඔව්.

v. දෙකකි.

ප්‍රශ්නය :

ඇ. i. බේරුවල ප්‍රාදේශීය සභාවට ක්‍රීඩා භූමි භාරකරු ලෙස තනතුරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර තිබේද ?

ii. සංවිධාන ව්‍යුහය තුළ තනතුරු ඇතුලත් කරනුයේ කෙසේද ?

iii. එම තනතුරට අදාළව සභාවෙන් වැටුප් ගන්නා සේවකයින් සිටීද ?

පිළිතුර :

ඇ. i. නැත.

ii. සංවිධාන ව්‍යුහය තුළ එවැනි තනතුරක් ඇතුළත් කළ නොහැක.

iii. නැත.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්න අංක 06. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා නැහැ. සභාගත කරන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*

*[Tabled Answer]*

***06.***

***ඕ.ඩබ්.ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/32)***

ප්‍රශ්නය :

අ. බේරුවල ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බව ඔබතුමා දන්නේද ?

පිළිතුර :

අ. බේරුවල ප්‍රාදේශීය සභාවේ ආර්එස් 0995 දරන බැකෝ යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බව වාර්තා වේ.

ප්‍රශ්නය :

ආ. මෙය ක්‍රියා විරහිත වූ කාලය කොපමණද ?

පිළිතුර :

ආ. මාස 11 ට ආසන්න කාලයකි.

ප්‍රශ්නය :

ඇ. එය අලුත්වැඩියා කිරීමට 2015 වසරේදී වියදම් කළ මුදල කොපමණද ?

පිළිතුර :

ඇ. රුපියල් තුන් ලක්ෂ හැත්තෑ හය දහස් හතයි ශත හැත්තෑ පහකි.

ප්‍රශ්නය :

ඈ. සභාව සතු සම්පතක් මෙසේ නොසලකා හැරීම නිසා සිදුව ඇති පාඩුව කොපමණද ?

පිළිතුර :

ඈ. සිදු වී ඇති පාඩුව නිශ්චිතවම නිශ්චය කළ නොහැකි වුවත්, පෙර වර්ෂයන්හි උපයන ලද ආදායම් හා සැසඳීමේදී වර්ෂයකට

*ආසන්න කාලයක් සේවයේ නොයෙදීම තුළ, රුපියල් හැට හත් දහසකට ආසන්න වටිනාකමක් සහා අරමුදලට අහිමි වී ඇති බව උපකල්පනය කළ හැක.*

*ප්‍රශ්නය :*

*ඉ. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කර මහජනයාට සේවාවක් ලබා දිය හැකිද ?*

*පිළිතුර:*

*ඉ. අදාළ බැකෝ යන්ත්‍රය සේවාවන් සඳහා යොදා ගැනීමට ඇති හැකියාව, යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව තීරණය කරනු ඇත.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්න අංක 07. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***07.***

***ඕ.ඩබ්.ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/33)***

*ප්‍රශ්නය :*

*අ. 2017.01.19 දින පළාත් පාලන කොමසාරිස්, බේරුවල ප්‍රාදේශීය සභාවේ නිරීක්ෂණ චාරිකාවක යෙදුනු බව ඔබතුමා දන්නවාද ?*

*පිළිතුර :*

*අ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ආ. එහිදී සභාවේ පරිපාලන දුර්වලතා ප්‍රතික්ෂේප වී ඇති බව ඔබතුමා දන්නවාද ?*

*පිළිතුර :*

*ආ. පරිපාලන දුර්වලතා හඳුනාගෙන ඇති අතර, එය නිවැරදි කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.*

*ප්‍රශ්නය :*

*ඇ. ගැටළු පිළිබඳව ඍජුව ප්‍රකාශ කළ නිළධාරීන්ට අසරණභාවයට පත්වීමට සිදුවී ඇති බව ඔබතුමා දන්නවාද ?*

*පිළිතුර :*

*ඇ. එවැනි තත්ත්වයක් පිළිබඳව කරුණු වාර්තා වී නැත.*

*ප්‍රශ්නය :*

*ඈ. 2016 අගෝස්තු මාසයේදී W.P.PE7459 කැබ් රථය අනතුරට ලක් වුවත් අලාභය සම්බන්ධව රියදුරන්ගෙන් විමසා නැති බව ඔබතුමා දන්නවාද ? මේ සම්බන්ධව තවමත් පරීක්ෂණ සිදු කරනවාද ?*

*පිළිතුර :*

*ඈ. W.P.PE 7459 කැබ් රථය අනතුරක් සිදු වී ඇති බවට කරුණු වාර්තා වී නැත.*

*ප්‍රශ්නය :*

*ඉ. අවිධිමත් පත්වීම් (සෞඛ්‍ය කම්කරු) 08 ක් ලබා දුන් බවට ලේකම් සාවද්‍ය පිළිතුරු ලබා දී ඇති බව ඔබතුමා දන්නවාද ?*

*පිළිතුර :*

*ඉ. බේරුවල ප්‍රාදේශීය සභාවේ අවිධිමත් පත්වීම් ලබා දී ඇති බවට වාර්තා වී ඇති කරුණු සම්බන්ධයෙන් ඒ සඳහා පත් කරන ලද විශේෂ පරීක්ෂණ මණ්ඩලයක් මගින් තවදුරටත් පරීක්ෂණ සිදු කරන අතර, එම පරීක්ෂණ නිම වීමෙන් පසු නිගමනයකට එළඹෙමි.*

*ප්‍රශ්නය :*

*ඊ. සෞඛ්‍ය පරිපාලන සුරාජ් තරංග සිල්වාගේ පත්වීම විධිමත්ව ලබා දී තිබේද ?*

*පිළිතුර :*

*ඊ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා 25/2014 (i) හි විධිවිධානයන්ට අනුකූලව සුරාජ් තරංග සිල්වාගේ පත්වීම ලබා දී ඇති බව වාර්තා වී ඇත.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේ අවස්ථාව.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Chief Minister]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්න අංක නවය. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට යොමු කරන ලද ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**09.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/35)**

අ. i. කොට්ටාව ධර්මපාල විදුහලට අවශ්‍ය කුමන ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකුද?

ii. එම සුදුසුකම් සහිත විදුහල්පතිවරයෙකු පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබුවේද? කවදාද? කෙලෙසද?

iii. එම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු වාර්තාව මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේද ?

ආ. i. විධිමත් ලෙස විදුහල්පතිවරයෙකු පත් නොකිරීම නිසා පාසලේ පරිපාලනය සහ අධ්‍යාපනය බිඳ වැටී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ii. සුදුසුකම් නැති විදුහල්පතිවරයෙකු පත් කිරීමට කටයුතු කළ අධ්‍යාපන නිලධාරීන් පිළිබඳව ගනු ලබන පියවර කවරේද?

iii. සුදුසුකම් සහිත විදුහල්පතිවරයෙකු පත් කිරීමට කටයුතු කළ අධ්‍යාපන නිලධාරීන් පිළිබඳව ගනු ලබන පියවර කවරේද?

iv. පාසැලේ දියුණුව වෙනුවෙන් සාධාරණය හා යුක්තිය ඉටු කර ගැනීමට මැදිහත් වූ ගුරුවරුන්ගෙන් පිළිගැනීම් සිදු නොකිරීමට වගබලා ගන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ විදුහල්පති සේවය I පන්තියේ නිලධාරියෙකි.

ii. ඔව්. 2016.12.01 දින කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් ඉල්ලුම්පත් කැඳවන ලදී.

iii. ඔව්. ඇමුණුම 01.[5]

ආ. i. දැනට එවැනි තත්ත්වයක් නැත.

ii. අදාළ නැත.

iii. කිසිදු පියවරක් ගත යුතු නැත.

iv. ඔව්.

[5] පිළිතුර අවසානයේ පළ කර ඇත.

ඇමුණුම 01

01/17

<u>බප/ජය/කොට්ටාව ධර්මපාල විදුහලේ විදුහල්පති තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලේඛ</u>

| අනු අංකය | නම, සේවා ස්ථානය, තනතුර හා ශ්‍රේණිය | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය | ලකුණු | මුළු ලකුණු | අත්සන | වෙ |
|---|---|---|---|---|---|---|
| 01 | එම්. බී. බී. අත්තනායක මයා<br>ශ්‍රී ලං.වි.සේ.<br>විදුහල්පති<br>බප/පිළි/ලලිත් ඇතුලත්මුදලි විද්‍යාලය | පී. ශ්‍රිලාල් නෝනිස් මයා<br>යූ.ඩබ්.ටී.යූ. රාජකරුණා මිය<br>ඒ.ඒ.ඩී.එම්.සී. විජේතුංග මයා | 28<br>30<br>31 | 89 | | |
| 02. | කේ. කේ. විජයරත්න මයා<br>ශ්‍රී ලං.වි.සේ. 1<br>විදුහල්පති<br>බප/ජය/මහරගම මධ්‍ය මහා විද්‍යාලය | පී. ශ්‍රිලාල් නෝනිස් මයා<br>යූ.ඩබ්.ටී.යූ. රාජකරුණා මිය<br>ඒ.ඒ.ඩී.එම්.සී. විජේතුංග මයා | 67<br>67<br>67 | 201 | | |
| 03. | ටී. එල්. කේ. ප්‍රියදර්ශනී මිය<br>ශ්‍රී ලං. අ. ප. සේ. 111<br>නියෝජ්‍ය විදුහල්පති<br>බප/ජය/පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය | පී. ශ්‍රිලාල් නෝනිස් මයා<br>යූ.ඩබ්.ටී.යූ. රාජකරුණා මිය<br>ඒ.ඒ.ඩී.එම්.සී. විජේතුංග මයා | 56<br>57<br>56 | 169 | | |
| 04. | යූ. ජී. පී. අබේරත්න මිය<br>ශ්‍රී ලං.වි.සේ. 1<br>නියෝජ්‍ය විදුහල්පති<br>බප/ජය/පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය | පී. ශ්‍රිලාල් නෝනිස් මයා<br>යූ.ඩබ්.ටී.යූ. රාජකරුණා මිය<br>ඒ.ඒ.ඩී.එම්.සී. විජේතුංග මයා | 43<br>43<br>42 | 128 | | |
| 05. | වයි. යසරත්න මයා<br>ශ්‍රී ලං.වි.සේ. 1<br>විදුහල්පති<br>බප/කො/අශෝක විද්‍යාලය | පී. ශ්‍රිලාල් නෝනිස් මයා<br>යූ.ඩබ්.ටී.යූ. රාජකරුණා මිය<br>ඒ.ඒ.ඩී.එම්.සී. විජේතුංග මයා | 73<br>73<br>73 | 219 | | |

<u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය</u>

01. පී. ශ්‍රිලාල් නෝනිස් මයා - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය (බ.ප) ..............

02. යූ.ඩබ්.ටී.යූ. රාජකරුණා මිය - සහකාර ලේකම් - අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය (බ.ප) ..............

03. ඒ.ඒ.ඩී.එම්.සී. විජේතුංග මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන) - අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශය (බ.ප) ..............

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් අහන්නේ. ඔබතුමාට මම දීපු ප්‍රශ්න ටික මා ළඟ නැහැ. ඒ නිසා තුන්වැනි ප්‍රශ්නය -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඇහෙන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තුන්වැනි ප්‍රශ්නය, මම ඉදිරිපත් කරපු ප්‍රශ්න ටික මං අතේ මේ වෙලාවේ නැහැ. තුන් වැනි ප්‍රශ්නයේ යම් මුද්‍රණ දෝෂයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, තුන්වැනි ප්‍රශ්නය කිව්වේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ කියන්නේ "ආ" කොටසේ තුන්වැනි ප්‍රශ්නයේ මම හිතන්නේ න්‍යාය පත්‍රයේ තිබෙනවා. මම අතින් ලියලා දීපු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට තිබෙන අතුරු ප්‍රශ්නය, දැන් මේ වෙලාවේ පරිපාලනය සහ අධ්‍යාපනය බිඳ වැටිලා නැහැ තමයි. හැබැයි පසුගිය මාර්තු මාසයේ 20 වාගේ ආසන්න දිනවල ඔබතුමා දකින්න ඇති. මාධ්‍යවලත් දැක්කා. මේ පාසලේ බරපතළ කලබැගෑනියක් ඇති වුණා. ඒ මොහොතේ තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඒ මොහොතේ ඇත්ත වශයෙන්ම පාසලේ අධ්‍යාපනයත්, පරිපාලනයත් බිඳ වැටිලා තිබුණා. දැන් ඒක නැති වෙන්න පුළුවන්. ඊළඟට "ආ" කොටසේ දෙවැනි ප්‍රශ්නයට ඔබතුමා පැහැදිලි කළා, *සුදුසුකම් නැති විදුහල්පතිවරයෙකු පත් කිරීමට කටයුතු කළ අධ්‍යාපන නිලධාරීන් පිළිබඳව ගනු ලබන පියවර කුමක්ද?* කියලා ඇහුවාම ඔබතුමා කියනවා අදාළ නැහැයි කියලා. මේ පාසලේ ප්‍රශ්නය පැන නැගුණේ එතැන ගරු ඇමැතිතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න. මේ අහන අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ පාසලේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ පාසලේ ප්‍රශ්නය පැන නැගුණේ එතැනින්. හිටපු තාවකාලික විදුහල්පති පෙරේරා මහතාව ඉවත් කරලා, ඒ වෙනුවට ඔය කියන සම්මුඛ පරීක්ෂණයේ දෙවැනියාට ලකුණු තිබුණු කෙනාව මේ පාසලට කලාප අධ්‍යක්ෂ විසින් මැදිහත් වෙලා බලහත්කාරයෙන් මේ පාසලට ගෙනාවා. වැඩ භාර දුන්නා. ඒකත් එක්ක තමයි මේ පාසලේ ප්‍රශ්නය මතු වුණේ. ඒ නිසා තමයි මම ඇහුවේ මේ සුදුසුකම් නැති විදුහල්පතිවරයෙක් පත් කරන්න කටයුතු කරපු නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියලා. ඔබතුමා කිව්වා, අදාළ නැහැයි කියලා. මේ ප්‍රශ්නය පැන නැඟුනේම එතැනින්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අදාළ නොවේ කියලා උත්තරය දුන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා පිළිතුර දුන්නේ අදාළ නොවේ කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාද ප්‍රශ්නය අහන්නේ? එතුමාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කෙටියෙන් අහන්න. විග්‍රහ කරන්නේ නැතිව.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කලිනුත් කියලා තිබෙනවා. මේ සභාවේ රීති සංශෝධනයකට යන්න කියලා. බුලත් නැටි විසි වෙලා වාගේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කථා කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. දැන් ඒකේ එල්ලෙන්න එපා. මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමන්ලාගේ කරේ මම කීයටවත් එල්ලෙන්නේ නැහැ. මම හොඳ ශ්‍රී ලංකා කාරයෙක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය මඟහරින්න - හරියට අර ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා වාගේම තමයි. ප්‍රශ්න මඟහරින්න කොමිෂන් දානවා. කමිටු දානවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නය -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා ජනාධිපතිතුමාගේ අඩි පාරෙමයි යන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

යනවා. යනවා. අනිවාර්යයෙන්ම ජනාධිපතිතුමාත් එක්ක තමයි ඉන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය මඟහරින්න -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ අතුරු ප්‍රශ්නය ඉල්ලා අස් කර ගන්නවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අනිවාර්යයෙන් ජනාධිපතිතුමාත් එක්ක ඉන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්න මඟහරින්න -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යූ.ඇන්.පී. එකේ එල්ලුනත් ඕකේ එල්ලෙන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට එක උත්තර යයි දෙන්න තිබෙන්නේ. මේ පාසලේ හෝ වෙනත් පාසල්වල එවැනි ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. අමාත්‍යාංශයක් තිබෙන්නේ, ඇමැතිවරයෙක් ඉන්නේ ඒවා විසඳන්න. ඉතින් මේ අසනීප, ලෙඩ වුණ අරවා මේවා හැදුණා. ඒවා ඔක්කොම හොඳයි. දැන් පාසලේ හොඳ පරිපාලනයක් තිබෙනවා. පාසලේ හොඳ අනාගතයක් ගොඩනඟන්න බලාපොරොත්තුවෙන් අපි කටයුතු කරනවා. බොහොම ස්තූතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ප්‍රශ්නයට උත්තරය ලැබුණේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මොකක්ද උත්තරය? මේ පරණ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ප්‍රශ්නය -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පරණ, පිළුණු වෙච්ච එකක් කථා කරනවා. මේ පිළුණු වුණු ප්‍රශ්න වැඩක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එහෙම බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

වෙච්ච වැරැදි අවසන් කරලා නිවැරැදි තැනකට පාසල ගෙනාවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කොහොමද පිළුණු වුණු ප්‍රශ්න කියන්නේ? නිලධාරීන් තමන්ගේ අත්තනෝමතික බලය පාවිච්චි කරලා වැරැදි තීන්දු තීරණ ගන්නවා නම්, ඒ වැරැදි තීන්දු තීරණ නිසා පාසල් අර්බුදයට යනවා නම් කොහොමද ඒක පිළුණු වෙච්ච එකක් වුණේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නයක් අහලා මේක උපදේශක කාරක සභාවෙන් පොඩ්ඩක් බේරගන්න කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

උපදේශක කාරක සභාව ඕනෑ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෙටියෙන් තමයි ප්‍රශ්නය ඇහුවේ. ප්‍රශ්නයට උත්තරය නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නිශ්ශබ්දව ඔබතුමා අහන ප්‍රශ්නයට මම උත්තර දෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෙටියෙන් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ප්‍රශ්නය තමයි මේ පාසලේ හිටපු විදුහල්පති කොඩිකාර විදුහල්පතිතුමා විශ්‍රාම ගියාට පස්සේ -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එහෙම ප්‍රශ්නයක් මේකේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩ්ඩක් ඉන්න ඉතින්. ප්‍රශ්නය අහන්න -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැති එක අහන්න බැහැ නේ. අතුරු ප්‍රශ්න අහන්න. හරි. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ ඕනෑම අතුරු ප්‍රශ්නයකට උත්තර දෙන්න පුළුවන්. මේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට උත්තර දෙන්න බැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා - කාලය යනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ පාසලේ හිටපු විදුහල්පතිතුමා විශ්‍රාම ගියාට පස්සේ තාවකාලික විදුහල්පතිතුමෙක් පත් කළා. ඊට පසුව සම්මුඛ

පරීක්ෂණයක් කැඳවලා ඒ සම්මුඛ පරීක්ෂණයේ සුදුසුකම් සහිත - ඒ සම්මුඛ පරීක්ෂණයේ ගැටලු තිබෙනවා කියලා මාධ්‍යවලත් පළ වුණා. කෙසේ වුණත් ඒ සම්මුඛ පරීක්ෂණයේ දෙවැනියාට ලකුණු තිබුණු කෙනාව තමයි කලාප අධ්‍යක්ෂවරිය මැදිහත් වෙලා පසුගිය මාර්තු මාසයේ මේ පාසලට බලහත්කාරයෙන් ගෙනැල්ලා පාසලේ වැඩ භාර දෙන්නේ. ඒ ප්‍රශ්නයත් එක්ක දරුවොත් කළබල වෙලා, දෙමව්පියොත් කළබල වෙලා තමයි ප්‍රශ්නයක් ඇති වුණේ. එතකොට ඒ ප්‍රශ්නයට මුල් වුණු නිලධාරීන් ප්‍රමාණයක් ඉන්නවා. බලහත්කාරයෙන් සුදුසුකම් නැති විදුහල්පතිවරයෙක් පුටුවේ වාඩි කිරීම නිසා තමයි ප්‍රශ්නය මතු වුණේ. දෙමව්පියන්ගේ සහ දරුවන්ගේ ඉල්ලීම බවට පත් වුණේ සුදුසුකම් සහිත විදුහල්පතිවරයෙක් මේ පාසලට ලබා දෙන්නය කියලා. එතකොට ඒ ප්‍රශ්නය ඇති වුණේම, පැන නැඟුණේම මේ බලහත්කාරයෙන් මේ සුදුසුකම් නැති විදුහල්පතිවරයෙක් පාසලට පත් කිරීම නිසා. මගේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, එහෙම පත්කරපු නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද? කියලා. මෙතුමා කියනවා අදාළ නැහැයි කියලා. කෙටියෙන් ඇහුවාම ප්‍රශ්නය ඕක. තේරෙන්නේ නැද්ද කියලා මම -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉන්න කෝ. විනාඩියක් අහන්න. මේ සම්මුඛ පරීක්ෂණය තිබ්බා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පවත්වපු සම්මුඛ පරීක්ෂණය ඔබතුමා ළඟ තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට නැවත අහන්න බැහැ නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට කියන්න ඔය සම්මුඛ පරීක්ෂණය ඔබතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා වාඩි වෙන්න කෝ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට කියන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට උත්තර දෙන්න ඉඩ දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. උත්තර දෙන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වුවා. වැඩියෙන්ම ලකුණු ගත්ත විදුහල්පතිතුමා වැඩ භාර ගැනීම ප්‍රතික්ෂේප කළා. ඒ අනුව අපට තිබෙන තත්ත්වය තුළ, අපේ තිබෙන චක්‍රලේඛ තුළ සම්මුඛ පරීක්ෂණයෙන් දෙවැනියාට ගියා. දෙවැනියාට වැඩ භාර දෙන්න ගියාම - එයා කැමැත්තෙන් තමයි ඉවත් වුණේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඕක ඔබතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් දෙන්න. අවසන් කරන්න දෙන්න. එතකොට දෙවැනි මහත්මයාට වැඩ භාර දෙන්න ගියාම විරෝධතාවයක් ඇති වුණා. එතකොට ආයෙත් විරෝධතාවයක් ඇති වුණා. ආයෙත් විරෝධතාවයක් ඇති වුණා. දෙවැනි මහත්තයාට අපි අමාත්‍යාංශයට එන්න කිව්වාම ආවා. එතුමාත් කිව්වා, පාසලේ වැඩ භාරගන්න අකැමැතියි කියලා. ඒ අනුව අපට තිබෙන බලතල අනුව අපි සුදුසු විදුහල්පතිවරයෙක් පත් කළා. කලින් ප්‍රශ්න තිබුණු එක ඇත්ත. හැබැයි, අපේ නිලධාරීන් ඉතාම නිවැරදි ක්‍රමයට, ලකුණු ගත්ත පදනම අනුව අනුපිළිවෙළට තමයි ඔය වැඩ භාර දීම් සහ ඊළඟ පියවරයන්වලට ගියේ. දැන් ගිය අනුන්ගේ කුණු ලෙඩ සොයන්න එපා. දැන් පාසල හොඳට යනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. පැහැදිලියි. ඒකත් එක්ක මට අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා ඔය කියන සම්මුඛ පරීක්ෂණයේ වැඩිම ලකුණු ගත්ත කෙනා ඉල්ලා අස්වීමේ ලිපිය සභාගත කරනවාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හරියට හරි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉල්ලා අස්වීම් ලිපි එතැන නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලිපිය සභාගත කරන්න. ඉල්ලා අස්වීමේ ලිපිය සභාගත කරන්න. නැත්නම් කොහොමද -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි. ඕක ඔබතුමා පස්සේ -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමා මේ රීති සකස් කරන්න. ඉල්ලා අස්වීම් ලිපි නැහැ. එතුමා වැඩ කරනවා, අසෝක විද්‍යාලයේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා කිව්වා නේ ඉල්ලා අස් වුණා කියලා. දැන් මේ සභාවට කිව්වා. දැන් මේ සභාවම සාක්ෂි දරනවා. දැන් මේ ඉල්ලා අස් වුණා කියලා කිව්වා. නිකන් කට වචනෙට ඉල්ලා අස් වෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විදුහල්පතිවරයෙකුට කට වචනෙට ඉල්ලා අස් වෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපි ඒක ලැබෙන්න, සභාගත කරන්නම්. හැබැයි,

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාව නොමඟ යවන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

තොරතුරු දැන ගැනීමේ පනත තිබෙනවා. දැන් අලුතෙන් දෙන්න දෙයක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම කනගාටු වෙනවා. ලැජ්ජයි. මේ ගරු සභාවම නොමඟ යවනවා. මෙහෙම අධ්‍යාපන ඇමැතිවරයෙක් - (බාධා කිරීම්) ලැජ්ජයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමැතිතුමා දන්න විදියට උත්තරය දුන්නා. උපදේශක කාරක සභාවේදී කථා කරන්න. නැත්නම් යෝජනාවක් හැටියට ගෙනෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒකට විශේෂ වරප්‍රසාද ඉල්ලීමක් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි. මීළඟට ප්‍රශ්න අංක 10 –

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට හරස් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. දැන් මෙතුමාගේ ප්‍රශ්නය සම්බන්ධව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තිබෙන වරප්‍රසාදය මොකක්ද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ප්‍රශ්න තුනක් අහන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩවීම මොකක්ද තිබෙන්නේ? වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු මන්ත්‍රීතුමා, මට අතුරු ප්‍රශ්නයක් අහන්න අවසර දෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්න අංක 10, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සති දෙකක් කල් ගන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්න අංක 11. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සති දෙකකට කල් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ රීති සංශෝධනයකට යනවා නම් හොඳයි. මොකද, කෙටි උත්තර දෙන්නත් බැහැ. විස්තර මහා පතරංග ජාතක මට කියවන්නත් බැහැ. මම රීති අනුගමනය කරන්න කැමැති කෙනෙක්. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. සති දෙකකට කල් ඉල්ලනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 12, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් මාර්ග, ප්‍රවාහන, සමූපකාර ගරු අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා කිව්වා මට ප්‍රශ්න ඉවර වුණාම අවස්ථාව දෙනවා කියලා. මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපේ නුගේගොඩ තැපැල් කාර්යාලයත්, උඩහමුල්ල තැපැල් කාර්යාලයත් අපට ලබා

[ ගරු උපාලි කොඩිකාර ]

දීලා තිබෙන රුපියල් 2000/- යේ තැපැල් වරප්‍රසාදය සම්බන්ධව අපේ ලිපි ඒ අය ගන්නේ නැහැ. ඒ අය කියනවා. දැන් මේ චක්‍රලේඛය 2009 ගහලා තිබෙනවා. මේක ඒ අයට අලුත් කරලා එවලා නැහැයි කියලා. එතකොට 2009.04.02 වැනි දින තමයි මේ චක්‍රලේඛය නිකුත් කරලා තිබෙන්නේ. එතකොට මේ චක්‍රලේඛයේ තිබෙනවා,

"ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වර්ෂයකට රුපියල් 24,000/- බැගින් ප්‍රතිපාදන වෙන් කර ඇත. එම ප්‍රතිපාදන සඳහා පෙර පරිදිම තැපැල් පහසුකම් ලබා දිය යුතුය. මහ නගර සභාවක් සඳහා රුපියල් 24,000/- ක් - ඒ කියන්නේ, අපට රුපියල් 24,000/- ක් තිබෙනවා. රුපියල් 2000/- ගණනේ මාස 12 කට. නමුත් තැපැල් කළාම සීල් එක ගහලා ලිපි ටික return එවනවා. එතකොට ඔබතුමන්ලා සභාවක් හැටියට මේ සම්බන්ධයෙන් තැපැල් කොමසාරිස්තුමාව දැනුවත් කරලා ඒක අපට ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය පැහැදිලියි. මේ සම්බන්ධයෙන් තැපැල් ස්ථානාධිපතිතුමාට කථා කරලා ඔබතුමාට ලබන සභා වාරයට කලින් පිළිතුරු ලබා දෙනවා. භය වෙන්න එපා. ප්‍රශ්නය විසඳනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ අනික් අයටත් මේ ප්‍රශ්නයම තිබෙනවාලු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය සභා වාරයේදී කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාවට මම අදහස් දක්වමින් සිටියා. අදහස් දක්වන අවස්ථාවේ ඔබතුමා තමයි මූලාසනයේ සිටියේ. නමුත් මම සූදානම් වෙලා ආපු ඒ අදහස් දැක්වීම කරගන්න මේ සභාවේ මට කිසිදු ඉඩක් ලැබුණේ නැහැ. ඔබතුමා ඒ අවස්ථාව මට අරන් දුන්නෙත් නැහැ. ඒ නිසා ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉදිරිපත් කළේ, මැතිවරණයේදී ඉදිරිපත් කරපු ජනාධිපතිතුමා කියපු දේවල් ටික තමයි මම කිව්වේ. මේ කොළේ. එතකොට මේක අහගෙන ඉන්න බැරි ඇයි?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. දැන් ඒ යෝජනාව ගත්තාම කථා කරමු.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මගේ වරප්‍රසාදය ඉල්ලා සිටින්නේ, එම යෝජනාව ආවොත් මට මගේ අදහස් දැක්වීම කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට න්‍යාය පත්‍රය අනුව තිබෙන්නේ නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනාව. ගරු මන්ත්‍රීවරුන්ට යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොදු ප්‍රශ්නයක් කථා කරන්න නැඟිට්ටේ. අර අපි පළාත් සභාවට ඇතුළු වන ප්‍රවේශ මාර්ගය. දැන් මාස ගණනාවක් ඉල්ලීමක් කෙරුවා. මීට පෙරත් ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් මතක් කෙරුවා. වැස්ස දවසට එන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අර බිල්ඩිම හදන්න ඉස්සෙල්ලා ප්‍රවේශ මාර්ගය හදන්න කියන්න. මොකද, වැස්ස දවසට මඩ වළක බැහැලා එන්න වෙන්නේ. ප්‍රවේශ මාර්ගය හදන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද, කාටවත් වාහනයේ ඇවිල්ලා බහින්න පුළුවන්කමක් නැහැ. වැස්සොත් පාරේ සිට තෙමි තෙමී එන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාත් සිටින නිසා අවධානය යොමු කරනවා. මම හිතන්නේ ප්‍රවේශ මාර්ගය මීටර් 10ක්වත් නැහැ. ඒ මීටර් 10 කාපට් එකක් දාලා හදන්න කියන්න. මොකද, වාහනයෙන් බැහැලා මඩේ එන්න ඕනෑ. එහෙම නැත්නම් තෙමී තෙමී එන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් පොඩ්ඩක් අවධානය යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. ඒක අපි අවධානයට යොමු කර ගන්නවා. අනිවාර්යයෙන්ම. ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා තිබෙනවාද? නැහැ. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ ඇත්නම් ඉදිරිපත් කරන්න පුළුවන්. ඇමතිවරුන්ට කිසිවක් ප්‍රශ්නවලට පිළිතුරු නැති වගයි පෙනෙන්නේ. මීළඟට තිබෙන්නේ, පෞද්ගලික පැහැදිලි කිරීම්.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ තිබෙනවා, කොළඹ මහ නගර සභාවේ රථ ගාල්වලට අය කිරීම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවක් න්‍යාය පත්‍රයට දාලා තිබෙනවා. ඒකට මම විරුද්ධයි. මොකද හේතුව එකක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට ඒ අවස්ථාවට අවාම කථා කරන්න දෙන්නම්. දැන් අවස්ථාව දෙන්න බැහැ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බස්නාහිර පළාතේ ඉඩම් කට්ටි කිරීම පිළිබඳව උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාට විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මම මේ පෞද්ගලික පැහැදිලි කිරීම කරන්නේ - මට ලොකු උවමනාවක් තිබෙනවා. නමුත් මේ පැහැදිලි කිරීම කොපමණ දුරට වැදගත් වෙයිද කියලා මම හිතන්නේ නැහැ. මට අවශ්‍යතාවය තිබෙන්නේ, ඉඩම් කට්ටි කිරීම සම්බන්ධයෙන් ප්‍රඥප්තියක් මේ සභාවේ සම්මත කර ගැනීමේ උවමනාවයි. ප්‍රවේශයක් වශයෙන් තමයි අද මම මේක ඉදිරිපත් කරන්නේ. මේක කොපමණ ප්‍රබල වෙයිද කියලා මම දන්නේ නැහැ. නමුත් මගේ වගකීම වශයෙන් මම ඒක ඉටු කරන්නේ. විශේෂයෙන් මේ වන කොට මම අවස්ථා ගණනාවක මේ ඉඩම් කට්ටි කිරීම සම්බන්ධව අපේ උපදේශක කාරක සභාවේ සහ වෙනත් ස්ථානවල කථා කරලා තිබෙනවා. නමුත් ඒකට විධිමත් ආකාරයෙන් අපේ ගරු මහ ඇමැතිතුමාත්, අපේ ලේකම්තුමියත් කටයුතු කළත් මම හිතන්නේ ඒක මාෆියාවක් බවට පත් වෙලා තිබෙන නිසා ඒකට යම්කිසි නීතිමය ආවරණයක අවශ්‍යතාවය තිබෙනවා.

විශේෂයෙන්ම මම නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ආසනය. විශාල ඉඩම් කට්ටි කරලා තිබෙනවා, මේ එන පුරාවටම අපි දකිනවා. ඒක මහර වෙන්න පුළුවන්. අත්තනගල්ල වෙන්න පුළුවන්. විවිධ ප්‍රදේශවල. මේ ඉඩම් කට්ටි කිරීමේ අවධිමත් භාවය තමයි තිබෙන්නේ. ඒ නිසා තමයි මම හිතුවේ මෙහෙම දෙයක් මේ සභාවට කියන්න ඕනෑය කියලා. අත්තනගල්ල ආසනයේ විතරක් අපේ ලේකම්තුමිය ගරු මහ ඇමැතිතුමාගේ උපදෙස් මත වතුර ටැංකි යම් ප්‍රමාණයක් බෙදලා දුන්නා. අත්තනගල්ල ආසනය කියන්නේ, ඉතා සුන්දර වූ පරිසරයක් තිබෙන ප්‍රදේශයක්. එතකොට එහේ වතුර නැහැයි කියලා කෙනෙකුට කියන්න පුළුවන්කමක් නැහැ. නමුත් මේ වන කොට පවුල් 4000 ක්, 5000 ක් වතුර නැති තත්ත්වයෙන් දුක් විඳිනවා. එතකොට මේ වතුර අද බෙදා දෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ බෙදා දෙන තත්ත්වය තුළම අපේ ප්‍රදේශයේ විතරක් අක්කර 100 කට, 150 කට වඩා ප්‍රමාණයක් ඉඩම් කට්ටි කරලා තිබෙනවා. මේ කට්ටි කරලා තිබෙන හැම ඉඩමකටම වතුර නැහැ. වතුර නැතිව තමයි මේ ඉඩම් සියල්ලම කට්ටි කරලා තිබෙන්නේ. මම ළඟ ලේඛනය තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කරලා. ඉතින් මම කියන්නේ, දෙයක් කරන කොට එක්කෝ මේවා නීතියට අනුගත වෙන්නට ඕනෑ. පොල් මණ්ඩලයට ගියා. පොල් මණ්ඩලය කියනවා අපට නිර්දේශයක් දෙන්න විධියක් නැහැ. අපට එහෙම බලයක් නැහැයි කියලා. අක්කර 27 ක් කැඩුවා. අක්කර 12 ක් කැඩුවා. අක්කර 10 ක් කැඩුවා. සශ්‍රීක පොල් ඉඩම්. රබර් ඉඩමක් කඩන කොට ගියාම කියනවා, අපට එහෙම නිර්දේශයක් දෙන්න බැහැ. අක්කර 25 ට 50 ට අඩු නම් අපට එහෙම ගැටලුවක් නැහැයි කියනවා. පොල් එකට ගියාම කියනවා, අක්කර 10 ට අඩු වුණාම

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

නිර්දේශයන් අවශ්‍ය වන්නේ නැහැයි කියලා. නමුත් අහිංසක මිනිස්සු වෙනුවෙන් නම් රටේ නීති ක්‍රියාත්මක කරනවා. මම පෞද්ගලිකවම කුඩුවට - සමහරවිට අධිකරණයෙන් චෝදනා ලැබුවා, කොස් ගහක් කපන්න නියෝග යවලා. මම සභාපති කාලයේ කොස් ගහක් කපන්න නියෝග යැව්වාම අපරාධ නීති සංග්‍රහය යටතේ මාව වරදකරු කළා. කොස් ගසත්, දෙල් ගසත්, තල් ගසත් කපන්න සභාපතිවරයාට අවසරයක් නැහැ. හෙලීමේ පනතින් ඒක ආවරණය වෙලා තිබෙනවා කියලා. එහෙම තිබෙන කාලයේ රැයක් එළි වන කොට කොස් ගස් 25 ක් එකවර කපලා ඉවත් කරනවා. දෙල් ගස් ටික කපලා දාලා තිබෙනවා. එහෙමනම් මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්නේ අහිංසක මිනිහෙක් ගෙයක් හදන්න කොස් ගහක් කැපුවොත් විතරද? ඉඩම් කට්ටි කරන මිනිස්සුන්ට මේ නීතිය නැද්ද? ඒකයි මම අහන්නේ. අපි දන්නවා, ගෙයක් හදන්න ගියාම ගොඩනැගිලි සීමා අවශ්‍යයි. වීථි රේඛාව ඉල්ලනවා. මාර්ග සංවර්ධන අධිකාරිය පාරට පර්චස් 10 කඩනවා. මාර්ග රක්ෂිතය තියන්නේ නැහැ. PRD පාරට මාර්ගය රක්ෂිතය තියන්නේ නැහැ. අක්කර 15 ක් ඉඩමක් ගම ඇතුළත කඩනවා. අඩි 08 පාරට කඩලා අක්කර 15 ක ඉඩමක් ඇතුළේ කඩපුවාම වාහන දෙකක් මාරු වෙන්නේ කොහොමද? එතකොට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ගන්නේ නැහැ. එහෙම නැත්නම් ගොවිජන සේවා එකෙන් නිර්දේශයක් ගන්නේ නැහැ. කට්ටි කිරීමේ මණ්ඩලයෙන් අවසරයක් ගන්නේ නැහැ. පොල් මණ්ඩලයෙන් අවසරයක් ගන්නේ නැහැ. පිරමීඩ් ප්ලෑන් එක අනුමත කරන්නෙත් නැහැ. පිරමීඩ් ප්ලෑන් එක අනුමත කරලා ඉල්ලා ගන්නට ඕනෑ. තමන් ඉඩම් කට්ටි කරනවා නම් මෙන්න මේ නිර්දේශයන් ඉල්ලනවා. එතකොට කරන්නේ අක්කර හතරක, පහක ඉඩමක් තිබෙනවා නම්, අක්කර 2 ½ ට අඩුවෙන් ඔප්පු ලියලා, ඒ අක්කර පහ නම් දෙකකින් දෙගොල්ලක් කඩනවා. පොදු පහසුකම් දෙන්න වෙනවට. එතකොට මේ තත්ත්වය තුළ අපේ ප්‍රදේශවලට ඇති වෙන්නේ මොකක්ද?

ගම්පහ දිස්ත්‍රික්කය වෙන්න පුළුවන්. බස්නාහිර පළාත වෙන්න පුළුවන්. මිනිස්සුන්ගේ අයිතීන් තිබෙන්නට ඕනෑ. මේ අණපනත් හැදුවේ අතීතයේ හදන කොටත්, ග්‍රාම නිර්මාණ පනත හදන කොටත් මිනිස්සු වෙනුවෙන් නිදහස් උද්‍යාන ඇති කරන්න. ඒ පනත්වල එහෙම තිබුණාට අද අපේ ප්‍රදේශවල අක්කර 27, 12, 15 කඩලා තිබෙනවා. පොදු පහසුකම් නැහැ. පාරවල් ටික අඩි 20 ට නැහැ. අඩි 30 ට පාර නැහැ. වට රවුම නැහැ. U අකුරට හැරෙන්න ඒ ප්‍රදේශයේ පාර හදලා දීලා නැහැ. එතකොට මේවා දැක දැක අපට නිහඬ වෙලා ඉන්න පුළුවන්කමක් නැහැ. මේවා මාෆියාවන් බවට පත් වෙලා තිබෙන්න පුළුවන්. ඒ නිසා අද වන කොට අපේ මේ බලතල නාගරික සංවර්ධන අධිකාරිය ගත්තාට පස්සේ තවත් මේක එහාට යන්න පුළුවන් කාර්යයක්. ඒ නිසා පළාතක් වශයෙන් බස්නාහිර පළාතේ වගකීම, මහජන නියෝජිතයන් වශයෙන් අපේ වගකීම ඉටු කරන්න අපට වගකීමක් තිබෙනවා. ඒ නිසා තමයි මම අද මේ පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ බස්නාහිර පළාත් සභාවට යෝජනා කරන්නේ. ඉඩම් ප්‍රඥප්තියක් හදන්න. වයඹ පළාතේ හදලා තිබෙනවා නම් බස්නාහිර පළාතට මේ ඉඩම් ප්‍රඥප්තිය අවශ්‍ය වෙනවා. මොකද, ඉතා වටිනා ඉඩම් තිබෙනවා. ජනගහනයෙන් අතිවිශාල පිරිසක් මේ ප්‍රදේශයේ ජීවත් වන නිසා. ඒ නිසා මූලික සිද්ධාන්ත අනුගමනය නොකර මේ ඉඩම් කට්ටි කිරීම කරන්න දෙන්න එපා. පරිසර වාර්තා ගන්නට ඕනෑ. PHI ලාගේ වාර්තා ගන්නට ඕනෑ. ජල සම්පත් මණ්ඩලයේ වාර්තා ටික කැඳවන්නට ඕනෑ. මේවා කැඳවලා තමයි මේ ඉඩම් ටික කඩලා දෙන්නට ඕනෑ. කරුණු කාරණා කියන්න ගියොත් විශාල ප්‍රමාණයක් කියන්න තිබෙනවා.

මම ඉතාමත් ආයාචනාත්මකව මේ සභාවෙන් ඉල්ලන්නේ. මේ ප්‍රදේශවල ජීවත් වෙලා ඉන්න මිනිස්සුන්ට ඒ පහසුකම් ටික සපයන්නට ඕනෑ. මිනිස්සුන්ගේ මූලික අවශ්‍යතාවයන් නිදහසේ ජීවත් වෙන්නට තිබෙන්න ඕනෑ. ඔවුන්ට වතුර ටික නැත්නම් අපි කරන දේ මොකක්ද? අද මේ වන විටත් අපේ ප්‍රදේශයේ අක්කර 10 ක ඉඩමක් කඩන්න මේ වන විට කටයුතු කරමින් පවතිනවා. මේවාට කථා කරන්නේ කවුද? කොයි නිලධාරියාද කථා කරන්නේ? හරියට තක්සේරු කරන්නේ නැහැ. එතකොට ඉඩම ගත්ත මිනිහා නැවත තක්සේරුවට ගිහිල්ලා විශාල මුදල් ප්‍රමාණයක් තක්සේරු දෙපාර්තමේන්තුවට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. අණපනත්වල, නීතිරීතිවල මේවා තිබෙනවා. මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා මේ බස්නාහිර පළාතේ අපට වගකීම තිබෙනවා. අපි ඒ වගකීම ගමට අරගෙන ගිහිල්ලා, අපේ අහිංසක මිනිස්සු වෙනුවෙන්, අපේ ප්‍රදේශයේ තිබෙන ඒ අවශ්‍ය පද්ධතිය

ගොඩනගන්න මේ බස්නාහිර පළාත් සභාව ක්‍රියාත්මක වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

මම ගෙනාපු මේ කාරණය අර වෙනදා පෞද්ගලිකව ඕනෑ තරම් ගෙනැල්ලා තිබෙනවා. මම දකිනවා, පොතේ පමණයි තිබෙන්නේ. ගොඩක් දේවල් ක්‍රියාත්මක වුණේ නැහැ. දහම් පාසල් යෝජනාවක් ගෙනවා. තැබෑරුම් නැති කරන්න යෝජනාවක් ගෙනාවා. කථාවට විතරයි මේ හැම දෙයක්ම සීමා වුණේ. මම හිතනවා, මේකට හැම කෙනාම ඇහුම්කන් දීලා උවමනාවෙන් කටයුතු කරයි. අපි මේ කථා කරන්නේ පෞද්ගලික දෙයකට නොවෙයි. මේ ප්‍රදේශවල ජීවත්වන මිනිස්සු මේවාට එනවා. ගම්මාන බවට පත් වෙනවා. සොහොන් පිටි අවශ්‍යතා ඇති වෙනවා. ක්‍රීඩා පිටි අවශ්‍යතා ඇති වෙනවා. විවිධ පාරිසරික ගැටලු ඇති වෙනවා. මේවා අපට කියන්න තිබෙන්නේ, පළාත් පාලන ආයතනයට. පළාත් පාලන ආයතනයේ බලතල දැන් නාගරික සංවර්ධන අධිකාරිය උදුරා ගත්තාට පස්සේ මේවා පිළිබඳව අපේ බස්නාහිර පළාතට තිබෙන (බාධා කිරීමක්) එම නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මගින් ගරු මහ ඇමැතිතුමාටත්, අනෙකුත් ගරු ඇමැතිතුමන්ලාටත්, ලේකම්තුමිය ප්‍රධාන අදාළ නිලධාරීන්ගෙන් මම ඉල්ලන්නේ. දැනුම තිබෙන අය එකතු කරලා, ඒකරාශී කරලා ප්‍රඥප්තියක් හදන්න. මම කියන දේ විධිමත් නැත්නම් විධිමත් ආකාරයට ගොනු කරලා, වයඹ පළාත් සභාවේ තිබෙන ප්‍රඥප්තිය හරි ගෙනැල්ලා, ඒක පූර්වාදර්ශයක් කරගෙන මේ ඉඩම් කට්ටි කිරීම සම්බන්ධව නීතියක් හදලා ඒ නීතිය දෙන්න. අපට මේ විධියට මෙන්න මේ කාර්යය කරගන්න. මම මේ ඉඩම් කට්ටි කිරීමට විරුද්ධව නොවෙයි කථා කරන්නේ. විධිමත් භාවය ඇති කර ගැනීම සඳහායි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. බේරුවල මුස්ලිම් දරුවන්ගේ අධ්‍යාපන ගැටලු පිළිබඳව කථා කිරීමට නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කථා කරන්න යන ගැටලුව පිළිබඳව පෙබරවාරි මාසයේ හත් වැනිදා තිබුණු සභාවට, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හැටියට ඉදිරිපත් වුණත් අවස්ථා කිහිපයකදීම රීති අත්හිටුවීමේ යෝජනා නිසා මෙය කථා කරගන්න හැකියාවක් ලැබුණේ නැහැ. මම ගරු අධ්‍යාපන ඇමැතිතුමාගේ විශේෂ අවධානයට යොමු කරනවා. අපේ රටේ දරුවන් කුමන ප්‍රදේශයක, කුමන ජාතියක්, කුමන ආගමක් නියෝජනය කළත් ඔවුන්ට අධ්‍යාපනය ලබා දීමේ යුතුකමක් අප කාටත් තිබෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාවට අයිති පාසලක් නිසා මෙම පාසල ගරු ඇමැතිතුමනි, -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පාසල මොකක්ද?

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

මරදානේ අල් ෆාසියතුල් නස්රියා විද්‍යාලය. මම හිතන්නේ මේ මුස්ලිම් බාලිකා විද්‍යාලය 1924 තමයි ලංකාවේ පළමු මුස්ලිම් බාලිකා විද්‍යාලය හැටියට ආරම්භ වුණා කියලා මට දැනගන්න ලැබුණේ. මේ ආසන්නයේම බේරුවල මරදානේ අල් ෆාසියතුල් නස්රියා මිශ්‍ර ප්‍රාථමික විද්‍යාලය. මෙහිදී ගරු ඇමැතිතුමනි, වෙන දේ තමයි බාලිකා විද්‍යාලයේ ළමයිනුත්, ඊට පසුව ප්‍රදේශයේ සිටින අනික් පිරිමි ළමයිනුත් ප්‍රාථමික පාසලට තමයි යන්නේ. 1 සිට 5 දක්වා තමයි අල් ෆාසියතුල් නස්රියා මිශ්‍ර පාසල තිබෙන්නේ. පහෙන් පසුව වන දේ තමයි ඒ ඉන්න ගැහැණු දරුවන් ටික ඒ ආසන්නයේ තිබෙන අල් ෆාසියතුල් නස්රියා මුස්ලිම් බාලිකා විද්‍යාලයට එනවා. පිරිමි ළමයින්ට පාසලක් නැති වෙලා යනවා. පන්ති දෙකක් මේ පාසලේ තිබෙනවා. ගිය අවුරුද්දේ වුණු දේ තමයි පිරිමි ළමයින්ට පාසලක් නැති නිසාම ශිෂ්‍යත්ව පාස්, වැඩිපුර ලකුණු ගත්තු ළමයින්ව අවට තිබෙන ජාතික පාසලට ඇතුළත් වුණත් ළමයින් 35 ක ප්‍රමාණයක් ඉතිරි වුණා. මෙහිදී තවත් ළමයින් 15 දෙනෙක් ඒ ආසන්නයේ තිබෙන ILM සම්සුදීන් පාසලට ගියා. ළමයින් 20 කට පාසලක් නැති වුණා. මෙහිදී කොට්ඨාශ අධ්‍යක්ෂතුමා කරපු දේ තමයි මේ ළමයින් 20 දෙමව්පියන් කැඳවලා, මේ ළමයින් 20 දෙමව්පියන් ඉස්සරහා කථාබහ කරලා පාසලක් සොයා ගන්න තුණ්ඩු උඩ දැම්මා. තුණ්ඩු උඩ දැම්මාට පස්සේ, ඒ ගැන මම ඇහුවාම කියන්නේ, දෙමව්පියන්ගේ කැමැත්ත මත තමයි තුණ්ඩු උඩ දැම්මේ කියලා. එතුමාටත් කරන්න

[ ගරු නන්දන පත්මකුමාර ]

දෙයක් නැති නිසා තමයි තුණ්ඩු උඩ දැම්මේ. නමුත් තුණ්ඩු උඩ දැම්මාට පස්සේ, සමහර දෙමව්පියන්ට දරුවන් 20 කට හම්බ වුණේ දුර පාසලක් තමයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ මේකට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කරලා තිබෙනවා, කොට්ඨාශ අධ්‍යක්ෂතුමා. මොකද, මේ වන විට ප්‍රශ්නය විසඳලා ලබන අවුරුද්දටත් ප්‍රශ්නය විසඳලා මමත් සියල්ල ගිහිල්ලා ප්‍රශ්නය විසඳුවා. ඒ නිසා මම හිතන්නේ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ පුටුවට එන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඒ පුටුවට ඉස්සරහාදී එනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමා පොඞ්ඩක් ඉන්න කෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු අධ්‍යාපන ඇමැතිතුමා, මේකේ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට කරන්න දෙයක් නැහැ. කොට්ඨාශ අධ්‍යක්ෂතුමා කළේ දෙමව්පියන්ගේ ඇහුම්කන් දීමට මේ දරුවන් ගෙදර ඉන්න නිසා එතුමා කළේ. එතුමා -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

දැන් ප්‍රශ්නය ඉවරයි.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

එහෙමනම් ඔබතුමා ළමයින් 20 දාන්න එපැයි. අපි මැදිහත් වෙලා ළමයින් ටික දැම්මේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

කවුද දැම්මේ?

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

කවුද දැම්මේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

තමුන්නාන්සේ පැත්ත පළාතක ආවේ නැහැ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

කවුද ගියේ? ඔබතුමා දන්න හැටි. මේ ළමයින් 20 ට යන්න දුර පාසලක් හම්බ වුණේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සම්බන්ධයෙන් ගරු අධ්‍යාපන ඇමැතිතුමා ප්‍රකාශයක් කරයි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඒ නිසා -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

බොරුවට කයිය ගහලා වැඩක් නැහැ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඔබතුමා ප්‍රශ්නය විසඳුවා නම් මම කථා කරන්න ඕනෑ නැහැ නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

බොරුවට කථා කරන්නේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

බොරුවට නොවෙයි. අධ්‍යාපන ගරු ඇමැතිතුමාට මම කථා කරන්නේ. මේ ළමයින් 20 ට යන්න ඉස්කෝලයක් නැති වුණාම පසුගිය කාලයේ අපි මෙහෙට ඇවිල්ලා කථා කරලා අපි ළමයින් 20 දැම්මා. නමුත් ඉදිරියේදී මේ ගැටලුව තිබෙනවා. ලබන අවුරුද්දෙත් මේ පිරිමි ළමයින්ට යන්න පාසලක් නැහැ. ඇත්තටම ගත්තොත් එහෙම මේ පාසලේ ඕනෑ තරම් ගොඩනැගිලි තිබෙනවා. 01 සිට 05 ට නොවෙයි. 01 සිට 10 දක්වා පවත්වාගෙන යන්න. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ වෙන මොකුත් නොවෙයි. මේ ගැහැණු ළමයින්ට යන්න පාසලක් තිබෙනවා. හැබැයි, පිරිමි ළමයින්ට යන්න පාසලක් නැති නිසා 01 සිට 10 දක්වා පිරිමි ඉස්කෝලයක් හැටියට මේක පවත්වා ගෙන යන්න පුළුවන්. සියලු පහසුකම් තිබෙනවා. අපි ඉල්ලන්නේ, ඔබතුමා මැදිහත් වෙලා දිගින් දිගටම මේ මුස්ලිම් දරුවන්ගේ ගැටලුවට මැදිහත් වෙලා මේ පාසල පිරිමි පාසලක් හැටියට, මිශ්‍ර පාසලක් වුණත් පහෙන් පසුව ගැහැණු ළමයින් ටික බාලිකා පාසලට යයි. පිරිමි ළමයින් ටික මේ පාසලේ තියාගෙන 10 දක්වා අරගෙන යන්න කියන ඉල්ලීම කරන්නේ. ඒ නිසා ඔබතුමා කෑ නොගහා ඉන්න. ඔබතුමාට එහෙමනම් මේ සභාවේ ඇවිල්ලා කථා කරන්න තිබුණා නේ? කථා කරන්න තිබුණා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අධ්‍යාපන ඇමැතිතුමාට ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, අර ගරු මන්ත්‍රීතුමා කෑ ගැහුවාට වැඩක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේක මගේ බේරුවල ප්‍රදේශයේ තිබුණු දෙයක්. (බාධා කිරීමක්) අවශ්‍යතාව අනුව ගිහිල්ලා, කොට්ඨාශ අධ්‍යක්ෂ, කලාප අධ්‍යක්ෂ ගිහිල්ලා, දෙමව්පියන් කැඳවලා, රැස්වීම් තියලා, විදුහල්පතිතුමා කැඳවලා සියල්ල කළේ.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

කවදද කියන්න කෝ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. හරි. හරි. වාඩි වෙන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

තමුන්නාන්සේට කිය කිය ඉන්නවාද මම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මගේ රාජකාරිය මම කරලා ඉවරයි. දැන් බයිලා ගහන්නේ නැතිව ඉන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

කවදාද?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

නිකන් ලකුණු දා ගන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

කවදද කැඳෙව්වේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වත්මන් දේශපාලනය සම්බන්ධව විනාඩි පහක් කථා කරන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

දෙවැනි මාසයේ හත් වැනිදා සභාවට දැම්මේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

*[නැඟී සිටියේය. ]*
*[Stood.]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

[සභාවේ සෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථා කරන්න බැහැ නේ. දෙපැත්තෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම ගැන.

[සභාවේ සෝෂා]

ඔබතුමන්ලාගේ ප්‍රශ්නය පොඩ්ඩක් පස්සේ විසඳගන්න කෝ. අපටත් පොඩ්ඩක් කථා කරන්න දීලා. වෙලාවක් අරගෙන කථා කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මම මේ සභාවට පැමිණෙද්දී අර Highway එකෙන් එළියට එද්දී කැලණිය පැත්ත කොහොමත් පේනවා නේ. මම දැක්කා, නිලුයි කොළයි කොඩි හැම තැනම පිරිලා. මම බැලුවා, මොකද මේ වෙලා තිබෙන්නේ කියලා. නිලුයි කොළයි. අපේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඉන්නවා. මට ඉතින් මතක් වුණා. අපේ සරත් ෆොන්සේකා මහත්මයා කැලණියට ඇවිල්ලා ඉන්නවා නේ? ඉතින් මම බැලුවා මේ 5000 ක් ගත්තු එක්කෙනාගේ ඇඟේ 45,000 ක් ගත්තු එක්කෙනා එල්ලිලා යන්නේ මොකද කියලා. ඔන්න ඕක තමයි අද යහපාලනයට වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ දේශපාලන ප්‍රධාන පක්ෂ දෙකක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. දැන් මේ පක්ෂ දෙකේ තමයි මේ රටේ ප්‍රධාන වශයෙන් ආණ්ඩු කරන්නේ. ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට ගෙනි යන්නේ මේ පක්ෂ දෙක. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශේෂයෙන්ම කනගාටු වෙනවා. අද මේ පක්ෂ දෙක දියාරු වෙිගෙන යන්නේ. ඒක තමයි ඇත්ත කථාව.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

නැහැ. නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමැතිතුමා නැහැයි කිව්වාට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පැත්තේ ඉඳගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩන්න පොහොට්ටුවට උදව් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපේ පක්ෂය දියාරු කරන්න මෙතුමාට බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා තමයි ප්‍රධාන හේතුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දියාරු කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එක්සත් ජාතික පක්ෂය දියාරු වෙලා තිබෙන්නේ. ඒකට අපට කරන්න දෙයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තිබෙන තත්ත්වය කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දියාරු කරන්න බැහැ. ඒ පාප කර්මයට අපට කරගහන්න බැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් එක්ක ශක්තිමත් වෙමින් යන්නේ. ඒක තමයි ඇත්ත කථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපේ පක්ෂය දියාරු කරන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි පක්ෂය කැඩෙන්නේ නැහැ. අපි පක්ෂය එකතු වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දෙන්නාම කෑ ගහන්නේ ඇයි කියලා දන්නවා නේ? මේ අය එක තැනක ඉන්න පුළුවන් කට්ටිය නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක වෙලාවකට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගාව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. එතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඊට මහින්ද රාජපක්ෂ මැතිතුමා ගාව. මෙතුමා රනිල් වික්‍රමසිංහ මැතිතුමාව එලවන්න උත්සාහ කරපු අය. සිරිකොතට ගල් ගහපු අය. ඒක නිසා ජෝර්ජ් පෙර්රා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉල්ලන් කන්න හදන්න එපා මෙතැන. එක්සත් ජාතික පක්ෂයේ මූලස්ථානයට ගල් ගහද්දී -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මගේ නම කියැවුණා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක්සත් ජාතික පක්ෂය රැක ගත්තේ අපි. ජෝර්ජ් මන්ත්‍රීතුමන්ලා නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ අය තමයි ගල් ගහන්න ආවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක නිසා කරුණාකර වාඩි වෙන්න. සංවිධායකතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි මහින්ද රාජපක්ෂ මහත්මයාව රෑ හම්බ වෙලා නැහැ. අපි මහින්ද රාජපක්ෂ මහත්මයාව හම්බ වෙලා තිබෙන්නේ උදේ. මුළු රටම දැනුවත් වෙලා තමයි අපි හම්බ වෙලා තිබෙන්නේ. හොරෙන් හම්බ වෙලා නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ අවස්ථාව මටත් දෙන්න. මගේ නම කියැවුණා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද මේ පක්ෂ දෙක දියාරු කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මටත් ඒ අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා කෙටියෙන් කියන්න. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. මෙතුමාගේ නම කියන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සිරිකොතට ගල් ගැහුවා කිව්වා. විනය පරීක්ෂණයක් තිබෙනවා නම්, කොහේ හරි ගල් ගැහුවා කියලා ඔප්පු වෙනවා නම් මේ මන්ත්‍රීකමෙන් මම අස් වෙනවා. මගේ නායකයා අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විතරයි. මෙතුමාගේ තාත්තා වාගේ දෙපැත්ත කන එකෙක් නෙවෙයි මම. දෙපැත්ත කන එකෙක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පරක්කු වෙලා හරි වටහාගත්තු එක ලොකු දෙයක්. හැබැයි, එහෙම වුණයි කියලා කැලණියේ සංවිධායකකම හම්බ වුණේ නැහැ. ඒකත් දුන්නේ 5000 ක් ගත්තු සරත් ෆොන්සේකාට. 45,000 ක් ගත්තු මෙතුමා සිටිද්දී. ඒක ගැන අපි කනගාටු වෙනවා. මම කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පක්ෂ දෙක මේ රටේ තිබෙන්න ඕනෑ. මේ පක්ෂ දෙක කැඩිලා දියාරු වුණාට මේ රටේ අනාගතයට, මේ රටේ ඉදිරි ගමනට විශාල බාධාවක් වෙනවා. විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට. ප්‍රජාතන්ත්‍රවාදය රැක ගන්න නම්, මේ පක්ෂ දෙක මේ රටේ තිබෙන්න ඕනෑ.

ඒක නිසා තමයි මම කියන්නේ යහපාලනය කියලා අපි කිව්වාට, මේ යහපාලනයේ වෙන දේවල් දන්නවා නේ? අපේ පාසලක ඩෙස් පුටු ටික, බංකු ටික නැහැ. සමහර පාසලක ඉඳගන්න නැහැ. හැබැයි අද මන්ත්‍රීවරුන්ට වාහන ගන්න කෝටි ගණන් පරිපූරක ඇස්තමේන්තු දා ගන්නවා. ඒක මහා ආණ්ඩුවේ විතරක් නොවෙයි. පළාත් සභාවේත් වෙනවා. පළාත් සභාවේ ඇමැතිවරුන්ට, නිලධාරීන්ට කෝටි ගණන්වල වාහන ගෙන්න ගන්නවා. පරිපූරක දාලා අපට අත උස්සන්න කියලා. හැබැයි, සමහර පාසල්වලට වතුර ටික නැහැ. ඩෙස් බංකු ටික නැහැ. වහල කඩන් වැටෙනවා. තෙමෙනවා. ළමයින් ඉගෙන ගන්නේ මිදුලේ. ඉතින් යහපාලනයෙන් මිනිස්සු බලාපොරොත්තු වුණේ මේක නොවෙයි. අර මීට ඉස්සෙල්ලාත් යහපාලනය ගැන යෝජනාවක් තිබුණා. මට ගිය පාර එන්න බැරිව ගියා. ඉතින් යහපාලනය කියලා මිනිස්සු බලාපොරොත්තු වුණේ මේක නොවෙයි. යහපාලනයෙන් බලාපොරොත්තු වුණේ සාධාරණත්වයක්. මේ රටේ හොරකම් කළයි කියලා චෝදනා කරපු අයට අද තවම අඩුම ගණනේ චෝදනාව මිසක්, කට වචනයෙන් චෝදනා කරනවා මිසක් කිසිම දඬුවමක් දීලා නැහැ. කෝටි ගණන් හොරකම් කරපු කට්ටිය, මිලියන ගණන් හොරකම් කරපු කට්ටිය කියලා කිව්වා. අපිත් කිව්වා. නමුත් මේ යහපාලන ආණ්ඩුව අසමත් වෙලා තිබෙනවා, මේ වන කොටත් මේ අයව නීතියට ගෙනෙන්න. ඒක තමයි ඇත්ත කථාව. ඉතින් ඒක නිසා අපි යහපාලනය කියලා නීතිය, සාධාරණත්වය කියලා ජනතාව බලාපොරොත්ත වුණු දේ විශේෂයෙන්ම මේ පළාත් පාලන ආයතනවල ඡන්දය නොතිබීම නිසා විශාල හානියක් අපේ ගම්වලට සිදු වෙලා තිබෙනවා. අපේ

ගමක ලයිට් එකක් දාගන්න බැහැ. පාරක් හදාගන්න බැහැ. සමහර දේවල් අද වෙන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දියාරු කරන්න හදන - අපේ මහ ඇමැතිතුමාගේ අත්සන නැත්නම් අද පාරක් හැදෙන්නේ නැහැ. මහ ඇමැතිතුමාගේ අත්සන නැත්නම් අද පාරක් හැදෙන්නේ නැහැ. අද ලයිට් එකක් දාගන්න බැහැ. ඒක තමයි මම කියන්නේ. මේ පැත්තෙන් යහපාලනයේ ඉඳගෙන අර පැත්තෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩලා විනාශ කරලා දානවා. ඒක අපේ මහ ඇමැතිතුමාට සාධාරණීකරණය කරන්න බැහැ. ඒක නිසා යහපාලනය ගැන පෙනී සිටිනවා නම් අපි විශ්වාස කරනවා. අපේ පළාත් සභාවේ සිටින අනික් ඇමැතිවරු වාගේ යහපාලනය වෙනුවෙන් කෙලින් පෙනී සිටින්න. දවල්ට මේ පැත්තේ රෑට තව පැත්තක ඉන්න බැහැ. ප්‍රතිපාදන ලබා දෙද්දී, පළාත් පාලන ආයතනවලට මුදල් ලබා දෙද්දී ඒක යහපාලනය කියලා පොහොට්ටුවේ අයට විතරක් ඒක බෙදා දෙනවා නම්, ඒක යහපාලනයක් නොවෙයි. එතුමා යහපාලනය වෙනුවෙන් පෙනී සිටිනවා නම් හරියට යහපාලනය වෙනුවෙන් පෙනී සිටින්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අපට විශේෂයෙන්ම කියන්න තිබෙන්නේ, යහපාලනය කියලා - අපි ඉපදුණෙත් එක්සත් ජාතික පක්ෂයේ. මරෙන්නෙත් එක්සත් ජාතික පක්ෂයේ. අපේ තාත්තලා මේ එක්සත් ජාතික පක්ෂය රැකගන්න හිරේ ගිය අය. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයත් මෙහෙම කැඩිලා බිඳිලා යන්න දෙනවාට අපි විරුද්ධයි කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අපි කැමැති නැහැ. අපි ආරක්ෂා කරගත්තු පක්ෂය, අපි බලයට ගෙනාපු පක්ෂය අද කැලණියේ නිලුයි කොළයි එකට ගහලා 45,000 ක් ඡන්ද ගත්තු එක්කෙනා 5000 ක් ගත්තු කෙනාගේ නැට්ටේ එල්ලිලා යනවා දකිද්දී අපට ඉතාමත් කනගාටුවක් ඇති වෙනවා කියන එක කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමා මේ දූකට කෑ ගහන්නේ. මට තරහ ඒක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට, බදුරලිය විදුහල්පතිතුමා සම්බන්ධව කථා කරන්න විනාඩි පහක කාලයක් ලබා දෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

45,000 ක් නොවෙයි. 49845 ක් ගත්තා. දූකට කෑ ගහන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි. වාඩි වෙන්න. පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය දිනක බදුරලිය විද්‍යාලයේ ඉතාම කනගාටුදායක සිද්ධියක් ඇති වුණා. ඒ සිද්ධියට හේතුව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදුහල්පතිතුමා ආදි ශිෂ්‍ය සංගමයේ භාණ්ඩාගාරික, ලේකම් ඇතුළු කණ්ඩායමක් කලාප කාර්යාලය දැනුවත් කරලා ඉස්කෝලයට ගියා. ඒ ගිය වෙලාවේ විදුහල්පතිතුමාගේ කාමරයේ වර්තමාන ජනාධිපතිතුමාගේ ෆොටෝ එකක් තිබුණේ නැහැ. ඒ ගමන විදුහල්පතිතුමාගෙන් ඇහුවා, ෆොටෝ එකක් නැත්තේ මොකද කියලා. ෆොටෝ එකක් නැහැයි කිව්වා. ඊට පස්සේ අපි ගෙනත් සවි කරන්නද කියලා ඇහුවාම ඒ අය පිටින් ෆොටෝ එකක් ගෙනැල්ලා සවි කරන කොට, ඒක ඇදලා වීසි කරලා, ඒක සවි කරනවාට විරුද්ධත්වය දක්වලා ප්‍රශ්නයක් ඇති වුණා. ඒ ප්‍රශ්නය ඇති වෙලා ඒ අය ෆොටෝ එක සවි කළා. ඒ වෙලාවේ විදුහල්පතිතුමා ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමාට දුරකථනයෙන් දැනුම් දීලා කණ්ඩායමක් ගෙන්නලා ඒ තුන් දෙනාට පහර දුන්නා. ඉස්පිරිතාල ගත වෙලා සිටියා. නීත්‍යානුකූලව කටයුතු කරලා හිටපු සභාපතිතුමාව තවත් කිහිප දෙනෙක්ව රිමාන්ඩ් භාරයට ගත්තා. ඒ වෙලාවේ අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රාදේශීය සභාවෙන් සම්බන්ධ වුණු නිලධාරීන්ට නීත්‍යානුකූලව කටයුතු කළා. ඒ සම්බන්ධව එතුමාට ස්තුතිවන්ත වෙනවා. විදුහල්පතිතුමා ක්‍රියා දාමය සම්බන්ධයෙන් පසුව මාරු කළා. මාරු කළේ විනය පරීක්ෂණයක් තියනවා කියලා. අද විනය පරීක්ෂණ නැතිව නැවත විදුහල්පතිතුමා ඒ විද්‍යාලයට පත් කරලා තිබෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දෙමව්පියන් උස්සලා ගෙනැල්ල තිබ්බා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

දෙමව්පියන් ගෙනැත් තිබෙනවා නම් පළාත් සභාවේ අමාත්‍යාංශයක් තිබෙන එක වැඩක් නැහැ නේ. එහෙම ගෙනත් තියලා අද නැවත වරක් පත්වීමක් ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ මේකයි. පාසලක විදුහල්පතිවරයෙක් රාජ්‍ය නායකයා ගණන් ගන්නේ නැත්නම් එතුමා දරුවන්ට දෙන ආදර්ශය මොකක්ද? රටේ අධ්‍යාපනය තමයි වැදගත්ම දේ. මෙවැනි පුද්ගලයින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කරන්න නැවත පත් කරනවා නම් - ඒ වැරැද්ද හරි ගස්සලා තිබෙනවා. එහෙම නම් දැන් පොඩ්ඩකට ඉස්සෙල්ලා අපේ අධ්‍යාපන ඇමතිතුමා කිව්වා, එතුමා ජනාධිපතිතුමාගේ පැත්තේ ඉන්නවාය කියලා. ජනාධිපතිතුමාගේ රූපය ගහන්න නොදී ඒක ඇදලා දාලා, ජනාධිපතිතුමා පිළිගන්නේ නැහැයි කියන කෙනෙක් නැවත වරක් විදුහල්පතිවරයෙක් වශයෙන් ඒ ඉස්කෝලෙට පත් කිරීම තුළින් මේ තිබෙන - අපේ රාජ්‍ය නායකයා කවුරු වුණත් පිළිගත යුතුයි. කවුරු වුණත්, මොන දේශපාලන මතයක් තිබුණත් රාජ්‍ය නායකයා වැඩි ඡන්දයෙන් පත් වුණාම, ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට එතුමාට අපි ගරු කළ යුතුයි. එතුමාගේ ප්‍රතිරූපය බිඳ දමලා එතුමාට අපහාස වෙන්න කටයුතු කරන කෙනෙක් නැවත ඒ තත්ත්වයට පත් කිරීම තුළින්, ඒ කරපු ක්‍රියාදාමය නීත්‍යානුකූල භාවයට පත් වීමක් අපි දකින්නේ.

ඒ නිසා අපි මේ ක්‍රියාදාමය හෙළා දකිනවා. අතිගරු ජනාධිපතිතුමාට අපහාස කරපු කෙනෙක් නැවත ඒ තනතුරට පත් කිරීම තුළින් රටේ නායකයාට කරපු අගෞරවයක් හැටියට අපි දකින්නේ. අපි එය තරයේ හෙළා දකින අතර, බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයට අපේ බලවත් අප්‍රසාදය පළ කරනවා. මෙවැනි විදුහල්පතිවරයෙකුට මෙවැනි තත්ත්වයක් දීම තුළින් අපේ අධ්‍යාපනය කොයිබටද කියන ප්‍රශ්නය අපි ඔබතුමාගේ මාර්ගයෙන් යොමු කරනවා. අධ්‍යාපන ඇමතිතුමාට බැරි නම් මම මේ ගැන ප්‍රධාන ඇමතිතුමාට ඉල්ලීමක් කරනවා, මේකට නිසි මාර්ගයක් ගන්න. මේ වැරැද්දට දඬුවමක් කරන්න. විනය පරීක්ෂණයක් කරන්න කටයුතු කරන්නය කියලා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමා මේකට මැදිහත් වෙන්නය කියලා මම ගෞරවයෙන් ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පාසල්වල ප්‍රශ්නවලට වුවමනාවට වඩා දේශපාලඥයෝ මැදිහත් වීම පිළිබඳව මට ගැටළුවක් තිබෙනවා. මම මේ පළාතේ ඉපදුනු දවසේ සිට - ඔය පාසලට අවුරුදු 24 ක් වෙනවා. ඔය පාසල ගැන ඔබතුමාත් දන්නවා. ඔය පළාතේම පාසල්වල ඇවිදලා තිබෙනවා. මම කවදාවත් පාසල්වල දේශපාලනය වචනයක්වත් කථා නොකරපු මනුස්සයෙක්. ඔය පාසලේ පුංචි සිදු වීමක් වුණා. එහෙම ක්ෂණිකව පියවර ගන්න බැහැ. මම ඉතාම විධිමත් පරීක්ෂණයක් කළා. වාර්තාවක් කැඳෙව්වා. මගේ නිලධාරී වාර්තාව ඔක්කොම තිබෙනවා. අපට ලබන සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්. උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්. මූලාසනයට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ අනුව ඒ විදුහල්පතිවරයා දැසේ කඳුළු පුරවාගෙන ඇවිල්ලා ඉතාම බැගෑපත්ව සමාව ඉල්ලලා ලියුම් දෙකක් ඉදිරිපත් කළා. අභියාචනා කළා. ඒ අනුව විදුහල්පතිතුමා කිව්වා, මම මේක දැනගෙන කරපු දෙයක් නොවෙයි. මම ජනාධිපතිතුමාට ගරු කරනවා. ආදරය කරනවා. මට පින්තූරයක් තිබුණේ නැහැ. හදිසියේ දරුවෝ ටිකක් ඇවිල්ලා - මට තිබුණේ පරණ පින්තූරය. කලින් හිටපු ජනාධිපතිතුමාගේ. හදිසියේ පින්තූරයක් එල්ලන්න ආවා. ඒ වෙලාවේ මම කිව්වා, පුතා මේක කලාපයෙන් අවසරයක් ඇතිව එල්ලන්න කැමැතියි කියලා. ඒගොල්ලෝ ගිහිල්ලා, එළියේ හිටපු සභාපතිවරයෙක් අර ධම්මික, එයාට කථා කරලා. ඒ වෙන සිදු වීමක්.

මේ සම්බන්ධව ඉතාම නිවැරදි පරීක්ෂණයක් කරලා විදුහල්පතිතුමාට මේකේ දඬුවමකුත් කරලා තිබෙනවා. අපට වාර්තා හැමෝටම ප්‍රදර්ශනය කරන්න බැහැ. මට වගකීමක් තිබෙනවා. මගේ අමාත්‍යාංශයේ මගේ විදුහල්පතිවරු. මම කෙළින්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ මිනිහෙක්. වැනෙන මිනිහෙක් නොවෙයි. මම කෙළින් මිනිහෙක්. මගේ අධ්‍යාපනයට වුවමනාවට වඩා දේශපාලඥයින් ඇඟිලි ගහන්න ඕනෑ නැහැ. යහපත් විධියට ඇඟිලි ගහනවා නම් කමක් නැහැ. මේ පාසල්වල ගේට්ටු කඩා ගෙන පෙරළගෙන ගිහිල්ලා දේශපාලනය කරන්න දෙන්න බැහැ එහෙම.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

එහෙම කිසි දෙයක් වෙලා නැහැ. මේ අපහාස කරනවා. සම්පූර්ණ බොරු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. නැහැ. කථා කරන්න එපා. ඔබතුමා නොවෙයි -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

එතුමා දූරකථනයෙන් කථා කරලා තමයි සභාපතිතුමා ගෙන්නුවේ. මේ බොරු කියන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාට කථා කරන්න අයිතියක් නැහැ. මම කථා කරන්නේ. අපි නිවැරදිව කරලා තිබෙනවා. පාසල්වලට දේශපාලනය ඇතුළු කරලා නැහැ. මම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාගේ ඉල්ලීමට සාධාරණත්වයක් ඉෂ්ට කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක්. මමයි කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමයි එකට වැඩ කරලා තිබෙනවා. මේ පක්ෂ දෙකම එකට වැඩ කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. එතුමාගේ ඉල්ලීමට සාධාරණත්වය ඉෂ්ට කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සාධාරණත්වය ඉෂ්ට කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මට නොවෙයි. ජනාධිපතිතුමාට සාධාරණත්වය ඉෂ්ට කරන්න කියලා අපි ඉල්ලන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ජාතික පාසල්වලට ගුරුවරු නිදහස් කිරීම පිළිබඳව කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමා හරහා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මේ අපි හැම කෙනෙක්ම කථා කරන්නේ, සියලු දේ කථා කරන්නේ බස්නාහිර පළාතේ මේ දරුවන් වෙනුවෙන් තමයි. ඒ නිසා අපි මෙතුවක් කල් කියපු සියලු දේ පැත්තකට විසි කළා වාගේ මේ කරුණත් විසි කරන්න එපාය කියන ගෞරවනීය ඉල්ලීම ප්‍රදේශයේ බස්නාහිර පළාතේ දරුවන් වෙනුවෙන් ඉල්ලනවා. මොකද, ඔබතුමා දන්නවා. අපේ පළාතේ සමහර ගුරුවරුන්ගේ ලොකු පුරප්පාඩු තිබෙනවා. ඒ පුරප්පාඩු තිබෙද්දී ජාතික පාසල්වලට අනුප්‍රාප්තිකයන් රහිතව ගුරුවරුන්ව නිදහස් කරලා යවනවා. ඊට පස්සේ දැන් මාස ගණන් ඒ පාසල්වල දරුවන්ට ඉගෙන ගන්න ගුරුවරු නැහැ. මේක මම අධ්‍යාපන ඇමතිතුමාට පානදුරේ ක්‍රීඩා උත්සවයකට ආපු වෙලාවේදී පැහැදිලිව කිව්වා. එතුමා කොළ කැබැල්ලක් අරගෙන මේක ලියා ගත්තා. ඊට පස්සේ ආපහු මම දූරකථනයෙන් කථා කරලා කිව්වා. ආපහු මේ පළාත් සභාවේදී කථා කරලා කිව්වා. ඊට පස්සේ දැන් ඉන්න පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකව හම්බ වෙලා කිව්වා. දැන් මෙතුමාගේ ඉන්න ඒ අධ්‍යාපන ලේකම්වරුන්ට කිව්වා. ඒ කිසි කෙනෙක් සත පහකට ගණන් ගන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමා තේරුම් ගන්න ඕනෑ, මේ දරුවන් වෙනුවෙනුයි මේවා කථා කරන්නේ කියලා.

[ ගරු ලලිත් එල්ලාවල ]

දැන් උදාහරණයකට ගත්තාම පානදුර බාලිකාවේ ජපන් උගන්වන ගුරුවරියක් හිටියා. මම දන්නා පරිදි මේ ගුරුවරියව අනුප්‍රාප්තිකයෙකු රහිතව ජාතික පාසල්වලට නිදහස් කළා. අද බස්නාහිර පළාතේ ජපන් උගන්වන ගුරුවරු නැහැ. බස්නාහිර පළාතේ ලොකු පුරප්පාඩුවක් තිබෙනවා. මම ඇහුවා, මේක කාගේ ඕනෑකමකටද නිදහස් කළේ කියලා. මම පසුවයි දැන ගත්තේ අධ්‍යාපන ඇමතිතුමාගේ වුවමනාවටයි මෙයාව ඉවත් කරලා තිබෙන්නේ කියලා. හරිද? එහෙම නැත්නම් මෙතුවක් කල් කථා කරන්න තිබුණා. මෙතුවක් කල් කිසිම සභාවක වචනයක් කියන්නේ නැහැ. මගේ විශ්වාසය තමයි ඒක. මම කියන දේ අහන්නේ නැත්නම්, සභාව කියන දේ අහන්නේ නැත්නම්, මේකට උත්තරයක් දෙන්නේ නැත්නම් මගේ විශ්වාසය තමයි අධ්‍යාපන ඇමතිගේ වුවමනාවට තමයි මේ ගුරුවරුන්ව මෙහෙම නිදහස් කරන්නේ. මේ දරුවොත් එක්ක සෙල්ලම් කරන්නේ. ඒ පාසලේ දරුවෝ දැන් මාස ගණනක් තිස්සේ ගුරුවරයෙක් නැතිව ඉන්නවා. ඒ කළුතර දිස්ත්‍රික්කයේ හැම පළාතකින්ම ඒ පාසලට ආවා ජපන් ඉගෙන ගන්න ළමයි. අද ප්‍රශ්න පත්‍රය හදන්න ගුරුවරයෙක් නැහැ. අද එහෙමයි ඒ පාසලේ. හැබැයි, අපේ බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමතිතුමාට මෙහෙම කියද්දී තවමත් නිදාගෙන ඉන්නවා. අපි කථා කළාම කියනවා, ඔයාට ආදරෙයි. ඔයා හොඳයි. ඔයා අධ්‍යාපනය වෙනුවෙන් කථා කරනවාය කියලා. අපට කියන්න තිබෙන්නේ, අපි අධ්‍යාපනය වෙනුවෙන් කථා කරනවා. ඔක්කොම හොඳයි. මේකේ අධ්‍යාපන ඇමති හොඳ නැහැ. ඒකයි මේකේ ප්‍රශ්නය. ඒ නිසා කරුණාකරලා මෙහෙම අධ්‍යාපනය ගැන කථා කරන්න තියන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගමේ ප්‍රශ්නයක්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අධ්‍යාපන ඇමතිතුමාට බැරි නම් ලේකම්වරු මේවාට උත්තර දෙන්න ඕනෑ. මේක විහිළුවට ගන්න එපා. මාස පහක්, හයක් තිස්සේ දරුවෝ අද නිකම් ඉන්නවා. දරුවන්ට ප්‍රශ්න පත්‍රය හදාගන්න කෙනෙක් නැහැ. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ බස්නාහිර පළාතේ පුරප්පාඩු තිබෙන විෂයයන්වල මේ ජාතික පාසල්වලට අපේ ගුරුවරුන්ව නිදහස් කරන්න එපා. අනුප්‍රාප්තිකයෙකු රහිතව නිදහස් කරන්න එපා. ඕනෑ නම් කෙනෙක්ව අරගෙන නිදහස් කරන්න. ඒ නිසා මම පැහැදිලිව ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ බස්නාහිර පළාතේ දරුවන්ගේ අධ්‍යාපනය විනාශ කරන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. මේකට පැහැදිලි උත්තරයක් සභාවට ලබා දෙන්නය කියන එක මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ආනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුළු සභාව වෙනුවෙන්ම මේ දරුවෝ වෙනුවෙන් ඉල්ලන්නේ. මේක මාස ගණනක් තිස්සේ කථා කරනවා. පුළුවන් නම් අවස්ථාවක් දෙන්න එතුමාට මේකට උත්තරයක් දෙන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාට උත්තරයක් දෙන්න කියලා මට මේ වෙලාවේ ඉල්ලීමක් කරන්න බැහැ. මීළඟට ආනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා ඩෙංගු වසංගතය පිළිබඳව කථා කරන්න.

**ගරු ආනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මම හිතන්නේ මුළු ලංකාවටම විශාල උවදුරක් වෙලා තිබෙනවා, මේ ඩෙංගු වසංගතය. ඉතිහාසයේ කවදාවත් නැති තරම් ඩෙංගු හිස ඔසවලා තිබෙනවා. මම හිතන්නේ, මේකට ප්‍රධානම කාරණය තමයි අපි දකින විධියට පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක තත්ත්වයක් නැතිකමයි. මොනවා වුණත් පළාත් පාලන ආයතනවල සභාපතිවරු ඉන්න කොට, මන්ත්‍රීවරු ඉන්න කොට ගමේ උදවිය සභාපතිවරයාට කිව්වා, මන්ත්‍රීතුමාට කිව්වා ගමේ ප්‍රශ්නය. මහ ඇමතිතුමාට කිව්වා, මේ ප්‍රශ්නය ගැන සොයලා බලන්නය කියලා. ගමේ උදවිය

තමන්ට ගමේ අය කරදර කරන නිසා හරි ඒ ගම සුද්ධ කළා. කාණු සුද්ධ කළා. අද එහෙම දෙයක් කරන්න කෙනෙක් නැහැ. අද නිලධාරීන්ට වියදම් කරලා හරි එහෙම කරන්න අවස්ථාවක් නැහැ. නිලධාරීන් භයයි. මොකද, දැන් සභාව ගන්නවා වාගේ හදිසි තීන්දු නිලධාරීන්ට ගන්න බැහැ. මොකද, නිලධාරීන් එහෙම තීරණ ගත්තොත් එහෙම, ඊළඟට FCID යනවා. ඒ නිසා නිලධාරීන් වැඩ කරන්නේ කොළෙත් බේරා ගෙන. ගහත් බේරා ගෙන දෙකම බේරා ගෙන කරන්නේ. එහෙම කරන කොට ඩෙංගු මදුරුවා හිස ඔසවනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය දවස්වල නියඟයක් ආවා. ඉතිහාසයේ වැඩිම නියඟය. ඒ නියඟය කාලෙත් ඩෙංගු මදුරුවා බහුලව ඉන්නවා. සාමාන්‍යයෙන් අපි අහලා තිබෙන්නේ, වැස්ස කාලයට තමයි ඩෙංගු මදුරුවා ඉන්නේ. නමුත් මේ නියඟයෙත් ඉන්නවා. ඇයි ඒ? කාණුව සුද්ධ වෙන්නේ නැහැ. කුණු ටික අදින්නේ නැහැ. පාරවල් දිගේ කුණු ගොඩවල් පිරිලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් මහ ඇමතිතුමා යටතේ නේ පළාත් පාලන ආයතන තිබෙන්නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මහ ඇමතිතුමා යටතේ තිබෙන්නේ. නමුත් මහ ඇමතිතුමා ලේකම්වරු ලවා කරන ප්‍රමාණයක් තිබෙනවා. ලේකම්වරුන්ට වැඩ කරන්න බැහැ. වැඩ කරන්න බැරි ඇයි? FCID අරන් යනවා. ලේකම්වරු භයයි වැඩ කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මොන පිස්සුද? ඉඩම් කට්ටි කරන එක හොඳට කරනවා. ලේකම්ලා ඉඩම් කට්ටි කරන එක හොඳට කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේගොල්ලන් ඡන්දයට භය හන්දා මේ කාලකණ්ණි ආණ්ඩුව ඡන්දය තියන්නේ නැහැ. (බාධා කිරීම්) පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නැත්නම් ඡන්දය තියන්න කෝ? ගමට මන්ත්‍රීවරයෙක් පත් කරන්න. සභාවට මන්ත්‍රීවරයෙක් පත් කරන්න. පත් කරලා ඉවර වෙලා, මේ ප්‍රශ්නයට උත්තරයක් සොයන්න. මේ වැඩ බැරි ආණ්ඩුව ඡන්දය තියන්නේ නැහැ. සීමා නිර්ණය කිය කියා කල් දානවා. මේ වාගේ ජනතාවගේ පුරවැසියන්ගේ අයිතිය, පරමාධිපත්‍ය උල්ලංඝනය කරලා ඒ මිනිසුන්ගේ ජීවිතවල වටිනාකමක් නැහැ. මේ රජයට ජීවිතවල වටිනාකමක් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පළාත් සභා ඡන්දය එනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේ රජයට ජීවිතවල වටිනාකමක් නැති නිසා මිනිස්සු මැරෙනවා. සොයන්නේ බලන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කාලකණ්ණි ආණ්ඩුවට කියනවා, මේ පළාත් පාලන ආයතනවල ඉක්මනට ඡන්දය තියන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තව පෙළපාලියක් එන්න. එතකොට හරි යනවා.

## පළාත් සභාවේ රැස්වීම - I
PROVINCIAL COUNCIL MEETING - I

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"2017.03.22 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව, අද දින (2017.04.04 දින) විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව, 2017.04.25 දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම - II
PROVINCIAL COUNCIL MEETING - II

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා, 2017.03.22 වන දින පැවති, සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුකූලව, 2017.04.18 වන දිනය හා 2017.05.09 වන දිනය යන දිනයන්, සභා රැස්වීම් නොපැවෙත්වන දිනයන් විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාහන ගාල් කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
BY LAW REGARDING PARKING VEHICLES WITHIN THE ADMINISTRATIVE LIMITS OF COLOMBO MUNICIPAL COUNCIL

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කරන ලද,*

*කොළඹ මහ නගර සභාව විසින් 252 අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තිය යටතේ සාදනු ලැබූ, කොළඹ මහ නගර සභා සීමාව තුළ වාහන නැවැත්වීම තහනම් කිරීම, නවතා තැබීම සඳහා නැවතුම් ස්ථාන ඇති කිරීම සහ විධිමත් කිරීම, ගාස්තු අය කිරීම හා පැහැර හැරීම පාලනය කිරීම සඳහා විධිවිධාන සලසා ගැනීම සඳහා පනවනු ලබන, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි 'වාහන ගාල් කර තැබීමේ අතුරු ව්‍යවස්ථා' නම් වූ අතුරු ව්‍යවස්ථා,*

*ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 268 වන වගන්තිය යටතේ ස්ථිර කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි යන යෝජනාව කරමින්ම, එකී අතුරු ව්‍යවස්ථාවන්, මෙම පළාත් සභාවට ඉදිරිපත් කරමි."*

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකට පුංචි අදහසක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන්න. ඒ වාගේම තවත් ගරු මන්ත්‍රීවරුන් තමන්ගේ ගැටළු තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. ඒ අවස්ථාව ලබා දෙනවා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මේකේ මේ ඇත්තටම තිබෙන ගැටළුව කොළඹ මහ නගර සභා සීමාව තුළ තිබෙන සියලු මාර්ග සහ නගර සභාව යටතේ තිබෙන ස්ථාන කියලා තමයි සටහන් වෙලා තිබෙන්නේ. එතකොට මේකේ පටු මාර්ග කියලත් තිබෙනවා. එතකොට මේ මොන පාරවල්වලද, මොන ස්ථානවලද මේ රථගාල් තියන්නේ කියන එක පිළිබඳව සටහනක් දීලා නැහැ. එතකොට මෙහෙම බැලුවාම නගර සභාව හිතන ඕනෑම තැනක රථගාල් ඇති කරන්න පුළුවන්කමක් තිබෙනවා. එතකොට ඒක ලොකු අසාධාරණයක් වෙනවා. මොකද, සමහර මාර්ගවල ඉන්න ඒ ජීවත් වන ජනතාවට අසාධාරණයක් සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා අපි ඉල්ලීමක් කරන්නේ, මේ සම්බන්ධව ලේඛනයක් දෙන්න. මොනවාද රථ ගාල් පවත්වන ස්ථාන කියලා. ඒ ලේඛනය ප්‍රසිද්ධ කරලා ජනතාවගේ විරෝධතා කැඳවන්න. කැඳවලා ඊට පස්සේ අපි පළාත් සභාවට දාලා අනුමත කරලා ඒ කටයුත්ත කරන තුරු මේකට අනුමැතිය ලබා දෙන්න එපාය කියන ඉල්ලීම කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ සංශෝධන ටික -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඒ වාගේම මේකේ පාසල් බස් රථ සඳහා රුපියල් 1000 ක මුදලක් අය කරන්න යෝජනා කරනවා. මේ ගාස්තු වැඩියි. නමුත් කන්ටේනර් එකකට රුපියල් පනහයි. මේ විධියට තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව පළාත් සභාවේ අපේ මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් යම්කිසි සංශෝධන ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමටත් තිබෙනවා. මේ සම්බන්ධයෙන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, විශේෂ අවස්ථාවක් සේ සලකා අපට ප්‍රඥප්ති හා නීති කාරක සභාවට -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කිරීම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කරන්නේ. ඒ නිසා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට මෙම ප්‍රඥප්තිය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මමත් කියන්න හැදුවේ මේක ඇත්තටම සම්මත කිරීමත් එක්ක විශේෂයෙන්ම පාසල් බස් සේවය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් සම්මත කරන්නේ නැහැ. සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ අදහස් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන්න.

ඒ අනුව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙනාපු යෝජනාව මම ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරනවා.

***අනතුරුව, අතුරු ව්‍යවස්ථාව ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.***
*Accordingly, it was ordered that the by law be forwarded to the Committee on Statutes and Laws.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට න්‍යාය පත්‍රය අනුව තිබෙන්නේ, පෞද්ගලික මන්ත්‍රී යෝජනා. රීති අංක 107 යටතේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. සයිටම් ආයතනය පිළිබඳව යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඒ එක්කම එදා යෝජනාවේ ඉතිරි කොටස තිබෙනවා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාගේ. එතකොට දැන් මේක රීති අත්හිටුවීමේ යෝජනාව මුලට ගන්න වෙනවා. රීති අත්හිටුවීමේ යෝජනාවක් ගෙනාවාම වෙන එකක් ගන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි එකඟතාවයකට ආවා මගේ විවාදය අවසන් කරලා ඊට පස්සේ මෙතුමන්ලා ඒ යෝජනාව ගේන්න කටයුතු කරනවා කියලා. අපි එකඟතාවයකට ඇවිල්ලා තමයි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවක් ගෙනාවාම වෙන යෝජනාවක් ගන්න බැහැ. රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් වුණාම වෙන යෝජනාවක් ගැන කථා කරන්න බැහැ. ඒ නිසා අපි ඔබතුමාට මේ යෝජනාව අවසානයේදී අපි මේකට අවස්ථාව -

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ඒත් බැහැ. සභා රීති අනුව රීති අත්හිටුවීමේ යෝජනාව ගේන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක ඊළඟ සභාවට.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. ඊළඟ සභාවට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අනුව රීති අංක 107 යටතේ යෝජනාව ඉදිරිපත් කිරීමට අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අද මගේ යෝජනාව ගන්නේ නැද්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම නම් ඊළඟ එකට දා ගනිමු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තිබෙන්නේ පරණ කාර් එකක්. මොකද, දේශපාලනය කරලාම නැති වෙලා පරණ කාර් එකක් තිබෙන්නේ. අද මම එනකොට ඒ කාර් එක කැඩුණා. හදා ගන්න බැලුවා. ඒත් බැරිව ගියා. මම ත්‍රීරෝද රථයක ආවා. එතකොට මම අහන්නේ, පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙක් පත් වුණාම දැන් අපෙන් ගියා පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා. එතුමා මෙහේ පර්මිට් එකත් අරගෙන ගිහිල්ලා සුමාන දෙකෙන් එතුමාට පර්මිට් එකක් හම්බ වුණා. එතකොට අපි ඇවිල්ලා අවුරුදු තුනක් වෙනවා. හිටපු හැම ජනාධිපතිවරයාම මන්ත්‍රීවරුන්ට ඒ වරප්‍රසාදය ලබා දුන්නා. මේ දැන් ඉන්න ජනාධිපතිතුමායි, වර්තමාන අගමැතිතුමායි දෙන්නාම එකතු වෙලා ඉන්න කොට ඇයි මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට අඩු වැඩි වශයෙන් සලකන්නේ දෙපැත්තේම අය ඉන්නවා. ඇයි අපට පර්මිට් එකක් දෙන්නේ නැත්තේ? අපේ පර්මිට් එක දුන්නා නම් එහෙම අපිත් වාහනයක් ගන්නවා. අපි ආසා නැද්ද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් ඒගොල්ලෝ දුවන දිස්ත්‍රික්කයේම තමයි අපිත් දුවන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා යෝජනාවක් ගේන්න. මම ස්ථිර කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒගොල්ලෝ දුවන දිස්ත්‍රික්කයේම තමයි අපිත් දුවන්නේ. මම මේ සභාවට -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

යෝජනාවක් ගේන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මම මේ සභාවට යෝජනා කරනවා අපට ඉක්මණටම දෙන්න කියලා. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(1), 15(2), 15(5), 53(2) 53(3), 57(2), 57(3), 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අත්හිටුවීමට එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
# PRIVATE MEMBERS MOTION:

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව ඉදිරිපත් කරනවා.

*"මේ මොහොත වන විට රජයේ වෛද්‍ය පීඨවල සිසු දරුවෝ 2017 ජනවාරි මස සිට අඛණ්ඩ පන්ති වර්ජනයක නියැලෙමින් සිටී. තවද, රටේ සියලු ප්‍රගතිශීලී බලවේග ශිෂ්‍යයන්ගේ මෙම සටනට සහයෝගය දක්වමින් සිටී. මෙම සටන පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී වූත්, නිදහස් අධ්‍යාපනයට පක්ෂපාතී වූත් ප්‍රගතිශීලී සටනකි. ඒ අනුව මෙම සටනට මූලික විෂය වී ඇති සයිටම් ආයතනය අහෝසි කර රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කළ යුතු යැයි බස්නාහිර පළාත් සභාව රජයට යෝජනා කර සිටී."*

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දන්නා පරිදි මේ යෝජනාව - මේ පිළිබඳව අධිකරණය මගින් තීන්දුවක් දීලා තිබෙද්දී නීතිය අභියෝගයට ලක් කිරීමක් නොවෙයිද මේ කරන්නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එහෙම එකක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංශෝධන තිබෙනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක පොඩ්ඩක් -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව පාර්ලිමේන්තුව තුළත් සංවාදයට ලක් කරලා තිබෙනවා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් විධියට මේ සභාවට ඇවිත් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් උසාවියේ තීන්දුවක් දීලා තිබෙනවා. ඒක ගම් මට්ටමේ පාර තොටේ උද්ඝෝෂණය කරන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. ඒ කාරණාවලදී අපිත් එකඟ වන කාරණා තිබෙනවා. නමුත් මේක සභාවේ සාකච්ඡා කළ යුතුද කියන එක මම හිතන්නේ විමසා බලන්න. ඒ වාගේම පාලක පක්ෂය හැටියට පැහැදිලිවම කියන්න ඕනෑ. අපේ මතය පෞද්ගලික විශ්ව විද්‍යාලය ඉවත් කරන්න, අහෝසි කරන්න කියලා අපේ යෝජනාවක් නැහැ. අපේ යෝජනාව තිබෙන්නේ, එතුමා අපේ සංශෝධනයට එනවා නම්, අපට එකඟ වෙන්න පුළුවන්. තමුන්නාන්සේ බලන්න මේක සභාවට ගේන්න පුළුවන්ද කියලා. අපි මේකට පැහැදිලිව කියනවා, මොකද, අපි දන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්ව විද්‍යාලයට තේරෙන ළමයින්ගේ ප්‍රශ්නයක් නැහැ. නමුත් Z Score එක හරහා A 3 තිබෙන දරුවන්ටත් විශ්ව විද්‍යාල වරම් ලැබෙන්නේ නැහැ. අපි ඒක දකිනවා. අනික් එක මේක ප්‍රගතිශීලී කියලා කිව්වාට, මේ ප්‍රගතිශීලී කඳවුරේම ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා අපි පැහැදිලිව කියනවා. අපි මේකට සංශෝධනයක් ඉදිරිපත් කරනවා. පෞද්ගලික විශ්ව විද්‍යාල තිබෙන ඒවා විධිමත් කරන්න ඕනෑය කියලා. ඒකට එකඟ නම් අපි මේ යෝජනාවට එකඟයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සම්බන්ධයෙන් විතරයි මේක තිබෙන්නේ. ඒ නිසා මේකේ එහෙම ගැටළුවක් මතු වෙන්නේ නැහැ. මේක වඩාත් හොඳ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ ඇවිල්ලා අපිත් එක්ක මේක සාකච්ඡා කළා. පළාත් සභාවට ආවා. ඒ නිසා මේක සාකච්ඡාවට භාජනය කරන එක තමයි ඉතාමත්ම වැදගත්. ඒක මේ යෝජනාවට එකඟ වෙනවාද නැද්ද කියන එක ඡන්ද විමසීමක් තුළ අපි බලමු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමන්ලා මේ සංශෝධනයට එකඟද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියපු දේ තමයි අපේ විපක්ෂයේ කණ්ඩායමත් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ ඉල්ලීම විධිමත් කරන්න නේ ඔබතුමන්ලා කියන්නෙත්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔව්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සංශෝධනයක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංශෝධනයට කැමැති නම් මේක සාකච්ඡා කරමු.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අන්න ඒක ඉස්සෙල්ලා බලලා ඉන්න. අධිකරණයේ තීන්දුවකුත් දීලා තිබෙද්දී ගැටළුවක් වෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේකේ සයිටම් කියන වචනය ඉවත් කරලා සංවාදයට ලක් කරන්න මම එකඟ වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මේ සංසිද්ධිය ගැන කථා කරන්න බාධාවක් නැහැ. මොකද, අපට ප්‍රගතිශීලී අගතිශීලී අදහස් අහලා කථා කරන්න පුළුවන්. නමුත් නඩුව ගැන හෝ නඩු තීන්දුව විවේචනය කරන්නේ නැතිව පොදුවේ අදහස් කථා කරන්න පුළුවන්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එහෙම නම් සයිටම් කියන නම ගැන කථා කරන්නත් බැහැ. සයිටම් තහනම් වචනයද?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

එහෙම තහනම් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක මහජන නියෝජිත ආයතනයක් විධියට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාව සාකච්ඡාවට භාජනය කරන්න දැන් මහ ඇමතිතුමා ඉදිරිපත් කරපු සංශෝධනයට කවුරුත් එකඟයි නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

යෝජනාවේ යම් සංශෝධනයක් බලාපොරොත්තු වෙනවා නම්, සයිටම් කියන වචනය මෙතැනින් ඉවත් කරන්න මම එකඟ වෙනවා. නමුත් මේ යෝජනාව සයිටම් එක මුල් කර ගෙන -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අහිංසක මිනිස්සුන්ට ප්‍රශ්නයක් තිබෙන බව ඔබතුමාත් දන්නවා. ඔබතුමාගේ දරුවා වෛද්‍ය පීඨයට ඇතුළත් වීම සම්බන්ධයෙන් අපි

අතිශයින් සතුටට පත් වෙනවා. නමුත් මේ තුළ ඉන්නවා මේ රටේ අහිංසක මිනිස්සු. තමන්ගේ දරුවා වෛද්‍ය විද්‍යාලයකට උත්සාහ කරලා බැරි වුණු ළමයි. ලකුණු එක දෙක අහිමි වුණු දරුවෝ ඉන්නවා. ඒගොල්ලන්ට පෞද්ගලික විශ්ව විද්‍යාලයක වරම් තිබෙන්න ඕනෑ. ඒක කප්පාදු කරන්න දෙන්න බැහැ. ඒ නිසා මේ සංශෝධනයට - පෞද්ගලික විශ්ව විද්‍යාලය විධිමත් කර නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීම කියලා ගන්නවා නම් අපට එකඟ වෙන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකේ අහිංසක මිනිස්සුන්ට අවස්ථාවක් හම්බ වෙන්නේ නැහැ. සල්ලි තිබෙන මිනිස්සුන්ට විතරයි අවස්ථාවක් ලැබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අහිංසක දෙමව්පියන්ට ලක්ෂ 120 ක් නැහැ නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

සභාව කල් තියලා මේ ගැන කථා කරන්න බැරිද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සංශෝධන එන්න ඕනෑ. කථා කරන්න බැහැ. අපේ ළමයි මේකේ නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සංශෝධනවලට එකඟයි.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

සංශෝධනය වෙන්න ඕනෑ, සයිටම් ආයතනය අහෝසි කර කියන කැල්ල විතරයි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සංශෝධනවලට යටත්ව මේක සාකච්ඡා කරන්න එකඟ වෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංශෝධනවලට යටත්ව යෝජනාව ඉදිරිපත් කිරීම ගැටළුවක් නැහැ. නමුත් මේකේ නීතිමය තත්ත්වය පිළිබඳව - සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමන්ලා එහෙම දන්නවා. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේක බරපතළ ප්‍රශ්නයක්. ඔබතුමා දන්නවා. මේ ප්‍රශ්නය සම්බන්ධව අවස්ථාව මගහරින්න එපා. මේක මේ සභාවේ අයිතිය තහවුරු කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

විශ්ව විද්‍යාලයට යන ශිෂ්‍යයන්ට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. හැබැයි, විශ්ව විද්‍යාල වරම් අහිමි වුණු ලකුණු එක දෙක අඩු වුණු දරුවන් ගැන හඬනගන්න කවුරුවත් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේක සංවාදයට ලක් කරන්න ඉඩ දෙන්න. නිදහස් අධ්‍යාපනය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් පක්ෂ නායකයින් සියලු දෙනා විනාඩි 10 ක සාකච්ඡාවකින් පසුව නැවත සභාව රැස් වෙනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.30 ට යළිත් රැස් විය.***

*Sitting, accordingly suspened untill 11.30 a.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි රීති අත්හිටුවීමේ යෝජනාව සම්බන්ධව පක්ෂ නායකයින් සියලු දෙනා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් සාකච්ඡා කළා. ඒ සාකච්ඡාව අනුව රන්වල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සංශෝධන සහිතව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා සංශෝධනයක් ඉදිරිපත් කරනවා. ඒ යටතේ එකඟ වෙනවා නම් අපට සාකච්ඡාවට භාජනය කරන්න පුළුවන්කමක් වෙනවා. ඒ වාගේම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, උසාවියේ පවතින කාරණාවක් තිබෙන නිසා සයිටම් ආයතනය පිළිබඳව, ඒ සම්බන්ධව කථා නොකර තමන් මේ යෝජනාව කෙරෙහි අවධානය යොමු කරලා තමන්ගේ කථාව කරන්නය කියලා. රීති අංක 67(7) පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. ඒකේ සටහන් වෙලා තිබෙන්නේ, "කිසියම් මන්ත්‍රීවරයෙකු අධිකරණයක විනිශ්චයට භාජනව ඇති කරුණක් සම්බන්ධයෙන් හෝ අධිකරණමය තීන්දුවක් අපේක්ෂා කරන කරුණක් සම්බන්ධයෙන් හෝ සාකච්ඡා කිරීම හෝ හැඟවීම් කිරීම හෝ නොකළ යුතුය." මේ සම්බන්ධව සියලු දෙනාගේම අවධානය යොමු කරලා කථා කරන්නය කියලා ඉල්නවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ඔය ප්‍රකාශ කිරීමෙන්ම හැන්සාඩ් ගත වෙලා ඉවරයි මේ කථා කරන්නේ ඒ පිළිබඳවයි කියලා. ඒ නිසා එතැනම නෛතික ගැටළුව ඉස්මතු වෙලා ඉවරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක එපා කියලා නේ අපි කියන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒ කියන්නේ, ඔබතුමා ව්‍යංගයෙන් කියනවා, සයිටම් නම පාවිච්චි නොකර මේක කථා කරන්නය කියලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් මොකක්ද කරන්න කියන්නේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

එතකොට එහෙම කීම තුළින් සභාවේ වාර්තාගත වෙනවා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සයිටම් සම්බන්ධව කථා කරද්දී ඒ සියලු දේවල් හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන ආ යෝජනාවට අනුව පෞද්ගලික යන්න සිට *"මෙම සටන නිදහස් අධ්‍යාපනයට පක්ෂපාතී වූත්, ප්‍රගතිශීලී සටනක් වන නිසා පෞද්ගලික විශ්ව විද්‍යාල විධිමත් කරමින් රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතියද ශක්තිමත් කරමින් මෙ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් ඇති කළ යුතු යැයි බස්නාහිර පළාත් සභාව රජය යෝජනා කර සිටී."* යන සංශෝධනය මම ඉදිරිපත් කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමාත් එකඟයිද?

[පූ.භා. 11.33]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ යෝජනාව සංශෝධනයට යටත්ව යළිත් ඉදිරිපත් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මොහොත වන විට රට පුරාම වෛද්‍ය පීඨ සිසුන් 2017 ජනවාරි මාසේ සිට පන්ති වර්ජනය කරලා තිබෙන්නේ. ඒ වාගේම මේ මොහොත වන විට ඒ සිසුන් දින 453 ක. එක එක විශ්ව විද්‍යාල. කොළඹ වෛද්‍ය විද්‍යාලය, ජයවර්ධනපුර වෛද්‍ය විද්‍යාලය, රාගම වෛද්‍ය විද්‍යාලය, පේරාදෙණිය වෛද්‍ය විද්‍යාලය, ඒ වාගේම කරාපිටිය වෛද්‍ය විද්‍යාලය, මඩකලපුව වෛද්‍ය විද්‍යාලය, යාපනය වෛද්‍ය විද්‍යාලය ඒ වාගේම රජරට වෛද්‍ය විද්‍යාලය. මේ වෛද්‍ය විද්‍යාල අටේම සියලු සිසුන්

සාමූහිකව තීන්දුවක් අරගෙන තිබෙනවා පන්ති වර්ජනය කරන්න. අපේ රටේ ඉතාමත් ඉහළ ලකුණු අරගෙන, වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වෙලා ඉතාමත් සාමකාමීව තමන්ගේ වෛද්‍ය විද්‍යාලයේ හදාරමින් සිටියේ. පොදුවේ ගත්තාට පස්සේ, වෛද්‍ය සිසුන් පොදු විශ්ව විද්‍යාල වර්ජනවලටත් සහභාගී වෙනවා අඩුයි. හැබැයි, මේ සිසුන් ඒකරාශී කර ගෙන මේ මොහොත වන විට ශිෂ්‍ය සටනක් විධියට මේ සයිටම් ආයතනය අහෝසි කරන්නය කියන සටන් පාඨය යටතේ පෙළගැහිලා තිබෙනවා. මේ පෙළගැසීමත් එක්කම මේකට සහයෝගය දැක්වීම සඳහා රටේ ඉන්න සියලු ප්‍රගතිශීලී බලවේග එකට එකතු වෙලා තිබෙනවා. ඒකරාශී වෙලා තිබෙනවා. ප්‍රධානම ප්‍රගතිශීලී බලවේගයක් විධියට මේ මොහොතේ මේ සටන් පාඨයත් එක්ක පෙළ ගැසිලා තිබෙනවා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මේ මොහොත වන විට ප්‍රාදේශීය මට්ටමේ රෝහල්වල දැවැන්ත අරගල, උද්ඝෝෂණ දක්වා ගෙනැල්ලා තිබෙනවා. මේ හත් වැනිදා වෙන කොට ඔවුන් දැවැන්ත වැඩ වර්ජනයකට ප්‍රවිෂ්ට වෙලා තිබෙනවා.

ඒ නිසා මේ කාරණය අද වන කොට රටේ ප්‍රධාන සමාජමය ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අධිකරණ සීමාවෙන් ඔබ්බට ගිහිල්ලා, අද මේක සමාජයේ ප්‍රධාන ප්‍රශ්නක් බවට පත් වෙමින් සමාජයේ ඒ සම්බන්ධව විසඳුම් සෙවිය යුතු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාවට මේ සමාජමය තත්ත්වය බැහැර කරලා යන්න බැහැ. ඒ නිසා සභාවක් විධියට මොන තරම් අධිකරණ කොන්දේසි යටතේ හෝ මේක කථා කරන්න බල කරලා තිබෙනවා. මොන මොන පැත්තෙන් මේක කථා කරලා, ඒකට අදාළව සංවාදයට ලක් කරන එක තමයි වඩාත්ම සුදුසු දේ. අපි දන්නවා නිදහස් අධ්‍යාපනය කන්නන්ගර මහත්තයා පාර්ලිමේන්තුවට ගෙනෙන වෙලාවේ, ඒ පාර්ලිමේන්තුවේ සංයුතිය ගත්තාට පස්සේ නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රතිලාභ ගත්ත කවුරුවත් පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නිදහස් අධ්‍යාපනය නොමැති තත්ත්වයක් යටතේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙන්, කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන්, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් උපාධිය හදාරගෙන ඇවිල්ලා, ඒ පාර්ලිමේන්තුව නියෝජනය කරපු උගත් මන්ත්‍රීවරු සියලු දෙනා එකට ඒකරාශී වෙලා මේ නිදහස් අධ්‍යාපනය සම්බන්ධව සංවාදයට ලක් කළා. පළමුවැනි අවස්ථාවේදී පනත පරාද වුණා. දෙවන අවස්ථාවේදී නැවත සැරයක් සංවාදයට ලක් කරලා, ඒ අවස්ථාවේදී ඒ මන්ත්‍රීවරුන්ගෙන් බහුතරයක් විදේශ විශ්ව විද්‍යාලවල - දැන් මේ තිබෙන පෞද්ගලික සොකඩ විශ්ව විද්‍යාල නොවෙයි. කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය, ඒ වාගේම ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය වාගේ විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලැබුවේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු මන්ත්‍රීතුමා, එහෙම අපහාස කරන්න එපා පෞද්ගලික සොකඩ විශ්ව විද්‍යාල කියලා. ඔබතුමන්ලා මේ රටේ අධ්‍යාපනය විනාශ කරපු කණ්ඩායමක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමාට කථා කරන්න දෙන්න. ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙන්නම්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒ වචනය අයින් කර ගන්න. පෞද්ගලික සොකඩ විශ්ව විද්‍යාල කියන එක.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

කරුණාකර මට කථා කරන්න අවස්ථාව දෙන්න. ඔබතුමාගේ අවස්ථාවේදී ඒ අදහස් දක්වන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපහාස කරන්න එපා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔබතුමාගේ අවස්ථාවේදී ඒ සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න. මට මේ අවස්ථාවේදී කථා කරන්න දෙන්න. ඒ නිසා මම කිව්වේ, නිදහස් අධ්‍යාපනය යටතේදී ඒ මොහොතේදී නිදහස් අධ්‍යාපනයක් නොමැති තත්ත්වයක් තුළ පාර්ලිමේන්තුව ඇතුළේ මේ නිදහස් අධ්‍යාපන පනත සම්මත කරන්න, ඒ වෙලාවේ විදේශ අධ්‍යාපනය ලබපු

[ ගරු අසෝක සපුමල් රන්වල ]

සියලු මැති ඇමතිවරු සහයෝගය දක්වලා තිබෙනවා. හැබැයි, අද මේ පළාත් සභාව ඇතුළේ බොහෝ අය අතර සාතිශය බහුතරයක් දෙනා නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ අරගෙන තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. කීප දෙනෙක් ඇති පෞද්ගලිකව අධ්‍යාපනය හදාරලා මෙතැනට ඇවිල්ලා. ඔවුන් ඒ සම්බන්ධව ලබා ගත්ත කුසලතාවය මම අභියෝගයට ලක් කරන්නේ නැහැ. මෙතුමා කිව්ව විධියට ඒ සම්බන්ධව යම් යම් විශ්ව විද්‍යාල පෞද්ගලික වුණත්, යම් සාධනීය ලක්ෂණ සහිතව ක්‍රියාත්මක වෙනවා ඇති.

හැබැයි, මම කිව්වේ, පොදුවේ මේ සයිටම් ආයතනය සම්බන්ධව මම කථා කරද්දීම එතැන තිබෙන පොදු සාධකය විධියට ගත්තේ, එක එක කසිකබල් විශ්ව විද්‍යාලවලිනුත් උපාධි ගන්නවා. පොදුවේ මම විශ්ව විද්‍යාල පද්ධතිය අවමානයට ලක් කරන්නේ නැහැ, පෞද්ගලික වුණත්. හැබැයි, මම මේ කථා කළේ එදා ඉතිහාසය තුළ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල හෝ මේ රටේ 100% ක්ම පෞද්ගලික අධ්‍යාපනය පවතින තත්ත්වයක් තුළත් ඒ වෙලාවේ මැති ඇමතිවරුන්ට පුළුවන්කම ලැබුණා, නිදහස් අධ්‍යාපන පනත සම්මත කර ගන්න. හැබැයි, අද පාර්ලිමේන්තුව ගත්තත්, පළාත් සභාව ගත්තත්, සාතිශය බහුතරයක් දෙනා මේ නිදහස් අධ්‍යාපනයෙන් ඇවිල්ලා තිබෙන්නේ. අපේ දුවා දරුවනුත් අද බහුතරයක් මේ නිදහස් අධ්‍යාපන ක්‍රමය යටතේ අධ්‍යාපනය ලබනවා. එහෙම නම් මේ පළාත් සභාවේ විශාල වගකීමක් තිබෙනවා, එදාට වඩා මේ නිදහස් අධ්‍යාපනය සුරක්ෂිත කර ගැනීම සඳහා ඒ සම්බන්ධව මැදිහත් වෙන්න. ඒ වාගේම අද ප්‍රචලිත නමක් බවට පත් වෙලා තිබෙනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

හොර උපාධි කඩය කියලා ආමන්ත්‍රණය කරන්න. මේක කරන්න තත්ත්වය මොක්කද කියලා මම පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒ වචනය හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න සිද්ධ වෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න. මේක නැතිව මට කථා කරන්න බැහැ. මේක ප්‍රධාන කාරණය.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියන එකේ තේරුම තමයි South Asian Institute of Technology and management. දකුණු ආසියානු තාක්ෂණ සහ කළමනාකරණ ආයතනය. මේ ආයතනය කළමනාකරණ ආයතනයක් විධියට තමයි රජයේ ලියාපදිංචි වෙන්නේ. මේ කළමනාකරණ ආයතනයක් විධියට ලියාපදිංචි වෙලා BOI එකේ අනුමැතිය ලබා ගන්නවා. BOI එකේ අනුමැතිය ලබා ගත්තාට පස්සේ මේකේ මේ M අකුරට පොඩි ගේම් එකක් ගහලා, M අකුර Medical කියලා වෙනස් කර ගෙන, Medicine බවට පත් වෙනවා. ඒකේ නම එතැනම වංචාවක්. ඒ වාගේම හොර උපාධි කඩයක් බවට පත් වෙනවා. South Asian Institute of Technology and management කියන එක South Asian Institute of Technology and Medicine කියලා වෙනස් කර ගන්නවා. එතකොට නිදහස් අධ්‍යාපනයේ අයිතිය සුරකින මෙවැනි අවස්ථාවක යම්කිසි උපාධි දෙන ආයතනයක් තමන්ගේ නමේ අකුරක් වෙනස් කර ගෙන, ඒ අකුර පාවිච්චි කරමින් වෛද්‍ය උපාධි දෙන ආයතනයක් බවට පත් කර ගත්තා නම්, ඒක හොර උපාධි කඩයක් නොවෙයිද කියලා මම මේ ගරු සභාවෙන් අහනවා. ඒ වාගේම මේ ආයතනය තුළ මේ කටයුතු සිද්ධ වෙද්දී BOI එකේ සභාපතිවරයා විසින් වෛද්‍ය සභාවට ලියුමක් යවනවා. මේ සම්බන්ධව තමන්ගේ මතය ප්‍රකාශ කරලා. ඒ ලියුම යවන්නේ. 2010.08.09 වැනිදා. BOI එකේ සභාපති SLMC එකේ සභාපතිට මේක යවන්නේ. වෛද්‍ය විද්‍යාලයකට කිසිදු අනුමැතියක් අරගෙන නැහැ BOI සමාගමක් විධියට. ඊළඟ අවස්ථාවේදී මේ ආයතනය පුවත්පත් දැන්වීම් දානවා. රුසියාවේ Nishley Newgrode ආයතනයේ, ඇකඩමියේ සම්බන්ධතාවය සහිතව තමයි මේ විශ්ව විද්‍යාලය පවත්වාගෙන යන්නේ කියලා. ඇයි එහෙම දාන්නේ? වෛද්‍ය විද්‍යාලයකට හෝ වෙනත් උපාධි ආයතනයකට අඛණ්ඩ සහ අවිච්ඡින්න පැවැත්ම ඕනෑ. ඒකේ උපාධි ප්‍රදානය කරන ආයතනයක් විධියට. මේ අඛණ්ඩ සහ අවිච්ඡින්නතාවය පවත්වාගෙන යන්න ලංකාවේ වෛද්‍ය විද්‍යාලය කොළඹ විශ්ව විද්‍යාලයට

සම්බන්ධ වෙලා තිබෙනවා. කොළඹ විශ්ව විද්‍යාලයත් එක්ක. ඒ වාගේම කොළඹ විශ්ව විද්‍යාලය ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයත් එක්ක සම්බන්ධතාවය පවත්වාගෙන තිබුණා, මේ අඛණ්ඩ සහ අවිච්ඡින්නතාවය පවත්වාගෙන යන්න. නැත්නම් ශිෂ්‍යයෝ මේකට බැඳෙන්නේ නැහැ. උපාධි ප්‍රදානය කරන්න බැහැ.

මෙන්න මේ තත්ත්වය ඇති කර ගන්න Nishley Newgrode කියන විශ්ව විද්‍යාලයත් එක්ක රුසියාවේ සම්බන්ධ වෙනවා. හැබැයි, මේ සම්බන්ධව වෛද්‍ය සභාව විපරම් කරලා ගත්තාට පස්සේ එහෙම Nishley Newgrode විශ්ව විද්‍යාලයත් සමඟ කිසිම අනුබද්ධිත සම්බන්ධයක් නැහැයි කියලා ඔවුන් දන්වනවා. In response to your previous email inquiry with regard to the State of Sri Lanka Campus or Nishley Newgrode State Medical Academy I would like to inform you that the date base of affiliate higher education Institution in the Russian Federation maintained by the National Affiliated Agency does not contain any information about the Sri Lankan Campus of Nishley Nowgrode State Medical Academy. This means that this joint programme is not affiliated in Russia. ඉතාමත් පැහැදිලිව ඒ ආයතනය කියනවා, ඒ ආයතනයත් එක්ක ලංකාවේ කිසිම විශ්ව විද්‍යාලයක් සම්බන්ධ වෙලා නැහැයි කියලා. අන්න දෙවැනි වංචාව. විශ්ව විද්‍යාලයක් විධියට රුසියානු විශ්ව විද්‍යාලයත් සමඟ අනුබද්ධිතයි කියලා ව්‍යාජ ලෙස සකස් කරනවා.

ඊළඟට එන්නේ මූල්‍යමය වංචාව. මූල්‍යමය වශයෙන් සිසුන්ට දැනුම් දෙනවා, ඒ රුසියානු විශ්ව විද්‍යාලට මුදල් යවන්න ඕනෑය කියලා, 22% ක මුදල් ප්‍රමාණයක් අර අහිංසක දරුවන්ගෙන් අය කර ගන්නවා. මේකට විරුද්ධව 2009 ප්‍රථම වසරේ ශිෂ්‍යයින්ගේ දෙමව්පියන් මානව හිමිකම් කොමිෂන් සභාවට දිවුරුම් ප්‍රකාශනයක් මගින් මෙය ඉදිරිපත් කරනවා. මගේ ළඟ ඒ දිවුරම් ප්‍රකාශනය තිබෙනවා. ඒ දිවුරුම් ප්‍රකාශනයෙන් ඒගොල්ලෝ කියන්නේ, අපේ දරුවන්ගෙන් 22% ක් වැඩිපුර මුදල් අය කර ගෙන රුසියානු විශ්ව විද්‍යාලයකට යවනවාය කියලා අපේ දරුවන්ව රවට්ටලා තිබෙනවා. මේ රැවටීමට රජය වගකියන්න ඕනෑය කියලා ඒකේ දෙමව්පියෝ දිවුරුම් ප්‍රකාශයකින් මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දෙනවා. මේ දෙවැනි වංචාව.

මෙන්න මේ කාරණා එකින් එක එන කොට ඊළඟට එනවා, වෛද්‍ය සභාවේ අනුමැතිය සම්බන්ධ ගැටළුව. එතකොට වෛද්‍ය සභාවේ අනුමැතිය ලබා ගෙන නැහැයි කියලා පුවත්පත් නිවේදන 18 ක් මහජනතාව වෙත ප්‍රදර්ශනය කරන්න වෛද්‍ය සභාව විසින් ප්‍රසිද්ධ කරනවා. මම මේ පුවත්පත් දැන්වීම ඔබතුමාට දැනුවත් කරන්න මේ සභාවට ඉදිරිපත් කරනවා.

*"ශ්‍රී ලංකා වෛද්‍ය සභාව. මහජනයා වෙත නිකුත් කරනු ලබන නිවේදනයයි. වෘත්තීය වශයෙන් අතරමං නොවන්න. වෛද්‍ය සභාවේ උපදෙස් පතන්න. වෛද්‍ය සභාවේ නිල වශයෙන් පිළිගැනීමට ලක් නොවූ මෙතෙර හෝ එතෙර හෝ වෛද්‍ය, දන්ත විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා සිසුන්ට අනියම් අන්දමින් දිරි දීම."*

මේ වැරදි දෙයක් කියන්නේ. ඊළඟට තිබෙනවා,

*"ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිර්ණය කර ඇති අවම සුදුසුකම් සපුරා නොමැති සිසුන් වෛද්‍ය, දන්ත වෛද්‍ය විද්‍යාලවලට වංචා සහගත සහ අනියම් ආකාරවලින් යොමු කිරීම."*

මේක බරපතළ දඬුවම් දෙන වරදක් විධියට සටහන් කරනවා. කිසියම් පුද්ගලයෙකු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි නොවී, ශ්‍රී ලංකාව තුළ බටහිර වෛද්‍ය, දන්ත වෛද්‍ය වෘත්තියේ නියැලෙනවා නම් දඬුවම් ලැබිය හැකි නීති විරෝධී ක්‍රියාවක් බව අවධාරණයෙන් දන්වා සිටිමු. ඒ නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආයතනය, ආයතනයක් විධියට නීත්‍යානුකූල නැහැයි කියලා කියන්න අපට අයිතිය තිබෙනවා. වෛද්‍ය සභාව විසින් ඒක පිළිගන්න ඕනෑ. අධිකරණයට ඒ ආයතනය පිළිගන්නවාය කියලා මේ වනකල් කොහේවත් කියලා නැහැ. ඒ නිසා අධිකරණ කටයුත්තක් විධියට පැවතුනත් මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආයතනය ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාව තුළ ලියාපදිංචි වෙලා නැහැයි කියලා ඉතාමත් පැහැදිලි සාක්ෂි සහිතව මම ඉදිරිපත් කරනවා.

[ ගරු අශෝක සපුමල් රන්වල ]

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මෙයට අනුමැතිය ලැබිලා නැහැ. හැබැයි, වෛද්‍ය උපාධියක් ලබා දෙන ආයතනයක් විධියට මේකට බඳවා ගත් සිසුන් පළමුවැනි බැජ් එකේ සිට දිගින් දිගටම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය සහිතයි කියලා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයේ මේ සඳහා අනුමැතියක් නොමැති බව හිටපු සෞඛ්‍ය අමාත්‍ය, වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ උපදෙස් පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ලියුමක් නිකුත් කරනවා. ශිෂ්‍යයින්ට දැනුවත් කරන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආයතනයට බැඳෙන අයව දැනුවත් කරන්න. මෙය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි නොවණු බව. ඒ සම්බන්ධව මේ ලිපිය මම සභාගත කරනවා. වෛද්‍ය සභාව විසින් සයිටම් ආයතනය පිළිනොගන්නා බව ප්‍රකාශ කර තිබියදී පවත්වාගෙන යාම සම්බන්ධව තමයි සෞඛ්‍ය අමාත්‍යවරයා, දැනට ජනාධිපතිවරයා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් මේ ලිපිය නිකුත් කරන්නේ, Medical council එකට. 2013.04.05 වැනිදා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේ ලිපිය නිකුත් කරන්නේ. වෘත්තීමය වශයෙන් අතරමං නොවන්න කියලා. ඊළඟට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මෙවැනි තත්ත්වයක් යටතේ හෝ මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආයතනයට යම්කිසි අනුග්‍රහයක් ලබා දෙන්න පුළුවන්ද? අනුමැතියක් ලබා දෙන්න පුළුවන්ද කියලා බලන්න මොනිටර් කරනවා. මෙය සොයා බැලීමේදී ඔවුන් මාස හයක කාලයක් දෙනවා. ඒ ප්‍රමිතිය හදා ගන්නය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආයතනයට මාස හයක කාලයක් දෙනවා තමන්ගේ ප්‍රමිතිය හදා ගන්න කියලා. UGC එක. මේ මාස හය ඉවර වෙන්න දින අටක් තිබෙද්දී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආයතනයේ උපාධි ප්‍රදානය කිරීමේ බලය සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා ගන්නවා. අර නිර්ණායක ටික සපුරන්නේ නැතිව, දේශපාලන බලය පාවිච්චි කරලා ඔවුන් විශ්වාස කරනවා, සයිටම් ආයතනය කොහොම හෝ ආණ්ඩුවේ ලියාපදිංචි කර ගෙන Medical council එකට දාලා ලියාපදිංචි කරන්න පුළුවන් වෙයි කියලා. ඔවුන් කිසිදු නිර්නායක, අර UGC එක කියපු ඒවා සපුරන්නේ නැහැ. ඒ නිසා තමයි ශිෂ්‍යයින් මේ ආයතනයට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

හොර උපාධි කඩය කියලා ආමන්ත්‍රණය කරන්නේ. නිකම් ඇති වුණු දෙයක් නොවෙයි. පෞද්ගලික ආයතනයකට මෙවැනි බරපතළ චෝදනාවක් කරනවා නම්, ඒකේ වගකීම මම සම්පූර්ණයෙන්ම භාර ගන්නවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

හොර උපාධි කඩය කියලා කියන්නේම මේ නිල ලියකියවිලි මගේ අතේ තියාගෙන. පළාත් සභා මන්ත්‍රීවරයෙකු විධියට මම ඕනෑම අධිකරණයකට ගිහිල්ලා මේක හොර උපාධි කඩයක් කියලා කියන්න තිබෙන ඒ අයිතිය අධිකරණයේදී මම තහවුරු කරනවා. මේ පළාත් සභාවේ සියලු දෙනාම වගකියන්න ඕනෑ නැහැ ඒකට. මම ස්වාධීනව වගකියනවා. මේ -

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

හොර උපාධි කඩය, හොර උපාධි කඩයක් කියලා ප්‍රකාශ කරන්න මා ළඟ ඕනෑවටත් වඩා Documents තිබෙනවා. මේක ආරම්භය හොරකම. මේ දක්වා හොරකම. අවසාන හොරකම තමයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

ආයතනයේ සමීර සේනාරත්න මහත්තයා විධායක නිලධාරියා විධියට කරපු රඟපෑම. අද වන කොට පොලීසියෙන් ඔහුව සොයනවා. විදේශ රටකට පලා ගිහිල්ලා. තමන්ගේ වාහනය -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒකේ උසාවියේ නඩුවක් පවතිනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

උසාවියේ නඩුවක් පවතිනවා නම්, ඔහු ඇවිල්ලා පෙනී සිටින්න ඕනෑ. ඔහු පැනලා ගිහිල්ලා. ඔහුව ගේන්න කියලා අපි මේ කියන්නේ. ඒ වාහනයට වෙඩි තියලා, මැජෙස්ට්‍රේට් ඇවිදිල්ලා වාහනයේ දොර අරිද්දී වීදුරු ටික කඩාගෙන වැටෙනවා. වාහනයේ ඩ්‍රයිවර් මේකෙන් පැනලා ගිහිල්ලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා කරන කථාව අපි පක්ෂ නායකයින් ගත්ත තීන්දුවට පටහැනි කථාවක්. මොකද, අපි ගත්තේ රීති අනුව උසාවියේ පවතින කාරණා සම්බන්ධයෙන් කථා කරන්න බැහැයි කියලා. ඒක අපි පිළිගන්නවා. විශේෂයෙන්ම ඔබතුමා මගින් මේ මාධ්‍යවේදීන්ටත් කියන්න ඕනෑ, පක්ෂ නායකයින්ගේ එකඟතාවය ආවේ ඒ ආයතනය ගැන කථා කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ ආයතනය ගැන කථා නොකර - විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා උපදෙස් දුන්නේ, මේ රටේ රාජ්‍ය විශ්ව විද්‍යාල ක්‍රමවත් කරන්න කියන කථාවයි. ඒ කථාවේ මහ ඇමතිතුමා ඉන්නවා. සයිටම් විශ්ව විද්‍යාලය ගැන කථා කරන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් ඔබතුමා මාධ්‍යවේදීන්ට කියන්න. එකඟතාවයට පටහැනියි මේ කථාව. වාර්තා කරන කොට සභා රීතිවලට අනුව කටයුතු කරන්න කියලා ඔබතුමා ඉල්ලන්න. මට කථා කරන්න බැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පක්ෂ නායකයින් එකඟතාවයට ආවේ එතැනට.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

එහෙම කථා කරන්න බැහැ නේ? ඉඩ දීලා තිබෙනවාද මින් ඉදිරියේ එහෙම.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මාධ්‍යවලට කියන්න ඕනෑ, එහෙම.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මම ඒ අවස්ථාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මාධ්‍ය ආයතන වගබලා ගන්න. සියලුම පක්ෂ නායකයෝ එකතු වෙලා සාකච්ඡා කළේ මේ සම්බන්ධව නොවෙයි. මේ රටේ පෞද්ගලික විශ්ව විද්‍යාල ගැන නොවෙයි කථා කළේ. රාජ්‍ය විශ්ව විද්‍යාල ක්‍රමවත් කරන්න කියන හැඟීමෙන් තමයි කථා කළේ. මාධ්‍යත් ඒ ගැන කල්පනාකාරීව කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, UGC එකෙන් කරපු ඊළඟ වංචාව මම කියන්නම්. මේ ආයතනය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එනවා. පකිස්තාන ශිෂ්‍යයෝ දෙන්නෙක් animal science කරන්න ලංකාවට එන්නේ. තමන්ගේ රටේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළින් ලැබුණු විශේෂ වරප්‍රසාදයක්, ශිෂ්‍යත්වයක් සහිතව පකිස්ථාන ජාතික ශිෂ්‍යයින් දෙන්නෙක් එනවා, මේ අධ්‍යාපනය ලබන්න. Animal science කරන්න එන්නේ. ලංකාවේ විශ්ව විද්‍යාලයත් ගිහිල්ලා, පකිස්ථානයේ විශ්ව විද්‍යාලයත් එක්ක

[ ගරු අසෝක සපුමල් රන්වල ]

අනුබද්ධිතව මේ ශිෂ්‍යත්ව ක්‍රමය ක්‍රියාත්මක කරලා ඉවර වෙලා ලංකාවට ආපු මේ ශිෂ්‍යයින් දෙන්නාට animal science වලින් අයින් කරලා ඉවර වෙලා මෙඩිකල් ඩිග්‍රිය හදාරන්න විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සල්ලි ලබා දෙනවා,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනයට අනුයුක්ත කරලා. මෙලෙස අනුයුක්ත කරලා, මෙවැනි ආයතනයකට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල් වෙන් කරන්න, මොකක්ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට තිබෙන අයිතිය? මේ හොර උපාධි කඩයට යොමු කරලා ඉවර වෙලා ඔවුන්ට වෛද්‍ය විද්‍යාව හදාරන්න - මොකද, මේ අවශ්‍යතාවය තිබෙන්නේ, දේශපාලකයින්ට ඕනෑ මේ ආයතන ඇතුළේ විදේශ සිසුනුත් අධ්‍යාපනය ලබනවාය කියලා පෙන්වන්න. ඒකෙන් ඔවුන් බලාපොරොත්තු වෙනවා, එවැනි හොර උපාධි කඩයකට අවශ්‍ය ලයිසන් එක සකස් කර ගන්න. මේ ගැන කථා කරන්නේ නැතිව රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරන්නේ කොහොමද? රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරනවාය කියන්නේම ව්‍යාජ ලෙස, වැරදි ලෙස වංචනිකව පවත්වාගෙන යන වෛද්‍ය විද්‍යාල අහෝසි කරනවාය කියන එක. ඒ නිසා රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරන්න නම් මෙවැනි තිබෙන වංචා, හොර උපාධි කඩ වහන්න ඕනෑ රටේ. ඒ හොර උපාධි කඩ පවත්වාගෙන යාම සම්බන්ධව සමීක්ෂණ කරන්න ඕනෑ. ජනතාව තුළ ඒ සම්බන්ධව සංවාදයට ලක් කරන්න ඕනෑ. දිගින් දිගටම පාර්ලිමේන්තුව තුළ මේ සම්බන්ධව සංවාදය කළා. පහුවුණු පෙබරවාරි මාසයේදී මේ සම්බන්ධව සංවාදයට ලක් කළා. ඒ නිසා සංවාදය තුළින් තමයි වඩාත්ම හොඳ දේ අපට මතු කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. විශ්ව විද්‍යාල පද්ධතියක් විධියට ඒ විශ්ව විද්‍යාල පද්ධතියේ ස්වෛරීත්වය, ස්වාධීනත්වය ආරක්ෂා වෙන්නේම යම්කිසි තැනක රජය වගකියන්න ඕනෑ, වැරදි විධියට උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වන්න, උපාධි ප්‍රදානය කරන්න කටයුතු කරන ආයතනයක් තිබෙනවා නම්, ඒ ආයතනය වහාම අහෝසි කරන්න රජය මැදිහත් වෙන්න ඕනෑ. නිකම්ම අපි කථා කළාට රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරන්නය කියලා එහෙම අහඹු ලෙස නිකම්ම ශක්තිමත් වෙන්නේ නැහැ, කථාවකින්. හැබැයි, රජය වගකියන්න ඕනෑ. රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරනවා නම්, අයාලේ යන, කිසිම ප්‍රමිතියක් නැති යම් හොර ආයතනයක් තිබෙනවා නම්, ඒ ආයතනය වහලා දාලා ඒකේ සිසුන්ට යම් සාධාරණයක් කරනවාද නැද්ද කියන එක දිගින් දිගටම ප්‍රවෘත්ති නිවේදන 18 ක් ඉදිරිපත් කරලත්, ඒකේ දෙමව්පියන් විසින් සිය දරුවන්ව ඒ ආයතනයට දැමීම සම්බන්ධව ඒ දෙමව්පියෝ වගකියන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

විශ්ව විද්‍යාල හතරක් දානවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අලුතෙන් දානවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපේ විපක්ෂ නායකතුමා කියනවා, විශ්ව විද්‍යාල හතරක් අලුතෙන් දානවාලු.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

විපක්ෂ නායකතුමා නොවෙයි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

හිටපු විපක්ෂ නායකතුමා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආයතනය දිගින් දිගටම බරපතළ විධියට ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන නිසා අපේ රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතියේ සිසුන්ට අසාධාරණයක් වෙන නිසා නොවෙයි මේ ශිෂ්‍යයින් පාරට බැහැලා තිබෙන්නේ. මේ ශිෂ්‍යයෝ මේ වන කොටත් වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වෙලා තමන්ගේ උපාධි ලබා ගන්න සුදුසුකම් සම්පූර්ණ කරලා තියෙනවා. මේ ශිෂ්‍යයින් මේ හඬගාලා කියන්නේ

අපේ රටේ වෛද්‍ය, සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කරන්න නම්, මේ විධියට අනියමාර්ථයෙන් ඉදිරිපත් වන මෙවැනි වෛද්‍ය උපාධි කඩ බිහි වීම ඉතාමත් බරපතළ අනතුරුදායක තත්ත්වයක්. ඒක නවත්වන්න ඔවුන් ශිෂ්‍ය සටන් හරහා පුළුවන් උපරිම වෙහෙස දරනවා. ඒ නිසා රජයක් විධියට මෙවැනි හොර උපාධි ලබා දෙන ආයතන සම්පූර්ණයෙන්ම වහලා දාලා, කඩිනම් ක්‍රියාමාර්ගයක් අරගෙන මේ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතු දිගටම කර ගෙන යෑම සඳහා මේ සභාවෙන් තීන්දුවක් ගන්න ඕනෑ, රජයට බල කරන්න. මේ තීන්දුව ගන්නේ නැතිව රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරන්නේ කොහොමද කියලා මම අහනවා. ඒ වාගේම දේශපාලඥයින් විධියට දිගින් දිගටම මේ ආයතනය ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ මොකද කියලා. මම ළඟ ලේඛනයක් තිබෙනවා. ඒ ලේඛනය සභාගත කරනවා. නම් වශයෙන් තිබෙනවා. දේශපාලඥයින් මෙන්න මේ ආයතනයට මැදිහත් වෙන්නේ කුමන අරමුණක් වෙනුවෙන්ද කියලා. තනි තනි පුද්ගලයෝ විධියට තමන්ගේ දරුවා, තමන්ගේ ඥාතියාගේ දරුවා, එහෙම නැත්නම් තමන්ගේ හිතවතාගේ දරුවා මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනයේ ඉගෙන ගන්නවා. යම්කිසි විධියට ඔවුන්ට ඒ සම්බන්ධව ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා, ශිෂ්‍යත්ව විධියට. ඒ ලබා දුන් සෑම ආකාරයකදීම තමන්ගේ දරුවන් සුරක්ෂිත කරන්න කටයුතු කිරීම ඉතාමත් නින්දා සහගතයි. ඉතාමත් කැතයි.

එදා පාර්ලිමේන්තුව තුළ නිදහස් අධ්‍යාපන පනත ගේන කොට තමන්ගේ දරුවන් විදේශ විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබද්දීත්, මේ ඉන්න තාත්තලා නිදහස් අධ්‍යාපනයට කැමැති වුණේ, අහිංසක ගොවියන්ගේ දරුවන්ට, අහිංසක කම්කරුවන්ගේ දරුවන්ට, අහිංසක ධීවරයන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය තමන්ගේ හෘද සාක්ෂියෙන් පිළිගත් නිසා. ඒ නිසා මේ රටේ දුක් විඳින ඈත ගම්බද ප්‍රදේශවල ඉන්න ගොවියන්ට කවදාවත්, කොපමණ ලකුණු කිට්ටු කරලා තිබුණත් වෛද්‍ය විද්‍යාලයට ඔය කියන හොර උපාධි කඩවලට ඇතුළත් වීමේ අයිතිය ලැබෙන්නේ නැහැ. ඒවායෙන් උපාධි ලබා ගන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ලකුණක් දෙකක් එහාට වෙලා තිබුණත්, ඈත ගම්බද ප්‍රදේශවල ඉන්න ගොවියෙකුගේ දරුවෙකුට මේ අවස්ථාව ලැබෙන්නේ නැහැ. කොළඹ ප්‍රදේශයේ ඉන්න ඉතාමත් අඩු ආදායම්ලාභී දරුවෙකුට තමන්ගේ තාත්තලාට පුළුවන්කම තිබෙනවාද මෙවැනි ආයතනයකට දාලා ඉවර වෙලා අධ්‍යාපනය ලබා ගන්න. ඒ නිසා අපේ රට ඇතුළේ යම්කිසි විධියට සමානාත්මතාවය ගැන විශ්වාස කරනවා නම් - මේක මම නොවෙයි කියන්නේ. ජනතා විමුක්ති පෙරමුණෙන් නොවෙයි කියන්නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය මේ ගමන ඉදිරිපත් කරපු තිරසාර සංවර්ධන ඉලක්ක 17 ඉලක්ක 04 සහ ඉලක්ක 10 ලෙස ඉදිරිපත් කරලා තිබෙනවා. රටක අධ්‍යාපනයේ සමානාත්මතාවය, සෑම කෙනෙකුටම අධ්‍යාපනය ලැබීමට තිබෙන අයිතිය, මුදල් නැතිකම නිසා වහන්න එපාය කියලා. මේ කාරණයම තමයි එදා නිදහස් අධ්‍යාපන පනත ගේන කොට දීර්ඝ ලෙස ඇන්.ඇම්. පෙරේරා මහත්තයා පැහැදිලි කළේ. ඒ තුළ ඉතාමත් ගැඹුරින් කථා කරලා තිබෙනවා. තමන්ගේ දරුවාට අධ්‍යාපනය දීමේ අයිතිය අම්මා තාත්තාට හැකියාව මත නම් තීන්දු කරන්නේ, සමහර අයට පහේ පන්තියෙන් පාසල් හැර යන්න සිද්ධ වෙනවා. සමහර අයට දහය පන්තියෙන් පාසල හැර යන්න සිද්ධ වෙනවා. සමහර අයට විශ්ව විද්‍යාල ප්‍රවේශයෙන් පාසල හැර යන්න සිද්ධ වෙනවා. එහෙම වුණාට පස්සේ දක්ෂ දරුවෝ ඉදිරියට ඒම නතර වෙනවා. ඒ නිසා යම් ඉගෙනීමක් කළ හැකි, දක්ෂතාවය මත ඉදිරියට එන්න පුළුවන් හැකියාව අද වන කොට තහවුරු වෙලා තිබෙනවා. ඒ නිසා මේ සභාව මේ යෝජනාව රජයට කළ යුතුයි. විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ශක්තිමත් කිරීමේ වුවමනාව මත මේ හොර උපාධි කඩ වහලා ඉවර වෙලා, දරුවන්ට තම අධ්‍යාපනය නිදහසේ කර ගෙන යෑමේ අයිතිය වඩාත් හොඳින් තහවුරු කරන්නය කියලා මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. ඔබ සියලු දෙනාටම බොහොම ස්තුතියි.

[පූ.භා. 11.57]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කථා කරන්න ඕනෑ කාරණයක්, අද රටේ වැදගත් මාතෘකාවක් පිළිබඳවයි මේ සාකච්ඡාව කෙරෙන්නේ. මෙතැනදී අපි පැහැදිලිව කියන්න ඕනෑ. දැන් මේ සිද්ධිය සම්බන්ධයෙන්

අද අපේ රටේ බලවත් ලෙස ජන ජීවිතය කඩා කප්පල් වෙලා තිබෙනවා. ඇතැම් අය කිසිම පදනමක් නැති
[ ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

විරෝධතා උද්ඝෝෂණ හරහා අද බරපතළ ලෙස ජන ජීවිතයේ කඩා වැටීමකට පත් වෙලා තිබෙනවා. එතකොට මේ කථා කරන මාතෘකාව නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කාරණාවේදීත් ඒ ආකාරයෙන්ම එසේ සිදු වෙමින් තිබෙනවා. මෙතැනදී මම දකින කාරණාව තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්න ඕනෑ කියන තැන පළාතේ ප්‍රධාන ඇමතිවරයා හැටියට විතරක් නොවෙයි, පෞද්ගලිකවත් මම දරන මතය. නමුත් අපි මොනවා කිව්වත්, අද එක වසරකට ශිෂ්‍යයෙකු ඇතුළත් කිරීමෙන් පටන් ගන්නා පෞද්ගලික අධ්‍යාපනය අද උසස් අධ්‍යාපනය දක්වා, විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා ව්‍යාප්ත වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නයේදී මම දකින්නේ පෞද්ගලික විශ්ව විද්‍යාල විධිමත් නොකිරීමේ හේතුව උඩ අපේ ගම්වල ඉන්න අහිංසක දෙමව්පියන්ගේ දරුවන් උසස් අධ්‍යාපනයක් ලබන්න වෛද්‍ය විද්‍යාව ඇතුළු කොටගත් උසස් අධ්‍යාපනයක් ලබන්න අපේක්ෂා කරන අහිංසක දෙමව්පියන්ගේ ලක්ෂ ගණන්, කෝටි ගණන් දේපළ, වස්තුව අවසානයේ, ඒ සියලුම දරුවන් වෙනුවෙන් මුදල් මිලියන ගණන්වලට පත් වෙලා විදේශීය පෞද්ගලික විශ්ව විද්‍යාලවලට, විදේශීය විශ්ව විද්‍යාලවලට යනවා. එහෙම නම් අපේ රටේ ඒ ජනතාව පිටරට යාම අපි නවත්වා ගන්න ඕනෑ. ඒක අපි කරන්න ඕනෑ.

දැන් අපි ඔය කථා කරන සිද්ධිය සම්බන්ධයෙන් අපි කල්පනා කරලා බැලුවාම මම කියන්න කැමැතියි. මේ අපේ රටේ පෞද්ගලික විශ්ව විද්‍යාලය විධිමත්ව පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවයක් තිබෙනවා. මේ සටන් පාඨ උද්ඝෝෂණය කරන්නේ එක කණ්ඩායමක් විතරයි. හැබැයි, මේ උද්ඝෝෂණ නොකර, සටන් පාඨ නොකියන ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මේ රටේ ඉන්නවා. ඒ මිනිස්සු ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. දැන් මට මේ ළඟදී කථා කළා දැනට මාතෘකා වෙලා තිබෙන පුද්ගලික විශ්ව විද්‍යාලයක ඉන්න දෙමව්පියෙක්. එතුමිය වෛද්‍යවරියක්. වෛද්‍යවරියක් විතරක් නොවෙයි. එතුමිය අධ්‍යාපනයේ විශේෂ ජයග්‍රහණ ලබපු උගත් කාන්තාවක්. එතුමිය මට කථා කරලා කියනවා. ගරු මහ ඇමතිතුමා, මේ අසාධාරණය අපේ දරුවන්ට කරන්න දෙන්න එපා. මේක අපේ දරුවන්ට කරන විශේෂ වරප්‍රසාදයක්. අපේ මානසිකත්වය තේරුම් ගන්න. මම වෛද්‍ය විද්‍යාව හදාරලා, වෛද්‍යවරයෙක් විධියට උසස් අධ්‍යාපනය ලබලා අද මහාචාර්ය තත්ත්වයට මම පත් වෙලා ඉන්නවා. එතකොට මගේ දරුවාට මේ රටේ තිබෙන වරද නිසා, මේ රටේ තිබෙන වැරදි ක්‍රමය නිසා ලකුණු දෙකක් අහිමි වුණු නිසා මගේ දරුවාට වෛද්‍ය පීඨයට ඇතුළත් වෙන්න බැරි වෙනවා. ඒ නිසා මගේ තිබෙන තත්ත්වය ආරක්ෂා කරන්න, මගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කරන්නයි මම ඔය කියන ආයතනය දැම්මේ. අද අපි අසරණ වෙලා ඉන්නේ. මේ වාගේ අම්මලා කොයි තරම් ඇත්ද? පෞද්ගලික විශ්ව විද්‍යාලයට පිටරට යවන අපේ දෙමව්පියෝ කොයි තරම් ඉන්නවාද? අපි ඒ කවුරුත් ඔය උද්ඝෝෂණය කරන කවුරුත්, පෙළපාලි යන කවුරුත් ඒ මිනිස්සු ගැන හිතුවේ නැහැ. දැන් මම ගත්තෝ ආසන්න වශයෙන් මේ යෝජනාව ඉදිරිපත් කරන ජනතා විමුක්ති පෙරමුණ සාමාන්‍යයෙන් මතුවට තිබෙන්නේ මේ එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් වඩා ප්‍රගතිශීලී පක්ෂයක් හැටියට. මානුෂිකව දැන් සාමාන්‍යයෙන් අපි පාලකයෝ නිසා පාලක කණ්ඩායම්වලට චෝදනා එනවා. එක්සත් ජාතික පක්ෂයටත් එනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් අඩු වැඩියෙන් ඒ විවේචන එනවා. ඒක සාධාරණයි.

හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ කවදා හරි පාලනය කරපු දවසට තමයි ඒගොල්ලන්ගේ වැඩ ටික අපට බලාගන්න වෙන්නේ. හරිද? (බාධා කිරීම්) අපට බලාගන්න වෙන්නේ එතකොට. මොකද, ඉගිල්ලෙන කොට තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කුරුල්ලාගේ පාට පේන්නේ. දැන් අපි දෙගොල්ලෝ ඉගිල්ලිලා තිබෙන්නේ. අපට මේ අත්දැකීම තිබෙනවා. ඒ නිසා මේ කාරණාවේදී පෞද්ගලික විශ්ව විද්‍යාල පිළිබඳව සහ ඔය අපි අද මේ රටේ මාතෘකා වෙලා තිබෙන පෞද්ගලික විශ්ව විද්‍යාලය ගැන, ඒ අගතියට පත් වූ කාරණය සම්බන්ධයෙන් රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරන්න වාගේම, මේකට අගතියට පත් වුණු දරුවන් වෙනුවෙනුත් ඒගොල්ලන්ට අයිතියක් තිබෙනවා කථා කරන්න, ඇත්ත කථා කළොත් එහෙම. අගතියට පත් වුණු අය. ඒ නිසා මම ඉන්නේ එතැන. පළාතේ ප්‍රධාන ඇමතිවරයා හැටියට. ඒ නිසා මට තිබෙන දුක, - අද British council තිබෙනවා. ගම්වල ඉන්න අපේ අම්මලා, තාත්තලා ඔක්කොම ඉංග්‍රීසි A, B, C වත් දන්නේ නැති අපේ අම්මලා ගිහිල්ලා දානවා

British council. කවුරුවත් කල්පනා කරන්නේ නැහැ, එතැන සිද්ධ වෙන දේ ගැන. ජනතා විමුක්ති පෙරමුණ කථා කරන්න ඕනෑ British council එක ගැන. අධිරාජ්‍ය විරෝධී නම් ඔබතුමන්ලා කථා කරන්න ඕනෑ එතැන. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කියන්න දුකයි. සුද්දෝ අදත් තරහයි උන්ව අපි රටෙන් එළෙව්වාට. සුද්දෝ අදත් විරුද්ධයි. හැබැයි, සුද්දෝ අද ගිහිල්ලා අපට දුන්න, එංගලන්තේ දුන්න ෂොට් එකක් තමයි British council. එදා අපේ රන්, රිදී, මුතු, මැණික් ඔක්කොම කොල්ල කෑවා. දැන් අපේ අහිංසක අම්මලාගේ සල්ලි, පෞද්ගලික පන්ති දාලා කොල්ල කනවා. ඒවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතිතුමනි, ඒවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒකයි අපට තිබෙන කනගාටුව.

හැබැයි, අපට මිනිස්සු ඇවිල්ලා, දෙමව්පියෝ ඇවිල්ලා මේ ගැන කියනවා. ඉතින් ඒ නිසා මීට වඩා භයානක යාන්ත්‍රණයක් මේ රටේ ක්‍රියාත්මක වෙනවා. මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ සල්ලි පිටරටට යන්නේ. ඒක නතර කරන්න වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. ඒ නිසා අපි රජයට යෝජනා කරන්නේ මේ පෞද්ගලික විශ්ව විද්‍යාලය විධිමත් කරන්න ඕනෑ. ඔය කියන ආයතනය අපි පවරා ගන්න ඕනෑ. අපි පවරා ගෙන ඉවර වෙලා විධිමත් විධියට - දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා. මට හරිම සතුටුයි. ඔබතුමාගේ දරුවා වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වුණා. ඒක අපට ආඩම්බරයක්. මම මහ ඇමතිවරයා හැටියට, තාත්තා කෙනෙකු හැටියට මට ඒ ගැන ලොකු ආඩම්බරයක් තිබෙන්නේ. හැබැයි, එහෙම යන්න බැරි වෙන, ඔබතුමාගේ දුවත් එක්ක ඉගෙන ගෙන, Z score එක නිසා A 3 අරගෙන ගෙදර යන්න වෙන ළමයා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ නේ? ඔය විශ්ව විද්‍යාලවල ඉන්න ඇතැම් ආචාර්ය, මහාචාර්යවරුන්ට සහ විශ්ව විද්‍යාලවල ඉන්න ඇතැම් ශිෂ්‍යයින්ට තිබෙනවා පුදුම කුහකකමක්. ඊර්ෂ්‍යාවක්. මේක ඇත්ත කියන්න ඕනෑ. මේක කියන්න අපි භය වෙන්න ඕනෑ නැහැ. ඇතැම් මහාචාර්යවරුන්ට බන්දුල ගුණවර්ධන මැතිතුමා ගණිතය විෂයයට සංශෝධනයක් ඉදිරිපත් කළා. විරුද්ධ වුණේ, ආචාර්ය මහාචාර්යවරු. පසුගිය සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය අසමත් වෙලා ජීවිතය අහිමි කර ගත් දරුවන් වෙනුවෙන් වගකියන්න ඕනෑ මේ රටේ ඉන්න උගත් ආචාර්යවරු, මහාචාර්යවරු. ඒකට ඒගොල්ලෝ වගකියන්න ඕනෑ. මේක ප්‍රශ්නයක්. මේ ගණිතය අපි හැමෝටම තිබෙන ප්‍රශ්නයක්. මේකට හැමෝම මුහුණ දෙනවා. කවුරුවත් මේ ගැන කථා කරන්නේ නැහැ. ඒ නිසා අපට මොකටද සාමාන්‍ය පෙළට විෂයයන් නවයක්. අපට මොකටද සාමාන්‍ය පෙළ විෂයන් නවයක්.

මම කථා කරන්නේ නැහැ පින්ලන්තය ගැන. පින්ලන්තයේ අධ්‍යාපනය ගැන මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා කියයි. මෙතුමා මට කිව්ව නිසා මම මේ සභාවේ ඒක කියන්න යන්නේ නැහැ. මම සාමාන්‍යයෙන් අනුන්ගේ එකක් උදුරා ගන්නේ නැහැ. එතුමා එතුමාගේ කථාවේදී ඒක කියයි. අපට මොකටද විෂයයන් නවයක්. ඔබතුමා ඔබතුමාගේ කථාවේදී ඒ ගැන කියන්න. මම කියන්න යන්නේ නැහැ. මේ අපේ අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය වෙන්න ඕනෑ. අධ්‍යාපනය විතරක් නොවෙයි අපේ මිනිස්සුන්ගේ බුද්ධිය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ. එහෙම නැතිව. දැන් අද මොනවාද වෙන්නේ? අද මේ රටේ මොනවාද සිද්ධ වෙන්නේ. මට මේ ළඟදී මේ රටේ කොළඹ නගරයේ තිබෙන ප්‍රධාන මුස්ලිම් සහ දෙමළ පාසල්වල විදුහල්පතිවරු හමු වුණා. ඒගොල්ලන්ට තිබෙන ප්‍රශ්න. ඒගොල්ලන්ට තිබෙන ප්‍රශ්න සහ ගැටළු නිසා ඒගොල්ලෝ හරි නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැමදාම උද්ඝෝෂණය කරන්න ඕනෑ. දැන් පාසල්වලටත් උද්ඝෝෂණ රිංගලා. අද බලන්න. ඔක්කොම බෞද්ධ පාසල්වල උද්ඝෝෂණ. අපේ බෞද්ධ පාසල්වල තමයි මේ කුමන්ත්‍රණය තිබෙන්නේ. පසුගිය දවස්වල කොල්ලෝ පනහක් විතර පැන්නා කාන්තා පාසලකට. මේ බෞද්ධ පාසල්. අද විශාල බලපෑමක් සිද්ධ වෙනවා. මේවා ඔක්කොම සිද්ධ වෙන්නේ, අපේ සිංහල බෞද්ධාගම ගැන කථා කරන මිනිස්සුන්ට තමයි ඔක්කොම අසාධාරණය වෙන්නේ. මම ජාතිවාදය කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලා දන්නවා, මොකක්ද මම ඉන්න තැන කියලා. මුස්ලිම් හා දෙමළ මිනිස්සු සම්බන්ධයෙන් මම ඉන්න තැන ඔබතුමන්ලා දන්නවා. මේ සභාවේ ඉන්න දෙමළ, මුස්ලිම් සහෝදරවරු දන්නවා. අද විශ්ව විද්‍යාලවල දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කිරීම විතරක් නොවෙයි. තමන්ගේ දේශපාලන ඕනෑ එපාකම් වෙනුවට මේ අහිංසක දෙමව්පියන්ගේ දරුවෝ පාවිච්චි කරනවා. ගම්වලින් විශ්ව විද්‍යාලවලට එන දරුවෝ දුප්පත්කම කරපින්නාගෙන එන්නේ. ඒ දරුවාගේ මොළයට විෂ දානවා. විෂ දාලා ඒ දරුවන්ගේ තරුණ ජීවිතය අද විනාශ කරනවා. අද

මේ රටේ ඉන්න වැදගත්, උගත් දෙමව්පියෝ මොකක්ද කරන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සමාජයේ
[ ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා ]

ගිහිල්ලා කථා කරන කොට හුඟක් දෙමව්පියෝ මොකක්ද කරන්නේ? මේ රටේ A/L කරලා වැඩක් නැහැ. මේ රටේ A/L කරලා විශ්ව විද්‍යාලයට යන්න ගියොත් ළමයාට අවුරුදු 28 ක් 30 ක් වෙනවා. මේකයි ඇත්ත කථාව. අපේ දරුවෙක් විශ්ව විද්‍යාලයට ගියොත් අවුරුදු 28 ක් 30 ක් වෙනවා. තරුණ කාලේ ගිහිල්ලා ඉවරයි. ඒ නිසා දැන් අපේ රටේ මිනිස්සු මොකද කරන්නේ? ඇති හැකි මිනිස්සු කරන්නේ O/L පාස් වුණු හැටියේ ළමයාව පිටරට යවනවා. අවුරුදු 22 වනකොට ඒ ළමයා ලෝකයේ තිබෙන සියලුම - (බාධා කිරීමක්) මේ ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. අද ඔය ප්‍රගතිශීලීකම ගැන කථා කරන, ඔය විශ්ව විද්‍යාල ගැන කථා කරන අය කඬේ යන්නේ රටට නොවෙයි, ජාතියට නොවෙයි, විදේශිකයන්ට. විදේශිකයන්ට කඬේ යන්නේ. මේකෙන් ශක්තිමත් වෙන්නේ විදේශ රටවල්. මේ ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. මේක ඇවිල්ලා ජාතිය වෙනුවෙන්, නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් නොවෙයි. අපි දන්නවා ඇතැම් දේශපාලන කණ්ඩායම් හැමදාම විදේශ රටවලට කඬේ ගියා. මෙතැනදී සිද්ධ වෙන්නෙත් ඒක. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට වඩා මේ රටේ මිනිස්සු මේ ගැන කල්පනා කරලා බලන්න ඕනෑ. අද පාර වහලා තියෙන්නේ කවුද? මම මේ ළඟදී නිල නිවසේ ඉඳන් එනකොට කොළඹ විශ්ව විද්‍යාලය ළඟ පාර වහලා. ලොකු Traffic එකක්. මම බැලුවා මොකක් හරි Accident එකක් වෙලාද කියලා. මම හිතුවා Accident එකක් වෙලා කියලා. අනේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ පාරේ තුන්කාලක් වහගෙන විරෝධතා පවත්වනවා. මේකද අපේ උගත් ළමයින් කරන්න ඕනෑ. මේකද පරිණතභාවය. මේක උගත්කමද? නැහැ. අපේ උගත් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ තමන්ගේ උද්ඝෝෂණ පවත්වන්න ඕනෑ ඔය ආකාරයට නොවෙයි. මීට වඩා මානුෂික මෙහෙවරක් වෙන්න ඕනෑ. මේ උද්ඝෝෂණ නිසා ජීවිත කීයක් අහිමි වෙන්න ඇතිද? රෝගීන් කීදෙනෙක් ඝාතනය වෙන්න ඇතිද? අහිංසක මිනිස්සුන්ගේ ලක්ෂ ගණන්, මිලියන ගණන් - පැයක් පාරක බ්ලොක් වුණාම ඒක මාසෙකට ගණන් හැදුවාම මිලියන ගණනක් වෙනවා ඇති. මේවා ගැන කථා කරන්නේ නැහැ. ඇතැම් බලවේගවලට ඕනෑ මේ රට හැමදාමත් දුප්පත්කමෙන් තියන්න. මේක කාගේ උවමනාවක්ද? මේක ජාත්‍යන්තර උවමනාවක්. මේ ජාත්‍යන්තර උවමනාවක් සිද්ධ කරන්නේ. මේවා පරාජයට පත් කරන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනයට එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මේ රට කරවන කිසි කෙනෙක් ඒකට අරියාදුවක් කරන්නේ නැහැ. ඒක පාවලා දෙන්නේ නැහැ. මේ හැම දේශපාලඥයෙක්ම නිදහස් අධ්‍යාපනය ලබපු අය. ඒක කවුරුත් පාවලා දෙන්නේ නැහැ. අපි ඉන්න තැන, නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්න ඕනෑ. දැන් අපට කරන්න දෙයක් නැහැ. පුද්ගලික ඇවිල්ලා ඉවරයි. දැන් නිදහස් අධ්‍යාපනය ගෙවීගෙන යනවා. දැන් නිදහස් බෙහෙත් ශාලා නැහැ. දැන් මිනිස්සු රජයේ රෝහල්වලට දුවන්නේ නැහැ. දැන් මේවා වෙනස් වෙලා යනවා. ලෝකය වෙනස් වෙලා ඉවරයි. මේ නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කරන්න ඕනෑ. ඒ වාගේම විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙන්න බැරි දරුවන්ට මේ මහ පොළොවේ සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ කියන එක තමයි බස්නාහිර පළාත් සභාව යෝජනා කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බෙහොම ස්තුතියි ගරු ප්‍රධාන ඇමැතිතුමනි, මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව.

[අ.භා. 12.10]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ක්‍රමය සමස්තයෙන්ම ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ කියලා අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා කියපු කාරණාව හිස් මුදුනින් පිළිගනිමින් අද මේ යෝජනාව පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම

ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ යෝජනාවේ පැහැදිලිවම සඳහන් කරලා තිබෙනවා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධී වුත්, ඊළඟට තිබෙනවා ඒ අනුව මෙම සටනට මූලික විෂයය වී ඇති

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනය අහෝසි කරමි. ඒක තමයි විෂයය කරගෙන තිබෙන්නේ. හැබැයි ඒ කාරණා දෙකට පරිබාහිරව මෙහි අවසානයේ කියලා තිබෙනවා රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කළ යුතුයි කියලා. අන්න එතැන ඉඳගෙන තමයි අපට කථා කරන්න සිද්ධ වෙන්නේ. විශේෂයෙන්ම අද ජනතා විමුක්ති පෙරමුණ මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ කාලීනව ඔවුන්ගේ පැවැත්ම සඳහා. ඒක තමයි අපට දැනෙන දේ. එහෙම නම් මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියන ආයතනය පසුගිය රජය කාලයේ ආරම්භ කරපු වෙලාවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සියලුම සම්පත් දීලා, වරප්‍රසාද දීලා, වරදානයන් දීලා මේක ක්‍රමයෙන් පවත්වාගෙන යනකොට අද මේ තිබෙන උද්ඝෝෂණය මුලින්ම කඩලා දාන්න තිබුණා. නමුත් එහෙම කරන්න දුන්නේ නැහැ. මේක ලියලෙන්න දීලා, දීලා අවසානයේ ඒ දරුවෝ මේ උපාධිය ලබන්න සූදානම් වනකොට ඒ අවස්ථාව නැති කරනවා. දරුවෝ ඉන්න අම්මා කෙනෙක්ට, තාත්තා කෙනෙක්ට මේක හද කම්පා කරන කථාවක්. මට පෞද්ගලිකව සිදු වුණු දෙයක් ගැන කථා කරලා මම මේ කථාව පටන් ගන්නම්. මට ඉන්නේ පිරිමි දරුවෝ තුන් දෙනෙයි, එක ගැහැණු දරුවයි. ඒ දරුවාට දැන් අවුරුදු 18 යි මාස 02 යි. මගේ දරුවා ගියේ කතෝලික පාසලකට. ආණ්ඩුවේ ඉස්කෝලයකට. ගිහිල්ලා දෙවැනි පන්තියේ ඉන්න කොට ඒ කාලේ මම පළාත් සභාව නියෝජනය කෙරුවා. ඒ කාලේ පළාත් සභාව නියෝජනය කරන කොට මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හිටියා මොහාන් ලාල් ග්‍රේරු කියලා. එතකොට එතුමා වත්තල ප්‍රදේශයේ ලයිසියම් විද්‍යාලය පටන් අරගෙන අවුරුදු තුනයි හෝ හතරයි. මගෙන් දවසක් ඇහුවා සිරි දරුවෝ යන්නේ කොයි ඉස්කෝලවලටද කියලා. මම කිව්වා පිරිමි දරුවෝ තුන් දෙනා මේ ඉස්කෝලවලට යනවා. මගේ දුව මේ ඉස්කෝලයට යනවා කියලා. ඇයි අරගෙන එන්න දාලා දෙන්නම් කියලා කිව්වා. මම අස් කරගෙන ගිහිල්ලා දැම්මා. මම මේක කියන්න ඕනෑ. මේකත් සඳහන් කරන්න ඕනෑ. ඒ දරුවා උසස් පෙළ සමත් වනකල් එතුමා මගෙන් ශත පහක් අය කළේ නැහැ. ඒක පෞද්ගලික වරප්‍රසාදයක් හැටියට මට දුන්නේ. ඉතා හොඳ මට්ටමේ අධ්‍යාපනයක් තිබුණා. වත්තල ප්‍රදේශයේ තිබෙන ජාත්‍යන්තර පාසලක්. දැන් උසස් පෙළ විභාගය සමත් වනකොට මේ දරුවා කොහේ හරි විශ්ව විද්‍යාලයකට යන්න ඕනෑ. අද ඉන්න නාවික හමුදාපතිතුමා එක්ක මගේ සම්බන්ධයක් තිබුණා. එතුමා ඒ කාලේ රණවිරු සේවා අධිකාරියේ හිටියා. මම එතුමාට කියපුවාම කොතලාවල ඇකඩමි එකට දාලා දෙන්න පුළුවන්ද කිව්වාම, කිසි ප්‍රශ්නයක් නැහැ. A/L විභාගය පාස් වුණාම අරගෙන එන්න කියලා කිව්වා. මම හරි සන්තෝෂයෙන් ගියා. මොකද, රාජ්‍ය අනුග්‍රහය තිබෙන මේ රටේ විශ්ව විද්‍යාලයකට ගිහිල්ලා රජයේ හමුදාවකට බැඳිලා මගේ දරුවාගෙන් ඒ සේවය ලබා දෙන්න. නමුත් එතැනට ගියාම සිද්ධ වුණේ, ඒකට ජාත්‍යන්තර පාසල්වලින් එන අය ගන්නේ නැහැ. මේ ආණ්ඩුවේ විභාගය කරලා එන්න කිව්වා. අවුරුදු 18 යි මාස ගණනක මගේ දරුවාව රුසියාවට අරින්න මට සිද්ධ වුණා. අද අම්මත් නැතුව, ඒ දරුවත් නැතුව ඉන්නවා. මේක තමයි ඇත්ත සිද්ධිය. මේ දරුවන්ට ලංකාවේ අධ්‍යාපනය ලබන්න අවශ්‍ය කරන වටපිටාව සකස් කරලා දුන්නා නම් - අද මම වාගේ හුඟක් දෙනෙක් ඉන්නවා. ඒක නිසා මම අද කියන්නම් ආණ්ඩුවේ විද්‍යාලවලට විතරක් ඇතුළු වෙලා ඉගෙන ගන්න බැරි නිසා තමයි, මේ රටේ නිදහස් අධ්‍යාපනය මොන විධියේ කපීකාවකට ලක් වුණත්, ජාත්‍යන්තර පාසල්, පෞද්ගලික පාසල් මේ රටේ ආවේ. අද මෙතැන අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. මේ රටේ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දෙන හොඳ ගුරුවරයෙක්. හැබැයි පෞද්ගලිකව ලබා දෙන කෙනෙක්. ආණ්ඩුවේ ඉස්කෝලවලට ගිහිල්ලා නොවෙයි. හැමෝම දන්නවා. මේ වෛද්‍යවරුන්ට විතරක් මේ ප්‍රශ්නය ඇති කරන්නේ ඇයි? කිහිප දෙනෙකුගේ උවමනාවට. මේ රටේ පෞද්ගලික ආයතනවලින්, පෞද්ගලික විශ්ව විද්‍යාලවලින් ඉංජිනේරුවෝ බිහි වෙන්නේ නැද්ද? ගුවන් නියමුවෝ බිහි වෙන්නේ නැද්ද? ගණකාධිකාරීවරු බිහි වෙන්නේ නැද්ද? නීතිඥයෝ බිහි වෙන්නේ නැද්ද? ඇයි ඒකට මේ ප්‍රශ්නය ඇති කරන්නේ නැත්තේ?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා

Hon. Sumithlal Mendis - Minister

එහෙම නම් ඒ Flight එකේ යන්නත් බය වෙන්න ඕනෑ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔව්. ජීවිත ගණනාවක් එක්ක කඩාගෙන වැටෙනවා නේ? මේ කියන විධියට ප්‍රමිතියක් නැත්නම් වෛද්‍යවරු ගිහිල්ලා - එහෙම නම් පෞද්ගලික විද්‍යාලයකින් ඉගෙන ගත්තු ගුවන් නියමුවෙක් එක්ක ගුවන් යානයක යන්න බය වෙන්න එපැයි. එකම තැනකට විතරයි මේක සීමා කරලා තිබෙන්නේ. කිහිප දෙනෙකුගේ තිබෙන පටු උවමනාව ඉෂ්ට කරන්න. මට මතකයි ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ රාගම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ඉස්සෙල්ලාම ආරම්භ කළා. අද ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා සාක්ෂි දෙයි. ඒක නිසා රාගමට හොඳ රෝහලක් ලැබුණා. හොඳම රෝහලක් ලැබුණා. අවසානයේ මොකද වුණේ? රජයට පවරා ගත්තා. කමක් නැහැ. අද රාගම වෛද්‍ය පීඨයක් තිබෙනවා. දැන් රාගම නගරයට ගිහිල්ලා බලන්න දින හාරසිය ගණනක් අහිංසක ගැහැණු දරුවෝ අට්ටාලයක් හදාගෙන ඉන්නවා. කිසි කෙනෙක් කථා කරන්නේ නැහැ. මේ අපේ දරුවෝ. මේ අයව පාරට බස්සලා තමන්ගේ තිබෙන දේශපාලන අරමුණ ඉෂ්ට කර ගන්න විතරයි කටයුතු කරන්නේ. මේකේ යටි අදහස තිබෙන්නේ එපමණයි. වෙන මොනවත් නොවෙයි.

ඒ නිසා සැබෑ ආදරය කරනවා නම්, තමන්ගේ දරුවන්ට ආදරය කරනවා නම් අද විවෘත ආර්ථිකය මේ රටේ හැමතැනම තිබෙනවා. එතකොට ඒකට හැඩ ගැහෙන්න ලෝකයත් එක්ක අපි ගමන් කරන්න ඕනෑ. මම ප්‍රධාන ඇමැතිතුමාගේ කථාවට ඌණ පූර්ණයක් කියන්නම්. ඇත්ත. විෂයයන් නවයක් මොනවාටද? මේ රටට ගැළපෙන, ලෝකයට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් හදනවා මිසක් ගතානුගතික ඒ අධ්‍යාපනය මේ රටට වැඩක් නැහැ. පාසලෙන් එළියට යනකොට වෘත්තීමය වශයෙන් දරුවෙක් බිහි කරන්න ඕනෑ. ඔහු වඩුවෙක්ද? පෙදරේරුවෙක්ද? ගුවන් විදුලිය ගැන, රූපවාහිනිය ගැන දැනීමක් තිබෙන කෙනෙක්ද? වෛද්‍යවරයෙක්ද? නීතිඥයෙක්ද? ගණකාධිකාරීවරයෙක්ද? එහෙමයි මේ රටේ අධ්‍යාපනය සැලසෙන්න ඕනෑ. ඒකට ඕනෑ පසුබිම හදන්න ඕනෑ. ඒක රජයට විතරක් තනියම කරන්න බැහැ. A 3 ගත්තු ළමයින් අද අඩ අඬා ගෙදර ඉන්නවා, වෛද්‍ය විද්‍යාලයට යන්න බැරුව. දැන් මේ ඊයේ පෙරේදා සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් වුණා. එක දරුවෙක් ආවා. මම ඉස්කෝලයට ඇතුළත් කරපු දරුවෙක් ඇවිල්ලා වැඳලා කථා කෙරුවා. මම ඇහුවා කීයද පුතේ? A 7 ක් තිබෙනවා. එක B එකයි. මම ඇහුවා දැන් මොනවාද කරන්නේ? මම Commerce කරන්නේ අංකල්. මම ඇහුවා ඇයි Science කරන්නේ නැත්තේ? ඇයි Medicine කරන්නේ නැත්තේ? නැහැ Commerce වලින් තමයි ඉස්සරහාට මේ රටේ තැනක් එන්නේ කියලා කිව්වා. ඒ දරුවෝ හිතන විධියට. ඒකට උවමනා කරන විධියටයි අධ්‍යාපනය සකස් කරන්න ඕනෑ. මේ දරුවන්ව පාවිච්චි කරලා, අද පාරට බස්සලා මොකක්ද ලබන දේ? චම්පික රණවක ඇමැතිතුමා ගණන් හදලා කියලා මේ පාරවල්වල කරන උද්ඝෝෂණ නිසා රටට දවසකට අහිමි වන වැඩ කරන පැය ගණන සහ අපේ නැති වන මූල්‍ය තත්ත්වය.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගල් අඟුරු වංචාවෙන් කොච්චර ගැහුවාද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔව් තියෙනවා. ඒක වෙන්න පුළුවන්. අඩුවැඩි වශයෙන් හැමෝගෙම තිබෙනවා. තමුන්නාන්සේලාත් කාලෙක ආණ්ඩු කෙරුවා. තමුන්නාන්සේලාගේ පක්ෂයේ අයත්, ජනතා විමුක්ති පෙරමුණේ අයත් එකතු වෙලා ඇමැතිකම් කෙරුවා. මොකක්ද අවසානයේ සිද්ධ වුණේ? මොනවද සිද්ධ වුණේ? මොනවද මේ රටට ඉතුරු වුණේ? ගරු සභාපතිතුමනි, එහෙම කල්පනා කරන්න. නමුත් ඒ තත්ත්වයට යන්න මම කල්පනා කරන්නේ නැහැ. එතැනට මම වැටෙන්න කල්පනා කරන්නේ නැහැ. මම කියන්නේ මේක දේශපාලන කෝණයකින් බලන්න එපා. සමහර වෙලාවට අපටත් කියන්න පුළුවන් එක්සත් ජාතික පක්ෂය පාරට බැහැලා ඔව් මේකට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි කෝටි ගණනක් සල්ලි දුන්නේ. එයා තමයි අනුමැතිය දුන්නේ. ඒක නිසා මේ ප්‍රශ්නය අර ඒකාබද්ධ විපක්ෂය කියන කණ්ඩායම භාරගන්න ඕනෑ. මේක අපේ ප්‍රශ්නයක් නොවෙයි කියලා. නැහැ. මේක ජාතික ප්‍රශ්නයක්. මේ රටේ දරුවන්ගේ ප්‍රශ්නයක්. ඒක නිසා කුහක විධියට තමන්ගේ පටු දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්න මේ ප්‍රශ්නය පාවිච්චි කරන්න එපා. කරුණාවෙන්

ඉල්ලන්නේ. අර දරුවෝ ගිහිල්ලා බලන්න. මම ඇත්තටම රාගම නගරයට ආවාම මගේ හිතේ පුදුම කළකිරීමක් එනවා. මොකක්ද, මේ කරන දේ කියලා. හැමදාම. දවස ගණනේ එකේ දින 420 යි, 421 යි කියලා ලිය ලියා ඒක තිබෙනවා. අවසානයේ අපි දන්නවා මේකේ සිද්ධ වන දේ. අද උසාවියෙන් පැහැදිලි තීන්දුවක් දීලා තිබෙනවා. මේ දරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්. දරුවන්ගේ දෙමව්පියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්. බොහොම පැහැදිලි තීන්දුවක් දීලා තිබෙනවා. ඒක කාගේවත් බලපෑමකට දීපු තීන්දුවක් නොවෙයි. ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න දෙන්නෙත් නැහැ.

බලන්න කෝ මේකට විරුද්ධව කථා කරන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය. එකෙක්ගේ මුහුණේ හිනාවක් තියෙනවාද? තියෙන්නේ කුහකකම. ඊර්ෂ්‍යාව. වෛරය. මේවා තමයි තියෙන්නේ. හැබැයි ඔය කථා කරන ඔක්කෝම අපි දැකලා තිබෙනවා රජයේ රෝහල්වල සේවය කරන්න ඉස්සෙල්ලා දුවලා ගිහිල්ලා Private Practice කරනවා. ගිහිල්ලා බලන්න රාගම පෞද්ගලික රෝහල් දෙකක් තිබෙනවා. ඊයේ පෙරේදා මම යනකොට - ගරු සභාපතිතුමනි, මගේ පුතා ඩෙංගු හැදිලා හිටියා. මම නම කියන්න කැමැති නැහැ. මේවා ගැන කථා කරන වෛද්‍යවරයා තමයි අර පෞද්ගලික රෝහලේ ඉඳලා එළියට එන්නේ. මොනවද මේ? මේ තනිකර බොරුව ගෙනි යන්නේ. ඒක නිසා කරුණාකරලා මේ තත්ත්වය කරන්න දෙන්න එපා. අද මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකට එකතු වෙලා තිබෙන වෙලාව. මේක තමයි මේ රටට අවුරුදු ගණනකින් පස්සේ හම්බ වුණු ස්වර්ණමය අවස්ථාව. මේ රට හදනවා නම්. අපි දැක්කා ඊයේ කිරිබත්ගොඩ නගරයේ එක්සත් ජාතික පක්ෂයේ රැස්වීමක් තිබුණා. එතැන එළියේ ගරු අග්‍රාමාත්‍යතුමාට එක්සත් ජාතික පක්ෂයේ අය පැහැදිලි විරෝධයක් පළ කළා. මොකද, මේ පක්ෂයක් විධියට පාක්ෂිකයන්ට මොනවද වෙන්නේ කියලා. ගරු අගමැතිතුමා තමන්ගේ කථාවේදී බොහොම පැහැදිලිව කිව්වා තව අවුරුදු දෙකක් ඉවසගෙන ඉන්න කියලා. එහෙම නම් කියන්න තිබුණා හෙට දෙන්නම්, අනිද්දා දෙන්නම් කියලා. නැහැ, මේ රට යම්කිසි තත්ත්වයකට හදලා මේ තිබෙන ණය ප්‍රමාණය පුළුවන්තරම් අඩු කරලා 2018 දී, 2020 දී, 2036 දී මට මතකයි කිව්වා ඒ වනකොට, අවුරුදු දෙකක් විතර වනකොට අපි මේකේ උවමනා කරන තත්ත්වය හදලා හොඳ රටක් නිර්මාණය කරනවා කියලා. මේවා ලාභ දේවල් නොවෙයි. ලාභ සටන් පාඨ නොවෙයි. රටක් විධියට හිතන්න ඕනෑ. ඒක නිසා තමයි රටේ ප්‍රධාන දේශපාලන ධාරාවන් දෙක අද එකට එකතු වෙලා ඉන්නේ.

මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලනවා. එක ආයතනයක් ගැන විතරක් කථා කරලා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. අඩුපාඩු තිබෙන්න පුළුවන්. බඳවා ගැනීමේදී ප්‍රමිතියේ තිබෙන අඩුපාඩු තිබෙන්න පුළුවන්. අපි කියන්නේ නැහැ A 3 ක් තියෙන ළමයා ගෙදර ඉන්න කොට C 3 ක් තිබෙන ළමයාව අරගෙන වෛද්‍යවරයෙක් කරන්න කියලා. ඒක වැරැදියි. මොන තැනට ගියත් ප්‍රමිතියක් තියෙන්න ඕනෑ. ඒක නිසා මේ ප්‍රශ්නය පිළිබඳව මීට වඩා මානුෂිකව කල්පනා කරන්න. මම මේ තාත්තා කෙනෙක් විධියට කියන්නේ. පෞද්ගලිකව මට දැනෙන දේ. මට හැඟෙන දේ. එහෙම නම් අද ඔය කථා කරන ඔක්කෝම හෙට කිව්වොත් එහෙම ශිෂ්‍යත්වයක් දෙනවා. ලන්ඩන්වලට යන්න. ඉන්දියාවට යන්න. බංගලිදේශයට යන්න. රුසියාවට යන්න. කවුද අකමැති වෙන්නේ? අරිනවා. ඒ අධ්‍යාපනය ඔක්කෝම ගෙන්න ගන්නවා. හැබැයි මේ සල්ලි පිටරට අරින්නේ නැතිව, ලංකාවේ ධනය පිටරට අරින්නේ නැතිව මේකේම රඳවාගෙන ප්‍රමිතියක් ඇතිව මේ විද්‍යාලය - පෞද්ගලික විද්‍යාල තිබෙනවා නම්, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් තියෙන්න බැරිකමක් නැහැ. මේක තියෙන්න ඕනෑ. මේක වෛද්‍යවරයාට විතරක් සීමා කරලා කොටු කරන්නේ ඇයි කියන ප්‍රශ්නය තමයි මම අහන්නේ? ඒක නිසා මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ඉතාමත් ස්තුතිවන්ත වෙමින්, මෙවැනි යෝජනා ගෙන ඒම දේශපාලන පක්ෂයක රඳා පැවැත්ම මත පමණයි. වෙන මොනවත් නොවෙයි. මේ දවස්වල කථා කරන්න මාතෘකාවක් තිබෙනවා නම් ඒක තමයි

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

දැන් වචනය අයින් කරයි. කමක් නැහැ. ඒක තමයි මාතෘකාව. ඒකත් එක්ක තමයි මේ අයගේ පැවැත්ම තිබෙන්නේ. ඒ පැවැත්මට උවමනා කරන යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව එතුමාට මගේ විරෝධය පළ කරමින් - මේකේ තිබෙන අවසාන ඡේදයට, ඒ කියන්නේ "*රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කළ*

යුතුයි" කියන තත්ත්වයට මගේ එකඟතාවය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.20]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. මේ යෝජනාව සාකච්ඡා කරන අතරවාරයේ අපට පේනවා සමාජයේ තිබෙන විවිධ මත, සමාජ මත, දේශපාලන මත, මේ යෝජනාව ඇතුළේ ඉස්මතු වෙමින් පවතිනවා. ගරු සභාපතිතුමනි, අපි හැමදාම කිව්වා මේ රටේ ඉතාම සංවේදී විෂයය තමයි අධ්‍යාපන විෂයය කියන එක. මේ රටේ මිනිස්සුන්ගේ, මේ රටේ දෙමව්පියන්ගේ වැඩිම අවධානය යොමු වුණු විෂයය අධ්‍යාපනය කියන විෂයය. ඒ නිසා අධ්‍යාපනය කියන විෂයයට අදාළව යම් කාරණාවක් ඉස්සරහාට ගත්තාම ඒ කාරණාව හරහා රට තුළ දේශපාලන ස්ථාවරත්වයන් ගොඩ නැඟීමේ හැකියාව ඒ කථා කරන අයට තිබෙනවා. ඉතින් මම හිතන්නේ, මේ යෝජනාව ඉදිරිපත් කරන කොට හැමෝම කිව්වා වාගේ ජනතා විමුක්ති පෙරමුණටත් එහෙම අරමුණක් තිබුණා නම්, අපි ඒ ගැන කනගාටු වෙනවා. අපි දන්නවා අද ලංකාවේ ශිෂ්‍ය අරගල කරන, විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවගේ ලොකුම දේශපාලන ව්‍යාපාරය වන අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ දේශපාලනන අයිතිය ජනතා විමුක්ති පෙරමුණෙන් ගිලිහිලා තිබෙනවා. ඒක අද පෙරටුගාමීන් අතට ගිහිල්ලා තිබෙනවා. මෙම යෝජනාව හරහා තමන්ට නැති වුණු දේශපාලන බලය ලබා ගන්න තමන් කල්පනා කළා නම්, ඒක ඉතාම කුහකයි කියන කාරණය මුලින්ම මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මේ යෝජනාවේ දේශපාලනික කාරණය, මේ යෝජනාවේ සමාජමය කාරණය, ඒ වාගේම මේ යෝජනාව හරහා මතු වන කුහකකම, වංචා සහගත බව, මේ සියල්ල තේරුම් බේරුම් කරගෙන තමයි අපි මේ යෝජනාව වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ කියන කාරණය තමයි මගේ හිතේ තිබෙන්නේ. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

වෛද්‍ය ආයතනය පිළිබඳව දැනුවත් කරන්න සමාජයේ විවිධ කතිකාවන් යන අතරේ වෛද්‍ය පීඨවල ශිෂ්‍යයෝ විවිධ අයව, සමාජ කණ්ඩායම් හම්බ වෙමින් පසුගිය කාලයේ තමන්ගේ මතයන් ප්‍රකාශ කරන්න කටයුතු කළා. ඒ අනුව බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු මුණ ගැහෙන්නත් මේ වෛද්‍ය පීඨවල ශිෂ්‍යයෝ ආවා. අපි හම්බ වෙලා කථා කළා. ඒ වෙලාවේත් අපි කිව්වා වෛද්‍ය ශිෂ්‍යයෝ කරන මේ අරගලයට, විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ කරන මේ අරගලයට සමාජමය තත්ත්වයක් දිනා ගන්න පුළුවන්කම තිබෙනවාද කියන කාරණාය අපි ඔවුන්ගෙන් මතු කෙරුවා. ඒකට ප්‍රධාන හේතුව තමයි ගරු සභාපතිතුමනි, මේ රටේ නිදහස් අධ්‍යාපනය ගැන විතරක් කථා කරලා, මේ රටේ සාමාන්‍ය ජනතාවට බලපෑම් කරන්න අපට පුළුවන්කම තිබෙනවාද කියන කාරණය අපි සැලකිල්ලට ගන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනය එක්කම ගැට ගැහුණු, නිදහස් සෞඛ්‍ය පිළිබඳව අවධානය අද යොමු වෙලා තිබෙනවාද කියන ප්‍රශ්නය අද මතු වෙනවා. ඒ හරහා තමයි මේ සටනට මේ රටේ සාමාන්‍ය ජනතාවගේ දායකත්වය දිනා ගන්න පුළුවන්ද කියන කාරණය මතු වෙන්නේ.

ගරු සභාපතිතුමනි, මේ රටේ වෛද්‍යවරු පිළිබඳව තිබෙන සමාජ මතය, වෛද්‍යවරු පිළිබඳව මේ රටේ මහජනතාවගේ තිබෙන දැනුම, ආකල්පය, විශ්වාසය මහජනතාව මත තහවුරු වෙලා තිබෙන්නේ කොයි ආකාරයෙන්ද කියන කාරණය පැහැදිලි කර ගන්න ඕනෑ. අපි දන්නවා නිදහස් අධ්‍යාපනය පටන් ගත්තේ මේ රටේ අධ්‍යාපනය මුදලට, නැත්නම් අධිරාජ්‍යවාදීන්ව ගෙනාපු එකට කොටු වෙලා තිබුණු එක මුදවාගෙන, මේ රටේ සාමාන්‍ය පන්තියේ දරුවන්ට අධ්‍යාපනය හදාරලා ඉස්සරහාට එන්න පුළුවන් විධියට තමයි නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් වෙලා, නිදහස් අධ්‍යාපනය සංකල්පය රටේ ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තේ. අද ඒ නිදහස් අධ්‍යාපනය හරහාම මතු වුණු මිනිස්සු තමයි නිදහස් අධ්‍යාපනයට විශාලම හානිය සිද්ධ කරලා තිබෙන්නේ. මේ ලංකාවේ පෞද්ගලික විශ්ව විද්‍යාල හැදුවාට පස්සේ ඒවාට ඇතුළු වුණු දරුවෝ 60% කට වැඩි ප්‍රමාණයක් ලංකාවේ නිදහස් අධ්‍යාපනයේ වෛද්‍යවරුන්ගෙන් බිහි වුණු දරුවෝ. ඉතින් මේ ප්‍රශ්නය ඇතුළේ කුහකකමක් තිබෙනවා. මේ ප්‍රශ්නය ඇතුළේ විශාල වංචා සහගත බවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, වෛද්‍ය විද්‍යාලවල ප්‍රශ්නය මතු වෙන්න ප්‍රධානම කාරණාව තමයි අවුරුදු ගණනාවක් තිස්සේ මේ රටේ බලයේ හිටපු ආණ්ඩු විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමේ ප්‍රවේශය සම්බන්ධයෙන් තමන්ගේ අවධානය නිසියාකාරයෙන් යොමු නොකරපු එක. ලංකාවේ වෛද්‍ය

පීඨවලට තෝරා ගනිද්දී මෙරිඩ් පාස් එකෙන් දරුවෝ ගන්නේ 40% ක් විතරයි. 60% ක් ගන්නේ දිස්ත්‍රික් පදනම මත තෝරා ගන්න දරුවන්ගේ මට්ටමෙන්. මේක අනික් පැත්ත කරකවන්න කියලා හැමදාම බොහොම අවධානයෙන් මේ රටේ අධ්‍යාපනය ගැන බලන අය කිව්වා. මෙරිඩ් පාස් එකෙන් 60% ක් ගන්න කියලා. දිස්ත්‍රික් පදනමෙන් 40% ක් ගන්න කියලා. එතකොට කොළඹ දිස්ත්‍රික්කයේ වැඩි ලකුණු අරගෙන විශ්ව විද්‍යාලයට යන්න බැරි වන අයට විශ්ව විද්‍යාලයට යන්න පුළුවන් වෙනවා. ඒත් එක්කම ඒ හා සමාන ලකුණු තිබුණොත් දිස්ත්‍රික් පදනමෙන් වෛද්‍ය පීඨයට එන්න පුළුවන් වෙනවා. ඒ තත්ත්වය ඇති කළේ නැහැ. ඒ තත්ත්වය නිසා තමයි සල්ලි තිබෙන අය, ලකුණක් දෙකක් මදි වුණු අය හොය හොයා හිටියේ කොහේද අපි අධ්‍යාපනය හදාරන්නේ කියලා.

අවුරුදු ගණනාවක් තිස්සේ මේ අය ඉගෙන ගන්න පිටරටවලට ගියා. හැබැයි පිටරටවලින් එද්දී ඒ අයට පුළුවන් වුණා, වෛද්‍ය සභාවේ අවසාන විභාගයට ලියලා වෛද්‍ය වෘත්තියට ඇතුළත් වෙන්න. ප්‍රශ්නය මතු වෙන්නේ මේ පෞද්ගලික විශ්ව විද්‍යාලය ඇතුළේ ඉගෙන ගන්න දරුවෝ වෛද්‍ය සභාවේ අවසාන විභාගයට පෙනී හිටින්න බැහැ. එයට ලියන්නේ නැතුව වෛද්‍ය වෘත්තියේ නියැලෙන්න අවසර දෙන්න කියලා අධිකරණයේ පිහිට පැතුවාට පස්සේ තමයි මේ ප්‍රශ්නය මතු වෙන්නේ. අධිකරණය ඒ සඳහා අවසර දුන්නා.

ගරු සභාපතිතුමනි, මේ රටේ පෞද්ගලික විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්න දරුවන්ට ඒ විභාගයට මුහුණ දෙන්න අවශ්‍ය කරන මූලික සායනික පුහුණුව නැහැ කියන කාරණය ඉතාම පැහැදිලි තත්ත්වයක්. ඔවුන් සායනික පුහුණුව ගන්න පාවිච්චි කරන්නේ පෞද්ගලික රෝහලක්. ඒ පෞද්ගලික රෝහල ඇතුළේ මේ රටේ විවිධ වර්ගයේ රෝගවලට ගොදුරු වන, රෝග නිධානයන් හොයා ගන්න පුළුවන්, කිසිදා අධ්‍යයනය කරන්න පුළුවන් රෝගීන් නැහැ. ඒ නිසා තමයි ඒ අයට සායනික පුහුණුව නිසියාකාරව ලැබෙන්නේ නැත්තේ. මේ සායනික පුහුණුව නැතිව පිටවන වෛද්‍යවරු මේ රටේ රෝගීන්ට බෙහෙත් කරන්න සියලු දැනුම සැපයූ වෛද්‍යවරු විධියට පිළිගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය මතු වෙන්නේ. හැබැයි මේක හරහා ගරු සභාපතිතුමනි, වෛද්‍යවරු තමන්ගේ දරුවෝ මේකට යවලා ඒ විභාගය නැතුව එළියට ඇවිල්ලා වෛද්‍ය වෘත්තීයේ යෙදෙන්න කියලා වෛද්‍යවරුන් බලපෑම් කරනවා නම් ඒකේ දැවැන්ත කුහකකමක් තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය තේරුම් ගන්න එක වඩාත් සංකීර්ණ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ මෙන්න මේ කාරණා නිසා. ඒ නිසා අද දවසේ අපට සිද්ධ වෙනවා මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල අහෝසි කරනවා කියන කාරණය පැත්තකට දාලා මේවා නීත්‍යානුකූල කරන්න කියන කාරණයට එන්න. වෛද්‍ය විද්‍යාලයට තෝර ගනිද්දී සුදුසුකම් සහිත දරුවෝ ඒ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් කරන්න. වැඩි ලකුණක් ලබලා පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය හදාරන්න මුදල් නැති අයට ආණ්ඩුව මැදිහත් වෙලා මුදලක් දීලා ශිෂ්‍යයත්ව පදනම මත ඒවා වෛද්‍ය විද්‍යාලයට යවන්න. මේ කාරණය සම්බන්ධයෙන් යෝජනාවක් පසුගිය සභාවේ ඉදිරිපත් වුණා. මීට කලින් තිබුණු පස්වැනි පළාත් සභාවේදී ඉදිරිපත් වුණා. රේණුක පෙරේරා හිටපු ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනාවා. සුමිත් ද සොයිසා ගරු මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කළා. මේකේ තිබෙන කාරණා පිළිබඳව විශාල විධියට සාකච්ඡා කෙරුනා. ඒකේදී යෝජනා කළා රජය මැදිහත් වෙලා ශිෂ්‍යයත්ව පදනමක් මත දරුවන්ට පෞද්ගලික විද්‍යාලවල - තිබෙන තරගකාරී බව නිසා මේ රටේ රාජ්‍ය විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්න බැරි නම් ඒ තත්ත්වය ඇති කරලා දෙන්න කියලා.

අපි මේ වෛද්‍ය සිසුන් එක්ක කථා කරද්දී ඒ අය කිව්වා වර්තමානයේ - ගරු සභාපතිතුමනි, කුලියාපිටියේ වයඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කරන්න මුල්ගල තිබ්බා. වෛද්‍ය විද්‍යාලවල උගන්වන කථිකාචාර්යවරුන්ට ආණ්ඩුවෙන් පඩි ගෙවන්නේ රුපියල් 125,000 ක විතර මුදලක්. හැබැයි පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ උගන්වන්න යන කථිකාචාර්යවරුන්ට මේ මුදලාලිලා 425,000 ක වැටුපක් ගෙවනවා. ඒ අය කිව්වා. වයඹ විශ්ව විද්‍යාලයේ මුල්ගල තිබ්බාට පස්සේ, රජරට විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෝ අතිශයින් බියට පත් වුණා කියලා. රජරට විශ්ව විද්‍යාලයේ උගන්වන්න ආචාර්යවරු නැති වෙන්න යනවා කියලා. ඒකට හේතුව තමයි රජරටට යන්න දුර වැඩියි. කුලියාපිටියට යන්න තිබෙන දුර අඩුයි. ඒ නිසා කොළඹ BP ඉඳලා ඉක්මණට රජරට ගිහිල්ලා උගන්වලා ආපහු BP එකට එන්න පුළුවන්කම ඒ අයට තිබෙනවා. ඒ නිසා නිදහස්

අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන ඉස්සරහාට ඇවිල්ලා මහචාර්යවරු වෙලා, ඒ අය විශ්ව විද්‍යාල කථිකාචාර්යවරු [ ගරු මහේෂ් අල්මේදා ]

වෙලා නැවත වතාවක් සල්ලිවලට නම් සේවය කරන්න යන්නේ, මේ රටේ නිදහස් අධ්‍යාපනයේ අයිතිය සුරකෙන්නේ නැහැ. ඒ නිසා වෛද්‍යවරුන් අතින්ම, ඉගෙන ගත්තු මිනිස්සු අතින්ම, නිදහස් අධ්‍යාපනය හරහා ඉස්සරහාට ආපු මිනිස්සු අතින්ම නිදහස් අධ්‍යාපනය කෙලෙසීමේ පියවරයන් අරගෙන තිබෙනවා. ඒ නිසා තමයි වෛද්‍ය විද්‍යාලවලට විතරක් නොවෙයි, මේ නිදහස් අධ්‍යාපනයට කණ කොකා හඬලා තිබෙන්නේ. ඒ නිසා නිදහස් අධ්‍යාපනයේ අයිතිය සුරකින්න ඕනෑ. මේ රටේ රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කරන්න ඕනෑ. හැබැයි ඒක කරන්න මේ රටේ සියලු මිනිස්සු කුහකකම් අතහැරලා තමන්ගේ රට වෙනුවෙන් සේවය කරන්න ඕනෑ.

දේශපාලඥයෝ වේවා, අධ්‍යාපනඥයෝ වේවා, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරු වේවා සියලු දෙනාට වගකීමක් තිබෙනවා තමන් නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත්තා නම්, එහි සේවය මේ රටට, මේ රටේ අනාගත පරපුරට දෙන්න. එහෙම නොදෙන එකේ පාපය තමයි මේ රටට මේ සිද්ධ වෙමින් තිබෙන්නේ. ඒ නිසා අපි හැමදාම කිව්වා වාගේම අධ්‍යාපනයේ පන්ති පරතරය පුළුල්වීම නතර කර ගන්න කටයුතු කරන්න ඕනෑ. මේ ආණ්ඩුව බලයට පත් වනකොට කිව්වා 6% ක් අයවැයෙන් අධ්‍යාපනයට වෙන් කරලා දෙනවා කියලා. හැබැයි 6% ක් දෙනෙන් නැහැ. නිදහස් අධ්‍යාපනයේ අයිතිය වෙනුවෙන් සටන් කරන විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට, වෙනත් අයට සටන් කරන්න ඒ නිදහස දෙන්නේ නැහැ. සටන්වල අවසානයේ ඒ අය ඉල්ලා සිටින අයිතිවාසිකම් දෙන්නේ නැහැ. එහෙම තැනක රට නැවත වතාවක් තිබෙනවා. හැබැයි බලයට එනකොට හැමෝම කියනවා මේ අයිතිය සුරක්ෂිත කරලා දෙනවා කියලා. කවුරුත් ඒ කටයුත්තට දායකත්වය දෙන්නේ නැහැ. අපි දන්නවා. ලංකාවේ නිකන් සමාජ මතය තිබෙනවා. ලංකාවේ සෞඛ්‍ය ඇමැතිතුමාගේ ඥාතීන් මේ පෞද්ගලික විශ්ව විද්‍යාල ඇතුළේ ඉගෙන ගන්නවා කියලා. ඒ අයට උසස් පෙළ විද්‍යා විෂයයන් හැදෑරීමේ සුදුසුකම නැති වෙලා තිබෙනවා. අපි දන්නවා. මේ දවස්වල බස් සංගම් නියෝජිතයෙක් බස් සටන්වලට ගිහිල්ලා, බස් සටන්වලින් සවුත්තු වෙලා පල්ලෙහාටම වැටිලා ඉන්න, Foot Board එකටම වැටිලා ඉන්න අය මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ දරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරනවා. සාමාන්‍ය සමාජ මතය තමයි ඒ දරුවාට තිබෙන්නේ ගෘහ විද්‍යාව කරපු සුදුසුකමක්. ඒ නිසා මිනිස්සු කුහකකම් මත මේ ප්‍රශ්නවලට මැදිහත් වෙලා කටයුතු කරනවා. හැබැයි ඒ අයට පුළුවන්කමක් නැහැ. කාටවත් පුළුවන්කමක් නැහැ. මේවා පිළිබඳව සමාජයේ මතය හෙළිදරව් කරන්න. අනෙක් පැත්තට අද අපි දන්නවා, මේ රටේ අහිංසක මිනිස්සුන්ට සෞඛ්‍යම ප්‍රශ්න කොයි තරම් තිබෙනවාද කියලා. මේ රටේ වෛද්‍යවරු කොයිතරම් ප්‍රමාණයකටද මේ රටේ අහිංසක ජනතාවගේ සෞඛ්‍යමය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් වදින්නේ කියලා. අද ලංකාවේ ටෙලිවිෂන් තොර තෝංචියක් නැතුව ඒ අයගේ බඩු අලෙවි කරන්න, මේ රටේ මිනිස්සුන්ගේ සෞඛ්‍ය බිංදුවට ඇදලා දාන්න, ටෙලිවිෂන් එකේ භාණ්ඩ ඕනෑතරම් විකුණන්න ඉඩ දීලා තිබෙනවා. ලංකාවේ වෛද්‍ය සභාවවත්, ලංකාවේ ඉන්න රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයවත් එක දවසක් මැදිහත් වෙලා නැහැ අහිංසක මිනිස්සුන්ගේ සෞඛ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් කිසිම සටනක් කරන්න. මේ රටේ වෛද්‍යවරු දන්නවා මිනිස්සු ලෙඩ වුණොත් තමයි උන්ට සල්ලි හම්බ වෙන්නේ කියලා. ඒ නිසා සල්ලිවලට තමයි වෛද්‍යවරු වැඩ කරන්නේ. ඒ නිසා මිනිස්සු ලෙඩ වෙනකල් බලාගෙන ඉන්න වෛද්‍යවරු ඉන්න රටක මහජනතාවගේ සෞඛ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නේ නැහැ.

ඒ සෞඛ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නේ නැති මහජනතාවකට ඒ අයගේ අධ්‍යාපනික අයිතිවාසිකම් ආරක්ෂා කරලා දෙන්න උමවනාවකුත් නැහැ. ඒ නිසා තමයි වෛද්‍ය සිසුන්ගේ සටනට දේශපාලනික වශයෙන් යම් යම් අය මැදිහත් වුණත් මේ රටේ සාමාන්‍ය ජනතාවගේ සහයෝගය අදත් නොලැබී තිබෙන්නේ. ඒ නිසා මේක මහජන සටනක් බවට පත් කරගන්න වෛද්‍ය සිසුන්ට බැරි වෙලා තිබෙනවා. ඒ බැරි වෙලා තිබෙන්නේ වෛද්‍ය ශිෂ්‍යයෝවත්, වෛද්‍යවරුවත් මේ රටේ මහජනතාව ගැන තමන්ගේ වෘත්තීයමය පැත්තෙන් කල්පනා කරන්නේ නැති නිසා. ඒ නිසා මේක එක එක පැති බද්ධ වුණු දැවැන්ත සමාජ ප්‍රශ්නයක්. මේක එක තැනකින් අල්ලගෙන පෞද්ගලික වෛද්‍ය විශ්ව විද්‍යාලය විතරක් වහලා දාලා මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න පුළුවන්කමක් නැහැ. මේ සමස්ත සමාජ ක්‍රමයේ කඩා වැටීම තමයි පිළිඹිබුවක් විධියට තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අලුතෙන්

සමාජ ක්‍රමයක් නිර්මාණය කරන්නේ නැතුව මේ ප්‍රශ්න එකකටවත් විසඳුම් සොයා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා තැන් තැන්වලින් අල්ලාගෙන අඳෝනා තියෙන එක වෙනුවට, ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ සමස්ත සමාජ ප්‍රශ්නය වෙනස් කිරීම සඳහා තැන් තැන්වල ඩීල් දාගන්නේ නැතුව කටයුතු කළොත් මම හිතනවා මීට වඩා හොඳ සමාජයක් මේ රටේ ජනතාවට උදා කරලා දෙන්න මේ දේශපාලන පක්ෂයෙන් මැදිහත් වෙන්න පුළුවන් වෙයි. ඒ නිසා දේශපාලනික උවමනා මත මේ යෝජනාව ගෙන ආවා නම්, ඒ ගැන කනගාටු වන ගමන් මේ රටේ නිදහස් අධ්‍යාපනය සුරකින්න රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ආරක්ෂා කරන්න කරන හැම සටනකටම මේ රටේ සියලු දෙනාට අපේ සහයෝගය තිබෙනවා කියන කාරණාය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.34 ]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා රීති අංක 107 යටතේ රීති අත්හිටුවලා ගෙනාපු යෝජනාවට අදහස් දක්වන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වාගේම මම ඊට එහා ගිහිල්ලා සන්තෝෂ වෙනවා, අද ආණ්ඩු පක්ෂයේ මහ ඇමැතිතුමාත්, ආණ්ඩු පක්ෂයේ සියලු දෙනාත් මේ විවාදයට ඇස් දෙක ඇරලා බලලා අවංකව, හදවතින් උත්තර දෙන්න ලැහැස්ති වුණු එක ගැන. මම ප්‍රථමයෙන් කියන්න ඕනෑ. අපි ගිය 22 වැනිදා සභා කටයුතු කාරක සභාව ඉවර වෙනවත් එක්කම එක පාරට කියනවා වෛද්‍ය විද්‍යාලයේ සිසුන් කිහිප පොළක් ඇවිල්ලා ඉන්නවා අපව හමු වෙන්න කියලා. අපි දැනගෙන හිටියේ නැහැ. මම හිතන්නේ ගරු සභාපතිතුමාත් එක් දැනගෙන හිටියාද නැද්ද දන්නේ නැහැ. එක පාරට සභා කටයුතු කාරක සභාවෙන් අපට ප්‍රකාශයක් කරනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් හිටියා. අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත් හිටියා. අපි සියලු දෙනා ගිහිල්ලා බැලුවා මොකක්ද මේ කියලා. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා හිටියා. කිසිම දෙයක් දන්නේ නැතුව වාගේ. හැබැයි අපි ගිහිල්ලා බැලුවාම මේ ඇවිල්ලා තිබෙන්නේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක ගැන අපට අදහස් කියන්න. මම කල්පනා කළා මේ රටේ දැවැන්ත ප්‍රශ්නයක් ගැන මේ දරුවෝ තුන් දෙනෙක් ඇවිල්ලා අපට කරුණු කාරණා කියලා දෙන්න යනවා. අපි නිහතමානීව එතුමන්ලාව පිළිගත්තා. තේත් හදලා ගෙනැල්ලා දෙන්න කිව්වා. නමුත් මේගොල්ලෝ මොකක්ද මේ කළේ? හැම තිස්සේම වහලා ගහන හැඟිල්ලේ එක්තරා පියවරක් තමයි මේ ගත්තේ. නමුත් ඒ අය උත්සාහ ගත්තා අපේ මොළවල් ටික වෙනස් කරලා මේ සභාවට ගෙනැල්ලා අතහරින්න. ගරු සභාපතිතුමනි, ඒක ටිකක් අමරු වුණා. අපි ඒ වෙලාවේ කරපු තර්ක විතර්කත් එක්ක ඒගොල්ලන්ට කට උත්තර නැති වුණා කියන එක මම මේ ගරු සභාවේ ඉන්න සහෝදර මන්ත්‍රීවරුන්ව මේ අවස්ථාවේ දැනුවත් කරනවා. එහෙම නම් අපි පටන් ගමු.

දැන් අපේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා බොහොම පූර්විකාවක් කළා මේ යෝජනාව ඉදිරිපත් කිරීමත් සමග. බොහොම දීර්ඝ විශ්ලේෂණයක් කළා. අපි අහගෙන හිටියා. ඒ කථාව ඇහුවාම අපට පෙනී යනවා මේ ආයතනය පවත්වන්න බැහැ. තනිකර බොරුවක්, වංචාවක් කියන එක තමයි එතුමා සඳහන් කළේ. එහෙම නේද ඔබතුමා කිව්වේ? ඔබතුමාගේ ප්‍රකාශය අනුව මේ ආයතනය මේ රටේ පවත්වාගෙන යන්න බැහැ. ඒක ඔබතුමාගේ මතය. හැබැයි මම ගරු සභාපතිතුමා ඇතුළු මේ සභාව දැනුවත් කරනවා මේ රටේ මාස ගණනක් නඩුවක් අහලා තීන්දුවක් දුන්නා. මම තීන්දුව ගැනවත්, උසාවිය ගැනවත් නොවෙයි කථා කරන්න යන්නේ. හැබැයි අපේ අසෝක සපුමල් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණු කාරණා, එදා උසාවියට ඉදිරිපත් කරන්නේ නැතුව බුදියගෙන හිටියාද කියලා මම අහනවා. ඒ කරුණු කාරණා ටික උසාවියට නීතිඥයෙක් මාර්ගයෙන් යම්කිසි ක්‍රමවේදයක් ඇතුව උසාවිගත කළා නම්, සභාගත කළා නම් නඩුකාරතුමා ඒ දුන්නු තීන්දුව කෙළින්ම නිෂ්ප්‍රභා කරලා, විනාශ කරලා දානවා. මම වගකීමෙන් කියන්නේ. මට හැඟුණු දේ මම කථා කරන්නේ. මට එකක් අමතක වුණා. මම මේ විවාදයට එකතු වෙන්නේ මගේ දරුවෙක්වත්, ඥාතියෙක්ගේ දරුවෙක්වත්, සහෝදරයෙක්ගේ දරුවෙක්වත් තවම මේ විද්‍යාලයේ නැහැ. මම කථා කරන්නේ මේ රටේ දැවෙන්න ප්‍රශ්නයක් ගැනයි. අහිසංක දරුවෝ වෙනුවෙන්. එහෙම නම් මම දීර්ඝව කථාව ඇදගෙන යන්න උත්සාහ කරන්නේ නැහැ. කරුණු කාරණා

ගත්තාම එදා උසාවියේ මේ අය නිකන් ඉඳලා තිබෙන්නේ. මේ සභාවට තමයි මේ කරුණු ගෙනැල්ලා රඟ දක්වලා, මේ රටේ ජනතාව උසි ගන්වලා, යම්කිසි කුහක දේශපාලන
[ ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා]

අරමුණක් ඉටු කර ගැනීමට මෙතුමන්ලා උත්සාහ ගන්නවා. මම සන්තෝෂයි කියන්න මන්ත්‍රීවරු 20 ක් මේකට අදහස් ඉදිරිපත් කළොත් ඒ විසි දෙනාම අපි එක්ක එතැන ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණේ කථා කරන කිහිප දෙනා විතරයි ඒ අයත් එක්ක ඉන්නේ. මෙන්න මේකයි ගරු සභාපතිතුමනි, අද වෙන්න යන දේ. වෙලා තිබෙන දේ. අද උද්ඝෝෂණය කරගෙන යනවා. ජනතා විමුක්ති පෙරමුණට අයිතියක් තිබෙනවා මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක වහන්න නොවෙයි. මේවාට සංශෝධන ඉදිරිපත් කරලා, මේවායේ වැරැද්දක් තිබෙනවා නම් මේ වැරදි නිවැරදි කරලා හරි කෙළින් කරලා, මේ ආයතන පවත්වාගෙන යන්න උදව් කරන්න. මේක කඩාකප්පල් කරන්න, විනාශ කරන්න, කුහක මත දරන්න නොවෙයි. මෙතැන කථා කරපු හැම කෙනෙක්ම කථා කළා. මේ මාතෘකාවට කථා කරන කොට ඉදිරියේදී කුහක කියන වචනය සියලු දෙනාගේම කටින් පිටවෙයි. එහෙම නම් මේගොල්ලන්ට තිබුණා මීට වැඩිය විනිවිද පේන්න මේ වැඩේ කරන්න. සයිටම් එකේ වැරැදි තිබෙනවා නම්, ඒකට රජයත් එක්ක එකතු වෙලා, රජයට අදහස් දීලා, උසාවියට අදහස් දීලා මේ ක්‍රමයට අපි යමු. මේ ආයතනය පවත්වමු. මම ඒ ශිෂ්‍යයින්ගනේ එදා ඇහුවා දැන් මේක ඔබතුමන්ලාට වහන්න බැහැ නේ? මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක්. නඩුව, උසාවිය ප්‍රජාතන්ත්‍රවාදියි. උසාවියෙන් තීන්දුක් දීලා තිබෙනවා. මේ රටේ තීන්දුව දැන් කාටවත් වෙනස් කරන්න බැහැ. මේ ජනතා විමුක්ති පෙරමුණ දැගලුවාට ඒක කරන්න බැහැ. හැබැයි මම ඒ දරුවන්ගෙන් ඇහුවා ඕගොල්ලෝ ඇයි දැන් මේ කළු ගලක ඔළුව ගහගන්න යන්නේ. මේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය හිටියා. මෙතුමන්ලා හිටියා. ඔයගොල්ලෝ හැප්පෙන්න හදන්න එපා. මේකට සංශෝධනය ඉදිරිපත් කරලා, මේක වෙනස් මාවතකට දාලා ඕගොල්ලන්ට සමගාමීව මේක කරගන්න. මම අදහසක් දැම්මා. ඇයි? ඔයගොල්ලෝ අදහස් කරන්නේ නැත්තේ මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ විභාගයයි, අපේ විභාගයයි දෙකම එකට ලියමු කියලා. බොහොම සාධාරණ යෝජනාවක්. මේ විභාග දෙකම එකට යන්න කියලා සාධාරණ යෝජනාවක් අපි කරන්නේ. ජනතා විමුක්ති පෙරමුණටත් ඒ වාගේ යෝජනා කරන්න පුළුවන්. කරලා මේ යන ගමන නිවැරැදි කරන්න පුළුවන්. අඩුපාඩුවක් තිබෙනවා නම් ඒක හදන්න පුළුවන්. මේක පෙරලන්න නොවෙයි අපි උත්සාහ ගන්න ඕනෑ කියන එක මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් මේ සභාව දැනුවත් කරනවා.

අපි මේ විධියට බලාගෙන යනකොට මේ පෞද්ගලික කියන ආයතනයේ අද වැඩි හරියක් ඉන්නේ කවුද? වැඩි හරියක් ඉන්නේ Z-Score ලකුණු එකක් දෙකක් එහා මෙහා වුණු දරුවෝ. අද ඒ දරුවෝ ඉන්නේ. මේ අය හක් හක් ගානවා. මේවාට මොනවාද කියන්නේ? අඩුවක් තිබෙනවා නම් හක් හක් ගාන එක නොවෙයි කරන්න ඕනෑ. ඒ අඩුව නිවැරැදි කිරීමයි. මේකේ වැරැද්දක් තිබෙනවා නම් හැක් හැක් ගාන එක නොවෙයි කරන්න ඕනෑ. මේ රටේ නීතිය කථා කරලා ඕක විනාශ කරන්න නොවෙයි. අපි මෙන්න මේක දාමු. Z-Score එකේ අඩුවක් තිබෙනවා නම් මෙන්න මේක දාමු. මේගොලලෝ දන්නේ යන්න දීලා පස්ස පැත්තෙන් පුකට පිහියෙන් අනින්න විතරයි කියන එක මම මේ සභාවට කියන්නේ බොහොම සාධාරණව ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, මේ දරුවෝ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ වචනය ඉල්ලා අස්කර ගන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

රිදෙනවා ඇති ටිකක් නේ? ගරු සභාපතිතුමනි, මේ පෞද්ගලික ආයතනයේ අධ්‍යාපනය ලබන දරුවෝ මේ රටේ බහුතරයක් පෞද්ගලික විද්‍යාලවල ඉගෙන ගත්තු අය. සියල්ල නොවෙයි. බහුතරයක්. මේකේදී ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා මේකේ උසස් ප්‍රතිඵල ගන්න ළමයින්, දරුවෝ සියලු දෙනාම මේ පෞද්ගලික ආයතනය නැති වුණත් පිටරට වෛද්‍ය විද්‍යාල සොයාගෙන, හඹාගෙන යනවා. මේක අපට නවත්වන්න බැහැ. මේක සක්කරයාගේ පුතා වයිමටවත්

නවත්වන්න බැහැ. ජනතා විමුක්ති පෙරමුණ කොහෙන් හිටගෙන හිටියත් මේ වැඩේ නවත්වන්න බැහැයි කියන එක මම මේ සභාවට මතක් කරලා දෙනවා. ගරු සභාපතිතුමනි, අපේ මහ ඇමැතිතුමා මතක් කළා මේ රටේ මුදල් ටික පිටරටට යන එක නවත්ව ගන්න ඕනෑ. අපේ රට විනාශ වෙලා තියෙද්දී අපි මේ වාගේ ආයතන තවත් මේ රටේ ඇති කරන්න ඕනෑ. ලෝකයට හඳුන්වලා දෙන්න ඕනෑ අපේ රටේ හොඳ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල තිබෙනවා. මෙහෙට එන්න, අඩුවෙන් වියදම් කරලා ඉගෙන ගෙන යන්න කියන එක. ගරු සභාපතිතුමනි, ඉන්දියාව එදා ලෝකයට නාට්ටාමීලා බිහි කළේ. එහෙම නැත්නම් අතුපතු ගාන අය. වතු කම්කරුවෝ. මේ වාගේ උදවිය තමයි එදා ඉන්දියාව ලෝකයට ආනයනය කළේ. අපනයනය කළේ.

ගරු සභාපතිතුමනි, අද මේ වනකොට ඉන්දියාව විද්‍යාඥයෝ බිහි කරලා ලෝකයට විකුණන රටක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා කියන එක මම මේ සභාවට මතක් කරනවා. ඒ මිනිස්සු කුහක විධියට හිතුවා නම් අද එතැනම තමයි. මේ කොහේවත් වැලේ වැල් නැතුව, මොනවත් කරන්න බැරි දේශපාලන පක්ෂයක් නිසා තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නඟාගෙන දගලන්න හදන කණ්ඩායමකට මේ අවස්ථාව උදා කරගන්න හදනවා. නමුත් ඒවා කරගන්න බැහැ. ගරු සභාපතිතුමනි, අද මෙතුමා රාගම වෛද්‍ය විද්‍යාලය ගැන කථා කළා. මම දකිනවා අපේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ඉදිරිපසින් මම නිතරම ගමන් කරනවා. අහිංසක කෙල්ලෝ කොල්ලෝ හතර පස් දෙනෙක් FB බල බලා කුඩාරමක් ගහගෙන ඉන්නවා. මේකේ තේරුම මොකක්ද? මම පෞද්ගලික ඇත්දැකීමක් කියන්නම් ගරු සභාපතිතුමනි. මගේ සහෝදරිය මීට වර්ෂ කිහිපයකට ඉහතදී යුනිවර්සිටි එකේ ඉන්න කාලේ එතුමිය මට කිව්වා, දවසක් TV එකේ උද්ඝෝෂණයක මුලම කණ්ඩායමක් ඉන්නවා. අපේ පිටකොටුවේ දුම්රිය පළ ඉදිරිපිට. එතුමිය මට මේක පෙන්නලා කිව්වා. අයියේ, අර ඉන්නේ අපේ කැම්පස් එකේ, අපේ බැජ් එකේ බොහොම අන්ත අසරණම ළමයා කියලා. අනුරාධපුරයේ ගමකුත් කියලා කිව්වා. මේ අනුන්ගේ යට ඇඳුම් මාරු කරගෙන අඳින ළමයින් තමයි මේ උද්ඝෝෂණවල නියැලිලා තමන්ගේ නොහැකියාව වහගන්න අනුන්ට ඊර්ෂ්‍යායා කුහකකම් කරලා මේ රට විනාශ මුඛයට ඇදගෙන යන්නේ. ඒකට කොහේ හරි යන්න ආත්මයක් නැති පක්ෂයක් සෙට් වුණාම ඕකට ජැක් එකක් ගැහුවාම උන්ටත් අර තරුණ කාලේ හොඳටම සෙට් වෙලා යනවා කියන එක මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් මේ සභාව දැනුවත් කරනවා.

ගරු සභාපතිතුමනි, අපි මතක් කරන්න ඕනෑ අද වෛද්‍යවරු මේ රටේ අපට ඇති කරන්නේ නැහැ. වෛද්‍යවරු අපේ නිදහස් අධ්‍යාපනය අරගෙන පිටරටට යනවා. අද ජනතා විමුක්ති පෙරමුණ ඒ ගැන කථා කරනවාද? මේ රටේ අපේ නිදහස් අධ්‍යාපනය අරගෙන අවසන් වුණු ගමන් පිටරට ගිහින් තමන්ගේ රැකියාව කරනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ අය මේවාට විසඳුම් සොයනවාද? අද ඒ ඉගෙන ගෙන ආපහු ලංකාවට ඇවිල්ලා රුපියල් 2000 යි 3000 යි Privet Practice කරනවා. අද ජනතා විමුක්ති පෙරමුණ මේ Privet Practice එකට නිකන් හරි කථා කරනවා ද? මේ වෛද්‍යවරුන්ට විරුද්ධව. නැහැ. ඒගොල්ලන්ට කථා කරලා පුදන්න බැහැ. කථා කරලා හයියක් ගන්න බැහැ. ඒක තමයි ගරු සභාපතිතුමනි, අද මේගොල්ලෝ ලැහැස්ති වෙලා යන්න තිබෙන, බහින පොඩි තැනක් අල්ලගෙන දගලනවා. ඒ විතරක් නොවෙයි. අද බැලුවා මේ පෞද්ගලික ආයතනය හරහා මේ රටේ උද්ඝෝෂණයක් නිර්මාණය කරන්න. අද එහෙන් පාගමන් ආවා. මෙහෙන් පාගමන් ආවා. මේ උද්ඝෝෂණය නැගිට්ට ගන්න බැරි වුණා. ඒ අවස්ථාවේ මේ අය උත්සාහයක් ගන්නවා මේ රටේ දේශපාලන කණ්ඩායමක් එකතු වෙලා ජනතා විමුක්ති පෙරමුණ හරහා යමක් කරන්න පුළුවන්ද කියලා බලන්න. වරද්ද ගන්න එපා. මේ රටේ අහිංසක ජනතාවට මේ රටේ වෛද්‍යවරු තිත්ත වෙලයි ඉන්නේ. මේ රටේ දොට්ට බහින්නේ ජනතා විමුක්ති පෙරමුණයි, වෛද්‍ය විද්‍යාලවල සිසුන් ටිකයි පමණයි කියන එක මම මේ සභාවට ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, අද මේ කවුරුවත් නැගිට්ටවන්න බැහැ. ගම්වල ජනතාව අද මේ ආයතනයට විරුද්ධව නැගිටින්නේ නැහැ. ඒ මිනිස්සු ලොකු වෛරයකින් ඉන්නේ. වෛද්‍යවරයෙක් ගාවට රුපියල් 2000 ක් 3000 ක් දීලා ගියත් ඒ යකත් එක්ක කථා කරන්න බැහැ. උන්ගේ මුහුණ බලන්න බැහැ. මේක මහ කරුමයක්. මේවාට මේ ජනතා විමුක්ති පෙරමුණ කථා කරන්නේ නැති එක ගැන මට ඉතා කනගාටුදායකයි කියන එක මම ප්‍රකාශ කරනවා. එහෙම නම් තවත් හොඳ අදහස් මේ සභාවෙන් එයි. අවසාන වශයෙන් මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මම විරුද්ධ වෙනවා. අපි සභාව කථා කරන්න ඕනෑ නිසා

මගේ කෙටි අදහස් ටිකක් මම සභාගත කළා. හැබැයි එකක් දැනගන්න ඕනෑ. මම අවසාන වශයෙන් ඉතාම සන්තෝෂ වෙනවා මම හිතාගෙන හිටියේ නැහැ මේ යෝජනාව ගැන.

[ ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා]

රීති අත්හිටුවලා යෝජනාවක් එන බව දැනගෙන හිටියා. නමුත් මම හිතුවේ නැහැ ආණ්ඩු පක්ෂයෙන් අපට මේ වාගේ සහයෝගයක් ලැබෙයි කියලා. එහෙම නම් ගරු සභාපතිතුමා, ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාවට විරුද්ධව යමක් කියන්න හැකියාව ලැබීම ගැන ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා.12.50]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව. විශේෂයෙන්ම අපි අලුත් ආණ්ඩුවක් හදන කොට බලාපොරොත්තු වුණු දෙයක් තමයි අධ්‍යාපනය වෙනුවෙන් අඩුම වශයෙන් 6% ක මුදලක්වත් ජාතික ආදායමෙන් වෙන් වෙන්න ඕනෑ කියන කාරණාව. ජාතික ආදායමෙන් 6% ක්වත් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් වෙන්න ඕනෑ කියලා කිව්වත් තවම ඒ තැනට රට පත් වෙලා නැහැ. අපි විශ්වාස කරනවා රටේ තිබෙන ආර්ථික අර්බුදය විශේෂයෙන්ම ණය අර්බුදය මේවා අවසන් වෙනවාත් එක්ක අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන මුදල ඒ මට්ටමට එන්න පුළුවන් වේවිය කියලා. එවැනි තැනකට එන්න පුළුවන් වෙනකොට අපි විශ්වාස කරනවා අධ්‍යාපනය වෙනුවෙන් අදට වඩා වඩාත් හොඳ තැනක් අපේ රටේ ඇති කරගන්න ඉඩකඩ ඇති වෙනවා කියලා. එහෙම වුණත් අධ්‍යාපනය වෙනුවෙන් රට, ආණ්ඩුව වඩාත් වැඩි මුදලක් ඇතුළත් කරන්න ඕනෑ. ආයෝජනය කරන්න ඕනෑ කියන එකයි අපේ විශ්වාසය වෙන්නේ. මොකද, වඩාත් වැඩි මුදලක් ආයෝජනය කරන්න පුළුවන් වුණොත් තමයි අපට හොඳ අධ්‍යාපන මට්ටමක් තුළ රට ඉදිරියට යන්න පුළුවන් ඉඩකඩ ලැබෙන්නේ. අපි දන්නවා ශ්‍රීමත් කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කළා. නමුත් එතුමා නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කරන අවස්ථාව වනකොටත් ගරු සභාපතිතුමනි, මේ රටේ නිදහස් අධ්‍යාපනය තිබුණා. මේ රටේ ඉගෙන ගැනීමේ අයිතිය තිබුණා. විශ්ව විද්‍යාල තිබුණා. කොළඹ විශ්ව විද්‍යාලය තිබුණා. ඒක නිසා නිදහස් අධ්‍යාපන පනතෙන්ම පමණක් නොවෙයි අපේ රටේ නිදහස් අධ්‍යාපනය ආරම්භ වුණේ. මේ රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමයට ඊට වඩා දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා කියන එකත් අමතක කරන්න නරකයි කියන එකත් අපි විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනය ආරම්භ කරන කොට මේ රටේ පෞද්ගලික පාසල් අඩුම වශයෙන් 1000 කට වැඩිය තිබුණා. ඒ එක පෞද්ගලික පාසලක්වත් එදා රජයට පවරා ගැනීමක් කළේ නැහැ. ඒ පාසල් පද්ධතිය ඒ විධියට පවත්වාගෙන යන්න ඉඩකඩ තිබුණා. ඒ සඳහා අවස්ථාව තිබුණා. පෞද්ගලික පාසල්වලින් වැඩිම ප්‍රමාණයක් නැවත රජයට පවරා ගැනීම කළේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය කාලයේදී. එතුමිය තමයි එවැනි පෞද්ගලික පාසල් වැඩි ප්‍රමාණයක් රජයේ පාසල් බවට පත් කරලා තවත් අධ්‍යාපනයට රජය පැත්තෙන් තිබෙන මැදිහත්වීම පුළුල් කරන්න එදා කටයුතු කළේ කියන එකත් අපි විශේෂයෙන්ම සිහිපත් කරන්න ඕනෑ. ඒක නිසා ඒ අවස්ථාවේදීත් තවත් පාසල් ප්‍රමාණයක් අද වනකොටත් පෞද්ගලික පාසල් හැටියට මේ රටේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒවා නතර වෙලා නැහැ.

ඒක නිසා අද වනකොට මේ පෞද්ගලික පාසල් වෙන්න පුළුවන්. ජාත්‍යන්තර පාසල්වලින් ඉගෙන ගන්න අය වෙන්න පුළුවන්. රජයේ පාසල්වලින් ඉගෙන ගන්න අය වෙන්න පුළුවන්. මේ රටේ උසස් අධ්‍යාපන සහතික පත්‍ර විභාගයට පෙනී ඉඳලා අඩුම ගණනේ ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් සුදුසුකම් ලබනවා. මේ සුදුසුකම් ලබන අය අතරින් 25,000 කට විතර ප්‍රමාණයකට තමයි රජයට විශ්ව විද්‍යාල පහසුකම් ලබා දෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේ නිදහස් අධ්‍යාපනය අපේ රටේ ස්ථාපිත වෙලා, මෙතරම් දීර්ඝ කාලයක් ගියාට පස්සෙත්, තවමත් 25,000 කට නම් පහසුකම් දෙන්න පුළුවන්කම ඇති වෙලා තිබෙන්නේ රජයට තවත් විශාල කාල පරිච්ඡේදයක් යාවි, ඒ සියලු දරුවන්ට රජයේ විශ්ව විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලබා දෙන්න ඉඩකඩ සලස්වන්න. ඒකට තවත් දීර්ඝ කාලයක් කල් ගත වෙනවා මම හිතන්නේ නැහැ කාටවත් බලාගෙන ඉන්න පුළුවන්කම තිබෙනවාය. ඒ දරුවන්ට අධ්‍යාපනයේ නිදහස නැති වෙන්න ඒක කිසිම හේතුවක් වෙනවා කියලා. ඒක නිසා මම හිතනවා රජයක් හැටියට මෙවැනි පෞද්ගලික

විශ්ව විද්‍යාල ආයතන ආරම්භ කරනවා නම්, ඒවාට විරුද්ධ වීම නොවෙයි අපේ යුතුකම, වගකීම වෙන්න ඕනෑ. අපට ඒ පහසුකම සලසන්න පුළුවන්කමක් නැත්නම් අපි ඒ වෙනුවෙන් යම්කිසි දිරි ගැන්වීමක් කිරීම තමයි රටක් හැටියට අපට කරන්න වගකීම වෙන්නේ කියන එකයි අපි විශ්වාස කරන්නේ. මොකද, කිසිම දරුවෙක්ට, කිසිම කෙනෙක්ට අධ්‍යාපනය ලබන්න තිබෙන ඉඩකඩ අපට සීමා කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒක නිසා අපි යෝජනා කරන්නේ මේ පෞද්ගලික අධ්‍යාපනය අහෝසි කරන්න නොවෙයි. මේ පෞද්ගලික ආයතනවලින් ඇති කරන අධ්‍යාපනය වඩාත් විධිමත් ආකාරයකට ගෙනියන්න, රජය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මැදිහත් වෙලා කටයුතු කරන්න ඕනෑ කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒකේදී පළමුවැනි සිද්ධාන්තය බවට පත් වෙන්න ඕනෑ මේ විශ්ව විද්‍යාල වෙන්න පුළුවන්, වෛද්‍ය ආයතන වෙන්න පුළුවන්. වෙනත් උසස් අධ්‍යාපන ආයතන වෙන්න පුළුවන් ඒ පෞද්ගලිකව ආරම්භ කරන කිසිම ආයතනයක් ලාභ ලබන ආයතන බවට පත් වෙන්න බැහැ. මේ ආයතන සියල්ලම ලාභ ලබන ආයතන බවට පත් වෙන්නේ නැතුව ඒවා අධ්‍යාපනයට වඩාත් ඉඩකඩ ඇති වන විධියේ ආයතන බවට පත් වෙන්න ඕනෑ. ඒවා ලාභ ලබන ආයතන බවට පත් වෙනවා නම් එහෙම තමයි මෙතැන ගැටළුවක් බවට පත් වෙන්නේ. නමුත් පෞද්ගලික ආයතනයකට නිකන් අධ්‍යාපනය ලබා දෙන්න බැහැ. ඒකට මුදල් අවශ්‍ය වෙනවා. නමුත් අපට මුදල තීන්දු කරන්න පුළුවන් වෙනවා රජයේ විශ්ව විද්‍යාලවල උපාධිධාරියෙක්, වෛද්‍යවරයෙක් නැත්නම් ඉංජිනේරුවරයෙක් පිට කරන්න රජය කොපමණ මුදලක් වියදම් කරනවාද? ඒ හා සමාන වන විධියට මේවායේ ගාස්තු අය කිරීමේ පදනමක් සකස් කරන්න පුළුවන් වෙනවා කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ විධියට සීමා කළොත් එහෙම විශ්ව විද්‍යාල අලුතෙන් ආරම්භ කරන අය ලාභ ලබන ආයතන බවට මේවා පත් වෙන්නේ නැත්නම් එහෙම මේ අධ්‍යාපනයට මේ විධියට වැඩි සල්ලි තියෙන අයට පමණක් අධ්‍යාපනය සීමා කරන්නේ නැතිව අධ්‍යාපනය ගෙනියන්න පුළුවන්කම ඇති වෙනවා කියන එක අපි විශ්වාස කරනවා.

ඒ වාගේම මෙවැනි පෞද්ගලික ආයතන, මෙවැනි පෞද්ගලික විශ්ව විද්‍යාලවල අඩුම වශයෙන් ඒවා පටන් ගන්න උදවිය, ඒවා ආරම්භ කරන අය ඒවායේ 10% ක්වත් අඩු ආදායම්ලාභී දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම ඊට වැඩි ශිෂ්‍යත්ව ප්‍රමාණයක් රජය පැත්තෙන් ලබා දීලා මේ ආයතනවල ඉගෙන ගන්න දරුවන්ට ඉඩකඩ සලස්වන්න ඕනෑ. මොකද, රජයට විශ්ව විද්‍යාල අධ්‍යාපනය සියලු දෙනාට නොමිලේ ලබා දෙන්න බැරි නම්, ඒ වෙනුවෙන් රජය පැත්තෙන් ශිෂ්‍යත්ව ලබා දීලා, මේ ආයතනවල අධ්‍යාපනය ලබන්න තිබෙන ඉඩකඩ ලබා දෙන්න ඕනෑ කියන එකයි අපි විශ්වාස කරන්නේ.

ඒ වාගේම ප්‍රායෝගික පුහුණුව. අද වෛද්‍ය විද්‍යාල පිළිබඳව තිබෙන විශාලතම ගැටළුව බවට පත් වෙලා තිබෙන්නේ ඒ අයට ප්‍රායෝගික පුහුණුවක් නැතිකම. හොඳ පුහුණුවක් ලබා ගන්න ආයතන නැතිකම. මම හිතනවා රජය මැදිහත් වෙන්න ඕනෑ. රජය මේ අයට පුහුණුවක් ලබා ගන්න හොඳ ආයතන ලබා දෙන්න ඕනෑ. ඒවාට පර්යේෂණ වෙන්න පුළුවන්, නැත්නම් රජයේ රෝහල්වල ඉඩකඩ සලසන්න ඕනෑ. ඒ ඉඩකඩ සැලසීම වෙනුවෙන් මේ ආයතනවලින් මුදල් අය කරන්න ඕනෑ. මුදලක් අය කරලා, රජයේ පහසුකම ලබා දීලා, මේ අධ්‍යාපනය වඩාත් ශක්තිමත් කරන්න, වඩාත් පදනමක් ඇති විධියට ඒවායේ ප්‍රමිතිය වඩාත් ශක්තිමත් වන විධියට කටයුතු කරන්න ඕනෑ කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ වාගේම මේ සියලු ආයතනවල ඉගෙන ගන්න දරුවන් වෙනුවෙන් පවත්වන විභාග, එක්කෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම පිළිගත්තු විභාග ක්‍රමයක් ඇති කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ විශ්ව විද්‍යාල කොමිසම මගින් පවත්වාගෙන යන විශ්ව විද්‍යාලවල සහ උසස් අධ්‍යාපන ආයතනවලටම සමාන වුණු විභාග ක්‍රමයක් ඇති කරලා මේවායේ සියල්ලටම ප්‍රමිතිය සහතික වන විධියට කටයුතු කරන්න ඕනෑ කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ විධියට කටයුතු කළොත් මේ සියලු දෙනාට සාධාරණයක් ඇති කරන්න පුළුවන් වෙනවා. සියලු දෙනාට අධ්‍යාපනය ලැබීමේ තිබෙන නිදහස ආරක්ෂා කර ගන්න අවස්ථාව ඇති වෙනවා කියන එකයි කියන්න වෙන්නේ. අද සිද්ධ වෙලා තිබෙන්නේ ඒක නොවෙයි. අද පටු දේශපාලන උවමනාවන් වෙනුවෙන් තමයි මේ සියලු සටන් පාඨ පාවිච්චි කරන්න සූදානම් වෙලා තිබෙන්නේ. අද මේක ජනතාවගේ ප්‍රශ්නයක් බවට පත් වෙලා නැහැ. ජනතාව අද විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ගෙන යන අරගලයේ කොටස්කාරයෝ බවට පත් වෙලා නැහැ. අපි දැකලා තිබෙනවා අන්තර් විශ්ව විද්‍යාල බල මණ්ඩලය. ඒකේ බලය කාගේ අතේද තියා ගන්නේ කියන එක පිළිබඳව. ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්. පෙරටුගාමී පක්ෂය

වෙන්න පුළුවන්. කවුද මේ බලය රැක ගන්නේ කියන දේශපාලන උවමනාව වෙනුවෙන් අද මුළු රටම අර්බුදයකට පත් කරන තැනකට පත් කරලා තිබෙනවා. මේ අර්බුදයට

[ ගරු කීර්ති කාරියවසම්]

ඉඩ දෙන එක වැරැදියි කියන එකයි අපි සඳහන් කරන්නේ. එහෙම නැත්නම් පෞද්ගලික ඉංජිනේරු ආයතන තිබෙනවා. නීති ආයතන තිබෙනවා. ඒවායෙන් උපාධිධාරීන් බිහි වෙනවා. ඒ කිසිවකට විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් මේ කාරණාවේදී පමණක් විරුද්ධ වෙනවා. ඒ වෛද්‍යවරුන් අතිවිශාල විධියට පෞද්ගලිකව මුදල් ඉපැයීමට කටයුතු කරනවා. ඒ පෞද්ගලික වෛද්‍ය සේවාවල යෙදෙන, පෞද්ගලික ටියුෂන් ක්‍රමය තිබෙනවා. මේ සියල්ල පවතිනවා. මේ කිසි දේකට විරුද්ධ වෙන්නේ නැතුව මේක අද දේශපාලන උවමනාවක් හැටියට යොදා ගනිමින් මේක රට අස්ථාවර කිරීම අරමුණු කරගෙන කරන මේ ක්‍රියාදාමයට අපි විරුද්ධ වෙනවා කියන එක සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම අපි ඉල්ලා සිටිනවා. මේ සියලු දෙනාම මේක තේරුම් අරගෙන මේ රටේ සියලු දරුවන්ට අධ්‍යාපනය ලබන්න අයිතිය තිබෙන්න ඕනෑ කියන එක පිළිගනිමින් ඒ සඳහා ඉඩකඩ විවර වන විධියට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා.01.00]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි ගරු සභාපතිතුමනි. මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරද්දී මම හිතනවා පළමු කොටම මම විශ්වාස කරනවා පළාත් සභාව අද මේ ගත්තු තීන්දුව ඉතාම වැදගත්. මේ පිළිබඳව සාකච්ඡාවක්, කථිකාවක් ඇති කිරීම ගැන. රටක යම්කිසි ප්‍රශ්නයක් ඇති වුණාම ඒ ප්‍රශ්නය යට ගහන්නේ නැතුව, ඒ ප්‍රශ්නය වාද විවාද කරලා ජනතාවට නිසි අවබෝධයක් ඇති කර ගන්න පුළුවන් අවස්ථාවක් සැලසීම තමයි මහජන නියෝජිතයින්ගෙන් සිද්ධ වෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් සියලු දෙනා එකඟත්වයෙන් සාකච්ඡාවට ඒම ගැන මම පළමුවෙන්ම සන්තෝෂ වෙනවා. ඒ වාගේම එකඟ වෙනවා. දෙවැනි කාරණාව තමයි ගරු සභාපතිතුමනි, නිදහස් අධ්‍යාපනය ගැන කථා කරන කොට සහ උසස් අධ්‍යාපනයේ අද තිබෙන තත්ත්වය ගැන කතා කරන කොට ඒ සඳහා කථා කරන්න අනන්‍ය වූ අයිතිවාසිකමක් මට තිබෙනවා කියන එක මම විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබලා, ඒ වාගේම ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසුව කොච්චිකඩේ මහ විද්‍යාලයේ අධ්‍යාපනය ලබලා 1983 – 1984 අවුරුද්දේ උසස් පෙළ වැඩිම ලකුණු ගත්තු ශිෂ්‍යයාව හැටියට පාසලටත් ගරුත්වයක් ඇතිව සමත් වෙලා නීති ප්‍රවේශය ලැබුවා. විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කරලා නීති ක්ෂේත්‍රයේ ඉන්න ගමන් දේශපාලන ක්ෂේත්‍රයට ආපු මට පරම අයිතියක් තිබෙනවා නිදහස් අධ්‍යාපනය ගැන කථා කරන්න. මෙහිදී විශේෂයෙන්ම මම කියන්න ඕනෑ පස්වැනි වසරේදී දරුවෙක් අධ්‍යාපනයට ඇතුළත් වෙලා අවුරුදු 13 ක් ඉගෙන ගන්නවා. ඒ අවුරුදු 13 ක් ඉගෙන ගත්තාට පස්සේ අපි විශ්ව විද්‍යාලයට සමත් වනකොට විශේෂ උපාධියක් කරනවා නම් අවුරුදු 03 ක් එහෙම නැත්නම් අවුරුදු 04 ක් අධ්‍යාපනය ලබලා රැකියාවකට යන්න පුළුවන්කම තිබෙනවා. මේ නිදහස් අධ්‍යාපනයෙන්, අධ්‍යාපනය ලබපු අපි වර්ෂ 1983 – 1984 උසස් පෙළට මුහුණ දීලා විශ්වා විද්‍යාල අධ්‍යාපනයට ඇතුළත් වෙන්නේ 1990 දී. 1983 ඉඳලා අපි අවුරුදු 07 ක් බලාගෙන ඉන්නවා. එතකොට මේ ජනතා විමුක්ති පෙරමුණ හරඹ කෙරුවා. අසූගණන් වනකොට. මොකද, බස් එකක යන්න බැහැ ගිනි තියනවා. පාරවල්වල ටයර් පුච්චනවා. එතකොට අපට දුර බැහැරකට පයින්වත් යන්න බැහැ. විශ්ව විද්‍යාලවල වෙඩි තියාගන්නවා. මරා ගන්නවා. පිහියෙන් ඇණ ගන්නවා. ශිෂ්‍යයෝ අතුරුදහන් වෙනවා. එහෙන් පුච්චනවා, මෙහෙන් පුච්චනවා.

එතකොට අපට විශ්ව විද්‍යාලයට යන්න 1990 වුණා. ඒ 1990 දී විශේෂ උපාධිය අවුරුදු 04 ක් හදාරනවා. අවුරුදු 04 ක් විශේෂ උපාධිය හදාරලා එළියට එනකොට අපට තිබෙනවා නීති විද්‍යාලයක්. ඒක පෞද්ගලිකයි. දැන් රජයෙන් විභාග තියනවා. මේකට ගිහිල්ලා තව මාස 06 කින් අවසාන විභාගයක් ලියන්න ඕනෑ. දැන් අද වෛද්‍යවරු බිහි වනකොට අඬනවා විභාගය ගැන. එතකොට අපි උපාධියක් අරගෙන ඇවිල්ලා කොහේවත් තියෙන විභාගයක් ලිව්වා. එව්වා ගැන කවුරුත් කථා කරන්නේ නැහැ. ඒකත් ලියලා තමයි අපි නීති ක්ෂේත්‍රයට අවතීර්ණ වෙන්නේ. ඊට පස්සේ මාස 06 ක පුහුණුවක් ලබන්න ඕනෑ. මම කියන්නේ ජීවිත කාලයෙන් හරියට අවුරුදු 25 ක් මේ අධ්‍යාපනයට යනවා. එතකොට

මේ අවුරුදු 07 ක් නාස්ති කරනවා පෙළපාළි යන්න. විරෝධතා කරන්න විශ්ව විද්‍යාලය වහලා තිබ්බා. ඒ කාලයේදී මම කියන්නේ මේ රටට අවශ්‍ය කරන ජාතික ධනය, රට නඟා සිටුවන්න ජාතියට අවශ්‍ය කරන තරුණ ශක්තිය දෙන්න පුළුවන් කිහිප දෙනෙක් නොවෙයි, දහස් සංඛ්‍යාත ශිෂ්‍යය සංඛ්‍යාවක් ගෙවල්වලට වෙලා ඉන්නවා. ඒ අයට රැකියාවට යන්න විධියක් නැහැ. අධ්‍යාපනය අවසන් කර ගන්න විධියක් නැහැ. විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කරගන්න විධියක් නැහැ. කවුද මේවාට වග කියන්නේ ? හිටපු ජනාධිපතිද? හිටපු අගමැතිද? මේ කඩාකප්පල්කාරයෝ පාරට බැහැලා ළමයින්ව කාලකණ්ණි කරන මේ කාලකණ්ණි තමයි මේකට වගකියන්න ඕනෑ.

අද මේකට කථා කරන්න අවස්ථාවක් මා ඉල්ලා සිටියේ ඒකයි. ඇත්ත වශයෙන්ම ජීවිතයකින් අවුරුදු 07 බිලි ගන්න කාටද පුළුවන්? අද අපි පුරුදු වෙන්න ඕනෑ උසස් පෙළ විභාගය කරලා මාස දෙකෙන් ප්‍රතිඵලය දෙන්න. එතැනින් ළමයාව විශ්ව විද්‍යාලයට ගන්න. අවුරුදු 04 කින් එළියට එනකොට රස්සාවක් දෙන්න. අද මේ ක්‍රමය කරන්නේ නැතුව මේ ළමයින් පාරේ වේලී වේලී මොකද කරන්නේ? පුළුවන් තරම් පෞද්ගලික අංශයට බැණ බැණ හිටියාට රාජ්‍ය අංශය අඩපණ කරන්නේ, රජයේ රස්සා කරන්න බැරි කරන්නේ, ඒ සියලු දේ කරන්නේ මේ කාලකණ්ණි තමයි, පාරට බැහැගෙන. ඒ නිසා මම කියන්න කැමැතියි මේ ජනතාව අද අවබෝධ කරගන්නට ඕනෑ නිදහස් අධ්‍යාපනය රැකීමේ සටනක් නොවෙයි මෙතැන තිබෙන්නේ. අපි නෙවිල් ප්‍රනාන්දුට කඩේ යන්න හදනවා නොවෙයි. නෙවිල් ප්‍රනාන්දු ඕකට බඳවා ගත්තේ කොහොමද, ඕක පටන් ගත්තේ කොහොමද කියලා මහින්ද මහත්තයාගෙන් ගිහිල්ලා අහගන්න ඕනෑ. එකට දීග කාලා ආණ්ඩු කරලා, අද ඇවිල්ලා මෙතැන කෑගහනවා. එදා ඔය ආණ්ඩුවේ හිටියේ ඔය කට්ටිය නේ? එතැන වළ කැපීගෙන එනකොට එළියට බැහැලා ඉවර වෙලා ඊට පස්සේ ඒ ආණ්ඩුව හොඳ නැහැ කියලා තව ආණ්ඩුවක් පිහිටුවනවා. දැන් ඒකට බණිනවා. බැණලා ඉවර වෙලා ඊළඟට තව එකකට යනවා. ප්‍රතිපත්තියක් නැතුව වැඩ කටයුතු කරන්නේ අපි නොවෙයි. ප්‍රතිපත්ති නැති මිනිස්සු. මම කියනවා අපි ඉපදුණොත් ප්‍රතිපත්තියක් ඇතිව. අද වැඩ කරන්නෙත් ප්‍රතිපත්තියකින්. අපි ඔය පක්ෂයකට සම්බන්ධ වෙලා දේශපාලනය කෙරුවාට අද එක්සත් ජාතික පක්ෂය ඇතුළේ ඕනෑම දෙයක් විවේචනය කරන්න අපට නිදහස තිබෙනවා. අපි ලොක්කන්ට විරුද්ධව කථා කරනවා. ලොක්කන්ට විරුද්ධවත් යම්කිසි තීන්දු තීරණ ගන්න වෙලාවේදී අපි කෑකෝ ගහනවා. නමුත් මම කියනවා ඕනෑම කෙනෙක් ගැන කියන්න පුළුවන්. ජනාධිපති ගැන වුණත් කියන්න පුළුවන්. අහගන්න මම තවත් කියනවා. ඒවා අහගෙන ඉන්න.

එහෙම නම් මම කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි, මේ වෛද්‍යවරුන්ගේ පැත්තෙන් ගත්තාම ඔය පුද්ගලික ආයතනයට ශිෂ්‍යයන් බඳවා ගැනීමේ ක්‍රමවේදයේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. ඒ වාගේම මේකෙන් අවසාන විභාගයට මුහුණ දෙනකොට ඒ සමත් වීමේදී අඩුපාඩු තිබෙන්න පුළුවන්. ඒ වාගේම ඒ අයට දෙන ප්‍රායෝගික පුහුණුවේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. මෙතැනදී BOI එක යටතේ රජය අවසර දීලා තිබෙනවා. ඒ වාගේම ආයෝජන කරන අයට යම්කිසි සහන පද්ධතියක් තියෙනවා. BOI එකේ ලියාපදිංචි වුණාම. මේකේ වාසිය අරගෙන ඉස්කෝලයක් හදාගෙන, ඒකේ වෛද්‍ය විද්‍යාල කරලා අපේ ආණ්ඩුවේ ඉස්පිරිතාලවල පුහුණු කරලා ගාණත් සාක්කුවට දාගන්නවා නම්, ඒකේ අඩුපාඩුවක් තිබෙන්න පුළුවන්. ඒකට නඩුවක් හරියට කියාගන්න ඕනෑ. අද සමහරු එළියට ගිහිල්ලා නඩුකාරවරුන්ටත් බණිනවා. ඇයි හත් දෙයියනේ උසාවිය ඉදිරියේ හරියට කරුණු ගොනු කරන්නේ නැතුව, නඩුකාරයා මොනවා දාලා තීන්දුවක් දෙන්නද? ඒවා හරියට කර ගන්න දැනගන්න ඕනෑ. දැන් අද හොඳම උදාහරණය තමයි එක්කෙනෙකුට ඇප දෙන්නේ නැහැයි කියලා අපේ බොහෝ අය මාධ්‍ය සාකච්ඡා තියනවා. සමහර නඩු තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සමහර අය ඇප දෙන්නේ නැහැයි කියලා කියනවා. එක නඩුවක් ගැන මම කියන්නේ නැහැ. හැබැයි, දැන ගන්න ඕනෑ. පොලිස් නිලධාරීන්, රහස් පොලිස් නිලධාරීන් බොහොම දක්ෂ විධියට කරුණු ඇතිව නඩුවක් ගොනු කරලා තිබෙනවා නම්, ඒකේ කරුණු තිබෙනවා නම් ඇප දෙන්න බැහැ. කරුණු නැත්නම්, එහෙම

නැත්නම් කාගෙන් හරි කීයක් හරි අරන් භාගෙට නඩුව හදලා නම්, ඒකේ කරුණු වැදගත් නැත්නම් ඇපයක් දෙනවා. නඩුකාරවරු ඉස්සරහාට එන කාරණාව දිහා බලලා
[ ගරු රෝස් ප්‍රනාන්දු]

දෙන්නේ. එහෙම නැතිව නඩුකාරවරුන්ටත් තේරෙනවා මේක වැරදියි කියලා. නමුත් එයාට අතින් දාලා නඩු තීන්දු දෙන්න බැහැ. උසාවියට එන කාරණාව උඩයි නඩු තීන්දු දෙන්නේ. ඒවා දන්නේ නැතිව කෑ ගහනවා. අර නඩුවට ඇප හම්බ වුණා. මේකට හම්බ වුණේ නැහැ. දැන් මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

හරි මොනවා හරි. අපි ඒ වචනය හැන්සාඩ් එකෙන් අයින් කළාට කමක් නැහැ. එතැන තීන්දුව දුන්නේ මොකද, ඒ තිබුණු ලිපිලේඛනවල අපේ සෞඛ්‍ය ඇමතිතුමාගේ අත්සනක් නැහැ. ඒක නතර කරන්න කාරණාවක් නැහැ. ඉතින් ඒ කාරණාව ඉදිරිපත් වෙන්නේ නැතිව නඩුකාරවරු කොහොමද නඩු තීන්දුවක් දෙන්නේ. මේවා ගැන ජනතාවට අවබෝධයක් ඇති කරන්නේ නැතිව පාර දිගේ ලස්සන, අහිංසක ගැහුණු ළමයින්ව අම්මලා, තාත්තලා හදලා අවුරුදු 13 ක් උගන්වල විශ්ව විද්‍යාලයට එවනවා. අම්මලා තාත්තලා දන්නේත් නැහැ. අම්මලා හිතන්නේ අනේ අපේ එවුන් හොඳට ඉගෙන ගන්නවාය කියලා. මේ කොල්ලෝ ටික උන්ගේ තරුණකම ප්‍රයෝජනය අරගෙන උන්ට පුළුවන් නම් ලව් පාර්ටි එකක් දාගෙන පාරට බස්සනවා. පාරට බස්සලා ඉවර වෙලා පාර දිගේ දූවිලි කකා, මේ ළමයින් ටික නාස්ති කරනවා. ළමයින්ගේ අනාගතය නාස්ති කරනවා. ඉතින් ඔපමණ දන්න, ඔපමණ කැක්කුමක් තිබෙන, ඔපමණ දේශප්‍රේමය තිබෙන, ඔපමණ නිදහස් අධ්‍යාපනයට ආදරය කරන අයට පුළුවන්නේ හරිහමන් නඩුවක් දාලා, මේකේ තිබෙන වැරදි ටික පෙන්වලා - නීතියක් රටේ තිබෙනවා. මේවා කැන්සල් කර ගන්න කෝ. ඇයි බැරි? කර ගන්නේ නැහැ. මෙතැන නිකම් මේ ලකුණු දා ගන්න අතන මාධ්‍ය තිබෙනවා. අපි කියනවා මේ මාධ්‍ය ගැන. මාධ්‍යයත් කොහේ හරි තිබෙන කුණු ගොඩක් ගිහිල්ලා ගිහිල්ලා අවුස්සනවා මිසක් අද මේ රට දියුණු කරන්න මොනවාද කරන්නේ? මේ රට ඉස්සරහාට යන්න ශක්තියක් දෙනවාද? ධෛර්යක් දෙනවාද? ස්ත්‍රී දූෂණයක් කරලා ආපු මිනිහෙකුට මල් මාලා දානවා. ඒක දානවා මාධ්‍යයේ. ඊට පස්සේ තව එකෙක් හය නැතිව දූෂණය කරනවා. මම දූෂණය කළාම මමත් හොඳ ලෝක ප්‍රසිද්ධ මිනිහෙක් වෙනවා කියලා. අන්න එහෙමයි අපේ මාධ්‍ය කටයුතු කරන්නේ. ඒ නිසා මාධ්‍ය දැන ගන්න ඕනෑ. මේ පිස්සෝ පිහාට්ටෝ පාරවල්වල නටන, නටන ගණනේ ඕවා දාන්න යන්න ඕනෑ නැහැ. වැදගත් මිනිහෙක් වැදගත් වැඩක් කළාම අන්න ඒක දාන්න මාධ්‍යයේ. එතකොට තමයි රට හැදෙන්නේ. මේ රට ඉස්සරහාට ගෙනියන්න බැරි වෙලා තිබෙන්නේ කාලකණ්නි කොට්ඨාශයක් ඉපදිලා තිබෙනවා රට කන්න. ඒ වුණාට ඔවුන් හිතාගෙන ඉන්නේ ඔවුන් තමයි ජාත්‍යාල කාරයෝ. ඔවුන් තමයි රට හදන්නේ. හැබැයි, මතක තියාගන්න ඕනෑ. මේ මෙතැන ඉන්නවා, ගම්වලින් බිහි වුණු උගත් මන්ත්‍රීවරු රාශියක්. ඒගොල්ලෝ පිටේ ගහගෙන නැහැ මොන උපාධි ද කරලා තිබෙන්නේ කියලා. මගේ ඉස්සරහා ඉන්නවා හොඳ උගත් මන්ත්‍රීවරු. ඉතින් මේකේ ඉන්න අපව තම්බන්න ඔය පට්ටපල් බොරු ගොතාගෙන ආවාට ඒවා ඉස්සරහාට අරගෙන යන්න මේ මන්ත්‍රීවරු කණ්ඩායම මේ පළාත් සභාවේ ඉඩ තියන්නේ නැහැයි කියන එක ඔය කට්ටිය හොඳට මතක තියාගන්න ඕනෑ.

ඒ නිසා මම විශේෂයෙන් කියනවා. ගරු සභාපතිතුමනි, නිදහස් අධ්‍යාපනය, ඒ වාගේම නිදහස් අධ්‍යාපනයට අදාළව ඒ විශ්ව විද්‍යාල පද්ධතියම වැදගත් විධියට සංවර්ධනය කරන්න ඕනෑ. දියුණු කරන්න ඕනෑය කියන එක අපි එක හිතින් පිළිගන්නවා. ඒකට අපි ආශිර්වාද කරනවා. හැබැයි, මාධ්‍ය හරහා ගිහිල්ලා නමක් හදා ගන්න, මාධ්‍ය හරහා ගිහිල්ලා ඡන්ද ටිකක් ගොඩ ගහ ගන්න, රටේ දැනුමක් තේරුමක් නැති මිනිස්සු මුලා කරන්න, මේ රටේ ඉදිරි ගමන කඩාකප්පල් කරලා හැමදාම රට එකතැන තියන්න, ඒකට අපට ඉඩ දෙන්න බැහැ. මම මේ සභාවේ අවධානය යොමු කරනවා. අද රජයේ රෝහලක්, පෞද්ගලික රෝහල් දිහා බැලුවාම රජයේ රෝහලකට ගියාම පැයක් විතර ඉන්න ඕනෑ කැරකි කැරකී කොහේටද යන්නේ කියලා බලන්න. පෞද්ගලික රෝහලට ගියාම ටක්ගාලා කවුරු හරි ඇවිල්ලා අවශ්‍ය තැනට අරගෙන ගිහිල්ලා, බෙහෙත් ටික දීලා ලෙඩාව එවනවා. ඒ වාගේම තමයි ඔපරේෂන් එකක් කරන්න ගියාම රජයේ රෝහලේ අවුරුදු පහක් විතර පෝලිමේ ඉන්න ඕනෑ. ලෙඩ්ඩු මැරිලා. මේ දැන් අපේ රජයේ වෛද්‍යවරු කොහේද කියලා අහපුවාම එක්කෝ ප්‍රයිවට් ප්‍රැක්ටිස් එකේ. එහෙම නැත්නම් පැය දෙක තුනකට පස්සේ ඇවිල්ලා පොත අත්සන් කරනවා. මම මේ කථා කරද්දී රජයේ නිදහස්

අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන, වැදගත් විධියට රස්සාව කරන ජනතාව වෙනුවෙන් කැක්කුමක් තිබෙන ඒ වැදගත් වෛද්‍යවරුන්ගේ අයිතිවාසිකම්වලට හානියක් නැතිවයි මම කථා කරන්නේ. එහෙමත් කිහිප දෙනෙක් රටේ ඉන්නවා. හැබැයි, බහුතරයක් ඉන්නේ කවුද? මේ රජයේ එන එකාට හෙණ ගැහුවත් කමක් නැහැ. ඔය ලෙඩා ගැන කෝල් එකක් ආවත් ඔපරේෂන් එකක් තිබෙනවාය කියලා, ප්‍රයිවට් එකේ ඔපරේෂන් එක කරලා තමයි මෙතැනට එන්නේ. ඇයි අපේ වෛද්‍යවරුන්ගේ ප්‍රශ්න නැත්නම් අපි පෝලිමේ ඉන්නේ මොකටද? අද ඔපරේෂන් එකක් කර ගන්න කීයක් හරි දීලා, අරයාව මෙයාව අල්ලන්ව, ඇමතිවරුන්ව අල්ලන්න අරෙහේ මෙහේ දුවනවා. ඔපරේෂන් එක කරන්න බැහැ. ඉතින් එහෙම පහසුකම් රටේ තිබුණා නම්, අපට ප්‍රයිවට් විශ්ව විද්‍යාල ඕනැත් නැහැ. ප්‍රයිවට් වෛද්‍යවරු ඕනැත් නැහැ. එතකොට මේ රටේ දාහකට එක්කෙනෙක්වත් වෛද්‍යවරු අද අපට නැහැ. විශාල හිඟයක් තිබෙනවා. එතකොට ඒ හිඟයට අපි කියන්නේ නැහැ ගෘහ විද්‍යාව කරපු අය ගෙනැල්ලා උපාධිය දෙන්න කියලා. ඒකට අපි එකඟ වෙන්නේ නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන තැන හරියට හඳුනාගෙන බෙහෙත් කරන්නේ නැතිව සමස්ත පෞද්ගලිකම අධ්‍යාපනය ලබන එකට අපි අත හෝදන්න යනවා නම් ඒක වැරදියි.

මම කියනවා, පෞද්ගලික අධ්‍යාපනය ගැන කථා කරද්දී කතෝලික ආගම සම්බන්ධ කර ගෙන විශාල පාසල් සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙනවා. අද මීගමුව ප්‍රදේශයේ, කටාන ප්‍රදේශයේ ඒ අපි ඉන්න අවට ගත්තොත් පෞද්ගලිකව වියදම් කර ගෙන හොඳට ළමයින්ට උගන්වන පාසල් රාශියක් තිබෙනවා. මේ පාසල්වලට එන්න ළමයින් පොර කනවා. හොඳ විනයක් තිබෙනවා. හොඳට උගන්වනවා. එහෙම නම් මේ පෞද්ගලික සියලු දේ නතර කළොත් මේවාත් නතර කරන්න වෙනවා. මෙදා විතරක් නොවෙයි. එදත් ඒවා තිබුණා. ඒවා රජයට කාලයකදී පවරා ගත්තා. නමුත් අද පවරා ගත්ත රජයේ පාසල් අභාවයට යන කොට නැවතත් මේ පෞද්ගලිකව මේ කතෝලික අංශයෙන් පවත්වාගෙන යන සියලුම පාසල් හොඳ තත්ත්වයෙන් තිබෙනවා. එතකොට රජයකට වියදම් දරන්න හැකියාවක් නැතිව තිබෙනවා නම්, අධ්‍යාපනයට 6% ක් වැය කරන්න බැරි තත්ත්වයක් තිබෙනවා නම්, කවුරු හරි මේ අධ්‍යාපනය හොඳට දීලා උගතුන් බිහි කරනවා නම්, දෙමව්පියෝ කැමැත්තෙන් සල්ලි දීලා උගන්වා ගන්න කැමැති නම් ඇයි අපි පසුබට වෙන්නේ? ඇයි අපි ඇඹරෙන්නේ? ඇයි අපි අඬන්නේ? උගන්වන්න කියනවා නේ? උගන්වලා සියලු දෙනාම තියන්න ඕනෑ එක විභාගයකට. එකම ජාතියේ විභාගයකට ඔක්කොම මුහුණ දුන්නාම කොහේද ඒකේ අඩුපාඩුවක් තිබෙන්නේ? කොහේද ඒකේ වැරැද්දක් තිබෙන්නේ? පෞද්ගලිකව ඉගෙන ගත්තත්, රජයේ ඉගෙන ගත්තත්, එක සහතිකය ගන්නවා නම් මොකක්ද ඒකේ තිබෙන වැරැද්ද? එහෙම නම් මේ සියලු දේ ගැනම අපි ජනතාවගේ අවධානය යොමු කරන්න ඕනෑ. රටේ දියුණුවට හානි කරලා - ඇත්ත වශයෙන්ම කරුණකට ගිහිල්ලා සටන් කළාට කමක් නැහැ. හාගෙට හරි සුදානමක් නැතිව නඩුවකට ගිහිල්ලා, ඒවා අවුල් කර ගෙන නඩුකාරයින්ට නඩුවලට, නීතියට ඒක දේශපාලනීකරණය කියලා බැණ බැණ ඉන්නේ නැතිව හරි ගමනක් යන්න මේ රට පුරා අතරමං වෙලා ඉන්න කාලකණ්ණින්ට නැණ නුවණ පහළ වේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඇත්ත වශයෙන්ම ඒ වචනය පාවිච්චි කිරීම ගැන මම කනගාටු වෙනවා. නමුත් අපට වේදනාවක් තිබෙනවා. මේ රටේ බිහි වන තරුණ තරුණියන්ගේ වයසින් අවුරුදු විස්සක්, විසි පහක් කාලකණ්නි කරන කොට ඒ අයට කාලකණ්නි නොකියා වෙන වචනයක් පාවිච්චි කරන්න විධියක් නැහැ. ඒ නිසා ජනතාවගේ කාලය, මේ මහජනතාව රට දියුණු කරන්න මේ තරුණ ජවය අරගෙන රටේ ආර්ථිකය දියුණු කරන්න තිබෙන අවස්ථාව නැති කරන්නේ මෙවැනි කාලකණ්ණි නිසා. මම කනගාටුවෙන් වුණත් ඒ වචනය පාවිච්චි කරලා අපි නිදහස් අධ්‍යාපනයත් ඉස්සරහාට ගෙනියනවා. ඒ වාගේම පෞද්ගලික අධ්‍යාපනය ලබන්න තිබෙන අයිතියත් ඉස්සරහාට ගෙනියනවා. හැබැයි, එක එක්කෙනාට කඩේ යන්න සූදානම් නැහැ. මහජනතාවගේ ඇස් මේ සඳහා විවර කරන්නය කියලා මේ සභාව හරහා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් වෙලාව ප.ව. 1.15 යි. මේ සම්බන්ධයෙන් විවාදයට විපක්ෂයෙන් ගරු මන්ත්‍රීවරු හතර දෙනෙකු කථා කරනවා. ආණ්ඩු පක්ෂයෙන් පස් දෙනෙකු සම්බන්ධ වෙනවා. ලැයිස්තුව මට දීලා තිබෙනවා. අද අපේ දිවා භෝජන සංග්‍රහය අලුත් ක්‍රමයකට සැලසුම් කරලා තිබෙනවා. ඒ නිසා ගණපූරණයත් ආරක්ෂා වන ආකාරයට ගරු මන්ත්‍රීතුමන්ලා පල්ලෙහාට ගිහිල්ලා - අද වෙනස්

ආරයේ දිවා භෝජනයක් තිබෙන්නේ. සාමාන්‍ය බුෆේ එක නොවෙයි. ඊට වඩා හාත්පසින්ම වෙනස් තත්ත්වයක් අද තිබෙන්නේ. මම දන්නේ නැහැ මොකක්ද කියලා. මට [ගරු සභාපතිතුමා]

හැබැයි සුවඳ දැනුනා. උඩට පොඩ්ඩ පොඩ්ඩ සුවඳ එනවා. එහෙම නම් පුළුවන්තරම් කථාව පොඩ්ඩක් - මට වෙලාව සීමා කරන්න බැහැ. මොකද, රීති අනුව. ඒ නිසා පුළුවන් තරම් අඩුවෙන් කථා කරන්න. නව දෙනෙක් කථා කරන්න තිබෙනවා. විනාඩි 10 බැගින් ගත්තොත් විනාඩි 90 ක් යනවා. එතකොට මේක ඉවර වෙන කොට තුනත් පහු වෙනවා. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. හැකිතාක් දුරට ඔබතුමන්ලා කරන ප්‍රකාශය, කථාව කෙටි කරන්න. මීළඟට මම ආරාධනා කරනවා, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියට.

[අ.භා.01.17]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අද රටේ පවතින වැදගත් මාතෘකාවක් ගැන යෝජනාවක් ගෙන ඒම ගැන අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මම ඇත්තෙන්ම කථා කරන්නේ, පෞද්ගලික විශ්ව විද්‍යාල ගැන නොවෙයි.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනය ගැන.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තහනම් වචනය.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඔබතුමාට තහනම් වුණාට මට නැහැ. මම කථා කරන්නේ. ඒ නිසා අහගෙන ඉන්න.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

මේකේ තිබෙනවා. ඒ නිසා අහගෙන ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක සංශෝධනය කළා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඒක ඇතුළේ තිබෙන අයිතිය. පෞද්ගලික විශ්ව විද්‍යාලයට වඩා මට තිබෙන ගැටළුව

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ලෝකයේ රෝහලක් වහලා විශ්ව විද්‍යාලයක් දැම්මේ ලංකාවේ. ඒ තමයි අපේ නෙවිල් ප්‍රනාන්දු මැතිතුමා. මේක ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රශ්නයක් නොවෙයි. මේක රටේ ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, පොඩ්ඩක් සමාවෙන්න. මම ඒ වෙලාවේ ඒ සාකච්ඡාවට හිටියේ නැහැ. මුල් අවස්ථාවේදී. ඒ සාකච්ඡාවේදී තීරණය කර තිබෙනවා,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියන වචනය කථා කරන්න එපාය කියලා. ඒ නිසා ඔබතුමිය හැකිතාක් දුරට වැළකෙන්න. මම හිතන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා සභාවට දැනුම් දීලා තිබෙනවා,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කථා නොකර මේ යෝජනාව ගැන කථා කරන්න. සංශෝධනයකුත් දීලා තිබෙනවා. ඒක ඉවත් කරලා කථා කරන්න කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ. එහෙම තීරණයක් ගත්තේ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඇයි නැත්තේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**

Hon. Lakshman Nipuna Arachchi

කථා කරන කොට ඒ වචනය කියවේවි. ඒක හැන්සාඩ් එකෙන් අයින් කරනවා කියලා කිව්වා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

හරි. හැන්සාඩ් එකෙන් අයින් කරන්න කෝ. නමුත් ඒක ගැන කථා නොකර මේ වෙලාවේ කථා කරන්න බැහැ නේ? එතකොට ලෝකයේ පළමුවැනි වතාව තමයි මම හිතන්නේ රෝහලක් වහලා විශ්ව විද්‍යාලයක් දැම්මේ. ඒක ලංකාවේ. ආශා සෙන්ට්‍රල් කියන රෝහල වහලා විශ්ව විද්‍යාලයක් දැම්මා. එතකොට අපට මේ තිබෙන ප්‍රශ්නය

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක ගැන කුහක අදහසක් නොවෙයි. හැම ක්ෂේත්‍රයකම පුද්ගලිකව සල්ලි හම්බ කරනවා. ගුරුවරු උගන්වනවා. ඉංජිනේරු මහත්වරු උගන්වනවා. ප්ලෑන් අඳිනවා. 10% ක් ඒගොල්ලන්ට ගෙවන්න ඕනෑ. නමුත් දොස්තර මහත්වරු උගන්වන එක, ගොඩක් අය බෙහෙත් දෙන එක ගොඩක් අයට ප්‍රශ්නයක්. ඒක මොකක්ද කියන එක අපට තේරෙන්නේ නැහැ. ඒක මොන කුහකකමක්ද කියන එක අපට තේරුම් ගන්න අමාරුයි. අධ්‍යාපනයේ ලාභ ලබන ආයතනයක් ලෝකයේ කොහේවත් නැහැ. ලෝකයේ පුද්ගලික විශ්ව විද්‍යාල තිබෙන බව ඇත්ත. නමුත් ඒවා ආදායම් ලබන ආයතන නොවෙයි. ලංකාවේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනය ගත්තොත් එක දරුවෙකුගෙන් එක් කෝටි විසි ලක්ෂයක් ගන්නවා දරුවෙකුව වෛද්‍යවරයෙකු කරන්න. සාමාන්‍යයෙන් රජයට ලක්ෂ 25 ක් 30 ක් අතර ප්‍රමාණයක් තමයි වෛද්‍යවරයෙක් බිහි කරන්න යන්නේ. එතකොට මේ එක පුද්ගලයෙක් රටේ දරුවන්ගේ අධ්‍යාපනයෙන් සල්ලි හම්බ කරනවා. ඒ සල්ලි හම්බ කරන ගමන් යෝජනාවක් ගේනවා, රජයේ රෝහල් ලබා දෙන්න. වෛද්‍යවරුන්ගේම දරුවෝ 44 ක් ඉන්නවා මේ ආයතනය තුළ. හැබැයි, මේ වෛද්‍යවරු ලෙඩක් හැදුනොත් බෙහෙත් ගන්න නෙවිල් ප්‍රනාන්දු රෝහලට යනවාද? සහතිකය ගන්න තමන්ගේ දරුවාව එක් කෝටි විසි ලක්ෂයක් දීලා යවනවා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනයට. නමුත් මේ කියන කිසිම අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක් නෙවිල් ප්‍රනාන්දු පුද්ගලික රෝහලට බෙහෙත් ගන්න නම් යන්නේ නැහැ. මොකද, අධ්‍යාපනය වැදගත් සහතිකය නිසා. සහතිකයට සල්ලි වියදම් කරනවා. අපි පිළිගන්නවා. පුද්ගලික අධ්‍යාපනයක් මේ රටේ තිබෙන්න ඕනෑ. හැබැයි, ඒකට විසඳුම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නොවේ. මොකද, අද Z Score වලින් ලකුණු එකක් දෙකක් අඩු වන දරුවෝ නොවෙයි ඔය ආයතනය තුළ ඉන්නේ. කලා අංශයෙන් ඉගෙන ගත් දරුවෝ ටික ඉන්නවා. S 3 ක් ගත්ත දරුවෝ ටික ඉන්නවා. Bio Science විතරක් කරපු දරුවෝ නොවෙයි ඔතැන ඉන්නේ. ඒ දරුවන්ට මොකක් හරි විසඳුමක් ගෙනෙන එක වෙනම දෙයක්. නමුත් මේ අධ්‍යාපන ක්‍රමය, මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියන්නේ ඇත්තම කියනවා නම්, තමන් පුද්ගලිකව සල්ලි හම්බ කරන ආයතනයක්. ඉතින් මේක ගැන මේ ජනතා විමුක්ති පෙරමුණත් එක්ක නොවෙයි සටන් කරන්න ඕනෑ. මේකේ යථාර්ථය අපි අවබෝධ කර ගත යුතුයි මේක රටට ගැලපෙනවාද කියලා. අනික අනික් විෂයන් වාගේ නොවෙයි. ඉංජිනේරුවරයෙක් වාගේ නොවෙයි. වෛද්‍ය ක්ෂේත්‍රය කියන්නේ, මේ මනුෂ්‍යයෙකුගේ ජීවිතයක් එක්ක සෙල්ලම් කරන්නේ. (බාධා කිරීමක්) හරි ඒක වෙනම ප්‍රශ්නයක්. අපි ඒක වෙනම කථා කරමු. මේ ජීවිත එක්ක සෙල්ලම් කරන්නේ. මේ ජීවිතත් එක්ක සෙල්ලම් කරන්න මෙවැනි දේවල් කරන්න පුළුවන්ද? හැමදාම කියනවා, යෝජනා ගේන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

එතකොට රජයේ ආයතනවල මිනිස්සු මැරෙන්නේ නැද්ද?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

රජයේ ආයතනවල මැරෙනවා. මොකද මැරෙන්නේ නැත්තේ? රජයේ ආයතනවල මැරෙනවා. ඇයි කවුරු හරි කිව්වාද මැරෙන්නේ නැහැයි කියලා. හැම තැනම මැරෙනවා. ආයුෂ ඉවර වුණාම මැරෙනවා. බෙහෙත් [ගරු නිරෝෂා අතුකෝරළ]

හරියට වැටෙන්නේ නැති වුණාම මැරෙනවා. ඒක මේකට ප්‍රශ්නයක් නොවෙයි නේ? මම අහන්නේ එක දෙයයි. මේ කවුරුත් උපාධිය ගන්න

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකට ඇරියාට තමන් බෙහෙත් ගන්න නෙවිල් ප්‍රනාන්දු රෝහලට යන්න කැමැතිද? කිසි කෙනෙක් ඒ රෝහලට යන්නේ නැහැ. ඒ රෝහලේ ඇඳන් 1000 ක් විතර තිබෙනවා. ලෙඩ්ඩු ඉන්නේ පස් හය දෙනයි. අපට කමක් නැහැ. පුද්ගලික අධ්‍යාපනය වර්ධනය වෙන්න ඕනෑ. රාජ්‍ය අංශයේ අධ්‍යාපනය වර්ධනය වෙන්න ඕනෑ. හැබැයි, ඒක ලාභ උපයන ආයතනයක් වෙන්න නරකයි. රටේ අධ්‍යාපනයට සල්ලි වෙන් කරන්නේ ඉතාම පොඩි මුදලක්. අඩුම තරමේ රාජ්‍ය අධ්‍යාපනය වර්ධනය කරන්න නම්, මේ උපාධි දුන්නාට කමක් නැහැ රජයෙන්. ඒ ගන්න ලාභයෙන් ඒ අධ්‍යාපනය ශක්තිමත් කරන්න ගන්නවා මිසක් එක පුද්ගලයෙකුගේ ලාභ සඳහා මේක පාවිච්චි කරන එක ඉතාම වැරදි බව ප්‍රකාශ කරනවා.

ඒ වාගේම අධ්‍යාපනය කියන්නේ, වෙළඳ භාණ්ඩයක් නොවෙයි. අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් කරන්න බැහැ කවදාවත්. අද අපේ රටේ සමහර ගුරුවරු අධ්‍යාපනය ගැන පෝස්ටර් ගහනවා. නමුත් එහෙම පෝස්ටරයක් ගහලාවත් දරුවෙකුව අධ්‍යාපනයට ගෙන්වා ගන්න බැහැ. ඒක වැරදියි. ඒ නිසා මුදල් උපයන ආයතනයක් කරන එක සම්පූර්ණ වැරදියි. මේක Z Score වලින් ලකුණු අඩු වන දරුවන්ට අධ්‍යාපනය වෙන ක්‍රමයකට රාජ්‍ය අංශයට අරගෙන ඒ දරුවන්ට අධ්‍යාපනය දෙන එක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. අනික් එක තමයි, අද දරුවෝ භාර සිය ගණනකගේ ප්‍රශ්නයක් ගැන තමයි ඔක්කොම කථා කරන්නේ. මුළු රටේ විශ්ව විද්‍යාල දරුවෝ ඔක්කොම එළියේ ඉන්නේ. ඊට පස්සේ රටම කථා කරන්නේ ඒක ගැන. මේ ඇමතිවරුන්ටයි, සමහර වෛද්‍යවරුන්ටයි තිබෙන ලොකුම ප්‍රශ්නය අර දරුවෝ භාර සිය ගණන. එතකොට රටක් අද මුළු විශ්ව විද්‍යාල පද්ධතියම - මොකද, රටේ හදවත කියන්නේ, විශ්ව විද්‍යාල දරුවෝ. මේ දරුවෝ තමයි රටට වටින්නේ. ඇයි මේකට මේ ජනාධිපතිතුමාවත්, අගමැතිතුමාවත් මැදිහත් වෙලා විසඳුමක් දෙන්නේ නැත්තේ. මේක ඇයි අදින්නේ? අපට තිබෙන ප්‍රශ්නය ඒකයි. මේ රටම ආගාධයකට ගෙන එනකල් මේකට විසඳුමක් දෙන්නේ නැතිව බලාගෙන ඉන්නවා. අද ඒ තත්ත්වය ගැන අපි කනගාටු වෙනවා. ඒ ගැන ඉතාමත් කනගාටු වෙනවා. ඒ නිසා ජනාධිපතිතුමාගෙන්, අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ප්‍රශ්නයට ඉතාම ඉක්මණින් විසඳුමක් දෙන්න. ඒ වාගේම සෞඛ්‍ය ඇමති වෙලා ඉන්න කාලයේ අතිගරු ජනාධිපතිතුමා අත්සන් කළේ නැහැ මේකට. එදා එතුමා විරුද්ධව හිටියේ. අද එතුමා තීන්දුවක් ගන්නේ නැති එක ගැනත් ඉතාමත් කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, පුද්ගලික විශ්ව විද්‍යාල එක්ක, අපට පුද්ගලික අධ්‍යාපනය ගැන කිසිම ගැටළුවක් නැහැ. අනාගතයේ දරුවන්ට ඒක විධිමත් වෙන්න ඕනෑ. ඒකට ක්‍රමයක් තිබෙන්න ඕනෑ. හැමදාම යෝජනා ගෙනැල්ලා හරියන්නේ නැහැ. ඒ නිසා රටේ වගකිවයුතු පුද්ගලයන්ගෙන් මේකට උත්තරයක් බලාපොරොත්තු වෙනවා. මොකද, නීතිය කියන්නේ දොරක් ඇරලා තිබෙන කොට ඇරලා තියෙනවා කියන්නත් පුළුවන්. ඒක වහලා තිබෙනවා කියන්නත් පුළුවන්. නීතිය කියන්නේ ඇත්ත නොවෙයි. ඒක අපි අවබෝධ කර ගත යුතුයි. ඒක කාටවත් කරන්න බැහැ. ඒ නිසා රජයේ වගකිවයුතු විශේෂයෙන්ම ජනාධිපතිතුමාගෙන්, අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, රටේ අනාගතය විනාශ කරන්න එපා. මේ දරුවෝ ටිකගේ අනාගතය විනාශ කරන්න එපා. දරුවෝ භාරසිය ගණනකගේ ප්‍රශ්නයක් වෙනුවෙන්. ඒ ප්‍රශ්නය විසඳලා, මේකට ඉක්මන් විසඳුමක් දීලා අධ්‍යාපනය ගැන නම් අපි කථා කරන්න ගියොත් මේ රටේ අධ්‍යාපනය ගැන අපි ඉතාමත් කනගාටු වෙනවා. මොන්ටිසෝරි අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා මේ රටේ අධ්‍යාපනය වෙනස් විය යුතුයි. මේ යන ක්‍රමයට නොවෙයි. ඒ වාගේම දරුවන්ට අධ්‍යාපනයේ විධිමත් ක්‍රමයක් මේ රටේ හඳුන්වා දිය යුතුයි. ඒක එක්කෙනෙකුගේ ගන්න තීරණ නොවෙයි. ඒක කණ්ඩායමක් විසින් ගත යුතු තීරණයක්. මොකද, අද අපේ

රටේ අධ්‍යාපනයට හෙණ ගැහිලා තිබෙන්නේ එක එක ඇමතිවරු එක එක කාලයට එන අය එක එක තීරණ ගන්නවා. රටේ හදවත දරුවෝ. අධ්‍යාපනය. ඒ හදවත. ඒකට සල්ලි වෙන් කරලා වැඩිපුර දරුවන්ට අධ්‍යාපනය රාජ්‍ය මට්ටමෙන් ලබා දෙන්න කියන එක ඉල්ලා සිටිමින්, සයිටම් ආයතනයට සම්පූර්ණ විරෝධතාවය අපි ප්‍රකාශ කරනවා. මෙම යෝජනාව ගෙන ඒම ගැන අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

[අ.භා.01.26]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, එක දෙයක් පැහැදිලි වුණා. අපේ මේ කථා කරපු මන්ත්‍රීවරු ගොඩක් කථා කරද්දී කියපු දේම තව පාරක් තහවුරු වුණා. මේ රටේ අද නොයෙකුත් ප්‍රශ්න අල්ලාගෙන කෑ ගහන්නේ, එක කොට්ඨාශයක්. කුඩා පක්ෂ. කුඩා පක්ෂවල පැවැත්ම තමයි මේ අපට පෙන්වන්නේ. මේක නැත්නම් ඒ පැවැත්ම නැහැ. අපි ගොඩක් දෙනෙකු කථා කරනවා නිදහස් අධ්‍යාපනය කියලා. අධ්‍යාපනයේ නිදහස් කියන කෑල්ල කපලා තමයි අධ්‍යාපනය ගැන කථා කරන්න වෙන්නේ. අපට නිදහස් අධ්‍යාපනයක් කන්නන්ගර මැතිතුමාගේ කාලයේ පටන් ගත්තාය කිව්වාට මම හිතන්නේ මේ රටේ කවදාවත් නිදහස් අධ්‍යාපනයක් තිබිලා නැහැ. ගරු සභාපතිතුමනි, නිදහස් අධ්‍යාපනයක් තිබෙනවා නම් ඒක අර්ථ කථනය කරන්නේ කොහොමද කියන එකත් මට තිබෙනවා ලොකු ප්‍රශ්නයක්. නිදහස් අධ්‍යාපනයක් තිබෙන රටක 5% ක් විශ්ව විද්‍යාලයට යන්න විධියක් නැහැ. අද උස්ස පෙළ ලියනවා ලක්ෂ හතක්, අටක් හැම අවුරුද්දේම. විශ්ව විද්‍යාලයට යන්නේ 20,000 යි. 25,000 යි. දැන් අඩුම ගණනේ මේ රජය පත් වුණාට පස්සේ ඒ ප්‍රමාණය 5000 කින් විතර වැඩි වෙලා තිබෙනවා. 20,000 සිට දැන් 25,000 ක් විතර විශ්ව විද්‍යාලට භාර ගන්නවා. වැඩි වෙලා තිබෙනවා.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

සංඛ්‍යා ලේඛන තිබෙනවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සංඛ්‍යා ලේඛන අහගන්න පොහොට්ටුවේ ඔබතුමන්ලාගේ ලොක්කාගෙන් ගිහිල්ලා. ඒ නිසා සමහර අය කියනවා, 6% ක් දෙනවයි කිව්වාලු. කෝ 6% කියලා. හැබැයි, අපි අද පාසලකට ගිහිල්ලා බලපුවාම අපේ පාසල්වල ඉදි වන අලුත් බිල්ඩින්වලින් - බිල්ඩින්වලට කථා කරන්න බැහැ. නමුත් අපි දන්නවා, එදාට වඩා විශාල මුදල් ප්‍රමාණයක් අද අධ්‍යාපනයට ලැබිලා තිබෙනවා. අපේ හැම පාසලකටම ලක්ෂ 25 ගණනේ හම්බ වුණා. හැම පාසලකටම. ඉස්සර ඔය ලක්ෂ දෙක තුන තීන්ත බෙදන්නත් මන්ත්‍රීවරු ගියා. 50,000 තීන්ත ටික අරගෙන පාසලට ගියා. අද අපි ලක්ෂ 25 ක් දෙද්දී අපි ගිහිල්ලා බෙදුවේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ කථා කරන්නේ අපි සුළු පිරිසක් ගැන. ඉතාමත් සුළු පිරිසක් ගැන අපි කථා කරනවා, නිදහස් අධ්‍යාපනය කියාගෙන. දැන් මේකද නිදහස් අධ්‍යාපනය. අනික් රටවල්වල ගිහිල්ලා බලද්දී ගරු සභාපතිතුමනි, මමත් එංගලන්තයේ අවුරුදු 16 ක් හිටියා. මමත් උසස් අධ්‍යාපනය ලැබුවා එහේ. මේ උසස් අධ්‍යාපනය විශ්ව විද්‍යාලවල, පාසල්වල දේශපාලනයක් නැහැ. මේ දේශපාලනය තමයි මේ රට කාලකන්ණි කරලා තිබෙන්නේ. මොකද, අධ්‍යාපනයේ පොඩි තැන ඉඳන් උඩ තැනට යනකල්ම දේශපාලනය ගෑවිලා තිබෙනවා. අර මම කිව්වා වාගේ තීන්ත ටික එක බෙදන්නත් දේශපාලඥයින් පාසලට යන්නේ. තීන්ත ලීටර් 10 අරගෙන. රු. 50,000 වෙක් එක අරගෙන යන්නේ මන්ත්‍රීවරයා. වෙන රටවල්වල ඉස්කෝලවල මන්ත්‍රීවරුන්ව කවුද කියලා දන්නෙත් නැහැ. අද මේ ජනතා විමුක්ති පෙරමුණ මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකක් ගැන කථා කරනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක නොවෙයි. මේ වාගේ දහයක් පවත්වාගෙන යන්න ඕනෑ. එදා සුද්දා මේ ප්‍රයිවට් ඉස්කෝල ගෙනාවේ නැත්නම් අද මොකක්ද මේ - ගරු සභාපතිතුමනි, මේක පොඩ්ඩක් පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. අද කොළඹ සෙන් ජෝසප් එකට, ශාන්ත පීතර එකට, රෝයල් එකට, ආනන්ද, නාලන්ද, තර්ස්ටන් ඔය ඉස්කෝලවලට යන්න බැරි අය තමයි මේ රජයේ ඉස්කෝලවලට යන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒවා රජයේ නොවෙයිද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒවා රජයේ වුණාට ඒවා පවත්වාගෙන යන්නේ රජයට වඩා පහසුකම් තිබෙන ඉස්කෝල හැටියට. පෞද්ගලික ඉස්කෝලවල තිබෙන පහසුකම් ඒ පාසල්වල තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

Semi-government.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට මීගමුවේ ගත්තොත් මාරි ස්ටෙලා එකට යන්න බැරි අය තමයි ඊළඟට පොඩි පාසලට, ගමේ පාසලට යන්නේ. තමුන්නාන්සේ -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

රෝයල් එක Semi-government. නොවෙයි. Ful government.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රෝයල් එක Semi-government. නොවෙයි වුණාට, රෝයල් එක ඇවිල්ලා පෞද්ගලික ඉස්කෝලයක් වාගේ පහසුකම් තිබෙන පාසලක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒක හරි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ඔක්කොමට පුළුවන් නම් - කොළඹ ඉන්න ඔක්කොම හදන්නේ රෝයල් එකට යන්න නේ?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපිත් කියන්නේ එහෙම හදන්න කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොළඹ ඉන්න ඔක්කොම රෝයල් එකට යන්න තමයි හදන්නේ. ඒකට බැරි වුණාම තමයි යන්නේ තර්ස්ටන් එකට. ඒකටත් බැරි වුණාම තමයි වෙන එකකට යන්නේ. ඒකටත් බැරි වුණාම යනවා අන්තිමට ගමේ පාසලට. මේක තමයි යථාර්ථය. යථාර්ථය අපි තේරුම් ගන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ අය කථා කළාට, මේ නිදහස් අධ්‍යාපනය ලබලා විශ්ව විද්‍යාලයට ගිහිල්ලා, මිනිස්සුන්ගේ සල්ලිවලින් උපාධිය අරගෙන, දොස්තර විභාගය පාස් කරලා, නීතිඥවරු වෙලා ආයිත් සමාජයට මොකක්ද දෙන්නේ? අඩුම ගණනේ තමන් ඒ බදු මුදලවත් රජයට ගෙවනවාද. මිනිස්සුන්ගේ මුදල්වලින් ඉගෙන ගෙන දොස්තර කෙනෙකු වෙලා, නීතිඥවරයෙකු වෙලා, ගණකාධිකාරීවරයෙකු වෙලා - අපි දන්නවා නේ? අපිත් පුද්ගලික රෝහලකට ගියාම දොස්තර මහත්තයා ඉවර වෙලා යද්දී අතට කෑෂ් දෙන්නේ. සල්ලි මිටිය අතට දෙන්නේ. ඒකෙන් බදු ගෙවනවාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක තමයි අපිත් කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බදු ගෙවන්නේ නැහැ. ඉතින් ඒවා ගැන කථා කරන්න කෝ. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකක් ගැන කථා කරන්නේ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකත් වැරදියි. මම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක සාධාරණය කරනවා නොවෙයි. නමුත් ඊට වඩා මේක පුළුල් වෙන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ප්‍රශ්නය තිබෙන්නේ, ඔබතුමන්ලා ප්‍රයිවට් කිව්වාම හයයි. ප්‍රයිවට් කියපුවාම මේගොල්ලෝ හයයි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සල්ලි ගන්නවා කිව්වේ දොස්තර මහත්තයා

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ දොස්තර මහත්වරු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකෙන් ඉගෙන ගත් අය නොවෙයි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

කවුරු ගත්තත් ප්‍රයිවට් තිබෙන්නේ ඒකට තමයි. ඒකට තමයි පෞද්ගලික කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. වරදවා තේරුම් ගන්න එපා. මොන රටේවත් විශ්ව විද්‍යාලවල නිකම් උගන්වන්නේ නැහැ. හැම විශ්ව විද්‍යාලයටම යන දරුවෙකුට ණයක් දීලා, ලෝන් එකක් දීලා තමයි උගන්වන්නේ. එහෙම උගන්නපුවාම ඒකේ වටිනාකමක් තිබෙනවා. ඒ වටිනාකම මොකක්ද කියන එක පොඩ්ඩක් පැහැදිලි කරලා ඔබතුමන්ලා තේරුම් ගන්න. වටිනාකම තමයි ඒ ඉගෙන ගෙන දොස්තර කෙනෙකු හෝ ගණකාධිකාරීවරයෙකු හෝ ඒ කවුරුහරි වෙන කෙනා දන්නවා, මම ඉගෙන ගත්තේ මේ බදු මුදලින්. ඒ ණය මම ආයෙත් බේරන්න ඕනෑය කියලා. සමාජයට වගකීමක් තිබෙනවා. අන්න ඒක අද මේ රටේ නැහැ. නිදහස් අධ්‍යාපනය කිව්වාට. නිදහස් අධ්‍යාපනයෙන් හොඳට පෝෂණය වෙලා, ඊට පස්සේ තවත් රටට විනිවිදියක් කරනවා මිසක්, කවුරුත් රටට උදව්වක් කරන්නේ නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සමාගම් බදු ගෙවන්නේ නැතිව තිබෙන්නේ. කෝටි ගණනක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සමාගම් බදු ගෙවන්නේ - ඒක තමයි කියන්නේ. මේ රට දේශපාලනය නිසා කාලකන්ණි වෙලා තිබෙනවා කිව්වේ මම ඒකයි. ඒ කාලකණ්ණිකමට වැඩියෙන්ම වගකියන්න ඕනෑ තමුන්නාන්සේලා. ජනතා විමුක්ති පෙරමුණ. (බාධා කිරීම්)

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. හරි. අපි වගකියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ විශ්ව විද්‍යාලයේ ඉන්න දරුවන්ව උපාධිය පාස් කරන්න මේ වාගේ අවුරුදු හත අට යන්නේ ඇයි? ඇයි උපාධිය කරන්න ඔපමණ කල් යන්නේ? තමුන්නාන්සේලා එතැනට වෙලා දේශපාලනය කරනවා. ඒකයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ ඔක්කොම කරලා තිබෙන්නේ අපි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ ළමයින්ට ඉගෙන ගන්න දෙන්නේ නැහැ. අද ප්‍රයිවට් විශ්ව විද්‍යාලයට කවුරු හරි යනවා නම්, සල්ලි ගෙවලා යනවා නම්, ඒ ළමයින් යන්නේ නැහැ, පාරේ රස්තියාදු වෙන්න. උද්ඝෝෂණය කරන්න. ඒගොල්ලෝ පුළුවන් නම් පැය විසි හතරම ඒකේ ඉගෙන ගෙන ඉක්මණට උපාධිය ඉවර කරලා තමන් රස්සාවක් සොයන්න යන්නේ අද. අද රජයේ උපාධිය ලබන අය මොකද කරන්නේ? උපාධියත් අරගෙන රජය රස්සාවකුත් දෙනකල් බලාගෙන ඉන්නවා. ඔන්න ඕක තමයි වෙනස. මේ රට කාලකණ්ණි

වෙලා තිබෙන්නේ ඒකයි. වෙන මොකක්වත් නොවෙයි. තමුන්නාන්සේලා ඉඳගෙන ඒක පෝෂණය කරනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපි ද රට පාලනය කළේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රට පාලනය - තමුන්නාන්සේලා ගියා නේ පාලනය කරන්න. වැව් 1000 ක් භාරා ගන්න බැරිව ගිය ජනතා විමුක්ති පෙරමුණ නේ මේ කථා කරන්නේ? අමාත්‍යාංශයක් අරගෙන - (බාධා කිරීම්) අර රොන් මඩ ටිකවත් ඉවත් කර ගන්න බැරිව ගියා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දෙපැත්ත තකට තක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අවුරුදු දෙකක් පාලනය කරලා රොන් මඩ ටිකවත් ඉවත් කර ගන්න බැරිව ගියා. හැබැයි, තමුන්නාන්සේලාගේ පැවත්ම තිබෙන්නේ මෙන්න මේ වාගේ ප්‍රශ්න මතයි. මේක තමයි මෙගොල්ලන්ගේ පැවැත්ම. (බාධා කිරීම්)

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපට පැත්තක් තිබෙනවා. ඔබතුමාට පැත්තක්වත් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට පැත්තක් තිබෙනවා. මම ඉන්නේ ජනතාවගේ පැත්තේ. මම මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ ජනතාව වෙනුවෙන් කථා කරන්න. මම මේ පක්ෂ බදා ගෙන පක්ෂයට කඩේ යන්න මම මෙතැනට ඇවිල්ලා නැහැ. මට ඡන්දය දුන්න ජනතාව වෙනුවෙන් මම කථා කරන්නේ. අන්න ඒකයි වෙනස. තමුන්නාන්සේලාගේ වෙනසයි මගේ වෙනසයි ඒක තමයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තාත්තාව ප්‍රතික්ෂේප කළා. පුතාවත් ප්‍රතික්ෂේප කරනවා ළඟදීම.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තාත්තාව ප්‍රතික්ෂේප - මහත්තයෝ, මෙගොල්ලන්ට අර 5% කියන එක නැත්නම් මෙගොල්ලෝ අද මෙතැන වාඩි වෙලා ඉන්නවාද? ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ - අර ප්‍රේමදාස මහත්තයා 5% ක් මෙගොල්ලන්ට වෙන් කළා. ඡන්ද 5% ක් ගත්ත අයට. නැත්නම් මෙගොල්ලන්ට ඇපත් නැහැ. ඇපෙත් නැහැ ඕගොල්ලන්ට. ඕගොල්ලොන්ට ඇත්තටම අර -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ පාර්ලිමේන්තුවට. පළාත් සභාවට පහත් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පහත් නැහැ. පළාත් සභාවට පහත් නැහැ. මේ ඡන්ද දාහක් දෙදාහක් අරගෙන - ප්‍රාදේශීය සභාවටවත් ගන්න ඡන්ද ප්‍රමාණයවත් අරගෙනද මේ සමහර අය මේවාට එන්නේ. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. අද ප්‍රජාතන්ත්‍රවාදය තුළින් මේ වාගේ තැනකට ඇවිල්ලා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

5% ක් අරන් තාත්තාට එන්න බැරි වුණා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ තාත්තා 65,000 ක් ඡන්දය ගත්තා. තමුන්නාන්සේලාගේ ජේ.වී.පී. එකේ එපමණ ඡන්ද ගත්තේ කවුද කියලා කියන්න බලන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කවුරුවත් ගත්තේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමන්ලාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න. අනවශ්‍ය දේවල්වලට යන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වතුර දවස් තුනයි ඡන්දය කළේ. වතුරටත් පරාදයි තාත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි. ඒක මේ ලංකාවේ දේශපාලනයේ හැටි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, දැන් වෙනස මිනිස්සුන්ට තේරිලා තිබෙන්නේ. දැන් වතුර කොහේද ඉන්නේ? තාත්තා කොහේද ඉන්නේ කියලා මිනිස්සු හොඳට දන්නවා. ඉතින් ඒ නිසා ඔබතුමා කලබල වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය දේවල්වලට පැටලෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා ගත්ත ඡන්ද ප්‍රමාණය මෙතැන කථා කරන්න ඕනෑ නැහැ නේ? කථා කළොත් මේගොල්ලන්ට ඇපත් නැහැ. ජනාධිපතිතුමා පොරොන්දු කිහිපයක් දුන්නා. ඒ පොරොන්දුවලින් එකක් තමයි - ජනතාව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඡන්දය දුන්නේ ඇයි කියන එක අපි පැහැදිලි කර ගන්න ඕනෑ. ඡන්දය දීලා ජනාධිපතිතුමාව පත් කර ගත්තේ මේ තිබෙන මනාප ක්‍රමය නැති කරන්න. ඒකට විරුද්ධ අය කවුද? මේගොල්ලෝ ඒකට විරුද්ධයි. මොකද, මේ අන්තිම වතාව මේගොල්ලෝ මෙතැන ඉන්නේ. මනාප ක්‍රමය නැත්නම් මේගොල්ලෝ ඉවරයි. මේගොල්ලෝ එළියේ. ඒක තමයි. අපි කනගාටු වෙනවා. මේ අනාගතය ගැන කථා කරනවා. රට ගැන කථා කරනවා. රටේ දුවා දරුවන්ගේ අනාගතය ගැන කථා කරන මේ ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ දහස් ගණන් තරුණ තරුණියන් බිල්ලට දුන්න පක්ෂයක් මේක. අද කිසිම අයිතියක් නැහැ මේගොල්ලන්ට ඇවිල්ලා මේ වාගේ සභාවක මේ රටේ ඉන්න තරුණ පිරිස ගැන කථා කරන්න. තවත් මේ රටේ මේගොල්ලන්ගේ පැවැත්ම තිබෙන්නේ - මේ ප්‍රයිවට් ඒවා එනවාට කෑ ගහන්නේ මොකද? වෙන මොකුත් නොවෙයි. භයයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තරුණයෝ 60,000 ක් වල පල්ලට යවපු ඕගොල්ලන්ට අයිතිය තිබෙනවා එතකොට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පෞද්ගලික විශ්ව විද්‍යාල ඇති වුණාම මේ රජයේ විශ්ව විද්‍යාලවලට යන ගොඩක් ළමයි ඇත්තටම අඩු වෙනවා. ගරු සභාපතිතුමනි, සල්ලි දීලා හරි ඉගෙන ගන්න, හොඳ තැනක ඉක්මනට උපාධියක් කරන්න, හොඳ තැනකට ගිහිල්ලා ඉක්මණට උපාධියක් කරලා රැස්සාවක් සොයා ගන්න මේ රටේ ඉන්න ජනතාව කැමැතියි. ළමයි කැමැතියි. මේ වාගේ කාලකණ්ණි වෙලා, පාර තොට් රස්තියාදු වෙලා, හට් ගහගෙන, ජනතා විමුක්ති පෙරමුණේ කට්ටිය ගිහිල්ලා පෝෂණය කරන කට්ටිය ඇවිල්ලා ඇත්තටම මේ අපේ දුෂ්කර ගම්මානවල මිනිස්සුන්ගේ ඔලුව කාපු මේ ජනතා විමුක්ති පෙරමුණ තමයි මේකට වගකියන්න ඕනෑ. මෙන්න මේ දරුවෝ තමයි. අද මම අභියෝග කරනවා. තමුන්නාන්සේලාට මම එක අභියෝගයක් කරනවා. පුළුවන් නම් ඔය හට් අස්සේ ඉන්නවා නම් එක දරුවෙක් උගත් දෙමව්පියෙකුගේ දරුවෙක් ඉන්නවා නම්, එහෙම නැත්නම් යමක් කමක් තිබෙන දෙමව්පියෙකුගේ දරුවෙකු ඉන්නවා නම් පොඩ්ඩක් ගෙනැල්ලා පෙන්වන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නැහැ. නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා අර දුෂ්කර ගම්වල ඉන්න දරුවන්ගේ ඔලු කාපු, මොළය විකෘති කරලා ජනතා විමුක්ති පෙරමුණ

මේ ජීවිතේට බලයට එන්නේ නැහැයි කියලා අපි කවුරුත් දන්නවා නේ? මේ ජනතා විමුක්ති පෙරමුණ. මේගොල්ලෝ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. හරි. ඒවා ඉස්සරහාට බලා ගනිමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

යථාර්ථයත් එක්ක ජීවත් වෙන්න පුරුදු වෙන්න. යථාර්ථයත් එක්ක. මේ මළ ගිය විමුක්තියක් එක්ක ඉඳගෙන තවම දඟලනවා. දෙපයින් කෙළින් හිට ගන්න බැරි විමුක්තියක් මේක. බංකොලොත් විමුක්තියක් එක්ක තවම දඟලනවා. ගරු සභාපතිතුමනි, මේගොල්ලෝ එක කාලයක් හිටියා අපි යන්නේ නැහැ. ට්‍රිප් යන්නේ නැහැ. රට යන්නේ නැහැ. අරකයි මේකයි කියලා. දැන් එක්කෙනෙක් දෙන්නෙක් යන්න ගත්තා. මේගොල්ලන්ගේ ඉස්සර ලොක්කා කවුද? විමල් වීරවංශ. මේගොල්ලෝ ඉස්සර උඩින්ම මුරුංගා අත්තේ තියාගෙන හිටියේ කවුද? විමල් වීරවංශ. දවසයි දෙකයි රට අරගෙන ගියේ. පක්ෂයත් දාලා ගියා. ඒකයි වුණේ. දැන් ජනතා විමුක්ති පෙරමුණ ඔබතුමන්ලාගේ කාලයේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එළෙව්වා. දන්නේ නැති දේවල් නොකියා ඉන්න. එළෙව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එළෙව්වේ නැහැ. දාලා ගියා. අපිත් එහෙම තමයි කියන්නේ. එළෙව්වා කියලා. අපිත් කියනවා, එළෙව්වාය කියලා. හැබැයි, දාලා ගියා. ඔය ජනාධිපතිවරණයේත් ඔබතුමන්ලා සල්ලි ගත්තා. මහින්ද රාජපක්ෂ මැතිතුමා පරද්දන්න. සල්ලිවලට තමයි තමුන්නාන්සේලා කඩේ ගියේ. නැත්නම් තමුන්නාන්සේලා පත් කර ගත්ත ආණ්ඩුව, රජය වෙනුවෙන් තමුන්නාන්සේලා කථා කරනවාද? නැහැ. සල්ලි අරගෙන කඩේ යනවා. මේගොල්ලෝ දන්නේ නැහැ. ඔය කියපු අර වතුර සේනාරත්නම නේ. තමුන්නාන්සේ ඒගොල්ලෝ වෙනුවෙන් නේ දැන් කථා කළේ. එයාම තමයි කිව්වේ, තමුන්නාන්සේලා සල්ලි ගත්තාය කියලා. පස්සේ නැහැයි කිව්වාට. පස්සේ නැහැයි කියන්නේ ඉතින් දන්නවා නේ? හරි කමක් නැහැ.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය ගැන, නිදහස් අධ්‍යාපනයට මේ රටේ අධ්‍යාපනය කාලකණ්ණි කරපු පක්ෂය තමයි ජනතා විමුක්ති පෙරමුණ. ඒකට සම්පූර්ණයෙන්ම වගකියන්න ඕනෑ ජනතා විමුක්ති පෙරමුණ. මේගොල්ලෝ තවමත් ජීවත් වෙන්නේ සිහින ලෝකයක. ඒ සිහින ලෝකයේ ඔය මාක්ස්වාදය ජීවිතේට මේ රටට එන්නේ නැහැ. භය වෙන්න එපා. ඔය මාක්ස්වාදය ජීවිතේදී මේ රටට එන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ජනතා විමුක්ති පෙරමුණේ අර ශ්‍රේෂ්ට නායකයා, මැරුනේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කවුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විජේවීර වාගේම තමුන්නාන්සේලාගේත් කාලය ගිහිල්ලා නාකි වෙලා මැරිලා යන කල්ම -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මරන්න එපැයි එහෙම නම් අපිව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ පස් දෙනාගෙන් තව තුන් දෙනෙක් ඉතිරි වෙයි ඊළඟ පාර. තමුන්නාන්සේලාව මරන්න නොවෙයි. මරලා හරියන්නේ නැහැ මේගොල්ලන්ව. ජීවිත විනාශ කරපු විධියට. රජයේ දේපළ විනාශ කරපු විධියට. මේ රට බංකොලොත් කරපු විධියට. මේ රටේ තරුණයින්ව පුච්චලා, එල්ලලා, ටයර්වල දාලා ගිනි තියපු කට්ටිය මේගොල්ලෝ. මේගොල්ලොන්ව පෝරකයට යවන්න ඕනෑ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එකතුව කීයද? විනාශ කරපුවායේ එකතුව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

Hon. Srinath Perera

පොඩ්ඩක් රිදෙනවා නේද? තොප්පියත් ටිකක් දා ගන්න කැමැතියි. මට පේනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

බැදුම්කර හොරකම ඔය ඔක්කොටම වඩා ලොකුයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකක් ගැන කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම වැඩි වෙලාවක් කථා කරන්නේ නැහැ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකක් ගැන මේගොල්ලෝ කථා කරනවා. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක වාගේම ඉතින් අනික් ඒවා ටිකත් වහලා දැම්මා නම් ඉවරයි නේ? අර අනික් අය කිව්වා වාගේ, අද වන කොට අනික් හැම විශ්ව විද්‍යාලයක්ම මේ රටේ තිබෙනවා,. මේ වෛද්‍ය උපාධියට විතරක් ප්‍රයිවට් කරනවා කියලා මෙච්චරම තිබෙන ලොකු ප්‍රශ්නය මොකක්ද? අන්තිමට ඒ කරන රජයේ එකම විභාගය නම් ඔක්කෝම ලියලා පාස් වෙන්න ඕනෑ. මොකක්ද මෙතැන තිබෙන ප්‍රශ්නය? දැන්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ලිව්වත්, රජයේ විශ්ව විද්‍යාලය ලිව්වත් අන්තිමට විභාගය ලියන්න ඕනෑ වෙන්නේ එකම විභාගය නම් මොකක්ද තිබෙන ප්‍රශ්නය?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා දන්නෙත් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්න. ඔහොම තමයි. බාල්දිය දා ගන්න ආසයි. කියන්නත් ඉස්සෙල්ලා බාල්දිය දා ගන්නවා. තොප්පිය දා ගන්නවා. කියන්නත් ඉස්සෙල්ලා තොප්පිය දා ගන්නවා. ඒක තමයි වැඩේ. ඇයි ඉතින් කියන්න මොනවා හරි තිබෙන්නත් එපැයි. ඉතින් ගරු සභාපතිතුමනි, අපි කියන්නේ ඕනෑ කෙනෙකුට විශ්ව විද්‍යාලය ඇරගන්න දෙන්න. ඒක හොඳයි. මේ රටේ ලක්ෂ අටක් විතර උසස් පෙළ ලියලා, 25,000 ක් විතර විශ්ව විද්‍යාලයට එනවා නම් ඒක සාධාරණයක් නොවෙයි. මේ රටේ තරුණ පරපුරට කරන සාධාරණයක් නොවෙයි ඒක. අද -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉන්දියාවයි ලංකාවෙයි දෙකේ එකතුව ද ලක්ෂ අටක් කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

උසස් පෙළ ලියන ළමයින් ගණන දන්නේ නැහැ. එනවා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ගැන කථා කරන්න. ලක්ෂ අට ඉන්දියාවත් එක්කද? ඉන්දියාවයි පකිස්ථානයයි ඔක්කොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර අනවශ්‍ය ලෙස බාධා කිරීම් කරන්න එපා. ඔබතුමන්ලාට කාලය තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, අපි කියන්නේ ඕනෑ කෙනෙකුට ඇර ගන්න දෙන්න. කවුරු ඇරියත් අන්තිමට රජයක් හැටියට [ගරු ශ්‍රීනාත් පෙරේරා]

එක විභාගයක් තියනවා නම්, කාටවත් මේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. දැන් මහ ලොකුවට කථා කළාට මෙතුමන්ලාගේ පුතාලා දූවලාටත් කොහේ හරි පිට රටකට ගිහිල්ලා, බංගලාදේශයට හරි කොහේට හරි යවලා මේගොල්ලෝ උගන්වනවා. ඔය බයිලා ගැහුවාට. ගෙදර තියාගෙන කාලකණ්ණි වෙන්න දෙන්නේ නැහැ නේ දූවලා පුතාලාට. නිදහස් අධ්‍යාපනය කියන්නේ ඒකයි. මේ රටේම ඉගෙන ගන්න ඕනෑය කියලා නිදහස් අධ්‍යාපනක් නැහැ. නිදහස් අධ්‍යාපනය කියන්නේ ඕනෑ තැනකට ගිහිල්ලා ඉගෙන ගන්න පුළුවන් වෙන්න ඕනෑ කාට හරි. ඒකයි නිදහස් අධ්‍යාපනය කියන්නේ. මේ රජයෙන් කීයක් හරි වියදම් කරනවා කියන එක නොවෙයි නිදහස් අධ්‍යාපනය කියන්නේ. තමන්ට සල්ලි තිබෙනවා නම් - අද මේගොල්ලෝ කියන්නේ, වැඩිම ලකුණු ගන්න 20,000 ට විතරක් අධ්‍යාපනය දුන්නාම මේ රට ඉදිරියට යනවාය කියලයි. එතකොට අනික් ඔක්කොම කාලකණ්නි වෙනවා. අද හන්දි හන්දි ගණනේ ත්‍රීරෝද රථ වැඩි වෙලා තිබෙන්නේ ඇයි? ඒ අනික් කට්ටියට අද අධ්‍යාපනයක් ලබා ගන්න බැහැ. ඒ මිනිස්සුන්ට වෙන කරන්න දෙයක් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ යහපාලනයේ තරම.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

යහපාලනයේ තරම නොවෙයි. තමුන්නාන්සේලාගේ පක්ෂයේ තිබෙන කාලකණ්ණිකම. වෙන මොකුත් නොවෙයි. යහපාලනයක් ගැන කථා කරනවා මේගොල්ලෝ. අද නිදහස් අධ්‍යාපනය - ගරු සභාපතිතුමනි මම කියන්නේ, මේ රටට නිදහස ලැබුණු දවසේ ඉඳන්, මේ වෙනස කරන්න කාටවත් බැරිව ගියා. අද විශ්ව විද්‍යාලයට යන 20,000 ට හරි 25,000 ට හරි අද ඔය රජය වියදම් කරන ගණනෙන් භාගයක් ගෙවලා යන්න කියලා තව 20,000 කට වැඩියෙන් උගන්වන්න පුළුවන්, විශ්ව විද්‍යාලයේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

අපි උගන්වන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා ඒ වාගේ යෝජනාවක් කරන්නේ නැහැ. තමුන්නාන්සේලා මහා මෝඩ ඒවා ගේන්නේ. මේගොල්ලන්ට වැදගත් යෝජනාවක් ගේන්න බැහැ. මොකද, මේගොල්ලෝ කඩාකප්පල්කාරී සංවිධානයක්. ඒක තමයි මේගොල්ලන්ගේ පැවැත්ම. මේගොල්ලන්ගේ පැවැත්ම ඇවිල්ලා මේ රටේ තරුණ තරුණියන්ව කාලකණ්ණි කරන එක. එහෙම නැතිව මේගොල්ලන්ට පැවැත්මක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ ඒකයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තාත්තාගේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ටිකක් රිදෙනවා නේද? දැන් තාත්තාවත් ඇදලා ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ රටේ අලුත් ප්‍රවේශයක් අලුත් ආණ්ඩුව විශේෂයෙන්ම අපේ අධ්‍යාපන ඇමතිතුමා අරගෙන තිබෙනවා. පෙරට වඩා 5000 ක් අද ළමයි විශ්ව විද්‍යාලයට යනවා. අලුත් රජයක් තුළින් මේක දෙගුණයක්වත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපට ඕනෑ උසස් පෙළ කරන සෑම දරුවෙකුම අනික් අයට වඩා සාපේක්ෂව ගත්තාම හැම රටකම 80% ක් විශ්ව

විද්‍යාලයට යනවා. මේ ලංකාවේ තමයි 5% ක් 10% ක් විශ්ව විද්‍යාලයට ගිහිල්ලා අනික් කට්ටිය කාලකණ්ණි වෙලා ත්‍රීරෝද රථයක් අරගෙන මොනවා හරි කරලා තමන්ගේ ජීවිතය කාලකණ්ණි කර ගන්නේ. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම මේ ජනතා විමුක්ති පෙරමුණට මේ අපේ අනාගතය, රටේ අනාගතය දරු පරපුර කාලකණ්ණි කරන එක තවුරටත් පෝෂණය කරන්නේ නැතිව, ඒ කාලකණ්නිකම නැති කරලා, කර ගන්න බැරි නම් පැත්තකට වෙලාවත් ඉන්න කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේගොල්ලෝ අපිව භය කරනවා මේවා බෙදනවාය කියලා. අපි නම් භය වෙන්නේ නැහැ මේවාට. කොළ නොවෙයි මොනවා බෙදුවත් අපට මන්ත්‍රීකම තිබ්බත් එකයි. නැතත් එකයි. අපි හැමදාම කාලා බීලා ඇඳලා ඉන්නවා. ඕගොල්ලෝ වාගේ යැපෙන අය නොවෙයි අපි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔය භයට කෑ ගහන්නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේගොල්ලෝ කොළ බෙදනවාලු. හිතේ අපි දේශපාලනයෙන් කාලා බීලා යැපිලා ඉන්නවා කියලා. මන්ත්‍රීකම නැති වුණත් අපි ජොලියේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපිව මරන්න එපා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අනේ අපි යාළුවෝ නේ? අපි එහෙම කරන්නේ නැහැ කවදාවත්. හැබැයි, අපි කාලා, බීලා, ඇඳලා ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට රජිත හපුආරච්චි ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා.01.49]

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා, අද මේ විවාදයට එක් වෙන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. ඇත්තටම අද මම සතුටු වෙනවා, මෙවැනි මාතෘකාවක් පළාත් සභාවේ මේ සභා ගර්භය ඇතුළේ සාකච්ඡාවට, මතවාදවලට, විවාදවලට ලක් වෙන්න ඒ අවස්ථාව සැලැස්වීම ගැන. මොකද, ගොඩක් වෙලාවට අපි රටේ කාලීන ප්‍රශ්න ගැන කථා කරනවාට වඩා බොහොම සිල්ලර මාතෘකා තමයි අපි තෝරා ගන්නේ. ඒ නිසා අද රටේ කාලීන ප්‍රශ්නයක් ගැන විවාද කරන්න අවස්ථාව උදා කර ගැනීම සම්බන්ධයෙන් ඒ සියලුම පාර්ශවයන්ට මගේ ප්‍රශංසාව පුද කරනවා. ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ විවාදයට අදහස් දක්වන්න මම මුල් වෙලාවේදී බලාපොරොත්තු නොවුණත්, යම් යම් මන්ත්‍රීවරු, විවිධ පාර්ශව මත දක්වන කොට නිදහස් අධ්‍යාපනය ඇතුළේ ගමේ ප්‍රාථමික විද්‍යාලයෙන් අධ්‍යාපනය ආරම්භ කරලා, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබපු කෙනෙකු විධියට අපට වගකීමක් තිබෙනවා කියන එක කල්පනා කරලා තමයි මම මේ විවාදයට අදහස් දක්වන්න එකතු වෙන්න ඕනෑය කියලා තීරණය කළේ.

ඇත්තටම ගරු සභාපතිතුමනි, අද රටේ අපේ අධ්‍යාපන ක්‍රමය සම්බන්ධයෙන් ප්‍රධාන ගැටළුවක් තිබෙනවා. ඒ ගැටළුව තමයි අද අපේ අධ්‍යාපන ක්‍රමය රැකියාවක් ඉලක්ක කර ගත්තේ නැති, අධ්‍යාපන ක්‍රමයක් තමයි අපේ රටේ තිබෙන්නේ. ඉතින් අධ්‍යාපන ක්‍රමයේ වැරැද්ද නිසා තමයි අද ගොඩක් වෙලාවට අපි O/L, A/L ඊළඟට උසස් අධ්‍යාපනයට විශ්ව විද්‍යාලය සඳහා දරුවෝ එන කොට කොටසකට මේ අවස්ථාව හිමි වෙන කොට කොටසකට අහිමි වෙනවා. අහිමි වීම ඇතුළේ අපි අපේ අධ්‍යාපන ක්‍රමය සකස් කරලා නැහැ. ගරු සභාපතිතුමනි, හැමෝම කල්පනා කරන්නේ වෛද්‍යවරු වෙන්න. හැමෝම කල්පනා කරන්නේ ඉංජිනේරුවරු වෙන්න. හැමෝම කල්පනා කරන්නේ වෘත්තීයවේදීන් වෙන්න. හැබැයි, අපි වෙනත් කාර්මික අංශයෙන් වෘත්තියකට, රැකියාවකට යොමු වෙන්න අපේ අධ්‍යාපන ක්‍රමය ඇතුළේ අපේ වටපිටාව නිර්මාණය කරලා නැහැ. ඒක තමයි මේ තිබෙන ප්‍රධාන

ගැටළුව. මේ විශ්ව විද්‍යාල ප්‍රවේශය පිළිබඳ තිබෙන තදබදයට ප්‍රධාන ගැටළුව තමයි අපේ රටේ තිබෙන අධ්‍යාපන ක්‍රමයේ වැරැද්ද. ඉතින් මේ අධ්‍යාපන ක්‍රමයේ වැරැද්දට මම හිතන්නේ, රටේ නිදහස ලබා ගත් දා ඉඳලා අද වන තෙක් මේ රට පාලනය කරපු සියලු අය, අඩු වැඩි වශයෙන් මේකට වගකියන්න ඕනෑ. මොකද, රටේ අපට අද අධ්‍යාපන ප්‍රතිපත්තියක් නැහැ. ආණ්ඩු මාරු වෙන කොට, [රජිත හපුආරච්චිගේ]

ඇමතිවරු මාරු වෙනකොට අපේ රටේ අධ්‍යාපනය පිළිබඳ තීන්දු තීරණ වෙනස් වෙනවා. වැඩිදුර යන්නේ නැතිව අපි ළඟම උදාහරණයක් ගත්තොත් එහෙම අද රටේ උසස් අධ්‍යාපනය ඇමතිවරයාට එකතු කරලා තිබෙන විෂය පථය. මහාමාර්ග සහ උසස් අධ්‍යාපන. ගරු සභාපතිතුමනි, මේක හරියට නිකම් පරිප්පු හොද්දකට බෝල්ට් ඇණයක් දැම්මා වාගේ. ඒ නිසා එහෙම ප්‍රතිපත්තියක් තමයි අපේ රටේ අද තිබෙන්නේ. අධ්‍යාපනය සම්බන්ධයෙන්. එකට එකතු කරන්න බැරි, එකට යා වෙන්නේ නැති විෂය ක්ෂේත්‍ර දෙකක් එකට එකතු කරලා තමයි මේ අධ්‍යාපන ක්‍රමය ඉස්සරහාට ගෙනියන්න හදන්නේ. මම මේ ළඟම උදාහරණ ගත්තේ. මේ වාගේ උදාහරණ මොන ආණ්ඩු කාලයේත් තිබුණා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ කාරණාව ඇතුළේ තමයි, මේ වටපිටාව ඇතුළේ තමයි අද අපට මේ නම කියන්න බැරි ඒ ආයතනයේ ප්‍රශ්නය ගැන කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඉතින් එතැනදී මේ ගැන අදහස් දක්වන විවිධ පාර්ශව මේකට විවිධ විවිධ කෝණවලින් මේ දිහා බලනවා. විවිධ හේතු තමුන්ගේ ඔලුවේ තියාගෙන මේ ගැන කථා කරනවා. කොටසක් මේ ගැන කථා කරනවා, තමුන්ගේ දරුවෝ විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙලා අධ්‍යාපනය ලබනවා. ඒ නිසා ඒක නීතිගත කර ගන්න, ඒකේ උපාධිය ලබා ගන්න කොටසක් අද කථා කරනවා. තවත් ව්‍යාපාරිකයෝ තමන්ගේ දරුවෝ මේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ඇතුළේ O/L, A/L ලියලා සමත් වෙලා, මේ තරඟකාරීත්වය ඇතුළේ A 3 ක් අරගෙන, හොඳ Z අගයක් අරගෙන විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙන්න හැකියාවක් නැති අය කල්පනා කරනවා අපේ දරුවෝ කොහොම හරි විශ්ව විද්‍යාලයට ඇතුළත් කර ගන්නේ කොහොමද කියලා. ඒ නිසා ඒ අය කල්පනා කරනවා, මේ වෛද්‍ය විද්‍යාලය තිබුණොත් හොඳයි කියලා.

ඒ වාගේම තමයි තව දේශපාලඥයෝ කොටසක් ඉන්නවා, තමුන්ගේ දරුවෝ මේක ඇතුළේ ඉන්නවා. මේ සාමාන්‍ය ක්‍රමය ඇතුළේ ඒ දරුවන්ට විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙන්න අවස්ථාව නැති නිසා, ඒ අය කල්පනා කරනවා කොහෙන් හරි අපේ දරුවෝ මේ තැනට මේකට රිංගවා ගන්න නම් මෙවැනි වෛද්‍ය විද්‍යාල රටේ තිබෙන්න ඕනෑය කියලා. ඒ වාගේම තමයි තවත් කොටසක් කථා කරනවා, මේක ඇතුළේ දේශපාලන වාසිය ගන්නේ කොහොමද කියලා කල්පනා කරනවා. මේ රටේ වෙන තරුණයන්ට, මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වන අසාධාරණය පැත්තක තියෙන කොට අපි දේශපාලන වශයෙන් රටේ කාලීන මාතෘකාවක් අරගෙන, ඒක මාකට් කරලා, ඒක ඉදිරියට ගෙනැල්ලා අපි කොහොමද දේශපාලන වාසිය ගන්නේ? ඒක මත සමහර කණ්ඩායමක් මේ ගැන කථා කරනවා. ඒ වාගේම තවත් කොටසක් අපි වාගේ මේ නිදහස් අධ්‍යාපනය ඇතුළේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබපු අපි වාගේ කොට්ඨාශයක් වෙනත් මතයක් මේ සම්බන්ධයෙන් දරනවා. ඒ නිසා විවිධ විවිධ පාර්ශව මේ දිහා බලන්නේ තමුන්ගේ පුද්ගලික න්‍යාය පත්‍ර ඇතුළේ කියන එක තමයි අද මේ විවාදය දිහා සාවදානව අහගෙන හිටපු මට දැනුනේ.

ගරු සභාපතිතුමනි, ඒ නිසා එක පැත්තකින් අපට ලොකු ගැටළුවක් තිබෙනවා. මෙවැනි ප්‍රමිතියකින් තොර වෛද්‍ය විද්‍යාල, විශේෂයෙන්ම වෙනත් විෂයයකට වඩා වෛද්‍යවරයෙක් කියන ඒ වෘත්තිය ඉතාමත්ම සංවේදී කාරණාවක්. ඒක අපි කවුරුත් තේරුම් ගන්න ඕනෑ. නඩුවක් කියලා, නඩුව පැරදුනාය කියලා මිනිහා මැරෙන්නේ නැහැ. ඒ වාගේම ඉංජිනේරුවෙකු කරන මොකක් හරි කටයුත්තකදී ඒකත් එක්ක ලොකුවට මේක ජනතාවට විශාල හානියක් සිද්ධ වෙන්නේ නැහැ. ජීවිත අවධානමක් ලොකුවට සිද්ධ වෙන්නේ නැහැ. හැබැයි, වෛද්‍යවරයෙකුගේ අතින් වරදක් සිදු වුණොත්, ප්‍රමිතියක් නැති අධ්‍යාපනයක් තුළින් බිහි වන වෛද්‍යවරයෙකු නිසා එවැනි තත්ත්වයක් මතු වුණොත් ජීවිත අහිමි වීමේ අවධානම වැඩියි. විශේෂයෙන්ම වෛද්‍ය විද්‍යාලයක් ක්‍රියාත්මක කර ගෙන යන කොට ප්‍රමිතිය කියන එක ඉතාමත්ම වැදගත්. ඒ ප්‍රමිතියත් එක්ක තමයි මේ වෛද්‍ය විද්‍යාල ඇති වෙන්න ඕනෑ. ඒකෙන් කියන්නේ නැහැ ගරු සභාපතිතුමනි, පෞද්ගලික විශ්ව විද්‍යාල එපායි කියන තැනක ඉන්න කෙනෙක් නොවෙයි මම. පෞද්ගලික විශ්ව විද්‍යාල අවශ්‍යයි. හැබැයි, තිබෙන ගැටළුව තමයි පෞද්ගලික විශ්ව විද්‍යාල රටේ ඇති වෙනවාත් එක්කම රජයේ විශ්ව විද්‍යාල පද්ධතියට මොකක්ද වෙන්නේ කියන

එක. රජයක් විධියට රජයේ විශ්ව විද්‍යාල පද්ධතිය දියුණු කරන්න පසුගිය කාලය පුරාවට මොනවාද විවිධ රජයන් කරලා තිබෙන්නේ? අඩු වැඩි වශයෙන් ගත්තාම මේ සියලු දෙනා මේ පෞද්ගලික විශ්ව විද්‍යාල මාෆියාව නිසා රජයේ විශ්ව විද්‍යාල අඩපණ කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අඩපණ කරන්න කටයුතු කිරීම තුළ තමයි අද ඇතැම් දෙමව්පියෝ කල්පනා කරන්නේ, අපේ දරුවෝ රජයේ විශ්ව විද්‍යාලයට යවනවාට වඩා හොඳයි පුද්ගලික විශ්ව විද්‍යාලයකට යවන එක කියලා. එහෙම කථා කරන්නේ අන්න ඒ නිසයි. මේ කථා කරන මම විශ්ව විද්‍යාලයෙන් එළියට එන කොට අවුරුදු 24 යි. හැබැයි, අවුරුදු 21, 22 වන කොට අපට විශ්ව විද්‍යාලයෙන් එළියට එන්න පුළුවන්කම තිබුණා. ඒකට හේතුව තමයි විශ්ව විද්‍යාල ඇතුළේ මේ ශිෂ්‍යයන්ගේ තිබුණු විවිධ අරගල. මේ අරගල නිර්මාණය කළේ කවුද? මේ අරගල පිටිපස්සේ හිටියේ කවුද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනතා විමුක්ති පෙරමුණ තමයි හැම එකටම පිටිපස්සේ ඉන්නේ.

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ඉතින් මම ජනතා විමුක්ති පෙරමුණේ නොවෙයි නේ? මට කියන්න එපා. පොඩ්ඩක් ඉන්න. ඒ නිසා මේ අරගල පිටිපස්සේ හිටියේ කවුද? කවුද හිටියේ මේ අරගල පිටිපස්සේ? අන්න ඒ අය තමයි අද මේ ප්‍රශ්නය දඩමීමා කර ගෙන මේ එන්නේ, මේ රටේ අහිංසක දෙමව්පියන්ගේ දරුවන් වෙනුවෙන් කථා කරන්න නොවෙයි. මේගොල්ලෝ එන්නේ මේ ප්‍රශ්නය දඩමීමා කරගෙන ඒගොල්ලන්ගේ දේශපාලන වාසිය ගන්න. අන්න ඒකට අපි විරුද්ධයි. හැබැයි, ඒ වාගේම තමයි අපි පෞද්ගලික විශ්ව විද්‍යාල ප්‍රමිතියකින් තොර වෛද්‍ය විශ්ව විද්‍යාලවලටත් අපි විරුද්ධයි. ඒ වාගේම ඒක දඩමීමා කර ගෙන දේශපාලනය කරන ඔබතුමන්ලා වාගේ අයටත් අපි විරුද්ධයි කියන එක මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ වෙලාවේ මම කියන්න කැමැතියි. මගේ අදහසක් විධියට. අපි විශේෂයෙන්ම පෞද්ගලික විශ්ව විද්‍යාල ඇති කරන්න අවශ්‍ය වට පිටාව ඇති කරන අතරේ, ප්‍රමිතියක් ඇතිව ඒ විශ්ව විද්‍යාල ඇති කරන්නේ කොහොමද? ඒ විශ්ව විද්‍යාලවල ප්‍රමිතිය මොකක්ද කියන එක සොයලා බලලා ඒකටත් අවස්ථාවක් දෙන්න අවශ්‍යයි. ඒ නිසා අපි පෞද්ගලික විශ්ව විද්‍යාල බැහැර කරන තැනක ඉන්නේ නැතිව, ප්‍රමිතියකින් යුතු විශ්ව විද්‍යාල පද්ධතියක් ඇති කරන්න රජයේ මැදිහත් වීම අවශ්‍යයි. මේ පුද්ගලික අවශ්‍යතා වෙනුවෙන් උද්ඝෝෂණ කරවන, ඒ අය ගැන නොවෙයි අපි කථා කරන්නේ. අපේ එක මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ උද්ඝෝෂණවලට යන්නේ යට ඇඳුමවත් නැති සමහර දරුවෝ කියලා. මම ඇත්තටම විරුද්ධ වෙනවා ඒ කථාවට. ඒක ඉතාම නින්දිත කථාවක්. රජයේ විශ්ව විද්‍යාලවලට රටේ විවිධ දිශාවල්වලින් එන දුප්පත් දෙමව්පියන්ගේ දරුවෝ එනවා. හැබැයි, ඒ දුප්පත් දෙමව්පියන්ගේ දරුවන්ට කොළඹට ඇවිල්ලා විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලබන්න ඒ අවස්ථාව උදා වෙලා තිබෙන්නේ නිදහස් අධ්‍යාපනය නිසා. ඒ නිසා මේ පෞද්ගලික විශ්ව විද්‍යාල, ප්‍රමිතියක් නැති පෞද්ගලික විශ්ව විද්‍යාලවලට කඩේ යන ඒ මන්ත්‍රීතුමන්ලාට අපි කියන්න කැමැතියි, ඔබතුමන්ලා ඉන්න තැන වැරැදියි.

ගරු සභාපතිතුමනි, මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම යම්කිසි විධියකින් මේ සම්බන්ධයෙන් ඡන්ද විමසීමකට අපට එළඹෙන්නට සිදු වුණොත් ප්‍රමිතියක් නැති, ඔය නම කියන්න බැරි පෞද්ගලික විශ්ව විද්‍යාලයට මම විරුද්ධයි. ඒ නිසා මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙන්න මම සූදානම්. හැබැයි, ඒකෙන් කියන්නේ නැහැ මෙතුමන්ලාගේ තිබෙන මේ පටු දේශපාලන වාසිය ගන්න ගෙනාපු මේ යෝජනාවට අපි ඒ අරමුණෙන් පක්ෂ වුණාය කියලා හිතන්න එපා. මේ රටේ ජනතාව වෙනුවෙන්, මේ රටේ අහිංසක දෙමව්පියන්ගේ දරුවෝ වෙනුවෙන් මේ නම කියන්න බැරි විශ්ව විද්‍යාලයට මම විරුද්ධයි කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Hector Bethmage M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.
[අ.භා.02.00]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලී සිටින මන්ත්‍රීවරයෙකු හැටියට අද මේ පිළිබඳව කථා කරන්න ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටට පත් වෙනවා. එකක් මේ නම කියන්න බැරි ආයතනයට මම කොහෙත්ම සම්බන්ධතාවයක් නැහැ. මම රාජ්‍ය විශ්ව විද්‍යාලයක අධ්‍යාපනය ලබපු, සමස්ත මගේ පවුලම එහෙමයි. මගේ දියණිය මොරටුව විශ්ව විද්‍යාලයේ සහාය කථිකාචාර්යවරියක්. මගේ අනික් දියණියත් ඉගෙන ගන්නේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ. මම කොහෙත්ම මේ විශ්ව විද්‍යාල පද්ධතිය, එහෙම නැත්නම් මේකට සම්බන්ධ නැහැ. නමුත් මගේ තිබෙනවා මතයක්. මගේ මතය තමයි මම නියැලිලා ඉන්නේ පෞද්ගලික ඉගැන්වීම් ක්ෂේත්‍රයේ. මම බාහිර කථිකාචාර්යවරයෙකු හැටියට කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මේ ක්ෂේත්‍රයේ නියැලිලා ඉන්නවා. නමුත් මම පෞද්ගලික අංශයට කැමැතියි. ඒ අංශය නියෝජනය කරන්නේ. මේ යෝජනාව ගෙනාපු අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි. ඔබතුමන්ලා කථා කරන්නේ පෞද්ගලික අංශය පිළිබඳව. ඔබතුමාගේ පළමු නායකයා, මේ ව්‍යාපාරය ආරම්භ කරපු විජේවීර සහෝදරයා. විජේවීර සහෝදරයාගේ විශ්ව විද්‍යාලය කෝකද? රුසියාවේ ලුමුම්බා විශ්ව විද්‍යාලය.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒක ප්‍රයිවට්ද?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කෙසේ වෙතත් දේශීය නොවෙයි. විදේශීය. ඒ නිසා එතුමා එතුමාගේ උපාධිය ලබා ගන්න, වෛද්‍ය උපාධිය ලබා ගන්න උත්සාහ කළේ ලුමුම්බා විශ්ව විද්‍යාලයෙන්. එතුමා ලංකාවට ආවා නම් එතුමා හොඳයි. සෝමවංශ අමරසිංහ මැතිතුමාගේ පුතා සහ ඒ අය ලංකාවට ඇවිල්ලාවත් නැහැ. දැකලාවත් නැහැ ශ්‍රී ලංකාව කියන්නේ මොකක්ද කියලා. එතකොට සමස්තයම හිටියේම පිටරට. වැඩි කාලයක්ම හිටියේ විදේශගත වෙලා. මොකද, ශ්‍රී ලංකාවේ ඉන්න බැරි නිසා වෙන්න ඇති. එතුමන්ලාගේ තිබුණේ දේශීයත්වයත් නොවෙයි. විදේශීය ගැතිභාවයක්. ඊළඟට දැන් පෙරටුගාමී - දැන් මෙතුමන්ලා කොපමණ කෑ ගැහුවත් මේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ මෙතුමන්ලාට හයියක් නැහැ. මොකද, මේ වන කොටත් මෙතුමන්ලාගේ කළය බිඳිලා ඉවරයි. විශ්ව විද්‍යාල පද්ධතියට සම්බන්ධ වෙලා ඉන්න මන්ත්‍රීවරයෙක් විධියට මේ විශ්ව විද්‍යාලවල දැන් කුමාර් ගුණරත්නම්ලා අරක් අරගෙන ඉවරයි. අද ඒ පෙරටුගාමී ව්‍යාපාරය, මෙතුමන්ලාගේ ශිෂ්‍ය ව්‍යාපාරය ආරම්භ කරන්නේ - එතුමාත් ශ්‍රී ලංකාවේ නොවෙයි. එතකොට මේක පරම්පරාවෙන් පරම්පරාවට ජාන ගත වුණු, සම්බන්ධ වෙලා තිබෙන විදේශ සම්බන්ධතාවයක්. මේ අය දේශීය ආදරයක් තිබෙන කට්ටියක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි අවුරුද්දේ විශ්ව විද්‍යාලවලට ඇතුළත් වුණාම ගැහි ගැහී ඉන්නේ. මේ මෙතුමා අපේ විශ්ව විද්‍යාලයේ පළමු වසර ගත කරන්නේ. විජේරාම හන්දියේ ගැහෙනවා. රෑගට අහු වෙයි කියලා. අරගෙන ගිහිල්ලා කසේ යටට වෙලා, කස ගස් යටට වෙලා මනස ශෝධනය කරනවා. මනස ශෝධනය කරනවා. මොකටද? උඹලා යන්න ඕනෑ මේ වැඩේට මල්ලිලා. නම් දානවා. කාඩ් ගහනවා. මෙතුමන්ලා දන්නවා. කාඩ් එකක් දෙනවා. උඹලා මේකට ගියේ නැත්නම් හවසට එන්න ඕනෑ. ඔය මහ ලොකුවට කෑ ගහන මන්ත්‍රීතුමන්ලා අර මේ ළඟදී අහිංසක දරුවෝ කිහිප දෙනෙක් අරගෙන ගිහිල්ලා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාමරයක නවක වදයක් දුන්නා. හෙළුවෙන්. ඊට එරෙහිව එක වචනයක් කථා කළාද.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා ඇහුවාද? දැක්කාද?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**

Hon. Rodney Rudolph Fraser

ඔය එකක්වත් විවෘත වේදිකාවේ කථා කළාද? එකම තැනක. අඩුම තරමේ රූපවාහිනී මාධ්‍යය තුළ කථා කළාද? අඩුම තරමින් පත්තරේක කථා කළාද ඒගොල්ලන්ට විරුද්ධව. නැහැ. කථා කරන්නේ නැහැ. භයයි. ඇයි? තමන්ගේ ශිෂ්‍ය ව්‍යාපාරය. මේක නිකම් මේ අයම එකතු කර ගෙන ඉවර වෙලා මේ ව්‍යාපාරය අරගෙන යන්න උත්සාහ දැරීමක් කරන්නේ. ඉතින් ඒ නිසා මේක මේ ආදරේට කරන වැඩක් නොවෙයි. මම මේ ව්‍යාපාරයට විරුද්ධයි. මම මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

කියන ආයතනය පිළිබඳව මම දන්නේ නැහැ නම කියන්න බැරි වුණත් මගේ සම්බන්ධතාවයක් නැහැ. නමුත් මම මේ මෑතදී දෙරණ 360 කියන වැඩ සටහන බලාගෙන ඉන්දැද්දී ඒකේ නියෝජ්‍ය උප කුලපතිතුමිය හරි කොහොම හරි මහාචාර්යතුමියක් සහභාගී වුණා. එතුමිය කියනවා, මේ විශ්ව විද්‍යාලයේ ඉන්නවා රාජ්‍ය විශ්ව විද්‍යාල තුළ අවුරුදු 20 කට වඩා වැඩි කාලයක් සේවය කරපු මහාචාර්යවරු 19 දෙනෙක්. එතකොට මහාචාර්යවරු 19 දෙනෙක් ඉන්නවා. ආචාර්යවරු 72 ක් ද කොහේද - මම දන්නේ නැහැ හරියටම සංඛ්‍යාව කොපමණද කියලා. 72 ක් විතර. ආචාර්ය මණ්ඩලයත් ඉන්නවා. (බාධා කිරීම්) අපි ගණනය කරන්නේ ඇයි? එතකොට මහාචාර්යවරු කියන්නේ ඇයි? එතකොට රජරට විශ්ව විද්‍යාලයට නැත්තේ ඇයි? එතකොට ඇයි අනික් -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඇවිල්ලා යනවා. විසිටින් ඉන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමා බොරුවට අර න්‍යායත් එක්ක එකතු වෙලා. ඔබතුමන්ලාගේ ඔය තෙලට අපිත් තැම්බුනා. අපිත් අහු වුණා. ඒකයි 89 සැප්තැම්බර් මාසේ 16 වැනිදා රෑ දෙකට අපව අත්අඩංගුවට ගන්න හැදුවේ. ඔය ව්‍යාපාරය ඉන්න කල් විතරයි. මේ මහ ලොකුවට කථා කරනවා. ජනාධිපතිවරණයට ඉදිරිපත් කරපු මෙතුමන්ලාගේ නන්දන ගුණතිලක මහත්තයා අද කොහේද ඉන්නේ? මේ පද්ධතියේම හිටියේ. එතුමා ඒකෙන් බේරිලා ගියා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එළෙව්වා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

එළෙව්වා නොවෙයි. ගියා. අද විමල් වීරවංශ හිටපු ඇමතිතුමා කියනවා, මගේ ජීවිතයේ මම කර ගත්ත ලොකුම මෝඩකම. මට හරියට ඉගෙන ගන්න බැරි වුණා. මට සීගිරියට නගින්නවත් බැරි වුණා. ඒක අඳෝනාවක්. මේ ඉන්නේ ඔක්කොම ඒ තෙලට අහු වෙලා බැඳිලා ඉන්නේ. මේ අමුතු ලෝකයක ජීවත් වෙන්නේ. හිතාගන්න බැරි පාවෙන ගන්ධබ්බ අවස්ථාවේ ඉන්න මන්ත්‍රීවරු කිහිප දෙනෙක්. මම අර ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. මම තර්ක කරන්න කැමැති නැහැ. මොකද, මගේ මිත්‍ර මන්ත්‍රීවර නිසා. නමුත් මේ කිහිප දෙනෙක් ඉන්නේ, ගන්ධබ්බ අවස්ථාවේ ඉන්න කිහිප දෙනෙක්. කොහේ හරි එල්ලෙන්න හිතාගෙන ඉන්නේ. රාජ්‍ය විශ්ව විද්‍යාල සහ පෞද්ගලික විශ්ව විද්‍යාල කියලා - පූර්ණ සමාජවාදී රටක් නම් මේක. මේකේ රාජ්‍ය විශ්ව විද්‍යාල තිබෙන්න පුළුවන්. මේක පූර්ණ සමාජවාදී රටක් නොවෙයි. මේක ඇවිල්ලා ධනවාදී සහ සමාජවාදී කියන මිශ්‍ර ආර්ථිකයක් තිබෙන රටක්. ඒ නිසා පෞද්ගලික අංශයත් මෙහෙයවනවා. රාජ්‍ය අංශයත් මෙහෙයවනවා. ඉතින් මෙතුමන්ලාගේ කුහකත්වය තිබෙන්නේ. ඇයි වෛද්‍ය උපාධිය පමණක් හැල්ලුවට ලක් කරන්නේ. දැන් අපේ රජිත මන්ත්‍රීතුමා කිව්වා, ප්‍රමිතියෙන් තොරයි කියලා. අවුරුදු ගණනාවක් උගන්වපු මහාචාර්යවරු 19 දෙනෙකු එතැන ඉන්නවා නම්, එතුමන්ලා කියනවා නම් මගේ අපේ විශ්ව විද්‍යාලය තුළින්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක හරහා එන දරුවන්ට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සායනික පුහුණුව?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

සායනික පුහුණුව තිබෙනවා නේ? ඒ අවිස්සාවේල්ල සායනික පුහුණුව තිබෙනවා. එතකොට තව කඩුවෙල අවස්ථාවක් ලබා දීලා තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

නවගමුව.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔව්. ඒ අවස්ථාවක් ලබා දීලා තිබෙනවා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

නවගමවුව රෝහල නොවෙයි. නවගමුව MOH එක.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අන්න හරි. MOH එක හරහා දීලා තිබෙන්නේ. රෝහල නොවෙයි. MOH එක හරහා සායනික කටයුතු පිළිබඳව අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇඳන් දෙකයි තිබෙන්නේ. බොරු කියන්න එපා. ගිහින් බලන්න කෝ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමන්ලාගේ දේශනය අහන්නද? නැත්නම් මම කථා කරන්නද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමිය අහනවා. මම එතුමියගේ දේශනය අහගෙන හිටියා. එතුමිය ඉඳන් කියනවා, අපි එහෙම නම් වැරදි නම් - දැන් මේ ප්‍රමිතිය තීරණය කරන්නේ කොහොමද? යම්කිසි භාණ්ඩයක හරි ප්‍රමිතිය තීරණය කරන්න වෙන්නේ අවසානයේ Quality Countroller කෙනෙක් හරි කවුරු හරි ඉන්න එපැයි. එහෙම නම් රාජ්‍ය විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා දරුවන්ටත්, මේ විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා වූ දරුවන්ටත් එකට විභාගයක් තියන්න. අපි කැමැතියි අපේ දරුවන්ව මේවාට ඉදිරිපත් කරන්න. ඉතින් ඇයි මේකට අකමැති. මේකට අකමැති අර කුහක පිරිසක් විතරයි. කුහක පිරිසක් විතරයි. ඔය අන්තරේ ඉන්න. මම කථා කරන්න කැමැති නැහැ. එහෙම වුණොත් අපිත් යම් යම් දේවල් - ඔය ඉන්න සමහර කට්ටිය ඉන්නවා. down වෙනවා. විභාගය ඇණ ගන්නවා. ඊට පස්සේ ආපහු අර ටික ව්‍යාපාරය අරගෙන යනවා. අන්න එක්කෙනෙක් නම් නීතිඥයෙකු හැටියට ගිහිල්ලා දෙයියනේ කියලා. අපෙත් හිතවතෙක්. ගියා ගොඩ. දැන් ඉන්න කොල්ලෝ ටිකත් එහෙමයි. විභාග ඩවුන් වෙවී, ඩවුන් වෙවී ගිහිල්ලා ඉවර වෙලා අරකම අරගෙන යනවා. රැවුල වවාගෙන - ඊට පස්සේ කල්පනා කරනවා. මොකද, සහෝදරයා වෙන්නේ. ඕක තමයි තිබෙන්නේ. රැවුල අඹර අඹරා. මේක තමයි න්‍යාය. මොකද මචං. මොකුත් නැහැ. අර න්‍යායෙන් තොර වුණු කිසිම දෙයක් නැහැ. ප්‍රායෝගික ලෝකයක ජීවත් වන මනුස්සයෙක් නොවෙයි. මගේ මිත්‍රයෝ ඉන්නවා සමහර විට මේ බැහැලා තෙලට තැම්බුනු ගෙදර ගෑණි අසනීප වෙලා. මිනිහා නැහැ. ගිහින්. මොකටද ගිහිල්ලා තිබෙන්නේ? අද වැඩක් තිබෙනවා. කොළ බෙදන්න යන්න තිබෙනවා. ඉතින් මෙහෙම න්‍යායක් ප්‍රායෝගික ලෝකයේ ජීවත් වෙන්නේ නැති, ගන්ධබ්බ අවස්ථාවේ ඉන්න මන්ත්‍රීවරු ගෙනෙන මේවාට අපි කතා බහ කරනවා. ඒ නිසා මේවා සමාජයේ හිටගෙන ඉන්න මිනිස්සු හැටියට ඉදිරිපත් කරන්නේ. කෙසේ වෙතත් මෙතුමාගේ අවසාන මේ යෝජනාවේ එක කොටසකට මම කැමැත්තක් දක්වනවා. විශ්ව විද්‍යාල පද්ධතිය කිසියම් ආකාරයක සංවර්ධනයක් කරනවා නම්, ඒකට සහයෝගය දැක්විය යුතුයි කියලා. ඒකට පමණක් මම එකඟතාවය පළ කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, අර හස්ත මුද්‍රාවෙන් කළේ මොකක්ද? ඒකට මම විරෝධතාවය දක්වනවා මූලාසනයේ ඉඳලා. ඒක මුළු රැවුල් සංහතියටම කරන අගෞරවයක්. දෙවැනි කාරණාව, මම මේ පළාත් සභාවේ කඩුවෙල ආසනය නියෝජනය කරන මහජන මන්ත්‍රීවරයෙක්. නවගමුව රෝහලේ ඇඳන් දෙකද තිබෙන්නේ කියන ප්‍රශ්නය නොවෙයි. නවගමුව රෝහලේ ඇඳන් 63 ක් තිබෙනවා. හොඳ රෝහලක්. මීළඟට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා.02.10]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද මේ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරද්දී මම මේ යෝජනාවේ පෙර විශේෂයෙන්ම මේ සාකච්ඡාව ඇතුළේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකුගෙන් මතු වුණු කාරණා පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කළ යුතු වෙනවා. විශේෂයෙන්ම මේ කිහිප දෙනෙකු මතු කළා මේ යෝජනා ගේන්නේ කුහකව කියලා. ඒ වාගේම අපට කාලකණ්ණි කියලා කිව්වා. ඉතින් අපි සතුටු වෙනවා. විශේෂයෙන්ම නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියත්, ජනතා විමුක්ති පෙරමුණේ අජිත් පමණක් මේ යෝජනාවට පක්ෂව, ඒ වාගේම අර තීරු බදු රහිත වාහන ගේන්න දෙගොල්ලෝම එකට එකතු වෙලා අත උස්සලා, අපට විරුද්ධව කාලකණ්ණි, කුහක කියලා කියන එක ගැන අපි සතුටු වෙනවා. මොකද, අපට ඒ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාලකණ්ණි කියන්නේ කාලය කන නිසා. ඒ නිසා කාලය කන්නේ නැතිව කථාව කර ගෙන යන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ යෝජනාව ගෙනාවේ අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමා. එතුමාට මේ යෝජනාවේ කිසිම ප්‍රශ්නයක් නැහැ. එතුමාගේ පුතා ඉන්නේ කොළඹ වෛද්‍ය පීඨයේ. දුව ඉන්නේ රජරට වෛද්‍ය පීඨයේ. දෙන්නාම වෛද්‍ය පීඨවල ඉන්නේ. කුහක නම් එතුමා මේ යෝජනාව ගේන්නේ නැහැ. අද ඒ දරුවෝ සටන් කරන්නේ, මේ වෛද්‍ය පීඨවල සියලු දරුවෝ දවස් 400 කට ආසන්න ප්‍රමාණයක් අට්ටාල ගහගෙන සටන් කරන්නේ තමන් වෙනුවෙන් නොවෙයි. අනාගතය වෙනුවෙන්. අනාගත දරුවන් වෙනුවෙන්. අනාගත අධ්‍යාපනය වෙනුවෙන්. නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍යයත් වෙනුවෙන්. එහෙම නැතිව මේ කුහකව නොවෙයි. අපට කාලකණ්ණි කිව්වා. බොහොම සතුටුයි. අපි සතුටු වෙනවා හතලිස් ලක්ෂයක් මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය ගැන, ඒ දරුවන්ගේ අනාගතය ගැන සාකච්ඡාවක්, යෝජනාවක් ගෙනැල්ලා ඒ අපවාදයට - එක්සත් ජාතික පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් මන්ත්‍රීවරුන්ගෙන් ඒ අපවාදයට අපව ගොදුරු වීම පිළිබඳව අපි සතුටු වෙනවා. අපි ඉතා ඉහළින්ම සතුටු වෙනවා. අපි කැමැතියි ඒ විධියට තනි වෙන්න.

දැන් විශේෂයෙන්ම මේ ආයතනය ගැන කථා කරද්දී අවධාරණය කරන්න ඕනෑ. දැන් මේ ආයතනය නම තහනම් වුණාට අපි කවුරුත් දන්නවා. ඇත්ත නමින් නොවෙයි මේක හඳුන්වන්නේ. මේකේ ඇත්ත නම තමයි හොර උපාධි කඩය. ඇයි මේකට හොර උපාධි කඩය කියලා කියන්නේ? මේ තරහකටද? වෛරයකටද? නැහැ. මේකේ ආරම්භයේ සිට තිබෙන්නේ වංචාව. මේක ලියාපදිංචි කළේ වංචා සහගත ලෙස. රන්වල සහෝදරයා ඒ ගැන පැහැදිලි කළා. මේකේ මුල්ම සිසුන් ලියාපදිංචි කළේ 2009 දී. රෝහල ආරම්භ කළේ කවදාද? 2012 දී. එහෙම කරන්න බැහැ. මා සතුව තිබෙනවා, මේ එක මන්ත්‍රීවරයෙක් කථා කරනවා ඉන්දියාව ගැන. විද්‍යාඥයෝ ඉන්නවාලු. අරගොල්ලෝ, මෙගොල්ලෝ කියලා. මා සතුව තිබෙනවා, ඉන්දියාවේ හින්දු පත්තරේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිළිබඳව පළ වුණු වාර්තාවක්. මේ වාර්තාව ලියන්නේ විද්‍යා ක්‍රිෂ්නන් කියලා කෙනෙක්. 2017 පෙබරවාරි 25 වැනිදා. මේකේ මොකක්ද කියන්නේ? ඉන්දියාවේ වෛද්‍ය විද්‍යාල 32 ක් තහනම් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මම මේකේ පොඩි කොටසක් කියවන්නම්. මේකේ කියනවා මෙහෙම. On January 4th & 5th four inspectors were in Bophal. බෝපාල් කියන ප්‍රදේශයේ හිටියාලු ඉන්දියානු Medical Council එකේ, MCI කියන එකේ නියෝජිතයෝ පිරිසක් මේ එක රෝහලක් ගැන පරීක්ෂා කරන්න. මොකක්ද කරලා තියෙන්නේ? The villegers in bus were promised free food and transport - ඊට ඉස්සරහා තව ගොඩක් තිබෙනවා. They visited Advanced Institute of those two days Advanced Institute එකේ ඒ දෙගොල්ලෝ ඒ දවස් දෙකේ පරීක්ෂා කළා. News travelled fast in the Madhya Pradesh Capital. They ahead of inspections at the Advanced Institute Administration sent out buses to round up near by villages from Videesha and Bethwan. මේ inspection එක තියෙන්න දවසට ඊට කලින් දවසේ බස් යවලා, අර මහ මග හිටපු අයව ගෙනැල්ලා රෝහලේ ගාල් කරලා, ඒගොල්ලන්ව තමයි රෝගීන් විධියට පෙන්නුවේ.

ඒ විතරක් නොවෙයි. ඒක දිගට තිබෙනවා. මට කාලය මදි නිසා විස්තර කරන්න වෙලාවක් නැහැ. රෝහලේ සේවකයෝත් රෝගීන් විධියට ඇඳන්වල ඉන්නවා. අන්තිමට ඒ ඇඳන්වල හිටපු සේවක රෝගීන්ගේ - රෝහලේ රෝගියෙකුගේ බඩු මුට්ටු තියෙන්න එපා? ඒ බඩු මුට්ටු කිසිවක්වත් නැති එහෙම එකක්. එහෙම වංචාකාරී විධියට තමයි ඔය කියන ඉන්දියාවේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පත්වාගෙන යමින් තිබෙන්නේ. ඒ නිසා එකක් මේක ආරම්භයේ සිට වංචා සහගත එකක්. හොර උපාධි කඩයක් [ගරු මහින්ද ජයසිංහ]

කියලා කියන්නේ ඒකයි. ඒ විතරක් නොවෙයි. දැන් මෙතැන ඉන්න අපේ පළාත් සභාවේ ආචාර්ය, මහචාර්යවරු ටික ඔක්කෝම අපේ රටේ ඉන්න ආචාර්ය, මහචාර්යවරුන්ට වඩා ඉහළ කට්ටිය. කවුද? සියලුම වෛද්‍ය පීඨ පීඨාධිපතිවරුන්. සියලුම වෛද්‍ය පීඨ ආචාර්යවරුන්ගේ සංගම්. ඒ වාගේම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය. මේ කියන සංගම් තුනම එකතු වෙලා, මේ කියන සියලු දෙනා එකතු කරලා පසුගිය මාර්තු මාසේ 13 වැනිදා ජනාධිපතිතුමාට භාර දුන්නා ලියවිල්ලක්. යෝජනා 05 ක් භාර දුන්නා. යෝජනා පහේ මොකක්ද කියන්නේ? එක, මම ඒක කියවනවා පුංචි වෙලාවක් අරගෙන.

*අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් කරන ලද පංච පුද්ගල කමිටුව ඇතුළුව අනෙක් අදාළ කමිටු පෙන්වා දුන් පරිදි මේ සයිටම් ආයතනය නීත්‍යානුකූලව පිහිටුවා නැති බැවින්* - කවුද මේක කියන්නේ? අද ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයා එදා සෞඛ්‍ය ඇමැති වෙලා ඉන්දැද්දී පත් කරපු පංච පුද්ගල කමිටුවෙන් මේ කියන්නේ. අහගන්න ඕනෑ කට්ටියම. එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපතිතුමා නේ?

*"තවදුරටත් සිසුන් බඳවා ගැනීම වහාම නතර කිරීම හා එම නතර කිරීමට අදාළ නීත්‍යානුකූල ක්‍රමවේදය පිළිපැදීම."*

ඊළඟට ආ යන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

"*ආයතනය මගින් MBBS උපාධි පිරිනැමීම වහාම නතර කිරීම.* ඒක තමයි මේ ආචාර්යවරුන්ගේ පළමුවැනි යෝජනාව. ඒ වාගේම විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨ සංගම්වල සහ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ - දැනට පවත්වාගෙන යන අධ්‍යාපනයට අදාළ දෙවැනි කරුණ.

*අදාළ අවම ප්‍රමිතියේ වලංගුභාවය නීතිය ඉදිරියේ තහවුරු කළ යුතු බව අභියාචනාධිකරණය පෙන්වා දෙන බැවින්* - අපි නොවෙයි කියන්නේ. පසුගිය නඩුවේදී කියන්නේ. අභියාචනාධිකරණය කියනවා දැනට පත්වාගෙන යන වෛද්‍ය අධ්‍යාපනයට අදාළ අවම ප්‍රමිතියේ වලංගුභාවය නීතිය ඉදිරියේ තහවුරු කරන්න ඕනෑ කියලා. *එබැවින් වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය හැකි ඉක්මණින් ගැසට් කර නීතිගත කිරීම.* මේවා කරන්න බැරි වැඩද? මේක තමයි පසුගිය මාර්තු මාසේ 13 වැනිදා ජනාධිපතිතුමාට දීලා තිබෙන දෙවැනි යෝජනාව.

ඊළඟට 03.

*වෛද්‍ය සභාව*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

*ආයතනය සම්බන්ධයෙන් 2015.09.04 දින වෛද්‍ය සභාව, SLMC එක, වන දින සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාට ලබා දුන් තාක්ෂණික වාර්තාව අභියාචනාධිකරණය පෙන්වා දෙන පරිදි නීතියෙන් බලාත්මක කර නැති බැවින් එයට අදාළ නීතිමය වලංගුභාවය ලබා දීම සඳහා*

*සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා කටයුතු කිරීම.* සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා මේ වනකල් මේකට අත්සන් කරලා නැහැ. ඒකයි මේ කියන්නේ. ඒක බලාත්මක කරන්න ඕනෑ කියලා. නීතිගත කරන්න ඕනෑ කියලා. හතර.

*උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා සයිටම් ආයතනයේ වෛද්‍ය සභාවේ අනුකූලතා සහතිකය මෙතෙක් ලබාගෙන නොමැති බව අධිකරණයට දැන්වීම.*

මේ හොර උපාධි කඩයට SLMC එකේ, වෛද්‍ය සභාවේ අනුකූලතා සහතිකය අරගෙන නැහැ ගරු මන්ත්‍රීවරුනි. ඒ ආයතන තමයි ඔබතුමන්ලා නීතිගත කරන්න කියලා කියන්නේ. ඒකෙන් තමයි දොස්තරලා එළියට දාන්න කියලා කියන්නේ. ඒ ආයතනයට වෛද්‍ය සභාවේ අනුකූලතා සහතිකය අරගෙන නැහැ. ඒක අධිකරණයට

කියලා නැහැ. නීතිඥ මහත්මයෙක් ඉන්නවා. උගත් නීතිඥ මහත්මයෙක් කියලා කියන්නේ. මම එයාගේ පැටිකිරිය ගැනත් කියන්නම්. එයා දන්න නීතිය ගැන මම කියලා දෙන්නම්.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

*ආයතනයේ වංචාවට හසු වී සිටින සිසුන්ට සාධාරණය ඉටු කරන ලෙස අදහස් කරන බැවින් ඒ පිළිබඳව අධ්‍යයනය කර අවශ්‍ය තීරණ ගැනීම සඳහා අදාළ පාර්ශව ඇතුළත් කමිටුවක් කිරීම.* මම හිතන්නේ සයිටම් ආයතනයේ 1000 කට ආසන්න සිසුන් ප්‍රමාණයක් ඉන්නවා. ඒ ශිෂ්‍යයින්ට වුණු අසාධාරණය පිළිබඳව සොයා බලන්න කමිටුවක් හදන්න. දැන් කිව්වා උසාවියේ නඩුවක් තිබ්බාලූ ඇයි ගිහිල්ලා කරුණු කිව්වේ නැත්තේ කියලා. නීතිය ගැන දන්න බම්බුවක් නැහැ. මහ ලොකුවට උසාවි ගිහිල්ලා මොනවාද දන්නේ නැහැ කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කවුද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමියත් කිව්වා. මේ කොස්තා මහත්තයාත් කිව්වා. පොඩ්ඩක් ඉන්නම්. මම කියන්නම්. මේකට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා මම කියලා කියනවා නම් මම උත්තර දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමිය මේ සභාවේ පැහැදිලිව, ප්‍රසිද්ධියේ කිව්වා අභියාචනාධිකරණයේ තිබුණු නීතියට අපි මැදිහත් වුණේ නැහැ කියලා. ඔබතුමිය දන්නවාද -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජේ.වී.පී. එකෙන් නඩු කියන්න දන්නේ නැහැ. උන් වෙඩි තියන්නයි, ගිනි තියන්නයි දන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් අහගෙන ඉන්න. ඔබතුමිය දන්න නීතිය ගැන මම කියලා දෙන්න යන්නේ. කලබල වෙන්න එපා. මෙතුමියගෙන් නීති උපදෙස් ගන්න මීගමුව පැත්තේ ජනතාවටත් දැනගන්න මේක කියන්න ඕනෑ. අභියාචනාධිකරණය ජනවාරි 31 තීන්දුව දීපු නඩුවට මේ රටේ පාර්ශව 11 ක්, රෝස් ප්‍රනාන්දු නීතිඥ ගරු මන්ත්‍රීතුමිය මේ පාර්ශව 11 ක් ඉල්ලා සිටියා, මේ නඩුවට මැදිහත් වෙන්න. එකක් ජනතා විමුක්ති පෙරමුණ. ඊළඟට අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය. ඊළඟට වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය. සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඇතුළු පාර්ශව 11 ක්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් එක්ක පාර්ශව 11 ක් ඉල්ලුවා. මොකක්ද කළේ? පාර්ශව 11 ම මැදිහත් වීම තාක්ෂණික හේතූන් මත ප්‍රතික්ෂේප කළා. මැදිහත්වීම ප්‍රතික්ෂේප කළා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තාක්ෂණික හේතු කියන්නේ නීතිය අනුව මැදිහත් වෙන්න බැහැ. ඔයාලා වෙනම නඩුවක් දාගන්න ඕනෑ. ඒකට මුක්කු ගහන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අභියාචනාධිකරණය දීපු තීන්දුවක් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙන කෙනෙක් දාපු නඩුවකට මුක්කු ගහන්න බැහැ. වෙනම නඩුවක් දාගන්න ඕනෑ. දන්නේ නැත්නම් ඉගෙන ගන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

සභාව ඇතුළේ චන්ඩි වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**

Hon. Mahinda Jayasinghe

දැන් හරිද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නීති දැනගෙන උපාධි කරලා ආපු අය අපි. තමුන්නාන්සේලා කියන කියන වෙලාවට ගිහිල්ලා නඩුවලට මුක්කු ගහන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බස්නාහිර පළාත් සභාවේ ඉදගෙන අභියාචනාධිකරණයේ තීන්දුව ගැන කියනවා. අපේ පක්ෂයේ නායක අනුර දිසානායක මැතිතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා. ඒ විතරක් නොවෙයි. අපේ පක්ෂයේ මන්ත්‍රීවරු, නායකයෝ රැසක් මේ තීන්දුව ගැන කිව්වා. එළියෙත් කිව්වා. ඔබතුමා කලින් වාගේ - මම කියන්නේ ඒ වෙලාවේත් කිව්වා නේ? ඒවා හැන්සාඩ් ගත වෙලා තිබෙනවා නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේගොල්ලෝ කෑගැහුවා කියලා නඩුකාරයෝ තීන්දු දෙන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ නඩු තීන්දුව දුන්නේ කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ නඩුවේ පැමිණිල්ල කවුද?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකේ දරුවෙක්. මේ නඩුවේ විත්තිය කවුද? සෞඛ්‍ය ඇමැතිතුමා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකේ දරුවෙක්ගේ මාමණ්ඩි. මේ නඩුවේ පැමිණිල්ලයි, විත්තියයි දෙකම එකයි. උස්ස අධ්‍යාපන ඇමැතිතුමා මේ නඩුවේදී SLMC එකේ අනුකූලතා සහතිකය නැහැයි කියන එක අභියාචනාධිකරණයට ඉදිරිපත් කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. මම කලින් පෙන්වා දීපු තුන්වැනි කැරුණ. ඒකට අනුව සෞඛ්‍ය ඇමැතිවරයා විසින් අධිකරණයට ඉදිරිපත් කරලා නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. නඩු ගැන කථා කරනවා. නීතිය ගැන කථා කරනවා. උසාවියට මේ කරුණු ඉදිරිපත් කරන්නේ නැතුව විත්තියයි, පැමිණිල්ලයි එක පැත්තක ඉඳගෙන දීපු තීන්දුවක්. විත්තියයි, පැමිණිල්ලයි එක පැත්තක ඉඳගෙන දීපු තීන්දුවක්. (බාධා කිරීමක්) ඒ නිසා මේ අදහස් දැක්වීම ඇතුළේ මම කලිනුත් සඳහන් කළා වාගේ කුහක කවුද? කාලකණ්ණි කවුද කියන එක හොඳට ප්‍රදර්ශනය වුණා. මේ රටේ ජනතාව කුහක කවුද, කාලකණ්ණි කවුද කියන එක තීරණය කරයි. ඒවා තීරණය කරන්නේ මේ වචනවලින් නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අවුරුදු 07 ක් ගිනි තිය තියා හිටියේ කවුද? අවුරුදු 07 ක් අධ්‍යාපනය කලාකණ්ණි කළේ කවුද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට කියන්න ඕනෑ මේ රටේ දරුවන්ගේ නිදහස් අධ්‍යාපනය. මේක නිකන් කොහෙන්වත් පාත්තරයක තියලා පත් කරපු එකක් නොවෙයි. 1946 නිදහස් අධ්‍යාපන පනත එන්නෙත්, පනතට විරුද්ධව එවකට එක්සත් ජාතික පක්ෂයේ ඩී.එස්. සේනානායකගේ ඉඳලා සියලු දෙනා විරුද්ධ වුණා. 1952 දී කන්නන්ගර මහත්තයා ගෙනාවේ. නමුත් කන්නන්ගර මහත්තයා මතුගම මැතිවරණයෙන් පරාජය කළා. කන්නන්ගර මහත්තයා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජේ.වී.පි. එකෙන් නේ නිදහස් අධ්‍යාපනය ගෙනාවේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉන්න කෝ පොඩ්ඩක් කියනකල්. දන්නේ නැත්නම් අහගන්න. ඒ කන්නන්ගර මහත්තයාට ඒක ගේන්න සිදු වුණේ, රට පුරා ප්‍රගතිශීලී ජනතාව එක පැත්තකින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ටෙලිග්‍රෑම් පිට ටෙලිග්‍රෑම් එවමින්, ඒ වාගේම රටේ පෙත්සම් අත්සන් කරමින් ප්‍රගතිශීලී ජනතාවගේ -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මොන භාෂාවෙන්ද දන්නේ නැහැ ටෙලිග්‍රෑම් එව්වේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මතුගම, කළුතර ප්‍රදේශයේ මන්ත්‍රීවරු මේවා ගැන දන්නවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මොන භාෂාවෙන්ද ටෙලිග්‍රෑම් එව්වේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මිනිය දණහිසෙන් උඩට උස්සන්න එපා කියලා නම් ලියුම් එව්වා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලේ මොන භාෂාවෙන්ද දන්නේ නැහැ ටෙලිග්‍රෑම් එව්වේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් දන්නේ නැති ඒවා අහගන්න කෝ? ඒ මතුගම ආසනයෙන් කන්නන්ගර මැතිතුමාව එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ විසින් හිතාමතා පැරැද්දුවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලියුම් දාලා ගියා නේ වෙඩි තියනවා කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊළඟට නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් වැඩිම හඬ නගපු මන්ත්‍රීවරයාට අඩුම තරමේ අධ්‍යාපන ඇමැතිකම දුන්නේ නැහැ. අධ්‍යාපන ඇමැතිකම නොදී වෙන කෙනෙකුට තමයි දුන්නේ. ඊට පස්සේ ඊළඟ වතාවේ කන්නන්ගර මැතිතුමා පාර්ලිමේන්තුවට ආවා. අධ්‍යාපන ඇමැතිකම දුන්නේ නැහැ. එහෙම තමයි එක්සත් ජාතික පක්ෂයේ නායකයෝ එදා නිදහස් අධ්‍යාපන අයිතිය වෙනුවෙන් කටයුතු කරද්දී කටයුතු කළේ. ඒ විතරක් නොවෙයි. කන්නන්ගර මැතිතුමා මේ රටේ මධ්‍ය විද්‍යාල 52 ක් ආරම්භ කළා. ඒක නතර කළා. ද්විභාෂා ප්‍රතිපත්තිය ගෙන ආවා. ඒක නතර කළා. ඒ වැඩ පිළිවෙළ ඉස්සරහාට යන්න දුන්නේ නැහැ. එහෙම තමයි කටයුතු කළේ. නිදහස් අධ්‍යාපනය අහෝසි කරන පියවරයන් ගත්තේ, 60 ගණන්වල ඉඳලයි. අද නොවෙයි. 77 වනකොට මේ රටේ අධ්‍යාපනය සඳහා 6% ක් වෙන් කළා. මොකක්ද වුණේ? 77 න් පස්සේ ක්‍රමානුකූලව, 85 වනකොට 3% ට බැස්සා. 2005 වනකොට 2.8% ට බැස්සා. 2015 වනකොට 1.2% ට බැස්සා. මේ රටේ විශ්ව විද්‍යාල ආචාර්යවරු ඇතුළු ප්‍රගතිශීලී ජනතාවගෙන් ආපු බල කිරීම මත එක්සත් ජාතික පක්ෂයටත්, වර්තමාන මේ හවුල් ආණ්ඩුවටත් කියන්න සිද්ධ වෙනවා අපි 6% දෙනවා කියලා. හැබැයි මොකක්ද කළේ? පළමුවැනි අයවැයෙන් රටේ ගොඩනැගිලිවල එකතුවත් එක්ක -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හැම ආණ්ඩුවෙන්ම ඇමැතිකමක් ගත්තා නේද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එකතු කරලා මිලියන 125 ක් අයවැයට එකතු කරලා කිව්වා අපි 6% ක් වෙන් කරනවා කියලා. පට්ට කෙබරයක් ඇද බෑවා. දැන් කෙබර -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පැනලා ඇවිල්ලා ඇමැතිකම් ගත්තු කට්ටිය.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පට්ට කෙබර ඇද බෑවා. මෙතුමාත් කෙබර කෙළලා, කෙළලා දැන් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අර මහින්ද මහත්තයා ආණ්ඩුවෙත් ඇමැතිකම් ගත්තා. කරගන්න බැරුව දාලා ගියා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇත්ත කියන කොට අහගෙන ඉන්න බැහැ. අධ්‍යාපනයට 6% ක් වෙන් කරනවා කියලා අද වනකොට ඒක 2% කටත් අඩු ප්‍රමාණයක් දක්වා පල්ලෙහාට බැහැලා. ඒකේ ප්‍රතිඵලය තමයි අද අපි මේ භුක්ති විඳිමින් තිබෙන්නේ. මේ රටේ දරුවෝ - ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා අහගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වැව්වල රොන් මඩ ටික අයින් කරලා, වැව්වල වතුරත් නැතුව ගියා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එංගලන්තයේ ඉගෙන ගත්තු කට්ටිය ඒවා දන්නේ නැහැ නේ? A/L කරන්න ලක්ෂ 60 ක් කොහේද? මේ රටේ 360,000 ක් පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වෙනවා. ඒකෙන් 10 ශ්‍රේණියට යනකොට 60,000 ක් ගෙදර නවතිනවා. කවුද මේ රට පාලනය කළේ? හරියට අපි රට පාලනය කළා වාගේ. මේ දෙගොල්ලෝ කථා කරන කොට මම හිතාගෙන හිටියේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කරන්න දුන්නා ඇමැතිකම් හතරක්. මොකද කළේ? ඇමැතිකම් හතර අරගෙන මොකද කළේ? පළමුවැනි දවසේ බත් පාර්සලය කෑවා. දෙවැනි දවසේ රට කෑවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා මම කියාගෙන ආවේ 360,000 ක් ඉස්කෝලයට ඇතුළත් වුණාම විශ්ව විද්‍යාලයට යන්නේ කීයද? 125,000 ක් උසස් පෙළ විභාගය සමත් වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මට කියන්න ඕනෑ වුණේ දැන් මේ 125,000 ක් විශ්ව විද්‍යාලයට සමත් වන අයගෙන් 25,000 යි විශ්ව විද්‍යාලයට තෝරා පත් කර ගන්නේ. වර්තමාන ආණ්ඩුව ඇවිල්ලා අවුරුදු 02 යි. එක දරුවෙක් වැඩි කළාද? ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා 5000 කින් වැඩි කළාලු. අපි අභියෝග කරනවා පුළුවන් නම් 2015, 2016, 2017 විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගත්තු සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න. එක්කෙනෙක් වැඩි කරගෙන නැහැ. ඒ නිසා විශ්ව විද්‍යාලයට ඇතුළත් වෙන්නේ 25,000 යි කියන්නේ පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වන දරුවන්ගෙන් 14 දෙනෙක්ගෙන් එක දරුවයි විශ්ව විද්‍යාලයට යන්නේ. ඕක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. විශ්ව විද්‍යාලවලට ඇතුළත් වෙන්නේ නැහැ. හැබැයි පසුගිය 2015 පෙබරවාරි 28 මහ දවල් සිදු කරපු මහ බැංකු බැඳුම්කර වංචාව හොරකමෙන් කරපු මුදල් ටික ආපහු ගන්න වෛද්‍ය විද්‍යාල පහක් ආරම්භ කරන්න පුළුවන්. වෛද්‍ය විද්‍යාල 05 ක් හදන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉඩ දෙන්න කෝ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකද, ඉඩ දෙන්නේ නැත්තේ? ඉඩ දෙන්නේ නැහැ නොවෙයි හංගගෙන ඉන්නවා. රනිල් වික්‍රමසිංහ හොරකම ආරක්ෂා කරනවා. අර්ජුන් මහේන්ද්‍රන් හොරකම රකිනවා. අර්ජුන් මහේන්ද්‍රන්ගේ තර්ජනයට යට වෙලා රනිල් වික්‍රමසිංහ අද බිය වෙලා. ඒ හොරකමට දඬුවම් දෙන්නේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගොවිනැගිල්ලට කීයද? මාසික කුලිය ලක්ෂ 245 යි. දැන් මාස 11 ක් ගෙවලා තිබෙනවා. කෝටි 27 ක්. කෝටි 27 ක් ගෙවලා තිබෙනවා. තවම කාර්යාලය පාවිච්චි කරන්නේ නැහැ. ඇමැතිවරු 10 දෙනෙකුට මාසයකට කෝටි 15 ක් වියදම් කරනවා ගොඩනැගිලි සඳහා මාසික කුලිය ගෙවන්න. (බාධා කිරීමක්) ඇත්ත තමයි කියන්නේ. පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇහුවා. ඔබතුමන්ලාගේ ගයන්ත කරුණාතිලක දීපු උත්තරේ. අපේ මන්ත්‍රීවරයෙක් අහපු ප්‍රශ්නයට ගයන්ත කරුණාතිලක ඇමැතිතුමා දීපු උත්තරය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මන්ත්‍රීතුමා යෝජනාවට අදාළව කථා කරමු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කෝටි 100 ක් අත්තිකාරම් අරන් තිබෙනවා. මේ නාස්තිකාර වියදම් නතර කළොත් වෛද්‍ය විද්‍යාල එකක් නොවෙයි 10 ක් අරින්න පුළුවන්. එහෙම ඇරලා මේ රටේ විශ්ව විද්‍යාල සුදුසුකම් ලබන දරුවන්ට වෛද්‍ය අධ්‍යයන පහසුකම් දෙන්න ඕනෑ. මම තව එකක් කියන්න ඕනෑ. එංගලන්තයේ ඉගෙන ගත්තු මහත්තයාට තව එකක් කියන්න ඕනෑ. ඒක කියලා නතර කරනවා. බිස්නස් කරන පෞද්ගලික වෛද්‍ය විද්‍යාල කොහේවත් නැහැ. එංගලන්තයේ තිබෙනවා ලෝකයේ තිබෙන හොඳම වෛද්‍ය විද්‍යාලවලින් එකක්. ඉම්පීරියල් කොලේජ්. තෝරන්නේ කොහොමද? දන්නවා නම් කියන්න. තෝරන්නේ A 3. A 3 න් A 2 ක් සුපර් A.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ කියන්නේ ඔබතුමාත් එංගලන්තයේ ගිහිල්ලා ඉගෙන ගත්තාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දන්නේ නැති ඒවා අහගන්න. ඊළඟට කියනවා මේ රජරට වෛද්‍යවරු. රජරට ආචාර්යවරු මෙහේ ඉන්නවාලු. රජරට විශ්ව විද්‍යාලය තිබෙන්නේ ලෝක ශ්‍රේණිගත කිරීම්වල -

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අන්තර්ජාලයේ සැරිසරලා ඒ විස්තර ටික සොයා ගන්න. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සයිටම් හොර උපාධි කඩය තිබෙන්නේ 16,000. රජරට විශ්ව විද්‍යාලය ශ්‍රේණිගත කිරීම්වල හාරදහස් වෙනි තැන තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ විධියට අපේ ස්ථාවරය අපි පැහැදිලිව කියනවා. දැන් එක එක්කෙනා එක එක කිව්වා නේ? අර කඩ තිබෙනවා. මේවා තිබෙනවා. අපේ ස්ථාවරය පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා මේ රටේ දරුවන්ට නොමිලේ අධ්‍යාපනය දිය යුතුයි. අපි වගකීමෙන් කියනවා. 2020 දී ජනතාවත් එක්ක නිර්මාණය කරන ආණ්ඩුව ආවාම (බාධා කිරීම්) ක්‍රියාත්මක කරලා -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ඕක කළාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ප්‍රකාශ කරන්න බැහැ. මොකක්ද? වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

36(1) න් වරප්‍රසාද ප්‍රශ්නයකුත් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හැබැයි, ඒක වරප්‍රසාදයක් විය යුතුයි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ආණ්ඩු පක්ෂයේ එහා පැත්තේ ලොබියේ දුරකථනය ක්‍රියා විරහිතයි. ගියවරත් ක්‍රියා විරහිතයි. මෙවරත් ක්‍රියා විරහිතයි. එකක්. ඊට අමතරව රස සාගරයක්. ජනතා විමුක්ති පෙරමුණ තමයි මේ රටේ වැඩිම වත්කම් තිබෙන දේශපාලන පක්ෂය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ලියුම දාලා වෙඩි තියන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

දැන් වෙලාව 02.30 යි. පොඩි රහසක් තිබෙනවා. දිවා ආහාරය අති පෝෂ්‍යදායක නිසා තමයි මේ ඔක්කොම වැඩියෙන් කථා කරන්නේ. ලේකම්තුමාගෙන් මම ඉල්ලා සිටිනවා. මේ වාගේ අති පෝෂ්‍යදායි ආහාර වේලවල් මීට පසුව දෙන්න එපා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

BBQ එක පෙරළලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒකට කියන්නේ BBQ කියලාද? තව කථා තුනයි තිබෙන්නේ. මම කියන්නම්. ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමයි. අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමයි. ලෙනාඩ් කරුණාරත්න මන්ත්‍රීතුමායි විතරයි. ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. කථාව කෙටියෙන් කරන්න. යෝජනාවට අදාළව කථා කරන්න. ඒ නිසා පක්ෂ ප්‍රතිපත්ති, වෙනත් දේවල් මෙතැන කියන්න යන්න එපා. කරුණාකර ඒ ගැන අවධානය යොමු කරන්න. මම ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

[අ.භා.02.30]

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම බස්නාහිර පළාත් සභාවේ අපේ අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාවේ මාතෘකාව මූලික වශයෙන් කථාවට ලක් වුණත්, මම හිතන්නේ සභාවම එකඟතාවයට පත් වෙලා තිබෙනවා, ශක්තිමත් විශ්ව විද්‍යාල පද්ධතියක් ඇති කළ යුතුයි කියන මතයට. එතුමාත් බස්නාහිර පළාත් සභාවත් පිළිගන්නවා. දැනටත් රාජ්‍ය විශ්ව විද්‍යාලත් ශක්ත්මත් නැහැයි කියන එකයි මගේ මතය. රාජ්‍ය විශ්ව විද්‍යාල ශක්තිමත් නැති අවස්ථාවක පෞද්ගලික විශ්ව විද්‍යාල ගැන අපි කථා කරන්නේ, ලෝක අධ්‍යාපන රටාවත් එක්ක අරගෙන බැලුවාම, මේ රටේ අධ්‍යාපන ක්‍රමවේදය තුළ මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය කප්පාදු කරන අධ්‍යාපන ක්‍රමයට විරුද්ධව මම හිතන්නේ, ජනතා විමුක්ති පෙරමුණවත්, ප්‍රගතිශීලී කණ්ඩායම්වත් නැඟී සිටින්නේ නැති එක කනගාටුවට කරුණක් හැටියටයි මම නම් දකින්නේ. අපි විශ්ව විද්‍යාල නැත්නම්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක ගැන කථා කරනවාට වඩා මේ රටේ රජය සියලුම අධ්‍යාපන අමාත්‍යවරු වෙන්න පුළුවන්. මේ රටේ පාලනය කරපු පාලකයන් වෙන්න පුළුවන්. උසස් පෙළත්, සාමාන්‍ය පෙළත් විභාග කරද්දී මොන තරා තිරමක් අනුවද මේ දරුවන් අසමත් කියලා තෝරා ගන්නේ කියන එක ගැන අපි කථා කළේ නැහැ. ඒ නිසා අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ගැන මම කනගාටු වෙනවා. එතුමා විද්‍යාඥයෙක් හැටියට එතුමා යෝජනාව ගෙනාවත්

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

වැනි 400 ක් නොවෙයි. ලබන අවුරුද්ද වන විට 4000 ක් වෙලා තව අවුරුදු ගණනාවක් වෙන කොට 40,000 ක් වෙලා මුළු ලෝකයටම වෛද්‍යවරු ලංකාවෙන් බිහි කරන්න පුළුවන් නම් අපි සතුටු වෙන්නට ඕනෑ. ඒ හැරෙන්නට කුහක විධියට මේ විශ්ව විද්‍යාල තහනම් කරලා, අර විශ්ව විද්‍යාලයට තහංචි ගෙනැල්ලා රජයේ විශ්ව විද්‍යාල පමණක් ශක්තිමත් කරන්න ඕනෑය කියලා යෝජනා කරන එක කනගාටුවට කාරණාවක් හැටියටයි මම නම් දකින්නේ. මෙතුමා විද්‍යාඥයෙක් හැටියට යෝජනාව ගේනවා. අද මේ රටේ පෝස්ට් ග්‍රැජුවෙට් කෙනෙක් හැටියට විශ්ව විද්‍යාලයේ හැදෑරුවාට පස්සේ වෛද්‍යවරයෙක් වෙන්න පුළුවන්, විද්‍යාඥයෙක් වෙන්න පුළුවන්, ඉංජිනේරුවක් වෙන්න පුළුවන්, ඊට ඉහළට යන්නට ආයතනයක් මේ රට තුළ නැහැ. අපි 2500 ක ඉතිහාසයක් මේ රටේ ඉතිහාසය ගැන ආගම ධර්මය ගැන කථා කරනවා. මුස්ලිම් අය හැටියට අපි 1500 ක අවුරුද්දක් ගැන ආගම ගැන අපි කථා කරනවා. මේ රටේ ඉහළ අධ්‍යාපනයට, ඉහළ ක්ෂේත්‍රයට යන්නට ආයතනයක් නැති නිසා තමයි අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා ජපානයට ගිහිල්ලා සල්ලි ගෙවලා විද්‍යාඥයෙක් හැටියට පත් වෙලා අද මේ රටට සේවාවක් කරන්නේ. ඒ එතුමාට එදා ඒ විශ්ව විද්‍යාලයට ගිහිල්ලා විද්‍යාඥයෙක් වෙන්න පුළුවන්

වන්නේ මේ රටේ ඒ අධ්‍යාපන ක්‍රමවේදයන් නැති නිසා. හැබැයි, එතුමා යන්නේ scholarship එකක් අරගෙන නොවෙයි. සල්ලි ගෙවලා ගිහිල්ලා ජපානයේ විද්‍යාඥයෙක් හැටියට ඉගෙන ගෙන අද ලංකාවට සේවාවක් ලබා දෙනවා. මම එතුමාට ඒක කුහක කමට කියනවා නොවෙයි. මේ රටේ අවාසනාවන්ත විධියට අධ්‍යාපන ක්‍රමවේදය හැදුණු නිසා තමයි ඒ කනගාටුදායක තත්ත්වයට අපට මුහුණ දෙන්නට සිද්ධ වුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනස් වෙන්නට ඕනෑ. එදා අපි ඉන්දියාවට උපාධිය ගැන නිකන් සොච්චම් කරලා කථා කළේ. අද ලෝකයේ ඉන්දියාව ඉහළම අධ්‍යාපන ක්ෂේත්‍රයක් තුළත් ඉන්දියාවට ආර්ථිකය ගලන්න පුළුවන් හැකියාවක් හදා ගත්තේ ඉන්දියාවේ අධ්‍යාපන ක්‍රමවේදය පුද්ගලීකරණයත්, රාජ්‍ය අධ්‍යාපනයත් එක්ක තරගකාරී ක්‍රමයට දියුණු වුණු නිසයි. ඒ නිසා තමයි අද ඉන්දියාව ආර්ථික අතින් ඉහළ මට්ටමට පත් වෙමින් පවතින්නේ. චීනය අරගෙන බැලුවාම කාර්මික පැත්තෙන් දියුණු වෙන කොට ආර්ථික අතින් පෝෂණය වන රටක් හැටියට අද ආසියාවේ මුළු ලෝකයම බබළන රටක් හැටියට පරිවර්තනය වන කොට අපි තවම කථා කරනවා, මේ Medical College එක ගැන. සයිටම් එක ගැන. මම උගතෙක්, බුද්ධිමතෙක්, විද්වතෙක් නොවෙයි. මම උගතුන්ට, බුද්ධිමතුන්ට, විද්වතුන්ට පහත් විධියට කථා කරනවා නොවෙයි. MBBS උපාධියක් වෛද්‍ය විද්‍යාලයෙන් ලබා දෙන කොට අපට ඔපරේෂන් එකක් කර ගන්න කොට ලෙඩක් දුකට අපි FRCS වෛද්‍යවරයෙක් සොයනවා. Specialist කෙනෙක් ඕනෑය කියලා. මේ උගත්වන කිසිම දොස්තරවරයෙකුට බැහැ මේ ලෙඩාව තෝරාගෙන බෙහෙත් කරන්නට. එංගලන්තයට ගිහිල්ලා සුද්දන්ට බැණ බැණ සුද්දන් එක්ක ඉගෙන ගත්තු FRCS ක්‍රමය අදත් ලංකාවේ පවතින්නේ. ඒකට විරුද්ධව මේ අයට කථා කරන්න හැකියාවක් නැහැ. ලෙඩක් දුකක් වුණාම Specialist කෙනෙක් FRCS කෙනෙක් රුසියාවේ ඉගෙන ගත්ත MB කෙනෙක් සොයාගෙන යන්නයි වෙලා තිබෙන්නේ.

අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, එංගලන්තයේ A 3 ක් සොයනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ A 3 ක් සොයන එකම රට ලංකාව පමණයි. ලෝකයේ කිසිම රටක A සොයාගෙන යන ක්‍රමයක් නැහැ. එක විෂයයක් ඉගෙන ගත්තොත් ඒ විෂයයට සහතික ලබා දෙන ක්‍රමවේදයක් තමයි තිබෙන්නේ. ඒ නිසා මම ගෞරවයෙන් කථා කරන්නේ. මේ අවස්ථාවේදී 2018 වසර වන විට නව රජය අපේ අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කරන ඒ විෂයයන් 23 නැවත අධ්‍යාපන ක්‍රමවේදයට ඇතුළත් කරලා මේ රටේ හොඳ දරුවන් නිර්මාණය කරන්න පුළුවන් ක්‍රමවේදයකට අපි සහයෝගය ලබා දිය යුතුයි. සයිටම් වලට විරුද්ධ වෙන්න පුළුවන් ප්‍රමිතිය ගැන අපි කථා කළ යුතුයි. SLMC එක Medical Council එක අවසරය දීලා නැහැයි කියලා අපේ මන්ත්‍රීවරයා කථා කරනවා. SLMC එකට අවස්ථාව දෙන්නේ නැතිව ප්‍රගතිශීලී කණ්ඩායම් කියලා කවුද කථා කරන්නේ? මේ ප්‍රගතිශීලි කණ්ඩායම් උද්ඝෝෂණය කරන දරුවන් 10 දෙනෙක් සිටියා නම් 10 දෙනාගෙන් 08 දෙනෙක් ඒ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එකටත් කැමැති අය. නමුත් ඔය ප්‍රගතිශීලී කියන හතර පස් දෙනාට හයට, වෘත්තීය සමිති එහෙම නැත්නම් ඔය විශ්ව විද්‍යාලවල තිබෙන සමිති නිසා හයට ඇවිල්ලා වාඩි වෙන අසරණ, අහිංසක, යමක් කමක් කරගන්න බැරි හැකියාව තිබෙන දරුවන්ව හය ගන්නවලා ගෙනැල්ලා වාඩි කරනවා කියන එක මතක් කරන්න ඕනෑ. ඒ නිසා මේ අධ්‍යාපන ක්‍රමවේදය වෙනස් වෙන්නට ඕනෑ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

වැනි විශ්ව විද්‍යාල, ඉංජිනේරු විද්‍යාල, අනිකුත් ආයතන, කාර්මික විද්‍යාල මේ රටේ මීටත් වඩා වැඩියෙන් ලබා දිය යුතුයි කියන එක අපි මේ අවධාරණය කළ යුතුයි. මගේ මතකයේ හැටියට ප්‍රමිතිය ගැන කථා කරද්දී ඔබතුමා ප්‍රකාශ කළා, හිටපු වත්මන් ජනාධිපතිතුමා අවසරය දීලා නැහැයි කියලා. 2009 වසරේ අවසරය දීලා නැත්නම් අද 2017 වත් ඉල්ලද්දී ඇයි අපට ඒ අවසරය දෙන්නට බැරි? ඇයි අපට practical කරන්නට Hospital එකට ගිහිල්ලා ලබා දෙන්න බැරි. ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ එකම ප්‍රශ්න පත්‍රයකට උත්තර දෙන්න ලියන්න දෙන්න බැරි ඇයි කියන කුහකකම අපට මතු කරන්න සිද්ධ වෙනවා. චීනයට ගිහිල්ලා, බංගලිදේශයට ගිහිල්ලා සල්ලි වියදම් කරගෙන ඉගෙන ගෙන ඇවිල්ලා ලංකාවේ විභාග කරලා රජයේ ආරෝග්‍යශාලා වල වෛද්‍යවරුන් හැටියට සේවය

කරන්න අවස්ථාව ලබා දෙනවා නම් අදත් ඇයි ඒකට කථා නොකර මේ සයිටම් එක හොර කඩයක් කියලා කථා කරන්නේ? මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක හොඳ විශ්ව විද්‍යාලයක්, විද්‍යා පීඨයක් හැටියට සංවර්ධනය කරන්න සහයෝගය ඇයි ලබා නොදෙන්නේ කියන එක මතක් කරන්න වෙනවා. ඒ නිසා මූලාසනාරූඪ [ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්]

ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවට එක්සත් ජාතික පක්ෂය හැටියට මම විරුද්ධව, මම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක ගැන සඳහන් නොකළත් පෞද්ගලික විශ්ව විද්‍යාල තව තවත් බිහි වෙන්නට ඕනෑ. Medical College තව තවත් බිහි වෙන්නට ඕනෑය කියන එක අවධාරණය කරමින් මට අවස්ථාව ලබා දීම ගැන ස්තුවන්ත වෙමින්, අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමාට මම කනගාටුවෙන් හරි ඔබතුමා උගතෙක්, බුද්ධිමතෙක් කියන එක අපි අවතක්සේරුවට ලක් කරන්නේ නැහැ. ඔබතුමා ගෙනාපු මේ යෝජනාව ඔබතුමා ගෙනෙන්න තිබුණේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

එක ගැන ප්‍රගතිය කථා කරලා මේ රටේ නිදහස් අධ්‍යාපනය අවශ්‍යයි. නිදහස් අධ්‍යාපනයට අපි විරුද්ධ නැහැ. නිදහස් අධ්‍යාපනය ලබා දෙන තරමම මේ අධ්‍යාපනය යමක් කමක් හම්බ කරගන්න බැරි අය තමයි සාමාන්‍ය මධ්‍යම පන්තියේ අය තමයි අද ලංකාවේ ඉගෙන ගන්නේ. යමක් කමක් කෝටි ගණන් හම්බ කරපු අය මුළු ලෝකයේම ගිහිල්ලා අධ්‍යාපනය හදාරලා අද ලංකාවට ඇවිල්ලා සේවය කරනවා. ඒ අයව අපි මල් මාලා දාලා පිළිගන්න යුගයක ඇයි මධ්‍යම පන්තියේ අයට ඉගෙන ගන්නට මේ රටේ අවස්ථාවක් ලබා නොදීම පිළිබඳව කනගාටුවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.02.40]

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි, මේ ඉතාම වටිනා යෝජනාවට මටත් වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන. සාමාන්‍යයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයෝ මේ දවස්වල ගෙනියන සටන්වලට මම එතුමන්ලාගේ පැත්තේ ඉන්නවා. නමුත් මේ යෝජනාවේදී මට ඒ දේ කරන්න මගේ හෘද සාක්ෂිය ඉඩ දෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද මට හිතෙනවා, මෙතැන අපි කරන්නේ - මම මෙතැන ඇත්තටම තරගයකටවත්, විවාදයකටවත්, වාදයකටවත් යන්නේ නැහැ. මගේ අදහස් විතරක් දක්වන්න අවස්ථාව ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා අපි අද නිදහස් අධ්‍යාපනයේ මුවාවෙන් අධ්‍යාපනයේ නිදහසට අකුල් හෙළනවා කියලා. ඒ කියන්නේ කාටත් ඉගෙන ගන්න තිබෙන අයිතියට අකුල් හෙළනවා කියලා. මොකද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් බොහෝ දෙනෙක්ට වැඩිය මේ කරුණ ගැන මට කථා කරන්න පුළුවන්කම තිබෙනවා. මොකද, මම රත්නපුරේ පාසලකින් පහ වසර ශිෂ්‍යත්වය සමත් වෙලා කොළඹ රාජකීය විද්‍යාලයට ශිෂ්‍යත්වය හරහා ඇතුළත් වුණු ශිෂ්‍යයෙක්. ඒ නිසා මම ශිෂ්‍යත්වයෙන් රාජකීය විද්‍යාලයට ඇවිල්ලා, අර අමුතු දේවල් දැකලා පොඩ්ඩක් මගේ මොළෙත් අවුල් ගිය නිසා මම O/L ඇණ ගත්තා. ඉතින් ඒක නිසා මම ඊට පස්සේ ජාත්‍යන්තර පාසලකින් London A/L තමයි කළේ. ඉතින් ඒක හරහා මම කොහොම හරි පිටරට විශ්ව විද්‍යාලයකට ගිහිල්ලා දෙමව්පියන් වියදම් කරපු නිසා මම ඉගෙන ගෙන ආවේ. දැන් බැරි වෙලා හරි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒ අවස්ථාව තිබුණේ නැත්නම් මොකද වෙන්නේ? අද මම මේ සමාජයට බරක් වෙන පුද්ගලයෙක් වෙනවා. එහෙම නැත්නම් මම මෙතැන පුටුවේ වාඩි වෙලා සිටියත් උගත්කමක් නැති පුද්ගලයෙක් වෙනවා. ඕක තමයි ඇත්ත කථාව. මට ඒ අයිතිය තිබුණා. මගේ දෙමව්පියන්ට ඒ හැකියාව, හයිය තිබුණු නිසා මට ඉගෙන ගන්න පුළුවන් වුණා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේක ගැන කථා කරනවා නම් දැන් ගොඩක් වෙලාවට මේ පවතින පෞද්ගලික විශ්ව විද්‍යාලයේ රුපියල් ලක්ෂ 120 ක් ගන්නවා කියනවා, එක වෛද්‍යවරයෙක් බිහි කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චීනයට යන්න පුළුවන්. මට A/L සමත් නැති දරුවෙක් දෙන්න. චීනයට ඇරලා ලක්ෂ 80 ක් දීලා වෛද්‍ය උපාධිය අරගෙන ලංකාවට එවන්න පුළුවන්. ආපු ගමන් අවුරුද්දක් ගියාට පස්සේ acsisteen කරන්න දෙනවා. Acsisteen කළාට පස්සේ ඒ දරුවා පිළිගත් වෛද්‍යවරයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ චීනයේ තිබෙන විශ්ව විද්‍යාලවල ප්‍රමිතිය අපි සොයනවාද? නැහැ, අපි සොයන්නේ නැහැ. පිටරටින් ආවොත් අන්න ප්‍රශ්නයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්තීතුමනි, පොඩ්ඩක් හිතලා බලන්න. ඒක හරහා ලංකාවෙන් කොයිතරම් විදේශ විනිමයක් පිටරට යනවාද? මම 2000 වර්ෂයේ තමයි යුනිවර්සිටි ගියේ. මම වෛද්‍ය විද්‍යාව නොවෙයි කළේ. මගේ දෙමව්පියින් මාස තුනකට සැරයක් ඩොලර් 7500 ක් 1999, 2000, 2001, 2002 වසර වලදී මාස තුනකට ඩොලර් 7500 ක් ඉස්කෝලයට විතරක් ගෙව්වා. ඒ තරම් වියදමක් ගියා. තව මට ජීවත් වෙන්න වෙනම මුදල් එව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ රටවල් අපෙන් හම්බ කර ගත්තා. අපෙන් හම්බ කර ගත්තේ ඒ මුදල විතරක් නොවෙයි. චීනය, මැලේසියාව, ඉන්දියාව, බංගලිදේශය, අද වැඩිපුරම විශ්ව විද්‍යාලවලට දරුවන් ගෙන්න ගන්නේ ජපානයේ. මුදල් විතරක් නොවෙයි හම්බ කර ගන්නේ. හොඳ උගත්, බුද්ධිමත් අර පැය 20 ට එහා වැඩ කරනවා නම් අඩුවට පොත යටින් වැඩ කරන්න ඕනෑ. හොඳ උගත් බුද්ධිමත් ශ්‍රම බලකායකුත් ලාභෙට වැඩ ගන්න පුළුවන් ශ්‍රම බලකායකුත් ඒ අය අපෙන් ගෙන්න ගන්නවා. ඔන්න ඕකයි ඇත්ත තත්ත්වය. අපි ඒවා ගැන සොයන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේවා ගැන සොයන්නේ නැහැ. අපි A/L පාස් වුණු පළියට මගේ උගත් මන්ත්‍රීවරුනි ඔබතුමන්ලා කියන්න එපා පාස් වුණයි කියලා බුද්ධිමතෙක් කියලා. ෆේල් වුණයි කියලා මෝඩයෙකුත් නොවෙයි. මම දන්න මගේ හිතවත් විශේෂඥ වෛද්‍යවරයෙක් ඉන්නවා. පළමුවැනි සැරේ A/L ෆේල්. පළමුවැනි සැරේ ෆේල්. දෙවැනි සැරේ පාස් වෙලා, විශ්ව විද්‍යාලයේ ගිහිල්ලා, Medical College ගිහිල්ලා අද ලංකාවේ ඉන්න ඉහළම වෛද්‍යවරයෙක්. විශේෂඥ වෛද්‍යවරයෙක්. ඉතින් එහෙම කියලා මේක අපට මනින්න බැහැ. අපි හැම දරුවෙක්ටම ඉගෙන ගන්න අවස්ථාව දෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපි කථා කරනවා නම් විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමේ තිබෙන විෂමතාවය මොකක්ද? දරුවෝ ටියුෂන් යන්නේ නැද්ද? ටියුෂන් ගිහිල්ලා මහන්සි වෙලා, මහන්සි වෙලා දෙමව්පියන් ණය වෙලා හරි ටියුෂන් Fees ගෙවලා ඇතුළට යන එක අසාධාරණ නැද්ද? දුප්පත් දරුවෙක්ගේ අම්මා තාත්තා කෙනෙක්ට ටියුෂන් fee එක ගෙවන්න බැරි වෙලා ඒ ටියුෂන් ගාස්තු ගෙවන්න බැරි වෙලා ඒ දරුවාට A/L පාස් වෙන්න බැරි වුණොත් ඒක අසාධාරණයක් නොවෙයිද? එහෙමනම් අපි ටියුෂන් පන්තිවලටත් විරුද්ධව උද්ඝෝෂණ කරමු. ඒක තමයි කෙරෙන්න ඕනෑ. මොකද ඒකටත් සල්ලි ගෙවලා නේ යන්න ඕනෑ. ඒකට නොමිලේ නොවෙයි යන්න හම්බ වෙන්නේ. එතකොට ටියුෂන් පන්තියට යන්න පුළුවන් දෙමව්පියන්ට මුදල් තිබෙන දරුවාට. නැති දරුවාට වැඩිය සාධාරණයක් වෙනවා නේ. අපි ඒ ගැන කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේ විෂමතාවල් මේ අපේ අධ්‍යාපනය ඇතුළේ ගොඩාක් තිබෙනවා. මේ පෞද්ගලික විශ්ව විද්‍යාල ඇති කිරීම හින්දාම කියලා අපට කියන්න බැහැ. මොකද, විශාල විදේශ විනිමයක් ලංකාවෙන් පිටතට යනවා. ඒ විතරක් නොවෙයි. අපේ දරුවන් සමහර වෙලාවට ඒ රටවල්වලට ගිහිල්ලා ඒ රටවල්වල තිබෙන නරක දේවල් විෂම දේවල් මේ රටවල් වලට අරගෙන එනවා. නැතුවා නොවෙයි. ඒ විතරක් නොවෙයි. රෝගාබාධත් අරගෙන එන අවස්ථා තිබෙනවා. නැහැයි කියන්න බැහැ. දරුවන් වැරැදි මාර්ගයේ යනවා. දෙමව්පියන් ළඟපාත නැහැ. ඒකටත් මේ දරුවන් ලංකාවේ ඉගෙන ගන්න එක හොඳ නැද්ද? ඒ ගැනත් අපි පොඩ්ඩක් කල්පනා කරලා බලන්න ඕනෑ. මම උදාහරණයක් හැටියට කියන්නම්. මේ ළඟදී මම Facebook එකේ දැක්කා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ලංකාවේ කට්ටියක් චීනයේ මහායාන බුද්ධාගම ලංකාවේ අරින්න උත්සාහ කරනවාලු. කවුද ගෙනැල්ලා තිබෙන්නේ? අනිවාර්යයෙන්ම චීනයේ ඉගෙන ගත්ත කවුරු හරි තමයි ඕක මෙහාට ගෙනෙන්න ඇත්තේ. එදාට අපි ආපහු පාරේ උද්ඝෝෂණ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික විශ්ව විද්‍යාල මේ රටේ ඇති වෙන්න ඕනෑ. හැබැයි ඒක කියලා නිදහස් අධ්‍යාපනයට පාරක් වදිනවා නම්, ඒකටත් අපි ඇත්තටම විරුද්ධ වෙන්න ඕනෑ. මොකද, අද හිතලා බලන්න. නිදහස් අධ්‍යාපනයට ඇත්තටම අර 6% අයින් කරලා නැහැ. ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි විශ්ව විද්‍යාලවල යන්න දෙමව්පියෝ දරුවන්ගේ ඔළුවට - අර 10% ක් විතරයි A/L කරන කට්ටියගෙන් යන්න පුළුවන්.

ඒකට ඇති කරන පීඩනය හරහා අද විශ්ව විද්‍යාලවලින් පාස් වෙලා පිටත් වෙලා එන දරුවන් අද හැසිරෙන ආකාරය බලන්න. වැඩිපුරම රජයේ ආයතනයකට ගියොත් ඉන්නේ රජයේ විශ්ව විද්‍යාලවල උපාධිධාරීන්. ජනතාවට කොහොමද සලකන්නේ කියන එක මම ඔබතුමාට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. රජයේ උපාධි ගත්ත වෛද්‍යවරු, DMO එකේ වෛද්‍යවරු අද රෝගීන්ට සලකන විධිය ගැන අපි කථා කරන්න අවශ්‍ය නැහැ. අපි දන්නවා, ආණ්ඩුවේ ඉස්පිරිතාලෙකට ගියොත් කොහොමද සලකන්නේ කියලා. මේක තමයි ඇත්ත. ඒ විතරක්
[ගරු අනුරාධ විමලරත්න]

නොවෙයි. ඇයි අපි කථා කරන්නේ නැත්තේ, මේ රජයේ විශ්ව විද්‍යාල ගැන අපි මෙච්චර උනන්දුවෙන් කැපවීමෙන් කථා කරනවා නම් ඇයි අපි කථා කරන්නේ නැත්තේ අපේ ලංකාවේ ඉගෙන ගෙන, ලංකාවේ දොස්තරලා වෙලා ඔස්ට්‍රේලියාවේ, ඇමරිකාවේ එහෙම නැත්නම් එංගලන්තයේ, නවසීලන්තයට Skilled migration නිදහස් අධ්‍යාපනය ලබලා Skilled migration යන කට්ටිය ගැන ඇයි අද අපි කථා කරන්නේ නැත්තේ? මොනතරම් පාඩුවක්ද? මොනතරම් වින්නැහියක්ද කරන්නේ. පිටරට ඉගෙන ගන්න එවුන් ගොඩක් මේ රටට එන්න try කරනවා. මේ රටේ ඉගෙන ගත්තු එවුන් පිටරට යන්න උත්සාහ කරනවා. ඕක නේ සත්‍ය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කථා කරනවා නම් ඔන්න ඔය දේවල් ගැන කථා කරන්න ඕනෑ. ඒ වාගේම ඇයි මේ වෛද්‍යවරු මේ පෞද්ගලික විශ්ව විද්‍යාලයකට මේ තරම් විරුද්ධ? ඒ ගොල්ලන්ට තිබෙන අවශ්‍යතාවය මේ ආණ්ඩුවල ඉස්පිරිතාලවල වෛද්‍යවරු වැඩි වෙයි කියලා නොවෙයි. Private Practice එකේ තිබෙන demand එක අඩු වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ සෞඛ්‍ය වැඩියෙන්ම තිබෙන රටවල් වන ඇමරිකාව, එංගලන්තය වාගේ රටවල්වල ජනගහනයෙන් තිස් දෙනෙකුට එක වෛද්‍යවරයෙක් ඉන්නවා. ලංකාවේ දාහකටවත් එක්කෙනෙක් නැහැ. 2700 ට එක්කෙනයිලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඉස්පිරිතාලවල දොස්තරලා නැතිව ඉන්න වෙලාවේ ඇයි අපට බැරි පෞද්ගලික විශ්ව විද්‍යාලයක් හරි ඇරලා ඒවා අපේ මට්ටමට ගෙනැල්ලා ළමයින්ට කරන්න දෙනවා වාගේ ඇයි අපට බැරි ඒ ළමයින්ව මේවාට වාඩි කරවන්න. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයෝ තමයි මම හිතන්නේ මොනෑෂ් එක ලංකාවට ගේන්න හදන කොටත් විරුද්ධ වුණේ. ඒක මැලේසියාවට ගිහිල්ලා අද කොයිතරම් විනිමයක් ඒ අය උපයනවද? කොයිතරම් සෙනඟ කන්දරාවක් එහෙට ගෙන්න ගන්නවාද? එතැනින් වන පාඩුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න ඕවා ගැන අපි කථා කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. දැන් අද විශාල වශයෙන් උද්ඝෝෂණ පවත්වනවා. වෛද්‍ය සිසුවෝ අද පන්තිවලට යන්නේ නැතුව ඉන්නවා. කාටද පාඩු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේ රටේ ජනතාවටයි ඒ අහිංසක දරුවන්ටයි විතරයි පාඩු. මොකද, ඕවාට සල්ලි වියදම් කරන්නේ, මහ මඟ රස්තියාදු වෙන්නේ ඔක්කෝම අපේ සල්ලිවලින්. කාටවත් පාඩුවක් වෙලා නැහැ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

පාඩුවක් වෙලත් නැහැ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ළඟට යන්නේ නැතුව පිටරට ගිහිල්ලා ඉගෙන ගන්න දරුවාට පාඩුවක් වෙලත් නැහැ. එකම දේ වෙලා තිබෙන්නේ. අනේ මේ දුප්පත් අපේ දරුවෝ ටික අවුරුදු හතරෙන් පහෙන් ඉවර කරගන්න පුළුවන් degree ය අවුරුදු අටක් දහයක් අදිනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඇයි රෝගීන් ටික.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

රෝගීන්ටත් දොස්තරවරු නැති වෙනවා. අන්න ඒ වාගේ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ කරන උද්ඝෝෂණ ක්‍රියා මාර්ගය හරහා ඇතිවන කාලයේ තිබෙන පරතරය. දැන් අපේ මන්ත්‍රීවරයෙක් කිව්වා, සාමාන්‍යයෙන් අවුරුදු 22 න් එන්න තිබුණු එක අවුරුදු 24 වුණාලු. ඇයි? ස්ට්‍රයික් කරන හින්දා. එතකොට දෙමව්පියෙක් ළමයෙක් අර රජයේ විශ්ව විද්‍යාලයට යවන්න ඉස්සෙල්ලා කල්පනා කරනවා මම කීයක් හරි දීලා පිටරට ඇරියොත් මේකාගේ අවුරුදු දෙකක් විතර ඉතුරු වෙනවා. දරුවෙක්ගේ ජීවිතයෙන් අවුරුදු දෙකක් ඉතුරු වෙනවා. කවුද අන්තිමට රජයේ විශ්ව විද්‍යාලයේ තිබෙන වටිනාකම බාල කරලා

තිබෙන්නේ. මේවා ගැන අපි කල්පනා කරන්න ඕනෑ. මේවා ගැන අපි හිතන්න ඕනෑ. ඉතින් පෞද්ගලික පාසල් අරිනවාට, විශ්ව විද්‍යාල අරිනවාට මගේ විරුද්ධත්වයක් නැහැ. හැබැයි, ඒවායේ ප්‍රමිතියක් තිබෙන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඒකට ආණ්ඩුවට මැදිහත් වෙන්න ඕනෑ. පෞද්ගලික විශ්ව විද්‍යාල අරිනවා නම් ඒවායින් අපේ ජනතාවටත් ලාභයක් ගන්න ඕනෑ. අරින්න දෙන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි අරිනවා නම් අඩුම ගණනේ 20% ක් රජයට ඉල්ලන්න. 20% ක් අපේ A/L පාස් වුණු දරුවෝ දාන්න. ඊට වැඩිය හොඳයි ඇත්තටම විශ්ව විද්‍යාල දියුණු කරන්න පුළුවන් නම්. අලුත් විශ්ව විද්‍යාල අරින්න පුළුවන් නම් හොඳයි. ලොකු දෙයක්. අපි කැමැතියි. නැත්නම් අරින එකාගේ පහනෙන් හරි අපි එළිය බලමු. 100 ක් ගන්න කොට අපේ ළමයින් 20 ක් දා ගනිමු. ශිෂ්‍යත්ව දෙන්න කියමු. ඒ අයව අපි A/L පද්ධතිය හරහා යවමු. මේ වාගේ දේවල්වලට තමයි අපි සටන් කරන්න ඕනෑ. මේ පාසල් වහලා වැඩක් ඇතැයි කියලා මම හිතන්නේ නැහැ. උද්ඝෝෂණය කරනවා නම් මගේ ආදරණීය ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරවරුනි. කොයිතරම් දේවල් තිබෙනවාද? මේ රජය අද කොයිතරම් බංකොලොත් වෙලා තිබෙනවාද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ අධ්‍යාපනයට 6% ක් අධ්‍යාපනයට වෙන්න කරන්න කියන උද්ඝෝෂණය - මගේ පළාතේ පටන් ගන්නේ දෙහිවල පාලම ගාවින්. දෙහිවල පාලම ගාව සිට ඒ 6% ක් ඉල්ලපු උද්ඝෝෂණයේ ඒ ශිෂ්‍යයන් එක්ක මමත්, ඉරාන් වික්‍රමරත්න ඇමතිතුමාත් හයිට් පිටියට යනතුරු පයින් ගියා. අපි ඒක ඉල්ලුවා. මේ ආණ්ඩුවෙන් දෙනවයි කිව්වා. ලැබුණේ නැහැ. අද 2% ත් නැහැ. මට සැකයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මම මෙච්චර ආදරේ කරන ජේ.වී.පී. සහෝදරයොත් අර ජනතාව කියන විධියට රතු අලි පැටව් වෙලා දෝ කියලා. මොකද මේ දේවල් වලින් වෙන්නේ වෙන කිසිම දෙයක් නොවෙයි. ඇත්ත අරගලවල තිබෙන සැර බාල වෙනවා.

අද මේ අරගලය හරහා විශ්ව විද්‍යාල සිසුන්ගේ, වෛද්‍ය විද්‍යාලවල ඉන්න සිසුන්ව අද මේ රටේ ජනතාවට තිත්ත වෙලා, එපා වෙලා. මොකද, වැරදි සටනක් ගෙනියන හින්දා. ඒගොල්ලන්ව ගේනවා නම් අපි ගේන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත සටනට. ජේ.වී.පී. සහෝදරවරුනි ඔබතුමන්ලා ඇත්ත සටනට ගේන්න. 6% ක් ඇයි අධ්‍යාපනයට වෙන් කරලා නැත්තේ කියන සටනට ඒ ගොල්ලන්ව එක්ක එන්න. මහපොළ ශිෂ්‍යත්වය වැඩි වෙලා නැත්තේ ඇයි කියන සටනට ගේන්න. ඒ විතරක් නොවෙයි. 25,000 ක් අලුතෙන් විශ්ව විද්‍යාලයට ගන්නවා කියලා මේ රජය පොරොන්දු වුණා. අද වන කොට අවුරුදු දෙකක් ගිහිල්ලත් තුන් හාර දාහයි වැඩිපුර අරගෙන තිබෙන්නේ. අවුරුදු පහ ඉවර වන කොට 25,000 කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ සටනට එන්න. හාර දහස් ගණනයි වැඩිපුර අරගෙන තිබෙන්නේ. මම හිතන්නේ 25,000 ට පොඩ්ඩක් අඩුවෙන් ගන්නවා. ඒකත් වැරැදියි. අවුරුදු දෙකකටම මේ අයට දෙන්න පුළුවන් වුණේ 2000 යිද? එහෙමනම් කොහොමද අවුරුදු 5 ඉවර වන කොට 25000 ක් දෙන්නේ. අන්න ඒ සටනට ගේන්න. මේවා තත්ත්ව පාලනයක් කරන සටනකට ගේන්න. මේ වාගේ සැර බාල කරන්න එපා. මේ වාගේ සටන් අපි ශක්තිමත්ව කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අධ්‍යාපනයට, සෞඛ්‍යට තිබෙන ඔක්කොම දේවල් අද කපා හැරලා. මන්ත්‍රීවරු, ඇමැතිවරු සුර සැප විඳිනවා. ඒ විතරක් නොවෙයි. අර කිව්වා වාගේ මහ බැංකු හොරකම ගැන කථා කරන්නවත් කවුරුත් නැහැ. ගේන්න. ඒ කට්ටියවත් මේවා කරන්න ගේන්න. ඒවාට අපි ඉන්නවා. ඒ වාගේ හොඳ සටන්වලට අපි ඉන්නවා. මේ වාගේ සටන් කරන්න එපා. මේකෙන් වෙන්නේ මේ රටේ ඇදන්වැටිලා තිබෙන අධ්‍යාපනය තවදුරටත් පල්ලෙහාට වැටෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ දරුවන් හරි සටනක් කරන කොටත් ජනතාව ඒ දරුවොත් එක්ක ඉන්න තත්ත්වය නැතිව යනවා. ඉතින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට වැඩිය මම මේ සභාවේ වටිනා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම ඉන්න තැන ඕකයි. මේ යෝජනාවට මගේ එකඟතාවය පළ කරන්න කොහෙත්ම හැකියාවක් නැහැ. තවත් යුනිවර්සිටි වැඩි වෙන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනය වාගේම සියලුම දෙනාට අධ්‍යාපනයේ නිදහසත් ලැබිය යුතුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබ සියලු දෙනාටම ස්තුති වන්ත වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අන්න යූ.ඇන්.පී. කොල්ලෝ. ජය වේවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අනුරාධ විමලරත්න ගරු මන්ත්‍රීතුමනි, මම මූලාසනයේ ඉඳන් පොඩි ප්‍රකාශයක් කරන්න ඕනෑ. කාලයකට පස්සේ ඉතාමත්ම හරබර, අර්ථාන්විත, මධ්‍යස්ථ, දේශපාලන ගැතිභාවයෙන් බැහැරව හොඳ සාරවත් කථාවක් කළා. ඒක මම මූලාසනයේ ඉඳන් අගයන්නට ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

යූ.එන්.පී. කාරයින්ට රිදෙයි. ඒ වුණාට හොඳ කථාවක් කළේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

හොඳ කථාවක්. ඇත්තටම ඔබතුමාගේ දේශපාලන අනාගතයට මම මූලාසනයේ ඉඳන් සුභ පතනවා. මීළඟට ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.
[අ.භා.02.55]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. අවසාන කථාව. මම දීර්ඝ වශයෙන් මේ සභාවේ කාලය ගන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. අද මේ සභාවේ අවධානයට යොමු වෙලා තිබෙන්නේ තවමත් තමන්ගේ නීත්‍යානුකූල උපත ලබා ගන්නට හැකියාව නොලබා සිටින, නොමේරූ දරුවෙක් වශයෙන් තවමත් මේ ගර්භාෂාව තුළ පවතින

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

නැමැති ඒ නොමේරූ දරුවා පිළිබඳව තමයි අද මේ සභාවේ කථා කළේ. මම හිතන්නේ අපි කවුරුත් දන්නවා මේ සයිටම් නැමැති නොමේරූ දරුවා තවමත් සිටින්නේ ගර්භාෂය තුළ. හැබැයි ගර්භාෂයෙන් එළියට එන්නට, එළියට ගන්නට තිබුණු කාලය දැන් හොඳටම ප්‍රමාද වෙලා. තවමත් අපි කථා කරන්නේ, මේ ගර්භාෂයට, මේ දරුවා, මේ කළලය ඇති වුණේ කොහොමද කියන ප්‍රශ්නය තමයි. මෙතැනදී මේ කළලය මේ ගර්භාෂය තුළ ඇති වනකොට කවුද සංවාසයේ යෙදුණේ, කෙසේද ඇති වුණේ, කවුද යහන්ගත වුණේ කියන ප්‍රශ්නය ගැන අපි හොයමින් අපි ඒ ගැන වාද විවාද කරනවා මිස මේ වනවිට ඉතාමත්ම අපහසුවෙන් අනිවාර්යෙන්ම ගර්භාෂයෙන් එළියට ගත යුතු මේ නොමේරූ දරුවා පිළිබඳව, ඒකට අදාළ විසඳුම ලබා දෙන්න දේශපාලන අධිකාරියවත්, අනෙකුත් නිලධාරීන්වත් කටයුතු කරන්නේ නැති අවස්ථාවක්. ඒ නිසා අපේ වගකීමක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනය කරන අපේ වගකීම තමයි ප්‍රශ්නයට විසඳුමක් දෙන එක. ප්‍රශ්නය තව තවත් විකෘති කරන එක නොවෙයි. ඉතින් ඒ නිසා එම වගකීම අපි සිතෙහි දරාගෙන මේ වෙනුවෙන් අපි කථා කළ යුතුයි කියන එක මම විශ්වසා කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ දරුවාව නීත්‍යානුකූලව උත්පාදනය කරන්න, උප්පත්තිය ලබා දෙන්න බැහැයි කියලා කියන කණ්ඩායම මොකක්ද කියන්නේ? මේ අයට ප්‍රමිතිය නැහැ. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනයේ ඉන්න දරුවන්ට නිසි ප්‍රමිතියක් නැහැ. ඒක තමයි කියන්නේ. ප්‍රමිතය කියන්නේ මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ප්‍රමිතිය කියන වචනයෙන් අපි අදහස් කරන්නේ මේක ඉබේ පහළ වුණු දෙයක් නොවෙයි. ප්‍රමිතිය ස්වභාව ධර්මයෙන් ඉබේ පහළ වුණු දෙයක් නොවෙයි. ප්‍රමිතිය කියන්නේ අපි විසින් හදාගත්තු දෙයක්. අපි විසින් හදාගත්තු නිර්ණායකයන් ඇතුළේ තමයි, ඒ නිර්ණායකයන් සම්පූර්ණ කළාම තමයි ප්‍රමිතිය ලබා ගත්තා කියලා කියන්නේ. එහෙම නම් ඒ ප්‍රමිතිය ලබා ගන්නට යම්කිසි අපහසු වීමක් තිබෙනවා නම් ඒ සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් නැත්නම් ඒ ප්‍රමිතිය ලබා ගන්න අවශ්‍ය වටපිටාව සලසා දෙන්න අපට පුළුවන්. ඒ නිසා එම නිර්ණායකයන් අතුළේ ඉඳලා, ඒ නිර්ණායකයන් සම්පූර්ණ කළාම අදාළ ප්‍රමිතිය ලබා දෙන වැඩ පිළිවෙළට අපි සහයෝගය දෙන්න ඕනෑ.

නමුත් ප්‍රමිතිය නැහැයි කියලා කෑගහන මේ කණ්ඩායම මොකක්ද කරන්නේ? ප්‍රමිතිය ලබා දෙන්න තිබෙන සියලුම අවස්ථාවන් සඳහා අකුල් හෙලනවා. බාධා කරනවා. ඒක හරියට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අත පය ගැටගහලා, වතුරට දාලා පිහිනපන් කියනවා වාගේ වැඩක්. ප්‍රමිතිය නැහැයි කියනවා. ප්‍රමිතිය ලබා ගන්න අවශ්‍ය වටපිටාව සහ නිර්දේශ ලබා දෙනකොට ඒකට බාධා කරනවා. අද මේ දේශපාලන කණ්ඩායම කරන්නෙත්, රජයේ වෛද්‍ය නිලධාරී කණ්ඩායම කරන්නෙත් ඒ දේමයි. ඒ නිසා මම නැවතත් කියනවා එහෙම නැත්නම් අපේ බෙල්ල මිරිකලා, අපේ බොටුව මිරිකලා කථා කරපන් කියනවා වාගේ. ප්‍රමිතිය ලබා ගන්නට තිබෙන අවශ්‍යතාවය, ඒ අවස්ථාව අපට ඒ සඳහා බාධා කරනවා නම් අපට ප්‍රමිතිය ලබා ගන්න බැහැ. ඉතින් ඒ නිසා ඒකට අවශ්‍ය අවස්ථාව ලබා දීලා මේ ඉන්න කණ්ඩායමට ප්‍රමිතියට අනුව නිර්ණායකයන් සම්පූර්ණ කරන්න දීලා ඒ අදාළ විභාගවලට ඔවුන්ට පෙනී හිටින්නට දීලා මේ කණ්ඩායමට විසඳුමක් ලබා දිය යුතුයි කියලා මා මේ අවස්ථාවේදී යෝජනා කර සිටිනවා.

අනෙක් ප්‍රධාන කරුණ මොකක්ද? සුදුසුකම. අවම සුදුසුකම. මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනයට අද ඇතුළත් වෙලා ඉන්න දරුවන්ට සුදුසුකම් නැහැයි කියලා කියනවා. අපේ ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ යම්කිසි උපාධියක් හදාරන්නට අවශ්‍ය අවම සුදුසුකම ඒ ක්ෂේත්‍රය තුළ තිබෙන උපරිම සුදුසුකම බවට පත් වෙලා තිබෙන එකම රට තමයි ලංකාව. අද යම්කිසි විෂයයක් සම්බන්ධයෙන් උපාධිය හදාරන්නට අපේ රට තුළ අවශ්‍ය අවම සුදුසුකම ඒ ක්ෂේත්‍රයේ උපරිම සුදුසුකම තමයි අද අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒක හරි අසාධාරණයක්. ඒ නිසා මම ඒ පිළිබඳව දීර්ඝව කථා කරන්නේ නැහැ. අපි ඒ පිළිබඳව ඕනෑ තරම් කථා කළා. අද මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ආයතනය කියන්නේ සමාජයීය අවශ්‍යතාවයක්. වසර ගණනාවක්, දශක ගණනාවක් පුරාවට මේ රට පාලනය කරපු සියලුම රජයන් විසින් අරගෙන ගිය, ක්‍රියාත්මක කළ ආර්ථික සහ දේශපාලනික ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් අනුව මෙය සමාජයීය අවශ්‍යතාවයක් බවට පත් වෙලා තිබෙනවා. මේ පෞද්ගලික විශ්ව විද්‍යාල. ඒක අපට බැහැර කරන්න බැහැ. ඉතින් ඒක නිසා ඒකට අවශ්‍ය නිසි වටපිටාව හදාල මේ දේ ලබා දෙන්නට අපි අපේ සහයෝගය දෙන්න ඕනෑ. ප්‍රතිමිතිය පිළිබඳව අපි කථා කළොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ප්‍රමිතිය තිබෙනවාද? අපි කථා කරලා බලමු ලෝක විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම එක්ක කොළඹ විශ්ව විද්‍යාලය තිබෙන්නේ කොහේද? 2171 ට ඉන්නේ. පේරාදෙණිය විශ්ව විද්‍යාලය 2248 ට තිබෙන්නේ. මොරටුව විශ්ව විද්‍යාලය 2647 තියෙන්නේ. මේක ඇතුළේ තිබෙන වෛද්‍ය විද්‍යාලවල තත්ත්වයත් ඒකම තමයි. අපි ආඩම්බරයෙන් කථා කරන්න, හෙට දවසේ ලෝකයේ තිබෙන අභියෝග ජයගන්න පුළුවන් ප්‍රමිතියකින් යුක්ත උපාධි අධ්‍යාපනයක් මේ කිසිදු විශ්ව විද්‍යාලයක් මේ රට තුළ ලබා දෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. එහෙම නම් මේ තත්ත්වය අපි අවබෝධ කරගෙන හෙට දවසේ අභියෝග ජය ගන්න පුළුවන් නිවැරදි, වඩාත් කාර්යක්ෂම, ඵලදායීතාවයෙන් යුක්ත විශ්ව විද්‍යාල පද්ධතියක් මේ රට තුළ නිර්මාණය වෙන්න ඕනෑ. පවතින තත්ත්වය තුළ එවැනි ප්‍රමිතියක් ඇත්තේ නැහැ. වෛද්‍ය විද්‍යාල සම්බන්ධයෙන් ගත්තොත්, අපි සමීක්ෂණයක් කළොත් අවාසනාවකට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ රජයේ රොහල්වලට ගිහිල්ලා සමීක්ෂණයක් කරලා නැහැ. රෝහල්වලට ගිහිල්ලා හරියට පරීක්ෂණයක් කළොත් අපට දැන ගන්න පුළුවන් මේ දක්වා ඉන්න රජයේ වෛද්‍යවරුන්ගේ ප්‍රමිතිය මොකක්ද කියලා. රජයේ වෛද්‍යවරුන්ගේ ප්‍රතිමියේ තිබෙන අඩුව නිසා, නොසැලකිල්ල නිසා එක වරුවකට, එක දවසකට කීදෙනෙක් මිය යනවාද? කීදෙනෙක් අබාධිත තත්ත්වයට පත් වෙනවාද? විකෘති වෙනවාද කියන එක හරියට දැනගන්න පුළුවන් මේ රටේ තිබෙන රජයේ රෝහල්වලදී නිවැරදි සමීක්ෂණයක් කළොත්. ඉතින් ඒ නිසා මේක තමයි ඇත්ත. අපට ඒ අත්දැකීම් තිබෙනවා. අපේ ඥාතීන්ට ඒ අත්දැකීම් තිබෙනවා. ඉතින් ඒ නිසා ප්‍රමිතිය අපට ළඟා කර ගත හැකි දෙයක්. ඒකට අවශ්‍ය වටපිටාව සකසන්න දේශපාලන අවශ්‍යතාවයක් වෙනුවෙන් මේක භාවිතා කරන්න එපා. ඒ නිසා අපි සියලු දෙනාම එකතු වෙලා ප්‍රශ්නයට විසඳුමක් දෙමු. ඒක තමයි අපේ වගකීම. මේ පණිවිඩය සමාජයට දෙන්න විශේෂයෙන්ම මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

ප්‍රශ්නය නිසා පාරට බහින විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට සහ අනෙකුත් දේශපාලන කණ්ඩායම්වලට මේ පණිවිඩය දෙන්න. මේ ප්‍රශ්නයේදී ඔබතුමන්ලාත් එක්ක, ඒ කණ්ඩායමත් එක්ක රටේ බහුතරයක් නැහැයි කියලා, රටේ බහුතරයක් ඔවුන් සමග හිට ගන්නේ නැහැයි කියන පණිවිඩය මේ බස්නාහිර පළාත් සභාවේ අද කථා කරන මේ විවාදයත් සමග මේ පණිවිඩය සමාජගත කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා.03.04]

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවට ඉදිරිපත් කරන ලද රීති අංක 107 යටතේ යෝජනාවට මන්ත්‍රීවරු 14 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් තම අදහස් දැක්වූවා. ඒ අදහස් තුළ යම් එකඟතාවයකුත්, ඒ අදහස් තුළ යම් ප්‍රතිවිරෝධතාවයකුත් දකිනවා. පොදුවේ රාජ්‍ය විශ්ව

විද්‍යාල පද්ධතිය ශක්තිමත් කළ යුතුයි කියන මූලික උවමනාවෙන් බොහෝ අය කථා කළා. රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කිරීම සම්බන්ධව අපි ඉදිරිපත් කළේ පෞද්ගලික විශ්ව විද්‍යාල පද්ධතිය විසින් ඒ පොදු දේපළ ගිල ගන්නවා කියන සංකල්පයත් එක්ක. ඒක නිසා මම අදහස් දැක් වූ සියලුම මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. හැබැයි මගේ යුතුකමක් තිබෙනවා මේ අවබෝධය ලබා දෙන්න. පොදු දේපළ පවතින්නේ නැහැ. පෞද්ගලික දේපළ විසින් පොදු දේපළ ගිල ගන්නවා. අපේ CTB එකට මොකද වුණේ? සමූපකාර පද්ධතියට මොකද වුණේ? [ගරු අසෝක සපුමල් රන්වල]

ඛණිජ තෙල් ක්ෂේත්‍රයට මොකද වුණේ? විදුලිබල පද්ධතියට මොකද වුණේ? පොඩ්ඩක් හිතා බලන්න.

අනුරාධ ගරු මන්ත්‍රීතුමා බොහොම සද්භාවයෙන් පැහැදිලි කළා. මේ විශ්ව විද්‍යාල පද්ධතියේ පෞද්ගලික අවශ්‍යතාවයකුත් තිබෙනවා කියලා. එහෙම අපට ඇති වෙන්නේ පොදු වැඩ පිළිවෙළ තුළදී ජයග්‍රහණය කර ගන්න අවුරුදු 70 ක් පුරා මේ රට පාලනය කරපු පාලකයින්ට නොහැකි වුණා. මේ විශ්ව විද්‍යාල පද්ධතිය රැක බලාගෙන ඒකට අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කරගෙන ආර්ථිකය ශක්තිමත් කරගෙන මේ රටේ විශ්ව විද්‍යාලයට සමත් වන 125,000 ක් දරුවන්ට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දෙන්න ආණ්ඩුව අසමත් වුණා. මේ මූලික කාරණය යටපත් කරලා තනි තනි මිනිස්සු විධියට, අම්මා තාත්තාට සල්ලි තිබුණු පලියට තමන්ට උපාධියක් කර ගන්න කියලා සිතුම් පැතුම් පෞද්ගලිකව හොඳයි. පොදු ප්‍රපංචයක් ඇතුළේදී මේ උවමනාව යථාර්ථයක් බවට පත් වෙන්නේ නැහැ. ඒක තුළ තිබෙන්නේ ක්‍රමානුකූලව සමස්ත විශ්ව විද්‍යාල පද්ධතියම බරපතළ අවධානමකට පත් කිරීම. ඒ නොසලකා හැරීම. ඒක යටපත් කිරීම. ඒක නිසා ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි විශ්වාස කරනවා එදා කන්නන්ගර මහත්තයා අපේ දේශපාලන පක්ෂයේ නියෝජිතයෙක් නොවෙයි. නමුත් මේ රටේ උගතෙක්, බුද්ධිමතෙක් විධියට මේ රටේ නිදහස් අධ්‍යාපනයේ උවමනාව ඇති කර ගත්තා. ඒ උවමනාව යථාර්ථයක් බවට පත් කර ගන්න තමන්ගේ දේශපාලන පක්ෂය තුළ අරගලයක් කළා. රට ඇතුළේ අරගලයක් කළා. පාර්ලිමේන්තුවේ අරගලයක් කළා. ඒ අරගලයේ ප්‍රතිලාභ අපට ලබා දුන්නා. ඒ ප්‍රතිලාභත් එක්ක තමයි මේ අපි කථා කරන්නේ. ඔබ අදහස් දැක්වූයේ. මේ උත්තරීතර අරමුණ ජයග්‍රහණය කරගන්න නම් ටිකක් මහන්සි වෙන්න වෙයි. එකිනෙක අදහස් එකිනෙකට සට්ටනය වෙන්න වෙයි. මේ විධියට අදහස් සංවාදයට ලක් කර ගන්න සිද්ධ වෙයි.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි, විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ ප්‍රමාණයක් වෛද්‍ය පීඨයෙන් මේ ස්ථානයට පැමිණිලා අපේ යසපාල කෝරලගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් එක්ක කථා කරලා මට කථා කළා. මෙන්න මෙහෙම යෝජනාවක් මේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ කරනවා. මොකද කරන්නේ කියලා. ඒ වෙලාවේ මම ඔවුන් එක්ක සංවාදයේ ප්‍රධාන අරමුණ බවට පත් වුණේ, සභා කටයුතු කාරක සභාවේදී මේ සම්බන්ධව සාකච්ඡා කරලා වෙලාවක් ලබා ගන්න කියලා. වැරදි අවබෝධයක් මෙතැන ඇති වුණා. අපේ හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා කියපු විධියට ඒ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ආවේ අපි කිව්ව නිසා කියලා. එහෙම නොවෙයි ඒ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ආවේ. මහජන නියෝජිතයින් විධියට යම් පිළිසරණක් බලාපොරොත්තුවෙන්. ඔවුන්ම කිව්වා ඔවුන් ආවේ ඉතාමත් ගම්බද ඈත ප්‍රදේශවලින් කියලා. වෛද්‍ය ශිෂ්‍යයෝ විධියට.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගම්බද ප්‍රදේශවලින් නොවෙයි, කොළඹ අවටින් තමයි ඇවිල්ලා හිටියේ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

හරි. හරි. මම ගම්බද කියලා කිව්වේ ඔවුන් මහ ලොකු සල්ලි හාගේ තිබෙන විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් නොවෙයි. ඒක නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පැහැදිලි කිරීම කළේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් වෛද්‍ය පීඨය ඉස්සරහා අට්ටාලයක් හදාගෙන - ඒ අට්ටාලය කියන්නේ රටට, ජනාධිපතිවරයාට, අග්‍රාමාත්‍යවරයාට තමන්ගේ විරෝධතාවය ඉදිරිපත් කරන්න පුළුවන් ක්‍රමයක්. ඒක මාධ්‍යයක්. ඒක හැල්ලුවට ලක් කරන්න එපා. අපේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ මේ විධියට තමයි තමන්ගේ විරෝධය පාලකයාට ඉදිරිපත් කරන්නේ. පාලකයා ළඟ දණ ගහලා වැඳ වැටිලා තමන්ගේ ඉල්ලීම් දිනා ගන්න සංස්කෘතියක් අපේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ නැහැ. ඒක නිසා මේ විධියට ගිහිල්ලා නිදහස් අධ්‍යාපනය රැක ගන්න විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් අසීමිත කැප කිරීමක් කරනවා. ඒක හැල්ලුවට ලක් කරන්න එපා. ඔවුන් කාලකණ්ණි කියලා

හඳුන්වන්න එපා. ඒ වාගේම ඔවුන්ට කටඋත්තර නැති වෙන්න, Knockout වෙන්න. එදා සභා කටයුතු කාරක සභාවේදී දුන්නා කියන අදහස දැඩි ලෙස මම ප්‍රතික්ෂේප කරනවා. ඒක නිසා මේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් බලාපොරොත්තු වුණු දේ අද අපෙන් ඉෂ්ට වුණා කියලා මම විශ්වාස කරනවා. ඔවුන් බලාපොරොත්තු වුණේ මෙතැන සංවාදයක් කරලා රටට මොකක්ද දෙන්නේ කියලා. යම් පමණකට යම් ආවේගයක් සහිතව කථා කරපු අය හිටියා. ඒ වාගේම සංයමයකින් කථා කරපු අය හිටියා. ඒ වාගේම තමන්ට සංවේගී කොටස අරගෙන ඉතාමත් සංවේගී විධියට කථා කරපු මන්ත්‍රීවරු හිටියා. අපේ අනුරාධ ගරු මන්ත්‍රීතුමා වාගේ. ඒ වාගේම නිරෝෂ අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය වෙනම ක්ෂේත්‍රයක් තුළ මේක දැක්කා. ඒ වාගේම අපේ රංගන හපුආරච්චිගේ ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව තවත් විධියකට දැක්කා. කොයි විධියකට දැක්කත් මේ සංවාදය ඉතාම අවශ්‍ය දෙයක්. මේක මහ නොහැර පළාත් සභාව තුළ අද රටේ සමාජයීය ප්‍රශ්නයක් සංවාදයට ලක් කිරීම පිළිබඳව සතුටට පත් වෙනවා.

ඒ වාගේම මට පොඩි කාලයක් දෙන්න ඉෆ්තිකාර් ජෙමිල් ගරු මන්ත්‍රීතුමා වැරැදි අදහසක් මේ සභාව තුළට දුන්නා. මම පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා ජපානයට ගියා නොවෙයි. කාටවත් සල්ලි දීලා ජපානයේ පශ්චාත් උපාධියක් හදාරන්න බැහැ. පශ්චාත් උපාධියක් හදාරන්න තමන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන්න ඕනෑ. ටෝකියෝ WASEDA University එකේ. ඒ සම්බන්ධව මගේ මූලික සුදුසුකම් බැලුවාට පස්සේ මම ඉදිරිපත් කරන්න ඕනෑ, Publish කරන්න ඕනෑ මගේ Research Paper එකක්. ඒ Research Paper එකක් මම Publish කළේ මේ රටේ අවුරුදු 3000 ක් පරණ කෘෂි කර්මාන්තයත්, වාරි කර්මාන්තයත් කාබනිකව කළේ කොහොමද කියලා. මේක විද්වත් මණ්ඩලයක් තුළ සංවාදයට ලක් කරලා ඔවුන් තීරණය කළා මගේ Research Paper එකට යම් අනුග්‍රහයක් දක්වන්න ඕනෑ කියලා. ජපානයේ ආණ්ඩුව මේ සම්බන්ධව මුදල් වෙන් කළා ජපන් යෙන්වලින්. මට Research Team එකට Professor කෙනෙක් නම් කළා. ජපානයේ ආණ්ඩුවෙන් මේක කළේ. ඒ Professor කෙනෙක් නම් කරලා මගේ Research එක ජපානය පුරාම කාබනික කෘෂි කර්මාන්තය කරන්න පුළුවන් Sitama Hokkido වාගේ දිවයිනවල්වල මට කරන්න අනුග්‍රහය දැක්වූවා. ඊට පස්සේ ජපන් විද්වතුන් එක්ක මේක යථාර්ථයක්ද කියලා බලන්න වැලිකන්ද, මැදවච්චිය, ගලෙන්බිඳුනු වැව ප්‍රදේශවලට ඇවිල්ලා නතර වෙලා ගොවිතැන් ප්‍රදේශවල මගෙත් එක්ක ඒ Research එක කළා. ඊට පස්සේ මේ Research Paper එක Publish කරලා අවුරුදු 04 කට පස්සේ මේක නව සොයා ගැනීමක් කියලා තහවුරු කරගෙන ජපානයේ ආණ්ඩුවෙන් මට ආචාර්ය උපාධිය දුන්නා. මම සල්ලි වියදම් කළේ නැහැ. මට සල්ලි වියදම් කරන්න බැහැ. මගේ තාත්තා විදුහල්පතිවරයෙක්. මගේ අම්මා ගුරුවරයෙක්. ගුරුවරයාට, විදුහල්පතිවරයාට පුළුවන්කමක් නැහැ කෝටි ගණනක් ජපානයට දීලා ඉවර වෙලා මට පශ්චාත් උපාධිය කරන්න. ලංකාවේ පශ්චාත් උපාධි ආයතනයක් තිබුණාට ඒ ආයතනයට ඒක බැහැ. තමන්ගේ Research Paper එකක් අනුමත කරන්න ඕනෑ. විදේශ විශ්ව විද්‍යාලයක මහචාර්යවරයෙක් යටතේ. ඒ අවශ්‍යතාවය තමයි මම ඉෂ්ට කළේ. ලංකාවේ මහචාර්යවරුන් හිටියාට ඒක ඉෂ්ට කරන්න බැහැ. ඒ නිසා ඒක නිවැරැදි කිරීම සඳහායි මම කථා කළේ. ඒක නිසා නිදහස් අධ්‍යාපනය තුළ මේ උවමනාව සාක්ෂාත් කර ගැනීම තමයි අපට අවශ්‍යතාවය තිබුණේ. ඒක යම් පමණකට පිරිමැසුනා කියලා විශ්වාස කරනවා. මේ විවාදයට සහභාගී වුණු සියලු ගරු මන්ත්‍රීවරුන්ට ස්තූතිවන්ත වෙමින් මම නවතිනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. ඇත්ත වශයෙන්ම ඔබතුමා වාගේ පළාත් සභා මන්ත්‍රීවරයෙක්, ඒ වාගේම විද්‍යාඥයෙක්ගේ තත්ත්වයේ ඉන්න කෙනෙක් හැටියට අපට ආඩම්බරයක් මේ සභා ගර්භයේ ඉඳීම. ඒ වාගේම ඔබතුමාගේ යෝජනාව නිසා මම හිතන්නේ මුළු රටට තර්කානුකූලව විශාල අදහස් ප්‍රමාණයක් පක්ෂ විපක්ෂ විසුරුනා. ඒ නිසා මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

අර්බුදය පිළිබඳව තීන්දු තීරණ ගන්න ජනතාවටත් යම්කිසි පණිවිඩයක් ඒවි. ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ගෙන එන ලද සංශෝධන සහිත යෝජනාවට මම මේ අවස්ථාවේදී සභාවේ එකඟත්වය විමසනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 03.12 ට, 2017 අප්‍රේල් මස 25 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 03.12 p.m till 9.30 a.m. on 25.04.2017*